PRAYPREPAREPREACH

# ද්විතීය නීති සංග්‍රහය

## ඉගැන්වීම

### ද්විතීය නීති සංග්‍රහය පොත සඳහා දේශනා සටහන්



*...ලොව වටා සිටින*
*බයිබල් ගුරුවරුන්*
*උදෙසා ලියා ඇත*

# ද්විතීය නීති සංග්‍රහය
## ඉගැන්වීම

**ද්විතීය නීති සංග්‍රහය පොත සඳහා දේශනා සටහන්**

# පටුන

අ. ඉක්මන් උපකාරය: ද්විතීය නීති සංග්‍රහයෙන් කතාවක් සූදානම් කරන අයුරු . . . . 4

ආ. ඉගැන්වීම සහ දේශනා කිරීම කළ යුතු අන්දම . . . . . . . . . . . . . . . . . . . 5

ඇ. ද්විතීය නීති සංග්‍රහය පොත ගැන . . . . . . . . . . . . . . . . . . . . . . . . 17

ඈ. ද්විතීය නීති සංග්‍රහය අධ්‍යයනය කර උගන්වන්න . . . . . . . . . . . . . . . . . 19

ඉ. පරණ ගිවිසුමේ පනත් අද දවසට අදාළ කරගන්නා ආකාරය . . . . . . . . . . . 98

ඊ. ද්විතීය නීති සංග්‍රහයෙන් පාඩම් . . . . . . . . . . . . . . . . . . . . . . . . 100

**Teaching Deuteronomy** is published by The Good Book Company
© Paul Barker/The Good Book Company 2014

© 2016 සිංහල පරිවර්තනය කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසිනි
Sinhala Translation © 2016 by Colombo Theological Seminary

සියලු අයිතිවාසිකම් කතුවරයා සතුය. කතුවරයාගේ හෝ ප්‍රකාශකයාගේ අවසරය නොලබා මෙම කෘතියේ කිසිදු කොටසක් කුමන ආකාරයකින් හෝ කුමන ක්‍රමයකින්, ඉලෙක්ට්‍රෝනිකව, යාන්ත්‍රිකව, ඡායා පිටපත් මගින් සම්ප්‍රේෂණය සහ භාවිතය පිණිස කිසියම් පද්ධතියක සටහන් කිරීම, ගබඩා කිරීම සපුරා තහනම්ය.

ISBN 978-955-82389-0-5

Colombo Theological Seminary, 189, Dutugemunu Street, Kohuwela
Sri Lanka
http://www.cts.lk

# පළමුව මෙය කියවන්න!

අපගේ (යාච්ඤා කරන්න, සූදානම් වන්න, දේශනා කරන්න ව්‍යාපෘතියේ) තවත් පොතක් ඔබ වෙත පිරිනැමීමට හැකිවීම මහත් ප්‍රීතියකි. දෙවියන්වහන්සේගේ වචනය දේශනා කිරීමටත් ඉගැන්වීමටත් මෙය උපකාරීවනු ඇතැයි යන්න අපගේ යාච්ඤාවයි. සෑමතැනකම සිටින සෙනඟ දෙවියන්වහන්සේගේ වචනය පැහැදිලිව අසනු දැකීම අපට අවශ්‍ය වන්නේය. එවිට සෙනඟ දෙවියන්වහන්සේ වෙතට හැරෙනු ඇත. ක්‍රිස්තු භක්තිකයන් වඩාත් යේසුස්වහන්සේ ආකාරයට වර්ධනය වනු ඇත. සියලු ප්‍රශංසාව දෙවියන්වහන්සේට හිමිවනු ඇත.

අපි ඔබට මෙසේ උපකාර කරන්නෙමු. එහෙත් ඔබ ද වෙහෙසවී කටයුතු කළයුතුය. කරුණාකර සරලව ඔබ කියවන දේ පිටපත් කරගැනීමෙන් වළකින්න.

යා.සූ.දේ හි තේරුම යාච්ඤා කරන්න, සූදානම් වන්න, දේශනා කරන්න යන්නය. ඔබ යම් පාසලක හෝ සේවා ස්ථානයක/සභාවක දෙවියන්වහන්සේගේ වචනය උගන්වන ගුරුවරයෙකු හෝ දේශකයකු නම් දෙවියන්වහන්සේගේ වචනය කතා කිරීමට මෙම පොත ඔබට උපකාරීවනු ඇත.

ඔබ දේශනා කිරීමට හෝ ඉගැන්වීම පටන්ගැනීමට පෙර කළයුතු බොහෝ දේ ඇත.

**යාච්ඤා කරන්න.** අපට මිනිසුන්ගේ හදවත් වෙනස් කළ නොහැකිය. එය කළ හැක්කේ දෙවියන්වහන්සේට පමණක්මය. මිනිසුන්ට අදහාගන්නට සැලැස්වීම අපට කළ නොහැකිය. එය කළ හැක්කේ දෙවියන්වහන්සේට පමණක්මය. අප සූදානම්වීමට පෙර යාච්ඤා කළ යුතුමය. දෙවියන්වහන්සේ කතා කරන හඬ ඔබට ඇසෙනු පිණිස යාච්ඤා කරන්න. අප කතා කරන්නට පෙර යාච්ඤා කළ යුතුමය. ඔබ පැහැදිලිව දෙවියන්වහන්සේගේ සත්‍යය ප්‍රකාශ කරනු පිණිස යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේගේ වචනය අප ඉගැන්වූ පසුවද යාච්ඤා කළ යුතුමය. දෙවියන්වහන්සේගේ වචනයට සවන් දුන් අය ප්‍රතිචාර දක්වනු පිණිස යාච්ඤා කරන්න.

**සූදානම් වන්න.** බයිබලීය කතාවක් කිරීමට සූදානම්වීම මහන්සිවී කළ යුතු කාර්යයක් වන්නේය. ඒ සඳහා පැය ගණනාවක් ගතවේ. මේ පොත ඔබට උපකාරයක් වුවත් ඔබ කළ යුතු සියලු කාර්යයන් එය සිදුකරන්නේ නැත. අදාළ ඡේදය හෙමින් සීරුවේ කියවීම ඔබ කළ යුතුය. පද ප්‍රවේසමෙන් අධ්‍යයනය කිරීම ඔබ කළ යුතුය. ඔබගේ අසන්නන්ට උපකාරීවනු පිණිස ඔබ පවසන්නට යන දේ ඔබ සූදානම් කරගත යුතුය.

**දේශනා කරන්න.** අප දෙවියන්වහන්සේගේ වචනය උගන්වන කල දෙවියන්වහන්සේ පුදුමාකාරයෙන් ක්‍රියාකරන සේක. දෙවියන්වහන්සේගේ වචනය අපගේ ජීවිතවල ඵල නිපදවන්නාවූ බීජ වැනිය. එම ඵල වනාහි ආත්මයාණන්ගේ ඵල වන්නේය. දෙවියන්වහන්සේගේ වචනය කතා කිරීම උද්යෝගිමත් දෙයක් ද වන්නේය. තමන්වහන්සේගේ වචනය උන්වහන්සේගේ කාර්යය ඉටුකරන බවට දෙවියන්වහන්සේ පොරොන්දුවූ සේක.

මෙම පොත භාවිත කිරීමට හොඳම මාර්ගය මෙන්න. “ඉගැන්වීම සහ දේශනාකිරීම කළයුතු අන්දම” කොටස කියවන්න. ඉන්පසු ද්විතීය නීති සංග්‍රහයේ ආරම්භයෙන් පටන්ගන්න. එක් එක් කොටස උගන්වන්න. එය කතන්දරයකි. එය ආරම්භයෙන් පටන්ගෙන අවසානයෙන් අවසන් කිරීම මහත් හැඟීමක් ඇතිකරයි.

“දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ.” *2 තිමෝති 3:16*

# අ. ඉක්මන් උපකාරය

## ද්විතීය නීති සංග්‍රහයෙන් කතාවක් සූදානම් කරන අයුරු

**1. දෙවියන්වහන්සේගේ උපකාරය ලැබීමට යාච්ඤා කරන්න.**

**2. ⊙ බයිබල් කොටස කිහිප වරක් කියවන්න.**
බයිබල් පද අධ්‍යයනය කිරීමට උපකාර සඳහා
« **පසුබිම** සහ ⊙ **සටහන්** උපයෝගී කරගන්න.

**3. බයිබල් කොටසෙන් දෙවියන්වහන්සේ අපට උගන්වන ප්‍රධාන කරුණු සොයාගැනීමට උත්සාහ කරන්න.**
ඔබගේ උපකාරය සඳහා ⊕ **ප්‍රධාන කරුණු** උපයෝගී කරගන්න.

**4. ඔබගේ සෙනඟ උදෙසා යාච්ඤා කරන්න. මෙම බයිබල් කොටස ඔවුන්ට කෙසේ උපකාර වන්නේදැයි කල්පනා කරන්න.**
ඔබගේ උපකාරය සඳහා ⊙ **කිරීමට යමක්** භාවිත කරන්න.

**5. කතාව ඔබගේම භාෂාවෙන් කිරීමට සූදානම් වන්න. ඔබගේ උපකාරය සඳහා සටහන් ලියාගන්න. ප්‍රධාන කාරණය රඳවා ගන්න.**
ඔබගේ උපකාරය සඳහා **උගන්වන්න** කොටසෙහි තිබෙන
අපගේ සටහන් භාවිත කරන්න.

**6. ඔබ කළ දේ සෝදිසි කරන්න.**

- **ප්‍රධාන කරුණු** පැහැදිලිද?
- **බයිබලය** උගන්වන දෙය ඔබ ඔවුන්ට පෙන්වූයේද?
- තේරුම් ගැනීමට හා මතකයේ රඳවාගැනීමට ඔබගේ සෙනඟට උපකාරවීම සඳහා ඔබ **පින්තූර** පෙන්වන්නේද?
- ඔබ සෙනඟ සමඟ **සම්බන්ධ** වන්නේද?
- කුමක් **වෙනස්වනු** ඇතැයි ඔබ බලාපොරොත්තු වන්නේද?

**7. ඔබගේ වචන තුළින් දෙවියන්වහන්සේ කතා කරන පිණිස යාච්ඤා කරන්න. උන්වහන්සේගේ සත්‍යය විසින් සෙනඟ වෙනස්කරනු ලබන පිණිස යාච්ඤා කරන්න.**

*උපකාරය සඳහා ඊළඟ කොටස කියවන්න*

# ආ. ඉගැන්වීම සහ දේශනා කිරීම කළ යුතු අන්දම

*බයිබලය කෙසේ ඉගැන්විය යුතුදැයි මෙම පිටු විස්තර කරයි. ඔබ අලුත් දේශනාවක් හෝ කතාවක් සූදානම් කරන සෑම අවස්ථාවකම ඒවා කියවීම උපකාරයක් වනු ඇත.*

2 තිමෝති 2:15 මෙසේ පවසයි, "දෙවියන්වහන්සේ ඉදිරියේ පෙනී සිටිමින් උන්වහන්සේගේ අනුමැතිය ගතහැකි පරිදි මහන්සිවී වැඩ කරන්න. සත්‍යයේ වචනය හරි ආකාර පහදා දෙන්නාවූ ලජ්ජාවෙන්ට ඕනෑ නැත්තාවූ වැඩකාරයෙක් වන්න."

මෙම පදය දක්වන්නේ බයිබලය ඉගැන්වීම සම්බන්ධවය. එය මහන්සිවී කළ යුතු කාර්යයක් බව පාවුල්තුමා තිමෝතියස්ට පවසයි. බොහෝ ගුරුවරුන් සහ දේශනාකරුවන් පණිවිඩයක් සූදානම් කරගැනීම සඳහා වැය කරන්නේ මිනිත්තු කිහිපයකි. එය ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා වෙහෙස විය යුතුය. තාප්පයක් ගොඩනගන මිනිසෙකු කල්පනාවට ගන්න. ඔහු අලසය. ඔහු හරියාකාරව එය නොකරන බැවින් තාප්පය කඩා වැටේ. තවත් තාප්පයක් ගොඩනැගීමට කිසිවෙක් ඔහුට නොපවසනු ඇත.

- *බයිබලය ඉගැන්වීමේදී වෙහෙසවී කටයුතු කිරීම වැදගත් වන්නේ ඇයි?*
- *අප නිවැරදි ආකාරයෙන් බයිබලය විවරණය නොකළහොත් කුමක් විය හැකිද?*

අප නිවැරදි ලෙස බයිබලය පැහැදිලි කර නොදුනහොත් දෙවියන්වහන්සේ දුක්වනු ඇත. සෙනඟට උපකාර නොලැබෙනු ඇත.

අප බයිබලය ඉගැන්වුවහොත් සෙනඟ නිරයෙන් ගැළවෙනු ඇත. සෙනඟ යේසුස්වහන්සේ ගැන දැනගැන්මෙන් වර්ධනය වී වඩාත් යේසුස්වහන්සේ මෙන් වනවා ඇත.

කතාවක් හෝ දේශනාවක් සූදානම් කිරීම සඳහා ඔබට හැකි තරම් කාලය ගන්න. හොඳ කතාවක් හෝ දේශනාවක් සූදානම් කිරීමට සම්පූර්ණ දවසක් ගතවිය හැකිය. යාච්ඤා කිරීමට මතක තබාගන්න. යාච්ඤාව මුලින්ම කළ යුතු කාර්යයි. ඔබ සූදානම් වන විටද කථා කිරීමට පෙර ද පසුව ද යාච්ඤා කරන්න.

## අධ්‍යයනය කරන්න, උගන්වන්න

සෑම ඡේදයකටම කොටස් දෙකක් තිබේ:

**අධ්‍යයනය** - ඡේදය අවබෝධ කරගන්නේ කෙසේද?

**ඉගැන්වීම** - එම ඡේදයෙන් කතාවක් හෝ දේශනාවක් ඉදිරිපත් කරන්නේ කෙසේද?

### අධ්‍යයනය

**යාච්ඤා කරන්න → පසුබිම → කියවන්න → සටහන් → කිරීමට යමක් → ප්‍රධාන කරුණ**

### උගන්වන්න

ආරම්භය → උප-කරුණු 2ක් හෝ 3ක් → නිදසුන → අදාළ කිරීම → යාච්ඤා කරන්න

# අධ්‍යයනය

පහත දැක්වෙන මාතෘකාවන් අධ්‍යයන කොටස තුළ ඔබ දකිනු ඇත:

**පසුබිම → කියවන්න → සටහන් → කිරීමට යමක් → ප්‍රධාන කරුණ**

බයිබලය දෙවියන්වහන්සේගේ වචනයයි. අප බයිබලය උගන්වන විට දෙවියන්වහන්සේ පවසන දෙය සෙනඟ අසන බවට අප සහතික විය යුතුය. මෙයින් අදහස් වන්නේ **ප්‍රධාන කරුණ** සොයාගැනීමට අප සැලකිලිමත් වියයුතු බවය. මක්නිසාද යත් අප තුළින් පැවසීමට දෙවියන්වහන්සේට අවශ්‍ය වන දෙය එය වන බැවිනි.

**ප්‍රධාන කරුණ** ඔබ දන්නා විට ඔබ තුළින් පැවසීමට දෙවියන්වහන්සේට අවශ්‍ය වන දෙය ඔබ දැනගනු ඇත. එවිට එය ඔබට සවන්දෙන්නන්ට හොඳම ආකාරයෙන් අදාළ කළ හැකිය.

එසේනම් ඔබ ප්‍රධාන කරුණ සොයාගන්නේ කෙසේද? මෙම පියවර අනුගමනය කරන්න:

## 1. යාච්ඤා කරන්න

දෙවියන්වහන්සේගේ උපකාර පතා යාච්ඤා කරන්න. ඔබ සූදානම් වන අතර ද **යාච්ඤාවෙන් යුතුව සිටින්න**. අපගේ අධ්‍යයනය සඳහා සහ ඉගැන්වීම එලදැරීම සඳහා අපට ශුද්ධාත්මයාණන්වහන්සේගේ උපකාරය අවශ්‍යය.

## 2. පසුබිම

ජේදයේ පසුබිම පිළිබඳව කල්පනා කරන්න.

පසුබිම යන්නෙන් අප අදහස් කරන්නේ කුමක්ද? මෙන්න නිදර්ශනයක්: පළමු පින්තූරයේ ගුවන්යානයක් දෙස බලන්න. ගුවන්යානය තිබෙන ස්ථානය පිළිබඳව ඔබට පැවසිය හැක්කේ කුමක්ද?



අනෙක් පිටුවේ තිබෙන දෙවන පින්තූරය දැන් බලන්න. එය එකම පින්තූරයයි, එහෙත් ඔබට දැන් **පසුබිම** දැකිය හැකිය. ගුවන්යානය තිබෙන ස්ථානය පිළිබඳව දැන් ඔබට පැවසිය හැක්කේ කුමක්ද?

ගුවන්යානය ගොඩ බස්වා ඇති බව දැන් ඔබට දැකිය හැකිය. එය ගමක් අසල බව පෙනේ. අහස අඳුරුව තිබෙන අතර පියාසර කිරීමට අනතුරුදායක වේලාවකි. එබැවින් එය ඉතා වැදගත් ගමනක් විය යුතුය.




අවබෝධ කරගැනීමට **පසුබිම** විශාල වෙනසක් ඇතිකරයි. අප දෙවියන්වහන්සේගේ වචනය අධ්‍යයනය කරන කල ඡේදයට අදාළ **පසුබිම** දෙස බැලීම අවශ්‍යය.

මෙයට කොටස් තුනක් ඇත:

1. මෙම ඡේදය පැමිණෙන්නේ බයිබලයේ කොතැනද?
2. මෙම ඡේදය ඇත්තේ බයිබලයේ කුමන පොතේද?
3. මෙම ඡේදයට පෙර හා පසු පරිච්ඡේද හෝ පදවල සිදුවන්නේ කුමක්ද?

අපි මේ දේවල් දන්නා විට බයිබල් ඡේදය අපට හොඳින් අවබෝධ වන්නේය.

සෑම කතාවක්ම පද කිහිපයකින් වනු ඇත. මෙම පද සම්පූර්ණ පරිච්ඡේදයට, සම්පූර්ණ පොතට සහ සමස්ත බයිබලයටම ගැළපෙන්නේය. පෙර පැවසූ දෙය මත ඡේදයක් ගොඩනැගෙන්නේ කෙසේදැයි කල්පනා කරන්න. උදාහරණයකට, ඔබ ද්විතීය නීති සංග්‍රහයෙන් කථා කරන්නේ නම්, පසුබිම අවබෝධ කරගැනීමට ඔබ පහත දැක්වෙන දෑ කල්පනා කළ යුතුය:

### සමස්ත බයිබලය

- බයිබලීය කතන්දරයේ මේ පොත පැමිණෙන්නේ කිනම් ස්ථානයේද?
- එය ඇත්තේ පරණ ගිවිසුමේ (යේසුස්වහන්සේ පැමිණීමට පෙර) ද අලුත් ගිවිසුමේ (යේසුස්වහන්සේ පැමිණි විට) ද?
- මෙම පොත තබා ඇත්තේ ඉතිහාසයේ කාලපරාසයේ කුමන ස්ථානයේ ද? (ලෝකය පිළිබඳ සැබෑ කතන්දරය බයිබලය අපට පවසයි)
- මෙම ඡේදය සමස්ත බයිබලයට ගැලපෙන්නේ කෙසේද යන්න දැනගැනීමට යොමු සහ අධෝලිපි අපට උපකාර විය හැකිය.

### සම්පූර්ණ පොත

- මෝසෙස් කථා කරන්නේ කාහටද?
- මෝසෙස් සෙනඟට කථා කරන විට ඔවුන් සිටියේ කොහිද?
- මෝසෙස් සෙනඟට මේ දේවල් කීවේ ඇයි?

ඔබගේ බයිබලයේ තිබෙන හැඳින්වීමෙහි අඩංගු එහි පසුබිම ඔබට උපකාරී වියහැකිය. "ද්විතිය නීති සංග්‍රහය පිළිබඳ තොරතුරු" (17 පිටුව) තුළින් ඔබට උපකාර ලබාගත හැකිය. උදාහරණයකට, මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට කථා කරමින් සිටි අයුරු ඔබ දකිනු ඇත. ඔවුහු පොරොන්දු දේශයේ මායිමේ සිටියෝය. දෙවියන්වහන්සේ විශ්වාස කර පොරොන්දු දේශයට ඇතුල්වීමට සෙනඟ උනන්දු කිරීම මෝසෙස්ට අවශ්‍ය විය.

**ඔබ කථා කරන්නට යන ජේදයට පෙර ජේදය**

- එය තිබෙන්නේ පොතේ කොතැන්හිද?
- මෙයට පෙර ජේදයේ ප්‍රධාන කරුණ වන්නේ කුමක්ද?

උදාහරණයකට, ඔබ ද්විතිය නීති සංග්‍රහයේ 2:1-3:11 කොටසෙන් දේශනා කරන්නේ නම්, 1:34-45 කොටසෙහි සිදුවූයේ කුමක්ද යන්න ඔබ දැනගත යුතුය. එවිට සෙනඟ කාදෙස්-බර්නේය වලදී ආපසු හැරුණේ ඇයිදැයි යන්න ඔබ අවබෝධ කරගනු ඇත (2:1).

## 3. කියවන්න

බයිබල් ජේදය **තුන්වරක්** කියවන්න. සෙමින් හා ප්‍රවේසමෙන් කියවන්න. ශබ්දනගා කියවීම වඩාත් හොඳය. ඔබ සතුව වෙනත් පරිවර්තනයක් තිබේ නම් එයද කියවන්න. තුන්වන වර එය ඔබගේම අත්දැකීමක් ලෙස කියවන්න. ඔබ එතැන සිටියේ යැයි කල්පනා කරන්න. ඔබ කුමක් දකිනු, අසනු, ආඝ්‍රාණය කරනු හා ඔබට කුමක් හැඟෙනු ඇතිද?

## 4. අවබෝධ කරගන්න

**ජේදය අවබෝධ කරගැනීමට කටයුතු කරන්න.** ජේදයක් හොඳින් ඉගැන්වීමට එය පවසන්නේ කුමක්දැයි ඔබ හොඳින් අවබෝධ කරගත යුතුය.

ගුවන්යානයේ පින්තූරය දෙස ප්‍රවේසමෙන් බලන්න. සිදුවන දෙයින් ඔබට ඉගෙනගත හැක්කේ කුමක්ද?



ඒ ආකාරයෙන්ම ජේදය ඇත්තෙන්ම පවසන දෙය දැකීමට ඔබ සැලකිල්ලෙන් යුතුව කාලය යෙදවිය යුතුය.

දැන් නැවත වරක් පින්තූරය දෙස බලන්න. පින්තූරය ඔබට නොපවසන්නේ කුමක්ද? උදාහරණයකට, රෝගී පුද්ගලයා වේදනා විඳින්නේ කුමකින්දැයි ඔබ නොදන්නේය.

එලෙසම ජේදය නොපවසන දේ පිළිබඳව උපකල්පනයන් නොකරන්න.

පදයෙන් පදය විමසන්න. එක් එක් පදය කියවා සිදුවන්නේ කුමක්දැයි ඔබගේම වචනයෙන් පවසන්න. ජේදය කුමක් පිළිබඳව ද යන්න දැනගැනීමට මෙය ඔබට උපකාර කරන්නේය.

ඇසීමට ප්‍රශ්න කිහිපයක් මෙන්න:

**කවුද?** *මේ ජේදයේ සිටින අය කවරහු ද?*

- සෙනඟ එක් එක්කෙනා පිළිබඳව ඔබ ඉගෙන ගත්තේ කුමක්ද?
- ඔවුන් සිටි ස්ථානය ගැන ඔබ ඉගෙන ගත්තේ කුමක්ද?
- මෙම ජේදය දෙවියන්වහන්සේ පිළිබඳව පවසන්නේ කුමක්ද?

**කුමක්ද?** *එය කුමක් ගැන ද?*

- නැවත නැවත සඳහන්වූ වචන හෝ අදහස් තිබේද?
- ඔබට නොතේරෙන දේවල් එහි තිබේද?
- එසේ තිබේනම් යාච්ඤා කර පද නැවතත් කියවන්න. සම්පූර්ණ පරිච්ජේදයම කියවා එය පැහැදිලි වන්නේදැයි බලන්න. ඔබට උපකාරීවන සමහර සටහන් මෙම පොතේ හෝ ඔබගේ බයිබලයේ තිබෙනු ඇත.

**ඇයි?** *එය පැවසුවේ ඇයි?*

- අසන්නා කුමක් කරනවා දකින්නට රචකයාට අවශ්‍ය ද? උදාහරණයකට, ද්විතිය නීති සංග්‍රහයේදී ඉශ්‍රායෙල් සෙනඟ කුමක් කරනවා දකින්නට මෝසෙස්ට අවශ්‍ය වූයේද?
- දෙවියන්වහන්සේගේ සෙනඟට එය කුමන වෙනසක් ඇති කරයිද? ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේගේ ආඥාවන්ට කීකරුවූ බව අපි ද්විතිය නීති සංග්‍රහය අවසානයේ දකිමු. ඔවුහු දෙවියන්වහන්සේ විශ්වාසකොට යෝෂුවා පසුපස පොරොන්දු දේශයට ගියෝය.

## 5. ප්‍රධාන කරුණ සොයාගන්න

**ප්‍රධාන කරුණ** සොයාගන්න. ප්‍රධාන කරුණ දෙවියන්වහන්සේ එක් එක් ජේදයේ පවසන වැදගත්ම දෙයයි. ඔබ මෙය ජේදය **තුළ** සොයාගැනීම වැදගත්ය.

සමහර දේශකයෝ පද අධ්‍යයනය ආරම්භ කිරීමට පෙරාතුවම තමන්ට පැවසීමට අවශ්‍ය වැදගත් දෙය කුමක්දැයි තීරණය කරති. මුදල් දීම පිළිබඳව දේශකයා බොහෝ දේ පැවසූ දේශනාවක් මම අසා ඇත්තෙමි. ඔහු දේශනා කළ ජේදය දීම හෝ මුදල් ගැන කොහෙත්ම සඳහන් කළේ නැත. ඔහුට **ප්‍රධාන කරුණ** මඟහැරුණේය.

ගුවන්යානයේ පින්තූරය දෙස යළිත් බලන්න.



ඔබට මේ පින්තූරය පිළිබඳව පැවසිය හැකි බොහෝ දේ ඇත. උදාහරණයකට,

- ගුවන්යානය කුඩාය.
- ගුවන්යානයට රෝද තුනක් සහ කවුළු කිහිපයක් ඇත.
- පුද්ගලයන් සත්දෙනෙක් සිටිති.

කෙසේවුවද මේ කිසිවක් මෙම පින්තූරයේ ප්‍රධාන දෙය පවසන්නේ නැත. වැදගත් දෙය වන්නේ රෝගී පුද්ගලයෙකු බේරාගෙන වැඩිදුර සාත්තු කිරීම සඳහා රැගෙන යන බවය.

සමහරවිට අපගේ දේශනාවන් සහ දේශනා එබඳුය. එහිදී බොහෝ සත්‍ය දේවල් පැවසුව ද **ප්‍රධාන කරුණ** අතහරියි. ඇතැම්විට ජේදයක තිබෙන සියල්ලම පැවසීමට අපට අවශ්‍ය වන්නේය. අපි බොහෝ දේවල් පවසන බැවින් ඉතා වැදගත් කාරණය කුමක් ද යන්න කිසිවෙකු නොදනී.

**ඇසිය යුතු වැදගත් ප්‍රශ්නය වන්නේ: මේ පද පවසන ප්‍රධාන කරුණ, වැදගත් දෙය වන්නේ කුමක්ද?**

උදාහරණයකට, ඔබ ද්විතිය නිති සංග්‍රහයේ 1:19-33න් දේශනා කළේ නම්, දිගු ගමනක් යාමට පෙර දේශය ගැන ඔත්තු බැලීමට යමෙකු යැවීම පිළිබඳව ඔබට කථා කළ හැකිය. එහෙත් එය ජේදයේ **ප්‍රධාන කරුණ** නොවේ. ජේදය දක්වන්නේ අපට බලවත් සතුරන් සිටින විටදී පවා දෙවියන්වහන්සේගේ පොරොන්දු විශ්වාස කිරීම පිළිබඳවය.

ප්‍රධාන කරුණ සොයාගැනීමට ඔබට සහයවීම සඳහා ඔබ ලියාගත් **සටහන් සහ කිරීමට යමක්** කොටස කියවන්න. එය පවසන වැදගත් දේ පිළිබඳව කල්පනා කරන්න. නැවත නැවත සඳහන් වන තේමාවන් සහ වචන සොයන්න.

පින්තූරයේ අවධානය යොමුව තිබුණේ රෝගී පුද්ගලයා උපකාර ලැබීම සඳහා ගුවන්යානය වෙත ගෙනයාම කෙරෙහිය.

ඡේදයේ අවධානය යොමුවන්නේ කුමක් වෙතද?

ඡේදය කුමක් පිළිබඳව ද යන්න එක වාක්‍යයකින් ලියන්න.

උදාහරණයකට, ඔබ ද්විතිය නිති සංග්‍රහයේ 1:19-33න් දේශනා කරන්නේ නම්, ඔබට මෙසේ ලිවිය හැකිය: *බලවත් සතුරන්ට බියවී ඔබට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමට අසීරුව සිටින්නේ නම් දෙවියන්වහන්සේ ඔවුන්ට වඩා බලවත් බව සිහිකරගන්න.*

ඔබගේ **ප්‍රධාන කරුණ** ලියා තබා ඡේදය නැවතත් කියවන්න. වැදගත් කිසිවක් අතහැරී නොමැති බවට වගබලාගන්න.

# සැලසුම් කරන්න

ඔබ ඔබගේ කතාව සූදානම් කිරීමට පෙර, ඔබ පවසන්නට යන්නේ කුමක්දැයි සැලසුම් කිරීම අවශ්‍ය වන්නේය. ඔබ විසින් කළ යුතු කාරණා පහක් ඇතැයි අපි කල්පනා කරමු:

**ප්‍රධාන කරුණ    උප කරුණු    නිදසුන්    අදාළ කිරීම    පුනරීක්ෂණය**

දැන් ඔබට ඡේදය අවබෝධ වී ඇත. ඔබට, සටහන් කරගත් කරුණු කිහිපයක් හා ප්‍රධාන කරුණක් තිබුණ ද මෙය දේශනාවක් හෝ කතාවක් නොවේ. අප දේශනාව හෝ කතාව සැලසුම් කළ යුතුය.

**ප්‍රධාන කරුණ** ඔබගේ කඩදාසියේ ඉහලින්ම ලියන්න. හොඳ පණිවිඩයක් සැලසුම් කිරීමට මෙය ඔබට උපකාරීවනු ඇත.

බොහෝ දේශකයන් ඔවුන්ගේ පණිවිඩ සැලසුම් කරන්නේ නැත.





ඇතැම් අය උනන්දුව හීන කරවමින්, එකම කරුණ නැවත නැවත සඳහන් කරති. කතාව වටේ කැරකෙමින් යයි. එහි ප්‍රයෝජනයක් නැත. වටේ කැරකෙමින් තිබෙන කිසිවිටෙක ගොඩ නොබස්සන ගුවන්යානයක සිටින්නාක් වැනිය.




අනෙක් අයට පැවසීමට බොහෝ දේ තිබුණ ද සැලැස්මක් නැත. අනුගමනය කිරීමට දුෂ්කරය. බොහෝ ස්ථානවලට යන එහෙත් ඔබ යායුතු ස්ථානයට කිසිවිටෙක නොයන බස් රථයක සිටින්නාක් වැනිය.

ඔබගේ පණිවිඩය සැලසුම් කිරීමට හොඳම මාර්ගය උප කරුණු හෝ මාතෘකා දෙකක්, තුනක් හෝ සතරක් තබාගැනීමය. එය අනුගමනය කිරීම පහසු කරන්නේය. එය ඔබගේ ප්‍රියතම ආහාරයක් සඳහා වන වට්ටෝරුවක් අනුගමනය කරන්නාක් වැනිය. ඔබගේ බඩ පුරවන සහ ඔබ තෘප්තියට පත්කරන හොඳ ආහාර වේලක් ලැබෙන තුරු ඔබ එකින් එක එකතු කරන්නේය.



## 1. උප-කරුණු

උප-කරුණු ප්‍රධාන කරුණෙන් කොටසක් පැහැදිලි කරයි.
උප-කරුණු ඡේදයේ එක කොටසක් පැහැදිලි කරයි.
උප-කරුණු කෙටි බැවින් ඔබගේ අසන්නන්ට මතකයේ රඳවාගත හැකිය.

ඔබ ඡේදය කොටස්වලට වෙන්කරනු ඇත්තේ කෙසේදැයි කල්පනා කරන්න.

- එක් එක් උප-කරුණ සමඟ ගැළපෙන්නේ කුමන පද ද?
- සියලු පද ආවරණය වුයේද?
- ප්‍රධාන කරුණ හැකි තරම් පැහැදිලි කරනු පිණිස උප-කරුණු එකිනෙක පිළිවෙලට සිටින සේ ඔබට සැකසිය හැක්කේ කෙසේද?
- උප-කරුණු කෙටි හා මතකතබාගැනීමට පහසුද?

උදාහරණයකට, ද්විතීය නීති සංග්‍රහය 4:9-20:

ප්‍රධාන කරුණ වන්නේ: *දෙවියන්වහන්සේට භෞතික රූපාකාරයක් නැති බැවින් රූප වන්දනා නොකරන්න.*

මෙහි උප-කරුණු විය හැක්කේ:

1. හොරෙබ්හි (සීනයි කන්දේ) දී සිදුවූ දෙය සිහිපත් කරන්න (4:9-14).
2. රූප සාදා නොගන්න (15-20 පද)
3. දෙවියන්වහන්සේගේ වචනයට සවන් දෙන්න (9 පදය)

උප-කරුණු සියල්ලම

- කෙටිය
- මතකයේ තබාගැනීමට පහසුය
- ඇතැම් පදවල අර්ථය ගෙනහැර දක්වයි

## 2. නිදසුන් දෙන්න නැතිනම් කතන්දරයක් පවසන්න

ඔබ ඉදිරිපත් කරන ප්‍රධාන කරුණ තේරුම්ගැනීමට නිදසුනක් හෝ කතන්දරයක් ඔබගේ අසන්නන්ට උපකාර කරයි.

ඇතැම්විට ඡේදය තුළ නිදර්ශන තිබේ.

සමහරවිට ඔබගේම නිදසුන් සාදාගැනීමට ඔබ කල්පනා කිරීම අවශ්‍යවේ. නිදසුන අවබෝධ කරගැනීමට පහසු එකක් බවට වගබලාගන්න. උදාහරණයකට, ඔබ ද්විතීය නීති සංග්‍රහයේ 16:1-17 උගන්වන්නේ නම්, ප්‍රධාන කරුණ වන්නේ: *දෙවියන්වහන්සේගේ සෙනග දෙවියන්වහන්සේ තමන්ට කළ දේවල් සිහිකළ යුතු අතර ඒවා සැමරිය යුතුය.*

ප්‍රධාන පණිවිඩය වන්නේ “සිහිකල යුතුය” යන්නය. සිහිපත් කිරීම කොතරම් වැදගත්ද යන්න ඔබගේ නිදසුන හෝ කතන්දරය ඔබගේ අසන්නන්ට පෙන්වා දෙයි.

සිදුවූ දේවල් ඔබ සිහිපත් කරන්නේ සහ සමරන්නේ කෙසේදැයි ඔබගේ අසන්නන්ට පවසන්න. උදාහරණයකට, ඔබගේ සභාව ආරම්භ කළ දවස හෝ ඔබගේ රටට නිදහස ලැබුණු දවස.

දෘශ්‍ය ආධාරකයක් හෝ පින්තූරයක් යොදාගත හැකිය. පින්තූරයක් ඇඳීමට හෝ කෙටි නාට්‍යයක් කිරීමට ඔබට හැකිය. එය ප්‍රධාන කරුණ ඉගැන්වීමට සහය වන බවට සැමවිටම සහතික වන්න.

## 3. අදාළ කිරීම

අප දෙවියන්වහන්සේගේ වචනය උගන්වන කල දෙවියන්වහන්සේගේ වචනය අපට කථා කළ යුතු අතර එය අසන සියලුදෙනා වෙනස් කරනු ලැබිය යුතුය. එබැවින් **ඔබ** කථා කරන්නට යන සෙනඟට ජේදයේ **ප්‍රධාන කරුණ** අදාළ වන්නේ කෙසේදැයි ඔබ කල්පනා කළ යුතුය.

ඔබ කථා කරන්නට යන සෙනඟගේ විවිධත්වය පිළිබඳව කල්පනා කරන්න. ප්‍රධාන කරුණ,

- දරුවන්ට
- අලුත් ඇදහිලිවන්තයන්ට
- ඇදහිලිවතුන් නොවන්නන්ට
- සභා නායකයන්ට

කථා කරන්නේ කෙසේද?

සවන්දෙන අතර ඔබගේ අසන්නන් තුළ ඇතිවන ප්‍රශ්න පිළිබඳව කල්පනා කරන්න. උදාහරණයකට:

- හෙට දවසේ මෙය මට කුමන තේරුමක් ගෙනදෙනු ඇද්ද?
- මා මෙය මේ සභාව තුළ ක්‍රියාවට නංවන්නේ කෙසේද?
- මාගේ පවුල තුළ මා මෙයට කීකරු වන්නේ කෙසේද?
- මාගේ ග්‍රාමයේ හෝ ප්‍රජාවේ මා මේ අනුව ජීවත් වන්නේ කෙසේද?
- විශ්වාසවන්තව යේසුස්වහන්සේ අනුගමනය කිරීමට මට මෙය උපකාර වන්නේ කෙසේද?
- මා ප්‍රවේසම් විය යුතු අනතුරු මොනවාද?

සියලුම උප-කරුණුවලට පසුව හා අවසානයේ ඔබට පණිවිඩය අදාළ කළ හැකිය. ඔබ පණිවිඩය අවසානයේ පමණක් අදාළකර ගැනීම ගැන දක්වන්නේ නම් ඇතැමුන්ට එය නොඇසෙන්නට ඉඩ ඇත.

දැන් ඔබ ඔබගේම දේශනාව හෝ කතාව ලිවීමට සූදානම්ය.

## 4. පුනරීක්ෂණය

ඔබ ලියූ දෙය ඉගැන්වීමට පෙර ඔබ එය පුනරීක්ෂණය කළ යුතුය.

ඔබ සූදානම් කළ දෙය පරීක්ෂා කරන්න:

- ප්‍රධාන කරුණ පැහැදිලිද?
- ඒ ජේදය තුළ බයිබලය උගන්වන දෙය ඔබ පෙන්වන්නේද?
- ඔබ නිරවුල්ව පද පැහැදිලි කළේද?
- සෙනඟට පණිවිඩය අවබෝධ කරගැනීමට හා මතකයේ තබාගැනීමට උපකාරීවන පින්තූර පිළිබඳව සිතුවේද?
- ඔබ පවසන දෙය සෙනඟට අනුගමනය කළ හැකි ලෙස ඔබගේ කතාවේ සුමට ගලායාමක් තිබේද?
- ඔබ දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ සවන්දෙන්නන්ගේ ජීවිතයේ කුමක් වෙනස් කරන ලෙසද?

ඔබ කථා කරන්නේ ඔබ සම්පූර්ණයෙන් ලියූ දේශනාවද නැතහොත් කෙටි සටහන් භාවිත කරමින් ද යන්න තීරණය කරන්න.

ඔබගේ අසන්නන් වැඩිදෙනෙක් හොඳින් අවබෝධ කරගන්නා භාෂාව සැමවිටම භාවිත කරන්න.

# ඉගැන්වීම

උගන්වන්න කොටස තුළ පහත දැක්වෙන මාතෘකා ඔබ බොහෝ සෙයින් දකිනු ඇත.

**ආරම්භය** **උප-කරුණු 2ක් හෝ 3ක්** **යාච්ඤා කරන්න**

ඇතැම්විට මේ කොටස තුළ **නිදසුන් හෝ අදාළ කිරීම** ද තිබෙනු ඇත.

බයිබල් ජේදයක් පිළිබඳ දේශනාවක් හෝ කතාවක් ලිවීමට මෙම කොටස ඔබට උපකාර කරනු ඇත. එය සම්පූර්ණ දේශනාවක් නොවේ. ඔබ ඔබගේම කාර්යයන් කළයුතු අතර එය ඔබට අදහස් ලබාදෙයි. එම අදහස් ගෙන ඒවා හොඳම ආකාරයෙන් ඔබ භාවිතයේ යෙදිය යුතුය.

කතාව **ප්‍රධාන කරුණ** මත පදනම් වන බව සැමවිටම මතකතබාගන්න.

## 1. ආරම්භය

ඔබගේ කතාව ආරම්භ කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව කල්පනාකාරීව සිතන්න. ඔබගේ සෙනඟට ප්‍රධාන කරුණ පැවසීම හොඳය. ඔවුන් සවන්දිය යුත්තේ ඇයි ද යන්න හා ඔවුනට මෙම ජේදය උපකාරී වන්නේ කෙසේද යන්න ඔවුන්ට පවසන්න. ඔවුන්ගෙන් ප්‍රශ්නයක් අසා ඔබගේ කතාව තුළදී ඊට පිළිතුරු දෙන බව පවසන්න. ඔවුන් ඔබට සවන්දෙන පිණිස ඔබ ඔවුන්ගේ සිත් ඇදගැනීම කළ යුතුය.

නිදසුනකට, ද්විතිය නීති සංග්‍රහය 8:1-20හි ප්‍රධාන කරුණ: *දෙවියන්වහන්සේ කාන්තාරයේදී ඔබ යටහත් පහත් අය කළ බව සිහිකරන්න. පොරොන්දු දේශයේදී යටහත් පහත් වන්න.*

ආරම්භ කිරීම සඳහා ඔබට මෙම ප්‍රශ්නය ඇසිය හැකිය:

- *සෙනග දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගෙන යන්නේ නරක කාලයන්ද නැතහොත් හොඳ කාලයන්ද?*

ඔවුන්ට කතන්දරයක් පැවසීමට ඔබට හැකිය:

- *එක්තරා මනුෂ්‍යයකුගේ බිරිඳ මරණයට පත්වන අතර ඔහුට රැකියාවක් ද නැත. ඔහු කෝපයට පත්ව දෙවියන්වහන්සේට චෝදනා කරයි. ඔහු තමාගේ ඇදහිල්ල නැතිකරගනී. වෙනත් කාන්තාවක් තමාගේ ජීවිතය යහපත්ව පවතින බව කියන්නීය. ඇයට තව තවත් දේ ලැබෙන අතර පොහොසත් වන්නීය. නමුත් ඉන්පසු ඇය දෙවියන්වහන්සේ වෙතින් ඉවතට යන්නීය.*

## 2. උප-කරුණු

උප-කරුණු ශරීරයක තිබෙන අස්ථි වැනිය. ඒවා ඔබ සෘජුව සිටගෙන සිටීමට සලස්වයි. නමුත් ඔබට මස් හෝ මාංස ද තිබීම අවශ්‍ය වන්නේය. අස්ථි මත මාංස දැමීමට, එනම් පද පැහැදිලි කිරීමට ඔබට කාලය අවශ්‍ය වන්නේය. පදවල අදහස ඔබ පැහැදිලි කලයුතු වේ. ඔබ පැහැදිලි කරන පද අතර එම බයිබලයෙන්ම කියවන්නේ නම් හොඳය. ඔබගේ සෙනඟට බයිබල් තිබේ නම් ඔවුන්ට එය බලාගන්නට සලස්වන්න.

මෙම පොත ඔබට අදහස් කිහිපයක් දෙන අතර ඔබ ද ඔබගේම අදහස් එකතු කරගැනීම අවශ්‍යවනු ඇත. ඔබගේ සෙනඟට කුමක් හොඳින් ගැළපෙනු ඇද්ද, පැහැදිලිව අවබෝධ කරගැනීමට ඔවුන්ට කුමක් උපකාරවනු ඇද්ද යන්න කල්පනා කරන්න.

ඔබ පවසන්නේ බයිබලයේ තිබෙන දෙය බව ඔබගේ අසන්නන්ට දැකගත හැකි බව සහතික වන්න.

## 3. නිදසුන

"උගන්වන්න" කොටසේ නිදසුනක් තිබිය හැකිය. වෙනත් ඒවා පිළිබඳව ද ඔබට කල්පනා කළ හැකිය. උපමා කතා පවසන විට යේසුස්වහන්සේ කළේත් මේ දේමය. යේසුස්වහන්සේ නිතරම, "ස්වර්ග රාජ්‍යය ... සමානය" යි පවසා ඉන්පසුව කතන්දරයක් පැවසූ සේක. යේසුස්වහන්සේ භාවිත කළ ඇතැම් නිදසුන් වචනය තුළ මැවෙන පින්තූරයන්ය. උදාහරණයකට, උන්වහන්සේ බොරු ගුරුවරුන් "භයානක වෘකයෝ" ලෙස දක්වා කථා කරන සේක. පාවුල්තුමා කිතුනු ජීවිතය "ධාවන තරගයක යෙදීමක්" ලෙස දැක්වූයේය. ඇතැම්විට දිග කතන්දරයකට වඩා වදන් පින්තූරයක් වඩා හොඳය.

## 4. අදාළ කිරීම

ඔබගේ අසන්නන්ට ජේදය අදාළ කිරීම ඔබට අවශ්‍ය වන්නේය. මෙය හැකි තරම් පැහැදිලි කිරීම වැදගත්ය. කල්පනා කිරීමට යමක් හෝ කරන්නට යමක් ඔබගේ අසන්නන්ට දෙන්න. සෙනඟගේ වෙනස්වීම සහ වර්ධනය වීම අපට අවශ්‍ය බව මතකතබාගන්න. ඇදහිලිවතුන් නොවන්නන් වෙතද යමක් පැවසිය යුතු බව මතකයේ තබාගන්න. සැමවිටම ඔබට සවන් දෙන්නේ විවිධාකාර සෙනඟ කණ්ඩායම්ය.

- ඇදහිල්ලෙන් පූර්ණ ඇදහිලිවතුන්
- ඉදිරියට යාමට පොරබදන ඇදහිලිවතුන්
- කිතුනුවන් වීමට කැමති එහෙත් එය කරන්නේ කෙසේදැයි නොදන්නා නොඇදහිලිවතුන්
- තමන් ගැළවීම ලැබීම අවශ්‍ය යයි නොසිතන නොඇදහිලිවතුන්

සැම කෙනෙකුටම යමක් පැවසීමට උත්සාහ කරන්න. සැම කෙනෙකුම යමක් ඇසීමට අවශ්‍යය.

උදාහරණයක් ලෙස, ද්විතිය නීති සංග්‍රහය 4:21-31 උගන්වන විට:

- ඇදහිල්ලෙන් පූර්ණ ඇදහිලිවතුන්ට: *ඔබ දෙවියන්වහන්සේට අයිතිය. දෙවියන්වහන්සේ ඔබට මහත් ලැදියාවක් දක්වන බැවින් උන්වහන්සේ කෙරෙහි වෙනුවට ඔබ මුදල් කෙරෙහි ප්‍රේමකිරීම උන්වහන්සේ ප්‍රිය නොකරන සේක.*
- ඉදිරියට යාමට පොරබදන ඇදහිලිවතුන්ට: *ඔබ අසාර්ථක වූවත් දෙවියන්වහන්සේ කරුණාවන්ත බැවින් ඔබට කමා කරනු ඇත. උන්වහන්සේ ඔබට ප්‍රේම කරන සේක.*
- කිතුනුවන් වීමට කැමති එහෙත් එය කරන්නේ කෙසේදැයි නොදන්නා නොඇදහිලිවතුන්ට: *දෙවියන්වහන්සේ කරුණාවෙන් පූර්ණය. උන්වහන්සේ අසාර්ථක වූවන්ට - අතිශය අසාර්ථක වූවන්ට පවා සමාව දෙන සේක. ඔබ ඔබගේ පාපයෙන් ඉවත්ව නැවත දෙවියන්වහන්සේ වෙතට හැරෙන්නේ නම් උන්වහන්සේ ඔබට කමා කරන සේක.*
- තමන් ගැළවීම ලැබීම අවශ්‍ය යයි නොසිතන නොඇදහිලිවතුන්ට: *දෙවියන්වහන්සේ ඔබට මහත් ලැදියාවක් දක්වන දෙවි කෙනෙක්ය. උන්වහන්සේ රූප වඳින සෙනග එපාකරන අතර ඔවුන් විනිශ්චයට ලක්කරන සේක.*

පළමුව ජේදය කියෙවූ තැනැත්තා හෝ සෙනඟ මත පදනම් වන අයුරින් එය අදාළ කිරීමට වගබලාගන්න. උදාහරණයකට, ද්විතිය නීති සංග්‍රහය 5:12-15:

- සමහර අය කම්මැලිය. ඔවුන් දින 6ක් වැඩ කළ යුතු බව ව්‍යවස්ථාව පවසයි. *අප දිනපතා වෙහෙසවී වැඩ කිරීමෙන් කුමක් සිදුවන්නේද?*
- ඇතැම් අය කෑදර නිසා අධික ලෙස වෙහෙසවී වැඩ කරති. *අප විවේක ගනිමින් අපට දී ඇති ලෝකය හා ජීවිතය භුක්ති විඳිය යුතු බව දෙවියන්වහන්සේ පවසන සේක.*

## 5. අවසානය

ඔබගේ කතාව අවසන් කරන්නේ කෙසේදැයි කල්පනා කරන්න. ප්‍රධාන කරුණ පිළිබඳව ඔබගේ සවන්දෙන්නන්ට මතක් කරන්න. මතක තබාගැනීමට ඔවුන්ට උපකාර කරන්න.

ඇතැම්විට ඔබ රැස්වීම ඉදිරියට කරගෙන යාමට පෙර තමන් ඇසූ දෙය පිළිබඳව කල්පනා කිරීමට කතාව පැවැත්වීමෙන් පසුව ඔබගේ සවන්දෙන්නන්ට කාලය දීම ප්‍රයෝජනවත්ය.

## 6. යාච්ඤා කරන්න

යාච්ඤා කරන්න, යාච්ඤා කරමින් සිටින්න.

- මුලින්ම ඔබ වෙනස් කරනු පිණිස දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.
- ඔබගේ සෙනඟට කථා කරන්නට දෙවියන්වහන්සේ ඔබගේ වචන යොදාගන්නා පිණිස යාච්ඤා කරන්න.
- දෙවියන්වහන්සේගේ සත්‍යය මගින් සෙනඟ වෙනස් කරන ලෙස යාච්ඤා කරන්න.

# ඇ. ද්විතීය නීති සංග්‍රහය පොත ගැන

## අවසාන දේශනාව

ද්විතීය නීති සංග්‍රහය යනු මෝසෙස් මරණයට පත්වීමට පෙර කළ ඔහුගේ අවසාන දේශනාවයි. පොරොන්දු දේශය වූ කානාන් දේශයෙන් පිටත පිහිටි කන්දක් මත මෝසෙස් සියලු ඉශ්‍රායෙල් සෙනඟට දේශනා කරයි.

ඉශ්‍රායෙල් සෙනඟ මිසරයෙන් පිටවූ පසු අවුරුදු 40කට වැඩි කාලයක් කාන්තාරයේ සිටියෝය (නික්මයාම 14:37-41 බලන්න). ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශයට ඇතුල් නොවීමට තීරණය කළ නිසා සියලුම වැඩිහිටියන් කාන්තාරයේදී මරණයට පත්වන බව දෙවියන්වහන්සේ පවසන සේක. පසුව ඔවුන්ගේ දරුවන් දේශයට ඇතුල්වනු ඇත (ගණන් කථාව 13-14 බලන්න).

කාන්තාරය තුළ ගතකළ මුළු කාලය තුළ ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට අකීකරුවී උන්වහන්සේට එරෙහිව ගියෝය (නික්මයාම 15:22-26; 16:1-3; 17:1-7; ගණන් කථාව 11:1-3; 14:1-4; 20:2-5; 25:1-3).

## මෝසෙස්ට අවශ්‍ය වන්නේ කුමක් කිරීමටද?

මෝසෙස් මරණාසන්නව සිටියේය. යෝෂුවා ඉශ්‍රායෙල්වරුන්ගේ නායකයා වනු ඇත. යෝෂුවා ඉශ්‍රායෙල් සෙනඟ දේශයට රැගෙන යනු ඇත. එබැවින් මෝසෙස් දීර්ඝ දේශනාවක් කළේය. කාරණා සතරක් කිරීම ඔහුට අවශ්‍ය විය.

1. ඔවුන්ගේ අතීතය ඔවුන්ට සිහිපත් කරලීම.
2. දෙවියන්වහන්සේ කෙරෙහිවූ ඔවුන්ගේ ඇදහිල්ල වැඩි කරලීම.
3. උන්වහන්සේගේ පනත්වලට කීකරුවනු පිණිස ඔවුන්ට සහයවීම.
4. දේශය අත්පත්කරගැනීම සඳහා ඔවුන් ධෛර්යවත් කිරීම.

ද්විතීය නීති සංග්‍රහය යනු මේ දේශනාවයි.

මෙම දේශය පොරොන්දු දේශය ලෙස හැඳින්වූයේ අවුරුදු 600කට පෙර දෙවියන්වහන්සේ මේ දේශය ආබ්‍රහම්ට දෙන බවට පොරොන්දුවූ නිසාය (උත්පත්ති 12:1-7 බලන්න). දෙවියන්වහන්සේ ඒ පොරොන්දුවලට විශ්වාසවන්ත බව ද්විතීය නීති සංග්‍රහය පොත පැහැදිලිව දක්වයි.

## දෙවියන්වහන්සේගේ පනත්වලට සෙනඟ කීකරු විය යුත්තේ ඇයි?

ද්විතීය නීති සංග්‍රහයේ වැඩි කොටසක් පනත්වලට කීකරුවීම ගැන වුවද පොත සැමවිටම අපගේ අවධානය දෙවියන්-වහන්සේ වෙත ගෙන එයි. හේතු තුනක් නිසා ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේගේ පනත්වලට හදවතින්ම කීකරු විය යුතුය.

1. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ උදෙසා අතීතයේ කළ දේවල් නිසා.
2. දෙවියන්වහන්සේ කවුද යන්න නිසා.
3. දෙවියන්වහන්සේගේ පොරොන්දු නිසා සහ අනාගතය පිළිබඳ උන්වහන්සේගේ අනතුරු ඇඟවීම් නිසා.

## ද්විතීය නීති සංග්‍රහය අපට පවසන්නේ කුමක්ද?

ද්විතීය නීති සංග්‍රහය පොත ඉශ්‍රායෙලයේ සෙනඟට කථා කරයි. අනාගත පරම්පරාවන් කියවා තමන්ට ද දෙවියන්වහන්සේ කථා කරන බව දැනගන්නා පිණිස මෝසෙස් දේශනාව පොතක ලියුවේය.


මෙම පොතම ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන කිතුනුවන් වන අපට කථා කරයි. අප ඉශ්‍රායෙල් මෙන් ජාතියක් නොවුව ද සභාවකි. කිතුනුවන් ඇදහිල්ල මගින් ආබ්‍රහම්ගෙන් පැවතෙන්නන්ය. එබැවින් මෙම පොත අද දවසේ ප්‍රධාන වශයෙන් අදාළ වන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ වන කිතුනු සභාවටය.

එයින් අදහස් වන්නේ අපගේ විවිධ අවස්ථාවන්ට පනත් අදාළ කරගත යුත්තේ කෙසේදැයි ප්‍රවේසමෙන් කල්පනා කළ යුතු බවය. අප ඒවා කියවිය යුත්තේ යේසුස්-වහන්සේගේ හා නව ගිවිසුමේ ඉගැන්වීම තුළය (උපකාර සඳහා, පරණ ගිවිසුම් පනත් කියවීම පිළිබඳ උපග්‍රන්ථය බලන්න, 98 පිටුව).

ඉශ්‍රායෙල් සෙනඟ විශ්වාසවන්ත කීකරුකමක් සඳහා ධෛර්යවත් කිරීම මෝසෙස්ගේ ඉලක්කය විය. මෙම දේශනාවෙහි අප උදෙසාද එම ඉලක්කයම ඇත. එනම් දෙවියන්-වහන්සේ කෙරෙහි විශ්වාසවන්ත වීමට හා කීකරුවීමට අපව ධෛර්යවත් කිරීමය.

**පොතෙහි පටුන**

| | |
|---|---|
| 1:1-5 | හැඳින්වීම |
| 1:6-4:43 | ඓතිහාසික පසුබිම |
| 4:44-11:32 | පොදු ආඥා |
| 12:1-26:19 | විස්තරාත්මක පනත් |
| 27:1-28:68 | ආශිර්වාද සහ සාප |
| 29:1-30:20 | අවසානය |
| 31:1-34:12 | යෝෂුවාට බාර දී මරණයට පත්වීමට මෝසෙස් සූදානම් වෙයි. |



# ද්විතීය නීති සංග්‍රහය

## ඉගැන්වීම

### අ: ද්විතීය නීති සංග්‍රහය අධ්‍යයනය කර උගන්වන්න

# 1 දේශයට ඇතුල්වන්න

### පසුබිම
මේ පද ද්විතිය නිති සංග්‍රහය පොතට පසුබිම සපයාදෙයි. ඒවා,
- **පොත කාගෙන්ද:** මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ මිසර දේශයෙන් ඉවත්කර ගනිමින් පාළුකරය ඔස්සේ වසර 40ක් මඟපෙන්වූයේය.
- **පොත කා හටද:** ඉශ්‍රායෙලයේ සියලු සෙනඟට, බාල, මහලු, ස්ත්‍රී, පුරුෂ සෑම පුද්ගලයෙකුටම.
- **පොත කුමක් පිළිබඳවද:** මෝසෙස් විසින් පවසනු ලැබූ (1 පදය), දෙවියන්වහන්සේ විසින් ආඥා කරන ලද වචන (3 පදය).
- **දේශනාව කළේ කොහිදීද:** යොර්දාන් නදියේ එහා පැත්තේ පිහිටි පොරොන්දු දේශයෙන් පිටත වූ ස්ථානයකය.
- **වචන කථා කළේ කවදාද:** මිසරයෙන් පිටවී 40 වන අවුරුද්දේය.
- **ද්විතිය නීති සංග්‍රහය අවශ්‍ය වන්නේ ඇයි:** දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පැහැදිලි කිරීම සඳහාය (5 පදය).

### 1-8 පද කියවන්න
*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න. මෙම ඡේදය කුමක් පිළිබඳවද යන්න ඔබට දැනගැනීමට මෙය උපකාරී වේ.*

### සටහන්
- **ද්විතිය නිති සංග්‍රහය** 1:4. ගණන් කථාව 21:21-26හි සඳහන් සීහොන් සහ ඕග් පරාජය වීම.
- **ද්විතිය නිති සංග්‍රහය** 1:5. “ව්‍යවස්ථාව.” හෙබ්‍රෙව් භාෂාවෙන් ව්‍යවස්ථාව යන්නට යෙදෙන වචනයෙන් “උපදෙස්” හෝ “ජිවත්වන රටාව” යන්න අදහස් වේ.
- **ද්විතිය නීති සංග්‍රහය** 1:7. අරබා යනු පහළ යොර්දාන් නිම්නයයි. බටහිර කුඩා කඳු (ශෙපෙලා) රටේ මැද පිහිටා තිබේ. 18 වන පිටුවෙහි තිබෙන සිතියම බලන්න.

### කිරීමට යමක්
උත්පත්ති 12:1-7; 15:13-18 ආබ්‍රහම්ටත්, උත්පත්ති 26:2-5 ඊසාක්ටත්, උත්පත්ති 28:12-15 යාකෝබ්ටත් දේශය පිළිබඳව දෙවියන්වහන්සේ දුන් පොරොන්දු ගැන කියවන්න: පොරොන්දුව අතින් අත භාර දුන්නේ කෙසේද යන්න හා ද්විතිය නීති සංග්‍රහයේ සිටින ඉශ්‍රායෙල් සෙනඟට තවමත් අදාළ වන්නේ කෙසේද යන්න බලන්න.

ඇදහිල්ල සහ කීකරුකම එකට බැඳී ඇත්තේ කෙසේදැයි සිතන්න. තමන්ට දේශය දෙනු ලබන පිණිස ඉශ්‍රායෙල්වරුන් දෙවියන්වහන්සේගේ පොරොන්දුව විශ්වාස කළ යුතු ය. එයින් අදහස් වන්නේ තම සතුරන්ගෙන් දේශය ගැනීම සඳහා ඔවුන් ආඥාවට කීකරු විය යුතුමය. එබැවින් කීකරුවීම සඳහා උපකාර කිරීමට අප දෙවියන්වහන්සේගේ සෙනඟට දේශනා කරන විට අප දෙවියන්වහන්සේ තුළ ඔවුන්ගේ ඇදහිල්ල වැඩි කළ යුතුය. අපි ඇදහිල්ල වැදගත් බව පෙන්වා නොදෙ-න්නේ නම් අප ක්‍රිස්තියානි ධර්මය පනත් සහිත ආගමක් කරන්නෙමු.

මක්නිසාද සැබෑ කිතුනුවන්ගේ “පොරොන්දු දේශය” ස්වර්ගිකය (උදා: 1 පේත්‍රුස් 1:4).

- *අප උදෙසා ඇදහිල්ල සහ කීකරුකම එක්ව ක්‍රියාකරන්නේ කෙසේද? (නිදසුනක් සඳහා, යාකොබ් 2:14-26)*

### ප්‍රධාන කරුණ
**තමන්වහන්සේ පොරොන්දුවූ දේශයට ඇතුල්වීමට දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟට අණකරන සේක.**

## → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 1:1-8

⦾ **ආරම්භය**

- වැඩියෙන් දෙවියන්වහන්සේට කීකරුවීමට ඔබ කිතුනුවන් ධෛර්යවත් කරන්නේ කෙසේද?

දෙවියන්වහන්සේ කෙරෙහි සහ විශේෂයෙන් දෙවියන්වහන්සේගේ පොරොන්දු කෙරෙහි අවධානය තැබීම මගින් මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ ධෛර්යවත් කරයි. ඉශ්‍රායෙල් සෙනඟ නිතර නිතර අසාර්ථක වූහ. කිතුනු දිරිගැන්වීම මිනිසුන් අනුගමනය කිරීමට නොව දෙවියන්වහන්සේ අනුගමනය කිරීම සඳහා වියයුතුය.

### පොත පිළිබඳ හැඳින්වීම

⦾ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1:1-5***

*පොතෙහි පසුබිම ඔබගේ අසන්නන්ට පවසන්න. කවුද, කාටද, කුමක්ද, කොහිද සහ කවදාද යනාදි මූලික දේවල් 1-5 දක්වා පද මගින් පැහැදිලි කරන්න. ඉන්පසුව කුමක් නිසාද යන්න කෙරෙහි අවධානය යොමුකරන්න.*

මෝසෙස් මේ දේශනාව කළේ ඇයි? දෙවියන්වහන්සේගේ පොරොන්දු විශ්වාස කිරීමට සහ දෙවියන්වහන්සේගේ ව්‍යව-ස්ථාවට කීකරුව සිටීමට ඉශ්‍රායෙල් සෙනඟ ධෛර්යවත් කිරීම පිණිසය.

### ප්‍රධාන කාර්යය

⦾ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1:6-8***

පොරොන්දු දේශයට ඇතුල්වන ලෙස දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට අණකරන සේක. දේශයේ තිබෙන දේ මොනවාද යන්න 7 වන පදය අපට පවසයි. ආබ්‍රහම්ට, ඊසාක්ට සහ යාකෝබ්ට එම දේශය දීමට පොරොන්දු වූ බව 8 වන පදය අපට පවසයි. එම පොරොන්දුව මෝසෙස් කාලයට අවුරුදු 600කට පෙර දෙන ලද්දකි. එනමුත් එම පොරොන්දුව මෝසෙස්ගේ කාලයේද වලංගුව පවතී.

තමන්ට දේශය දෙන බවට වන දෙවියන්වහන්සේගේ පොරොන්දුව විශ්වාස කර උන්වහන්සේට කීකරු වුවහොත් පමණක් ඉශ්‍රායෙල්වරුන් දේශයට ඇතුල්-වනවා ඇත.

⦾ **අදාළ කිරීම**: පොළොවෙහි දේශයක් දෙන බවට දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට පොරොන්දුවූ සේක. එය දෙවියන්වහන්සේ සැබෑ කිතුනුවන්ට පොරොන්දුවූ ස්වර්ගීය දේශයේ ආදර්ශයකි. භූමික දේශය කිතුනුවන්ට ඒ ආකාරයෙන්ම වැදගත් නොවේ. කිතුනුවෝ ස්වර්ගීය දේශයක් කරා ගමන් කරමින් සිටිති. දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ට ස්වර්ගීය දේශයක් දෙන බවට වන උන්වහන්සේගේ පොරොන්දුව අපි විශ්වාස කරන්නෙමුද? දැන් දෙවියන්-වහන්සේගේ ආඥාවන්ට කීකරුවීමට මේ පොරොන්දුව ඔබට සහ මට උපකාර වන්නේ කෙසේද?

⦾ **නිදසුන**: ඔබ ඔබගේ දරුවාට ලබන වසරේ විශේෂ තෑග්ගක් දෙන බවට පොරොන්දු වූයේ යැයි සිතන්න. එහෙත් ඔබගේ දරුවා නොනවත්වාම රසකැවිලි ඉල්ලමින් සිටියි. ලබන වසරේ වඩා විශාල තෑග්ගක් සඳහා ඔහු හෝ ඇය බලා සිටිය යුතු බව ඔබ දරුවාට පවසයි. තෑග්ග කොතරම් හොඳවනු ඇතිදැයි ඔබ ඔවුන්ට මතක් කරයි. අපි දැන් කුඩා දේවල් ඉල්ලා හඬන දරුවන් මෙන් නොවෙමු. අපි ස්වර්ගයේ මෙයට වඩා අගනා සම්පත් අපේක්ෂාවෙන් යහපත්ව ඉවසිලිවන්තව බලාසිටිමු.

එනිසා, අපට බොහෝ මුදල් ලැබීමේ පරීක්ෂාව පැමිණිවිට ස්වර්ගයේ තිබෙන බොහෝ අගනා සම්පත් පිළිබඳව අප කල්පනා කළ යුතුය. විනෝදය සඳහා ජීවත්වීමේ පරීක්ෂාව පැමිණෙන විට ස්වර්ගයේ තිබෙන්නට යන මහත් ප්‍රීතිය පිළිබඳව අප කල්පනා කළ යුතුය.

⦾ **යාච්ඤා කරන්න**: *පොළොවේදී දෙවියන්-වහන්සේට කීකරුවීමට ඔබට ශක්තිය ලැබෙනු පිණිස ස්වර්ගය පිළිබඳ පොරොන්දුව ඔබගේ කල්පනාවෙහි තබාගැනීමට උන්වහන්සේගේ උපකාරය අයදින්න.*

# 2 බොහෝ ඉශ්‍රායෙල්වරුන්

### « පසුබිම

දේශයට ඇතුල්වන්නට දෙවියන්වහන්සේ කල ආඥාව මෝසෙස් සෙනඟට සිහිපත් කරයි. මුලින්ම, උත්පත්ති 12:1-7දී දෙවියන්වහන්සේ දේශය පිළිබඳ පොරොන්දුව ආබ්‍රහම්ට දුන්සේක. ඒ කාලයේ සිටියේ ආබ්‍රහම් සහ ඔහුගේ බිරිඳ පමණි. දැන් ආබ්‍රහම්ගෙන් පැවත එන ඉශ්‍රායෙල්වරුන් බොහෝ දෙනෙක් සිටිති.

ඉශ්‍රායෙල්වරුන් බොහෝදෙනෙක් සිටීමෙන් අදහස් වන්නේ දෙවියන්වහන්සේගේ විශ්වාසවන්ත බවය. ඉශ්‍රායෙල්වරුන් බොහෝ දෙනෙක් සිටීමෙහි අදහස සෙනඟ විනිශ්චය කිරීමට මෝසෙස්ට උදව්කරුවන් අවශ්‍ය බවය.

### 9-18 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 1:10-11.** "අහසේ තාරකා" උත්පත්ති 15:5හි ආබ්‍රහම්ට දුන් පොරොන්දුව අදාළකර දක්වයි. 11 වන පදයේ තිබෙන "උන්වහන්සේ පොරොන්දු වූ ලෙස" යන සිහිකැඳවීම සිතට ගන්න.
- **ද්විතිය නිති සංග්‍රහය 1:12-18.** මෙහි පසුබිම සඳහා නික්මයාම 18:13-27 කියවන්න. බොහෝ සෙනඟ දෙන බවට වූ තමන්වහන්සේගේ පොරොන්දුව දෙවියන්වහන්සේ ඉටුකළ නිසා තමා විසින්ම කළයුතු බොහෝ වැඩ මෝසෙස්ට තිබිණි.
- **ද්විතිය නිති සංග්‍රහය 1:13, 16-17.** දෙවියන්වහන්සේගේ නායකයන් සැම කෙනෙකුටම එකසේ සැලකිය යුතුය. "පක්ෂග්‍රාහිත්වය" යනු අනෙක් අයට වඩා වැඩි වරප්‍රසාද වෙනත් අයට දීමෙන් සෙනඟට වෙනස් ලෙස සැලකීමය.
- **ද්විතිය නිති සංග්‍රහය 1:16.** "විදේශිකයා." (අන් දේශිකයා) මෙයින් අදහස් වන්නේ වෙනත් රටකින් පැමිණි එහෙත් ඉශ්‍රායෙලයේ ස්ථිර පදිංචිය ලැබීමට කැමති තැනැත්තාය.

### ⊙ කිරීමට යමක්

උත්පත්ති 15:1-6, 18-21 කියවන්න.

- *මෙහි තිබෙන පොරොන්දු දෙක මොනවාද?*

ඉශ්‍රායෙල් සෙනඟ දැන් අහසේ තාරකා මෙන් ගණන් කළ නොහැකි තරමට වැඩිවී සිටින බව ද්විතිය නිති සංග්‍රහය 1:10 පවසයි.

- *එම උපුටා දැක්වීම සඳහන් වන්නේ කොතැනද?*

උත්පත්ති 15හි දෙවියන්වහන්සේගේ පොරොන්දුව ගැන ආබ්‍රහම් දෙගිඩියාවෙන් සිටි බැවින් දෙවියන්වහන්සේ ඔහුට සහතික වූ සේක. ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු ගැන සැක කිරීම මෝසෙස්ට අවශ්‍ය නොවිණි. දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට ඔහුගෙන් පැවතෙන්නන් බොහෝ වන බවට වූ පොරොන්දුව ඉටුකළ සේක. ඉන් අදහස් වන්නේ දේශය පිළිබඳව දුන් පොරොන්දුව ද දෙවියන්වහන්සේ ඉටුකරන බව සෙනඟට විශ්වාස කළ හැකි බවය.

ඉශ්‍රායෙල්වරුන් බොහෝදෙනෙකු සිටින නිසා සෙනඟ විනිශ්චය කිරීම සඳහා මෝසෙස්ට උදව්කරුවන් අවශ්‍යය.

- *ඔවුන් කුමන ආකාරයේ පිරිසක් වනු ඇතිද? (13 පදය, 16-17)*

ද්විතිය නිති සංග්‍රහය 10:17-18 කියවන්න. නායකයන්ට ද දෙවියන්වහන්සේට තිබූ එම ආකල්පයම තිබිය යුතුය. නායකයන් සෙනඟට බිය නොවිය යුතු අතර දෙවියන්වහන්සේගේ ඇස් ඉදිරියේ නිවැරදි දෙය කළ යුතුය.

### ⊕ ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේ විශ්වාස කරන්න. උන්වහන්සේ ස්වකිය පොරොන්දු ඉටුකරන සේක.**

# ➔ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 1:9-18

## ⊳ ආරම්භය

පුද්ගලයන් පොරොන්දු දී ඒවා ඉටුකළ පසු ඔවුන් තවත් පොරොන්දුවක් වූ විට ඔබ ඔවුන් විශ්වාස කරන්නේය.

- ඔබට එවැන්නක් සිදුවූයේ කවදාද?

## පොරොන්දු ඉටුවන්නේ කොටස් වශයෙනි.

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1:10***

උත්පත්ති 12 හි ආබ්‍රහම්ට බොහෝ පැවතෙන්නන් සහ දේශය දෙන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක. පසුව ආබ්‍රහම් ඒ පොරොන්දු ගැන දෙගිඩියාවෙන් සිටි බැවින් උත්පත්ති 15 හි දෙවියන්වහන්සේ ඔහුට එය නැවත සිහිපත් කළ සේක. ආබ්‍රහම්ගෙන් පැවතෙන්නන් අහසේ තාරකා මෙන් බොහෝ වන්නේ යැයි දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක. ආබ්‍රහම් සැකයේ සිට ඇදහිල්ලට වෙනස් වූයේය.

ඉශ්‍රායෙල් සෙනඟ දේශය පිළිබඳ පොරොන්දුව සැක කළෝය. ඒ හේතුව නිසා දේශයට ඇතුල්වීමට ඔව්හු අසමත් වූහ. දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට මතක්කළ අයුරින්ම දැන් මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට මතක් කරන්නේය. දැනටමත් ඉශ්‍රායෙල් සෙනඟ අහසේ තරු මෙන් බෝවී සිටිති. එබැවින් දේශය ඔවුන්ට දෙන බවට වූ පොරොන්දුව දෙවියන්වහන්සේ ඉටුකරනු ඇති බවට ඔවුන්ට නිසැක විය හැකිය.

- ඔබට දෙවියන්වහන්සේ විශ්වාස කළ හැකි බව ඔබට හැඟෙන්නේද? දෙවියන්වහන්සේ ඔබට දුන් පොරොන්දුවලට උන්වහන්සේගේ විශ්වාසවන්තභාවය ඔබට පෙන්වූයේ කෙසේද?

## මෝසෙස් නායකයන් පත්කිරීම

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1:12-18***

ඉශ්‍රායෙල්වරුන්ගේ සංඛ්‍යාව කොතරම් විශාලවීද යත් තමාට උපකාර කිරීමට නායකයන් තෝරාගැනීමට මෝසෙස්ට සිදුවිය. නායකයන් ප්‍රඥාවන්ත විය යුතු අතර දෙවියන්වහන්සේගේ සෙනඟ විසින් ගරු කරනු ලැබිය යුතුය. සෑම කෙනෙකුටම ඔවුන් එකම අයුරින් සැලකිය යුතුය.

එබැවින් සභා නායකයන් ලෙස පත්කරනු ලබන්නේ සාධාරණ සහ යුක්තිගරුක පුද්ගලයන් බවට අප සහතික විය යුතුය.

**නිදසුන**: කනගාටුවට කරුණ නම් බොහෝ විට සභාව අයුක්ති සහගත හා අසාධාරණ ලෙස ක්‍රියාකිරීමය. සමහර රටවල සභාවක නායකයෙකු පත්කරනු ලබන්නේ ඡන්දය දෙන අයට අල්ලස් දීම මගින් පමණී. දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ මෙය නොවේ.

**අදාළ කිරීම**: සියල්ලන්ටම එක හා සමාන ලෙස අප සලකන බවට වග බලාගන්නේ කෙසේද? ඥාතීන් හා ධනවත් පිරිස තමන්ට පළමුතැන අපේක්ෂා කරන විට මෙය අසීරු කරුණකි. තමන්ට රිසි ආකාරයට කටයුතු සිදු නොවන විට ඔවුහු කෝපයට පත්වෙති. නායකයන් වීමේ අරමුණ ඇතිව ඇතැම් අය සභාවට මුදල් දෙන්නේද? ප්‍රඥාවන්ත, අවබෝධයෙන් යුත්, සාධාරණ හා යුක්තිගරුක නායකයන් අපට තෝරා පත්කර ගත හැක්කේ කෙසේද?

සෙනඟට භය නොවන ලෙස 17 වන පදය පවසයි. ඇතැම්විට අනෙක් මිනිසුන් කුමක් සිතනු ඇතිද කුමක් කරනු ඇතිද සිතා අපි භය වෙමු. දෙවියන්වහන්සේගේ ඇස් ඉදිරියේ නිවැරදි වූ තීරණ අප ගතයුතුමය.

**යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේගේ පොරොන්දු කෙරෙහි විශ්වාසය තැබීමට හැකිවනු පිණිස උන්වහන්සේගෙන් උපකාර ඉල්ලන්න. අපගේ නායකත්වයේදී සාධාරණ හා යුක්තිගරුක වීමටත් නිවැරදි නායකයන් තෝරාගැනීමටත් අපට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

# 3 දෙමව්පියන්ගෙන් ඉගෙනගන්න

### පසුබිම

මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට දේශනා කරමින් සිටියි. ඔව්හු පොරොන්දු දේශය ආසන්නයටම පැමිණ සිටිති. ඔවුන්ගේ සතුරන්ගෙන් එම දේශය ලබාගැනීමට ඔවුන් ධෛර්යවත් කිරීම මෝසෙස්ට අවශ්‍ය විය. ඔවුන්ගේ දෙමව්පියන් දේශයට ඇතුල් නොවූ බව ඔහු ඔවුන්ට සිහිපත් කරයි. ඔවුහු දෙවියන්වහන්සේට අකීකරු වූවෝය (ගණන් කථාව 13-14). ඔවුන්ගේ මවුවරු සහ පියවරු පාළුකරයේ මිය ගියෝය. ඉශ්‍රායෙල්වරුන් එම වරදම නැවත නොකරන පිණිස මෝසෙස් දේශනා කළේය.

### 19-33 පද කියවන්න

*එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්

- **ද්විතීය නීති සංග්‍රහය 1:19.** කාදෙෂ් බර්නේයාව පොරොන්දු දේශයේ දකුණු පැත්තේ මායිම් නගරය විය. දෙමව්පියන් අකීකරුවී දේශයට ඇතුල් නොවූ ස්ථානය මෙයයි. 18 වන පිටුවේ තිබෙන සිතියම බලන්න.
- **ද්විතීය නීති සංග්‍රහය 1:21, 25, 30.** පොරොන්දු දේශය "දී ඇති" බවත් ඉශ්‍රායෙල් වෙනුවෙන් දෙවියන්වහන්සේ සටන් කරන බවත් අවධානයට ලක්කරන්න. "අධෛර්ය නොවී" (21 පදය) යනු නොසැලෙමින් යන්නයි.
- **ද්විතීය නීති සංග්‍රහය 1:25.** ඔත්තුකරුවන් පැවසූ සේ ශුභවාදීය. දේශය යහපත් එකක් බව ඔවුහු පිළිගත්හ. "සාරවත්" යන්නෙන් අදහස් වන්නේ එහි පලතුරු සහ ගස්වැල් හොඳින් වැඩෙන බවය. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට එම දේශය දෙන බව ඔවුහු පිළිගන්න.
- **ද්විතීය නීති සංග්‍රහය 1:28.** දෙමව්පියෝ කාරණා දෙකක් ගැන දේශයේ සිටි සතුරන්ට බය වූවෝය. ඔව්හු ශක්තිමත් පුද්ගලයන් වූ අතර ශක්තිමත් පවුරුවලින් ආරක්ෂා වූ නගර ඔවුන්ට තිබිණි. ඉශ්‍රායෙල් සෙනඟ බියට පත් කළ අනාක්වරු ඉතා උස සෙනඟක් (යෝධයින්) විය.

### කිරීමට යමක්

ඔවුන්ගේ දෙමව්පියන්ගේ - පියවරුන්ගේ සහ මවුවරුන්ගේ - අකීකරුකම පිළිබඳව කල්පනා කරන්න. ඔවුන්ගේ පාපය 1:27-28හි දැකිය හැකිය. ඔවුන්ගේ පාපය ආකාර දෙකකින් පැහැදිලි කර ඇත.

1. ඔවුහු දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගසා උන්වහන්සේට අකීකරු වූවෝය (26 පදය).
2. ඔවුන් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබුවේ නැත (32 පදය).

ඔවුන්ගේ පාපය ඇදහිල්ල නොමැතිකමය.

- *දෙවියන්වහන්සේට අකීකරුවීම සහ උන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකිරීම එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේද?*

සෙනඟ සතුරාට බය වී සිටියෝය.

- *බය ඉවත් කරගැනීමට සෙනඟට උපකාරවීමට මෝසෙස් උත්සාහ කළේ කෙසේද?*

29-31 පදවල මෝසෙස් පවසන්නේ කුමක්දැයි බලන්න. එම අදහසම 21 වන පදයේද තිබේ.

- *ඔබගේ සහ සාමාජිකයන්ට එම ධෛර්යවත් කිරීමම අවශ්‍ය වන තත්වයන් පිළිබඳව කල්පනා කරන්න.*

### ප්‍රධාන කරුණ

**ශක්තිමත් සතුරන් සිටින විට පවා අප දෙවියන්වහන්සේගේ පොරොන්දු විශ්වාස කළ යුතුය. දෙවියන්වහන්සේ ඊට වඩා බොහෝ ශක්තිමත්ය.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 1:19-33

## ⊙ ආරම්භය

ඉශ්‍රායෙල්වරුන්ගේ දෙමව්පියෝ පොරොන්දු දේශය ආසන්නයට පැමිණි කල ඔවුහු අකීකරු වූවෝය. සෙනඟ එම වරදම දැන් කිරීම මෝසෙස්ට අවශ්‍ය නොවිණි. දේශයට ඇතුල්වීමට හා එය අත්පත් කරගැනීමට ඉශ්‍රායෙල්වරුන් කෙලෙස ධෛර්යවත් වනු ඇතිද? තමන් තම දෙමව්පියන්ට වඩා හොඳ යැයි ඔවුන් නොසිතිය යුතුය. ඔවුන් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම අවශ්‍යය.

## දෙමව්පියන්ගේ පාපය

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1:27-28***

ඔවුන්ගේ දෙමව්පියන් අකීකරු වූයේ ඔවුන් සතුරන්ට බය වූ නිසාය. ඔවුහු දෙවියන්වහන්සේ විශ්වාස නොකළෝය. ඔවුන්ගේ දෙමව්පියන් පැවසුවේ මේවාය:

- "දෙවියන්වහන්සේ අපට ද්වේෂ කරන සේක." (27 පදය)
- "සතුරන් බොහෝ ශක්තිමත්ය." (28 පදය)
- "සතුරන් හොඳින් ආරක්ෂා විධි විධාන යොදා ඇත." (28 පදය)

පළමුවන කරුණ සත්‍ය නොවේ. දෙවියන්වහන්සේ අපට පොරොන්දු වූ සහ අපට කළ දේ අමතක කලහොත් දෙවියන්වහන්සේ අපට ද්වේශ කරන්නේ යැයි බව අපට සිතිය හැකිය. දෙවියන්වහන්සේ අපට ප්‍රේමකරන බව අපට අමතක වේ.

දෙවන සහ තුන්වන කරුණු සැබෑය. සතුරා බලවත්ය. එහෙත් දෙවියන්වහන්සේ ඔවුන්ට වඩා අතිශයින් බලවත් බව ඉශ්‍රායෙල් සෙනඟට අමතක විය.

ඉශ්‍රායෙල්වරුන්ගේ දෙමව්පියෝ පව් කළෝය. එම පාපය ආකාර දෙකකින් පැහැදිලි කෙරේ:

1. ඔවුහු දෙවියන්වහන්සේට එරෙහිව කැරලිගැසුවෝය (26 පදය).
2. ඔවුන්ට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසයක් තිබුණේ නැත (32 පදය).

- ඔබ බයට පත් කරන්නේ කුමන සතුරන්ද?

ඇතැම් විට ඒ රජයන්, ඇදහිලිවන්තයන් නොවන පවුලේ සාමාජිකයන්, රැකියා ස්ථානයේ ප්‍රධානියා හෝ කට්ටඩියෙක් විය හැකිද? දෙවියන්වහන්සේගේ බලය සහ විශ්වාසවන්තකම ඔබ අමතක කරන්නේද?

## මෙය නැවත සිදුවීමට ඉඩ නොදෙන්න

⊙ ***කියවන්න: ද්විතීය නීති සංග්‍රහය 1:30-31***

ඔබ ඔබගේ දෙමව්පියන්ට වඩා හොඳ යැයි නොසිතන්න. දෙවියන්වහන්සේ ගැන සිතන ලෙසට මෝසෙස් ඉශ්‍රායෙල්වරුන් ධෛර්යවත් කරයි:

- දැන් දෙවියන්වහන්සේ ඔබට පෙරටුව යන සේක (30 පදය)
- ඔබ උදෙසා දෙවියන්වහන්සේ සටන් කරනු ඇත (30 පදය)
- දෙවියන්වහන්සේ මේ දෙය මෙයට පෙර ද කළ සේක (30-31 පද)

සතුරා ශක්තිමත් නමුත් දෙවියන්වහන්සේ වඩා ශක්තිමත්ය. දෙවියන්වහන්සේ ස්වකීය පොරොන්දුව ඉටු කරනු පිණිස ඕනෑම සතුරෙකු පරාජය කරනු ඇත. දෙවියන්වහන්සේගේ පොරොන්දු මත සතුරන් පරදා අපට ජය ලැබිය හැකිය. ඇදහිලිවන්ත කිතුනුවන්ට දෙවියන්වහන්සේ ස්වර්ගීය දේශයක් පොරොන්දු වන සේක. කුරුසිය මත දී යේසුස්වහන්සේ සියලු සතුරන් පරාජය කළ සේක. සියලු සැබෑ කිතුනුවන් ස්වර්ගය වෙත නොවරදවාම ළඟාවන බව යේසුස්වහන්සේ සහතික කරගත් සේක.

- සාතන් හෝ මන්ත්‍රකරුවන් හෝ සතුරන් විසින් ඔබ ස්වර්ගයට යාම වලක්වනු ඇතැයි බියෙන් ඔබ සිටින්නේද?

ඔබගේ සතුරා ශක්තිමත් නමුත් දෙවියන්වහන්සේ වඩා ශක්තිමත්ය. යේසුස්වහන්සේ දැනටමත් ජයග්‍රහණය කර ඇත. දෙවියන්වහන්සේගේ සියලුම සෙනඟ ස්වර්ගීය පොරොන්දු දේශයට ඇතුල්වනු ඇත.

# **නිදසුන**: ඔබගේ සභාවේ රැස්වීම් නැවැත්විය යුතු බව ප්‍රාදේශීය බලධාරීන් පවසන්නේ යැයි සිතන්න. ඔබ බලධාරීන්ට බය වන්නේය. එනිසා ඔබ සභාව රැස්වීම නතර කරන්නේය. සතුරන්ට බය නොවන්න. දෙවියන්වහන්සේ අතිශයින් ශක්තිමත්ය.

⊙ **යාච්ඤා කරන්න**: *සතුරන්ට බය නොවනු පිණිස ඔබට උපකාර කරන ලෙස දෙවියන්වහන්සේගෙන් අයදින්න.*

# 4 දෙවියන්වහන්සේගේ විනිශ්චය

**≪ පසුබිම**

ඉශ්‍රායෙල්වරුන්ගේ දෙමව්පියන් දෙවියන්වහන්සේට අකීකරුවූ කාලය පිළිබඳව මෝසෙස් ඔවුන්ට මතක් කරයි. මෝසෙස් 26-33 පදවලදී දෙමව්පියන්ගේ පාපය විස්තර කරයි. මෝසෙස් දැන් කථාකරන්නේ දෙවියන්වහන්සේගේ විනිශ්චය පිළිබඳවය.

**34-46 පද කියවන්න**

*එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

**සටහන්**

- **ද්විතිය නිති සංග්‍රහය 1:34.** "දිවුරමින්" යන්නෙන් අදහස් වන්නේ දැඩිව පැවසූ බවය.
- **ද්විතිය නිති සංග්‍රහය 1:39.** "අයිති කරගැනීම" යනු ඔවුන් වෙතින් ගැනීමය. කුමක් හරිද වැරදි ද යන්න දරුවන් දන්නේ නැත. ඔවුන්ගේ දෙමව්පියන්ගේ පව්වලට ඔවුන්ට දඬුවම් කරන්නේ නැත. ඔවුන් පොරොන්දු දේශයට ඇතුල් වන්නේ දෙවියන්වහන්සේ ස්වකීය පොරොන්දුව ඉටුකරන නිසා පමණක්මය.
- **ද්විතිය නිති සංග්‍රහය 1:40.** "පාළුකරයට ගමන් කරන්න." ඉශ්‍රායෙල් සෙනඟ අවුරුදු 40කට ආසන්න කාලයක් පොරොන්දු දේශය වෙතින් ඉවතට ගියෝය.
- **ද්විතිය නිති සංග්‍රහය 1:41.** තමන් පව් කළ බව සෙනඟ පැවසුවත් දිගටම දෙවියන්වහන්සේට අකීකරු වූවෝය. "කඳුකරයට යෑමට පහසුය කියා සිතුවහුය" දෙවියන්වහන්සේගේ උපකාරය නැතිව සතුරා පරාජය කරන්නට තමන්ට හැකියැයි ඉශ්‍රායෙල් සෙනඟ සිතුවෝය.

**⊙ කිරීමට යමක්**

දෙවියන්වහන්සේ කිසිවිටෙකත් කෝප නොවන්නේ යැයි ඇතැම්හු සිතති. එහෙත් දෙවියන්වහන්සේ පාපය කෙරෙහි කෝපවන සේක (34 පදය). දෙවියන්වහන්සේ ශුද්ධ නිසා පාපයට ද්වේශ කරන අතර සෙනඟ පව් කරන කල අසතුටු වන සේක. දෙවියන්වහන්සේගේ කෝපය සැමවිට නිවැරදිය. ආත්මාර්ථකාමී හෝ උඩඟුකමේ හේතු නිසා අප කෝප වන කල අපගේ කෝපය බොහෝවිට පාපිෂ්ඨය.

පොරොන්දු දේශයට ඇතුල් වන්නේ කවුද? දෙවියන්වහන්සේ දෙමව්පියන්ගේ පාපය නිසා ඔවුන්ට දඬුවම් කළ සේක. ඔවුහු සියලු දෙනා පාළුකරයේදී මළෝය. කාලෙබ් සහ යෝෂුවා විශ්වාසවන්ත නිසා ඔවුන් පොරොන්දු දේශයට ඇතුල්වනු ඇත (ගණන් කථාව 14:6-10). පව් කළ නිසා මෝසෙස් පවා පොරොන්දු දේශයට ඇතුල් නොවනු ඇත (ගණන් කථාව 20:2-12). දරුවන් දේශයට ඇතුල්වනු ඇත (ද්විතිය නිති සංග්‍රහය 1:39). දෙමව්පියන් පව් කළ ද දෙවියන්වහන්සේ පොරොන්දුව ඉටුකරනු ඇත. "පියවරුන්ට", එනම් ආබ්‍රහම්ට දෙවියන්වහන්සේ දුන් පොරොන්දුව 35 වන පදයේ සඳහන් කරයි.

දෙවියන්වහන්සේගේ විනිශ්චය දෙමව්පියන්ට ඇසුන නමුත් ඔවුන් කෙසේ හෝ දේශයට ඇතුල්වීමට තීරණය කළ බව මෝසෙස් පවසයි (41-46 පද). එහෙත් ඒ වන විට ප්‍රමාද වැඩිය. එහි නොයන ලෙස දෙවියන්වහන්සේ ඔවුන්ට පැවසූ සේක (42 පදය). දෙවියන්වහන්සේ ඔවුන් සමඟ නොගිය සේක. ඔවුන් ඔවුන්ගේ සතුරන්ට පරාජය වූ අතර දේශයෙන් පන්නා දමනු ලැබුවෝය.

**⊕ ප්‍රධාන කරුණ**

**දෙවියන්වහන්සේ පාපය විනිශ්චය කළ ද පොරොන්දුව ඉටු කරන සේක.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 1:34-46

㊉ **නිදසුන**: මිනිසුන් දෙදෙනෙකු ගැන කල්පනා කරන්න. එක් අයෙකු තමාට අවශ්‍ය දෙය නොලැබුණු විට කෝප වෙයි. තවත් මිනිසෙක් තම රජය දිළිඳුන් නොසලකා හැරීම ගැන කෝප වෙයි. ඔවුන්ගේ කෝපයේ වෙනසක් තිබේද? පළමු මිනිසාගේ කෝපය ආත්මාර්ථකාමී හා වැරදිය. දෙවන මිනිසාගේ කෝපය සාධාරණ සහ යහපත්ය.

දෙවියන්වහන්සේ කෝප වන සේක. මිනිසුන් පව් කරන කල දෙවියන්වහන්සේ කෝප වන සේක. උන්වහන්සේගේ කෝපය දෙවන මිනිසාගේ කෝපය වැනිය.

## පාපයට දඬුවම

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1:35, 37***

ඉශ්‍රායෙල්වරුන්ගේ දෙමව්පියන් දෙවියන්වහන්සේ විශ්වාස කළේ හෝ කීකරු වූයේ නැත (ද්විතීය නීති සංග්‍රහය 1:26, 32). දෙවියන්වහන්සේගේ දඬුවම වූයේ ඔවුන්ට දේශයට ඇතුල්වීමට නොහැකිවීමයි. කාන්තාරයේදී ජලය ලබාගැනීම සඳහා පර්වතයට පහරදීමෙන් පව් කළ නිසා මෝසෙස්ට ද දේශයට ඇතුල්වීමට නොහැකි විය (ගණන් කථාව 20:2-12).

## දෙවියන්වහන්සේ තවදුරටත් පොරොන්දුව රකින සේක.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1:36, 38-39***

*කාලෙබ් සහ යෝෂුවා දේශයට ඇතුල් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.*

දරුවන් දේශයට ඇතුල්වනු ඇත්තේ ඇයි? ඒ ඔවුන් ඔවුන්ගේ දෙමව්පියන්ට වඩා හොඳ නිසා නොවේ. ඔවුන් ඇතුල්වනු ඇත්තේ දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට වූ පොරොන්දුව ඉටුකරන නිසාය (35 පදය).

කිතුනුවන් ස්වර්ගීය දේශයක් කරා ගමන් කරමින් සිටී. අපි එහි සිටිනු ඇත්තේ අප යහපත් නිසා නොවේ. දෙවියන්වහන්සේ තම පොරොන්දු ඉටුකරන නිසා අප එහි සිටිනු ඇත. පසුතැවිලිවී යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන සියලුදෙනා ස්වර්ගයේ සිටිනු ඇති බවට උන්වහන්සේ පොරොන්දු වන සේක. එබැවින් අපි අපගේ පාප ගැන පසුතැවෙමු. අප යේසුස්වහන්සේට ප්‍රේම කරමින් උන්වහන්සේ උදෙසා ජීවත්විය යුතුය. පව් නොකිරීමට උත්සාහ කිරීමෙන් අප උන්වහන්සේ ප්‍රසන්න කළ යුතුය.

## සෙනඟ යළිත් පව් කළෝය

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1:41-45***

දෙමව්පියන් දේශයට ඇතුල්වීමට පසුව තීරණය කළ ද දෙවියන්වහන්සේ ඔවුන් සමඟ නොවූ සේක. ඔවුන් පළමු අවස්ථාවේ කීකරු වියයුතුව තිබිණි. දෙවියන්වහන්සේ සමඟ ඔවුන්ගේ ජය නිසැකය. දෙවියන්වහන්සේ නැතිවිට ඔවුන්ට පරාජය නිසැකය.

අප ස්වර්ගයට ළඟාවීම වැළැක්වීමේ අරමුණ ඇති අපගේ සතුරා සාතන්ය. අපගේම ශක්තියෙන් අපට සාතන් පරාජය කළ නොහැකිය. අපට දෙවියන්වහන්සේ අවශ්‍යය. යේසුස්වහන්සේ දැනටමත් සාතන් පරාජය කර ඇත. එබැවින් අප යේසුස්වහන්සේගේ ජයග්‍රහණය විශ්වාස කළ යුතුය.

㊉ **නිදසුන**: තමන්වහන්සේ අනුගමනය කරන්නට දෙවියන්වහන්සේ මනුෂ්‍යයෙකු කැඳවූ සේක. එහෙත් මනුෂ්‍යයා "බැහැ" කීවේය. දෙවියන්වහන්සේ අනුගමනය කිරීම ඔහුට අවශ්‍ය නොවීය. තම ජීවිතය අවසානයේදී දෙවියන්වහන්සේ වෙතට හැරෙන්නට ඔහු සිතුවේය. එහෙත් එය ප්‍රමාද වැඩි විය. ඔහුට තවත් අවස්ථාවක් ලැබෙන්නට පෙර දෙවියන්වහන්සේ ඔහුගේ ජීවිතය අවසන් කළ සේක.

ⓘ **අදාළ කිරීම**: දෙවියන්වහන්සේට කීකරුවීම ප්‍රමාද නොකරන්න. එසේම ඔබගේම ශක්තියෙන් ස්වර්ගයට ළඟාවිය හැකි යැයි නොසිතන්න. ඔබ යේසුස්වහන්සේගේ ජයග්‍රහණය මත විශ්වාසය තැබිය යුතුය.

# 5 දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ ධෛර්යවත් කරන සේක

### පසුබිම

පොරොන්දු දේශයට ඇතුල් වී එය අත්පත්කර ගන්නා ලෙස මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ ධෛර්යවත් කරමින් සිටියි. ඉශ්‍රායෙල්ට සෙනඟ මුණගැසුණු ජාතීන් පහක් පිළිබඳව ඔහු ඔවුන්ට සිහිපත් කරයි. සටන් කිරීමෙන් තොරව ඉශ්‍රායෙල්වරු ජාතීන් තුනක් පසුකර ගියෝය. මොවුහු ඒදොම්, මෝවබ් සහ අම්මොන්වරු වූහ. ඔවුහු අනෙක් ජාතීන් දෙක වූ හෙශ්බොන් සහ බාෂාන් සමඟ සටන් කර ජයගත්තෝය.

### 2:1-3:11 පද කියවන්න

*එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්

- **ද්විතිය නීති සංග්‍රහය** 2:4. ඒදොම් සෙනඟ උත්පත්ති පොතේ දැක්වෙන යාකොබ්ගේ නිවුන් සොයුරු ඒසව්ගෙන් පැවතෙන්නන්ය.
- **ද්විතිය නීති සංග්‍රහය** 2:9, 19. මෝවබ් සහ අම්මොන් සෙනඟ උත්පත්ති පොතේ දැක්වෙන ආබ්‍රහම්ගේ ඥාති පුත්‍රයා වූ ලොත්ගෙන් පැවතෙන්නන්ය.
- **ද්විතිය නීති සංග්‍රහය** 2:10-11, 20-21. "අනාක්වරු", "රෙපායිම්වරු": පුරාණ කාලයේ සිටි ඉතා උස මනුෂ්‍යයන් පිරිසකි (යෝධයන්). ඉශ්‍රායෙල් සෙනඟ අනාක්වරුන්ට භයව සිටියහ (1:28).

### කිරීමට යමක්

ජාතීන් පහ දකින පිණිස 18 වන පිටුවේ තිබෙන සිතියම බලන්න. ඔබට ගණන් කථාව 20:14-21; 21:10-13, 21-35 ද කියවිය හැකිය. ඒදොම්, මෝවබ් සහ අම්මොන්වරුන්ට ඔවුන්ගේ දේශයන් දුන්නේ දෙවියන්වහන්සේය (ද්විතිය නීති සංග්‍රහය 2:5, 9, 19). ඉශ්‍රායෙල්වරුන් ඔවුන් සමඟ සටන් නොකළ යුත්තේ ඒ නිසාය.

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට ද ඔවුන්ගේ දේශය දෙන බවට පොරොන්දු වූ සේක. මෙයට පෙර ඉතා උස මිනිසුන් මෝවබ් සහ අම්මොන්හි සිටියෝය (2:10-11, 20-21). මෝවබ් සහ අම්මොන්ට ඔවුන්ගේ දේශය දෙන පිණිස දෙවියන්වහන්සේ උස මිනිසුන් පරාජය කළ සේක.

1:28හි ඉශ්‍රායෙල්වරුන්ගේ දෙමව්පියන් උස මිනිසුන්ට භය වූ බව සඳහන්ව ඇති බව මතක් කරන්න. යෝධයන් පරාජය කිරීමට තරම් දෙවියන්වහන්සේ ශක්තිමත් බව ඉශ්‍රායෙල් සෙනඟ විශ්වාස කිරීම මෝසෙස්ට අවශ්‍ය විය.

ඉශ්‍රායෙල්වරු හෙශ්බොන්හි රජවූ සීහොන් හා බාෂාන්හි රජවූ ඕග් පරාජය කළෝය. දෙවියන්වහන්සේ එම දේශයන් ඔවුන්ට දී නොතිබුණි. සීහොන්ට සහ ඕග්ට ශක්තිමත් නගර බොහෝමයක් තිබුණි (2:36; 3:4). 1:28හි ඉශ්‍රායෙල්වරුන්ගේ දෙමව්පියෝ ශක්තිමත් නගරවලට භය වූ බව සඳහන්ව ඇත. ශක්තිමත් නගර පරාජය කිරීමට තරම් දෙවියන්වහන්සේ ශක්තිමත් බව ඉශ්‍රායෙල් සෙනඟ විශ්වාස කිරීම මෝසෙස්ට අවශ්‍ය විය.

ඕග් රජු ද යෝධයෙක් වූයේය. ඔහුගේ ඇඳ එතරම් විශාල වූයේ ඒ නිසාය (3:11). එහෙත් ඔහු ද මරා දමනු ලැබුවේය. දෙවියන්වහන්සේ යෝධයන්ට වඩා ශක්තිමත්ය.

### ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේ අතීතයේ ක්‍රියාකර ඇති බැවින් ධෛර්යවත් වන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 2:1-3:11

**⊳ ආරම්භය**

- දෙවියන්වහන්සේ මීට පෙර ඔබ වෙනුවෙන් කළ ඇතැම් දේවල් මොනවාද?

*දෙවියන්වහන්සේ කළ දේවල් පිළිබඳ උදාහරණ දෙන්න. ඇතැම් විට උන්වහන්සේ විශේෂ ආකාරයෙන් ඔබට සපයන්නට ඇත. ඇතැම් විට ඉතා පැහැදිලිව ඔබගේ යාච්ඤාවට පිළිතුරු දෙන්නට ඇත.*

- අනාගතය සඳහා එය ඔබ ධෛර්යවත් කරන්නේද?

අතීතයේ දෙවියන්වහන්සේ කළ දේ මෝසෙස් ඉශ්‍රායෙල්ට මතක් කරයි. ඇදහිල්ලෙන් යුතුව අනාගතයට මුහුණදීමට ඔහු ඔවුන් ධෛර්යවත් කරයි.

**දෙවියන්වහන්සේ ශක්තිමත් මිනිසුන් පරාජය කළ සේක**

**⌄ කියවන්න**: *2:10-11, 20-21*

*ඒදොම්, මෝවබ් සහ අම්මොන් ජාතීන් පිළිබඳව ඔබගේ අසන්නන්ට පවසන්න. දෙවියන්වහන්සේ මේ ජාතීන්ට ඔවුන්ගේ දේශයන් දුන් බව පෙන්වා දෙන්න.*

*ඔවුන්ගේ දේශවල මෙයට පෙර යෝධයන් සිටි බව දැන් පෙන්වා දෙන්න.*

ජාතීන්ට දේශයන් දෙන පිණිස දෙවියන්වහන්සේ යෝධයන් පරාජය කළ සේක. දෙවියන්වහන්සේ යෝධයන්ට වඩා බොහෝ ශක්තිමත්ය.

- **උස සහ ශක්තිමත් මිනිසුන් පරාජය කිරීමට තවමත් දෙවියන්වහන්සේට හැකිය.**

ඉශ්‍රායෙල් සෙනඟ තමන්ගේ දේශයට ඇතුල්වන විට එහි සිටින යෝධයන් පරාජය කිරීමට දෙවියන්වහන්සේ ශක්තිමත් බව ඔවුන් විශ්වාස කරනු පිණිස මෝසෙස් අතීතය පිළිබඳව පවසයි. දෙමව්පියන් යෝධයන්ට භයවූ බැවින් (1:28) දේශයට ඇතුල් නොවූහ.

- **දෙවියන්වහන්සේ අතීතයේ කළ දේවල් කරණකොට මෝසෙස් ඔවුන්ගේ ඇදහිල්ල ධෛර්යවත් කරයි.**

**දෙවියන්වහන්සේ ශක්තිමත් නගර පරාජය කළ සේක.**

**⌄ කියවන්න**: *2:36; 3:4*

*සීහොන් සහ ඕග්ගේ ජාතීන් පිළිබඳව ඔබගේ අසන්නන්ට පවසන්න. ඉශ්‍රායෙල්වරුන් ඔවුන් මීට පෙර පරාජය කර ඇති බව පෙන්වන්න.* සටන ජයගත්තේ දෙවියන්වහන්සේගේ බලයයි. දෙවියන්වහන්සේ ශක්තිමත් නගර මෙයට පෙරත් පරාජය කළ සේක.

- **දෙවියන්වහන්සේට තවමත් ශක්තිමත් නගර පරාජය කළ හැකිය.**

ඉශ්‍රායෙල් සෙනඟ තමන්ගේ දේශයට ඇතුල් වන කල ශක්තිමත් නගර බිඳ හෙළන්නට තරම් දෙවියන්වහන්සේ ශක්තිමත් බව ඔවුන් විශ්වාස කරනු පිණිස මෝසෙස් මේවා පවසන්නේය. ඔවුන්ගේ දෙමව්පියෝ තම සතුරන්ගේ ශක්තිමත් නගරවලට භය වූ බැවින් (1:28) දේශයට ඇතුල් නොවූහ.

- **දෙවියන්වහන්සේ අතීතයේ කළ දේවල් කරණකොට මෝසෙස් ඔවුන්ගේ ඇදහිල්ල ධෛර්යවත් කරයි.**

දෙවියන්වහන්සේ අදත් එයාකාරමය. උන්වහන්සේ ශක්තිමත් බැවින් සියලු සතුරන් පරාජය කිරීමට හැකිය.

යේසුස්වහන්සේ කුරුසිය මත දී අපගේ සියලු සතුරන් පරාජය කළ සේක. යේසුස්වහන්සේ පාපය, සාතන් සහ මරණය පරාජය කළ සේක. අපට දෙවියන්වහන්සේ කෙරෙහි ශක්තිමත් ඇදහිල්ලක් තිබිය යුතු අතර අපට උපකාර පිණිස දෙවියන්වහන්සේ විශ්වාස කළ යුතුය.

**ⓘ අදාළ කිරීම**: අතීතයේ යේසුස්වහන්සේ කළ දේ සිහිකරන්න. දෙවියන්වහන්සේ දැනටමත් ඔබට උපකාර කර ඇත්තේ කෙසේදැයි කල්පනා කරන්න. උන්වහන්සේ ඔබට නැවත නැවතත් උපකාර කරනවා ඇත. සැමවිටම උන්වහන්සේ විශ්වාස කරන්න.

**⌃ යාච්ඤා කරන්න**: *සෑම දවසකම දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන පිණිස උන්වහන්සේගේ ශක්තිය ගැන මතකයේ තබාගන්නට උපකාර කරන්නැයි අයදින්න.*

# අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 3:23-29

# 6 නායකයන් පවා අසාර්ථක වේ

### පසුබිම

ද්විතිය නිති සංග්‍රහය මෝසෙස් කළ අවසාන දේශනාවයි. ඉක්මනින් ඔහු මරණයට පත්වනු ඇත. මෝසෙස් පෙර පව් කළ නිසා ඔහු පොරොන්දු දේශයට ඇතුල් නොවනු ඇත. ඒ නිසා පව් නොකරන ලෙස ඔහු ඉශ්‍රායෙල්ට අනතුරු අඟවයි.

### 23-29 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 3:23.** දේශයට ඇතුල්වීමට තමාට ඉඩහරින ලෙස තම දෙවියන්වහන්සේට දැඩිව (බැගෑපත්ව) "කන්නලව්" කල අයුරු මෝසෙස් සිහිපත් කරයි.
- **ද්විතිය නිති සංග්‍රහය 3:26.** තමා කෝපයට පත්කළ සෙනඟගේ පාපය කුමක්දැයි මෝසෙස් ගෙනහැර දක්වයි. ඉන්පසු මෝසෙස් පව් කළ බැවින් දෙවියන්වහන්සේ ඔහු සමඟ කෝපවූ සේක.
- **ද්විතිය නිති සංග්‍රහය 3:27.** "පිස්ගා" යනු මෝසෙස් මරණයට පත්වන්නට යන්නාවූ කඳුකර ප්‍රදේශයයි (ද්විතිය නිති සංග්‍රහය 34:1).
- **ද්විතිය නිති සංග්‍රහය 3:27.** පොරොන්දු දේශය දැකිමට මෝසෙස්ට දැකගත හැකිවූ නමුත් ඊට ඇතුල්වීමට නොහැකි විය. ද්විතිය නිති සංග්‍රහය 34:1-4 බලන්න.
- **ද්විතිය නිති සංග්‍රහය 3:28.** යෝෂුවා ඔත්තුකරුවන් දොළොස්දෙනාගෙන් එක් අයෙකි (1:22-23). ඔහු විශ්වාසවන්ත වූයේය (1:38). "වගකිම් පවරා" යනු යාච්ඤා කර නායකයකු පිටත්කර හැරීමය.

### කිරීමට යමක්

මෝසෙස්ගේ පාපය ගණන් කථාව 20:2-13හි සඳහන් වෙයි. මෝසෙස් සෙනඟ සමඟ කෝප වූයේය. ඒ නිසා මෝසෙස් දෙවරක් පර්වතයට ගැසුවේය. දෙවියන්වහන්සේ නොව තමා පර්වතයෙන් ජලය ගෙනෙන බව මෝසෙස් කීවේය (10 පදය). මෙය බරපතළ පාපයක් විය. මෝසෙස් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකළ අතර දෙවියන්-වහන්සේගේ ශුද්ධකම ඉශ්‍රායෙල් සෙනඟට පෙන්වූයේ නැත (12 පදය).

- *මෝසෙස්ගේ පාපයට වරදකරු කවුරුන්ද?*

සෙනඟ පිට වරද පැටවීමට මෝසෙස්ට හැකියාව තිබිණි. ඔහු කෝපයට පත් කළේ සෙනඟය. එහෙත් වරද අයත් වූයේ මෝසෙස්ටය. මෝසෙස් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකළ නිසා හා උන්වහන්සේට කීකරු නොවූ නිසා වරදකරු ඔහු විය.

දේශයට ඇතුල්වීමට නොදීමෙන් දෙවියන්-වහන්සේ මෝසෙස්ට දඬුවම් කරන සේක. ද්විතිය නිති සංග්‍රහය අවසානයේ මෝසෙස් මරණයට පත්වනු ඇත. යෝෂුවා සෙනඟ දේශය තුළට රැගෙන යනු ඇත.

- *මෝසෙස්ට දුන් දඬුවම සාධාරණද?*

මෝසෙස් දෙවියන්වහන්සේ වෙනුවෙන් බොහෝ මහත් දේවල් කළේය. මෝසෙස් දෙවියන්වහන්සේගේ මෙහෙකරුවෙකුව සිටියේය. දේශයට ඇතුල්වීමට දෙවියන්-වහන්සේ මෝසෙස්ට ඉඩ දිය යුතුයි නේද? දේශයට ඇතුල්වීමට මෝසෙස්ට බොහෝ-සෙයින් අවශ්‍ය විය. දෙවියන්වහන්සේගේ විනිශ්චය සාධාරණය. මෝසෙස්ගේ පාපය බරපතළ විය. දෙවියන්වහන්සේ සියලුම පාපයන් බරපතළ ලෙස සලකන බවට මෙය අපට අනතුරු ඇඟවීමකි.

### ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේ පත්කල නායකයන් පවා අසාර්ථක වේ.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 3:23-29

### ⊙ ආරම්භය

දෙවියන්වහන්සේ පත්කල නායකයන් සර්ව සම්පූර්ණ අය යැයි ඇතැම්විට අපි සිතමු. නායකයන් පවා අසාර්ථක වන බව දැනගැනීම කිතුනුවන්ට හොඳය. *බයිබලයේ සිටින අසාර්ථක වූ නායකයන් කිහිපදෙනෙකු පිළිබඳව ඔබගේ අසන්නන්ට පවසන්න: ආබ්‍රහම්, සම්සොන්, දාවිත්, සාලමොන්.*

මෝසෙස් පව් කළේය. *මෝසෙස්ගේ පාපය කුමක්දැයි ඔබගේ අසන්නන්ට පැහැදිලි කරන්න.* *පර්වතයෙන් ජලය ලබාදීම පිළිබඳව ඔහු දෙවියන්වහන්සේට ගෞරවය නොදුන් බැවින් ඔහුගේ පාපය බරපතළ විය.* පොරොන්දු දේශයට ඇතුල්වීමට මෝසෙස්ට ඉඩ නොලැබිණි.

### පොරොන්දු දේශයට ඇතුල්වීමට අවසර දුන් මෝසෙස් යාච්ඤා කළේය.

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 3:23-25***

දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ගැන මෝසෙස් කථාකරයි (24 පදය). දෙවියන්වහන්සේ ශ්‍රේෂ්ඨ සහ බලවත් දේවල් කළ සේක. දේශයට ඇතුල්වීමට තමාට ඉඩහරින ලෙස ඔහු දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටි අයුරු මෝසෙස් සිහිපත් කරයි (25 පදය). තමාට කරුණාව දක්වන ලෙස මෝසෙස් දෙවියන්වහන්සේගෙන් අයැදිය. කරුණාව යනු කමාවයි. දෙවියන්වහන්සේ තම පාපය ගණන් නොගෙන සිටීම මෝසෙස්ට අවශ්‍ය විය.

### දෙවියන්වහන්සේ මෝසෙස්ගේ යාච්ඤාවට පිළිතුරු දෙන සේක

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 3:26-29***

"නැත" යනුවෙන් දෙවියන්වහන්සේ පිළිතුරු දුන් සේක (26 පදය). මෝසෙස්ට පොරොන්දු දේශයට ඇතුල් විය නොහැකිය. අපගේ යාච්ඤාවලට දෙවියන්වහන්සේ සැමවිටම "ඔව්" කියන්නේ නැත. දෙවියන්වහන්සේ සැමවිටම අපට කරුණාව දක්වන්නේ නැත. දෙවියන්වහන්සේ ශුද්ධය. සෙනඟ මෝසෙස් කෝපයට පත් කළේය. එහෙත් එය ඔහුගේ පාපය ගැන නිදහසට කරුණක් නොවිණි.

දෙවියන්වහන්සේ මෝසෙස්ගේ යාච්ඤාවට තවත් පිළිතුරු දෙකක් දුන් සේක.

1. දේශය දැකීමට මෝසෙස්ට ඉඩ ලැබිණි (27 පදය). මරණයට පත්වීම සඳහා මෝසෙස් මෙම කන්දට යනු ඇත (ද්විතිය නීති සංග්‍රහය 34:1). මෝසෙස් කෙරෙහි වූ දෙවියන්වහන්සේගේ කරුණාව මෙයින් පෙන්වයි.
2. මෝසෙස්ගේ මරණයෙන් පසුව යෝෂුවා සෙනඟට මගපෙන්වනු ඇත (28 පදය). මෙයද ඉශ්‍රායෙල් හි සෙනඟ කෙරෙහි වන දෙවියන්වහන්සේගේ කරුණාවන්තකමය. දෙවියන්වහන්සේ ඔවුන්ට වෙනත් නායකයෙකු දෙනු ඇත.

### අපට කරන අනතුරු ඇඟවීම්

මෝසෙස්ගේ පාපය අපට අනතුරු අඟවන්නේය. දෙවියන්වහන්සේගේ නායකයෝ පවා අසාර්ථක වෙති. දෙවියන්වහන්සේ සැමවිටම කරුණාව දක්වනු ඇතැයි අප නොසිතිය යුතුය. අප සැමවිටම දෙවියන්වහන්සේ විශ්වාසකොට උන්වහන්සේට කීකරු විය යුතුය. අනෙක් සෙනඟ අප කෝපයට පත් කළ ද පව් කිරීමට අපට එය නිදහසට කාරණයක් නොවේ. අප තවදුරටත් කීකරුවී දෙවියන්වහන්සේ විශ්වාස කළ යුතුය.

# **නිදසුන**: එක් මිනිසෙකුගේ භාර්යාව රාත්‍රී කෑම පිසීමට ප්‍රමාද වූවාය. එය ඇගේ ස්වාමිපුරුෂයා කෝපයට පත් කළේය. එනිසා ස්වාමිපුරුෂයා භාර්යාවට පහර දුන්නේය. ඔවුන්ගේ සභාපාලකවරයා ඒ බව දැනගෙන ස්වාමිපුරුෂයාට කථා කළේය. රාත්‍රී ආහාරය සුදානම් කිරීම ප්‍රමාදකළ බැවින් එහි වරද සිය භාර්යාවගේ බව ස්වාමිපුරුෂයා පැවසිය. ඔහු වැරදි බව සභාපාලකවරයා ඔහුට පැවසිය. යමෙකු අප කෝපයට පත් කළද පව් කිරීමට එය අපට නිදහසට කාරණයක් නොවේ.

⊙ **යාච්ඤා කරන්න**: *සැමවිටම දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට හා උන්වහන්සේට කීකරුවීමට දෙවියන්වහන්සේගේ සෙනගගේ නායකයන්ට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් අයදින්න.*

## ⬇ අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 4:1-8

# 7 අන්‍යයන් තුළ විශ්වාසය ගොඩනැගීම පිණිස කීකරුවන්න

### « පසුබිම

මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට අතිතය සිහිපත් කරයි. ඒ ඔවුන් දෙවියන්වහන්සේට කීකරුවී පොරොන්දු දේශයට ඇතුල්වීම ඔහුට අවශ්‍ය වූ නිසාය. ජීවත්විය යුත්තේ කෙසේදැයි ඔවුන්ට පැවසීමට මෝසෙස් දැන් ආරම්භ කරයි. ඔහු ඔවුන්ට එක් අනතුරු ඇඟවීමක් හා එක් ධෛර්යවත් කිරීමක් දෙයි.

### 1-8 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය** 4:2. "අමතර වචනයක් එකතු නොකර, ඒවායින් කිසිවක් අඩු නොකර" නැතහොත් "කිසිවක් වෙනස් නොකර" සිටිය යුතුය. අප කිසිවිටෙකත් දෙවියන්වහන්සේගේ වච-නය වෙනස් නොකළ යුතුය.

  ඇතැම්විට දෙවියන්වහන්සේගේ වචන-යට කීකරුවීම ඉතා අසීරු වුවද, අපට පහසුවක් වනු පිණිස එය වෙනස් නොකළ යුතුය.
- **ද්විතිය නිති සංග්‍රහය** 4:7. "අපේ දෙවි සමිඳාණන්වහන්සේ... අපට ළංව සිටින" සේක. ඉශ්‍රායෙල්වරුන් කීකරුවන කල දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කරනු ඇත. දෙවියන්වහන්සේ ඔවුන්ට ළංව සිටිනු ඇත. අනෙක් ජාතින් මෙය දැක මවිතයට පත්වනු ඇත.
- **ද්විතිය නිති සංග්‍රහය** 4:8. "සාධාරණ නිති හා නියෝග." පරණ ගිවිසුම තුළ දී ඇති දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ඉතාම සාධාරණය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව අනෙක් ජාතීන්ගේ ව්‍යවස්ථා-වන්ට වඩා හොඳය. ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරුවන විට අනෙක් ජාතීන් දෙවියන්වහන්සේ වෙතට එනු ඇත.

### ⊙ කිරීමට යමක්

පෙයෝර්හිදී ඉශ්‍රායෙල් සෙනඟට සිදුවූ දේ ගණන් කථාව 25:1-9 කොටසින් කියවන්න. ඉශ්‍රායෙල් සෙනඟ ලිංගික පාප සහ රූප වන්දනාව කළෝය.

ඉශ්‍රායෙල් සෙනඟට කළ අනතුරු ඇඟවීම වූයේ ඔවුන් අන්‍යයන්ගේ නරක මාර්ග අනුගමනය නොකළ යුතුය යන්නය. ඉශ්‍රා-යෙල් සෙනඟ ධෛර්යවත් කරනු ලැබුවේ, ඔවුන් දෙවියන්වහන්සේට කීකරුවන විට අන්‍යයන් ඔවුන් අනුගමනය කර දෙවියන්-වහන්සේ වෙතට එනු ඇත යන්නයි.

ඉශ්‍රායෙල් සෙනඟගේ ආදිපියා වන ආබ්‍රහම් තුළින් ලෝකයේ ජාතීන් ආශීර්වාද ලබනු පිණිස දෙවියන්වහන්සේ ඔහු තෝරාගත් සේක (උත්පත්ති 12:3).

එය සිදුවන්නේ කෙසේදැයි ද්විතිය නිති සංග්‍රහය 4:6-8 කොටස පැහැදිලි කරයි. ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට කීකරු වන විට, අනෙක් සෙනඟ නැතහොත් ජාතීන් ප්‍රශ්න අසමින් ඉශ්‍රායෙල් සහ දෙවියන්වහන්සේ ගැන මවිතයට පත්වනු ඇත.

ඉශ්‍රායෙල් සෙනඟ ජාතියක්ව සිටියෝය. අද දෙවියන්වහන්සේගේ සෙනඟ වන්නේ සභාවයි. දෙවියන්වහන්සේගේ සෙනඟ සියලු ජාතීන් අතරේ වෙසෙති. සභාව දෙවියන්-වහන්සේට කීකරුවී සෙනඟ දෙවියන්-වහන්සේ වෙතට ආකර්ෂණය කරගත යුත්තේ කෙසේදැයි කල්පනා කරන්න.

### ⊕ ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේට කීකරුවන කල අනෙක් සෙනඟ දෙවියන්-වහන්සේ වෙතට එනු ඇත.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 4:1-8

⊙ **ආරම්භය**

- කිතුනුවන් ජීවත්වන ආකාරය අන්‍යයන් ජීවත්වන ආකාරයට වඩා වෙනස් යැයි ඔබ සිතන්නේද?

කනගාටුව නම් බොහෝවිට වෙනසක් නැතිවීමය. ඇතැම්විට දෙවියන්වහන්සේගේ සෙනඟ බොරු කියති, අසාධාරණ, කෑදර වන අතර අනෙක් වැරදි දේවල් කරති. දෙවියන්වහන්සේගේ සෙනඟ නොඇදහිලිවතුන්ගෙන් වෙනස් විය යුතුය. නොඅදහන්නන් දෙවියන්වහන්සේ වෙතට එන්නේ මේ හේතුව නිසාය.

⊕ **නිදසුන**: කිතුනුවෙකුගේ නොඇදහිලිවන්ත අසල්වැසියකු රෝගාතුරව සිටින විට කිතුනුවා ආහාර ගෙනවිත් කෑම පිස දෙමින් රෝගාතුර අසල්වැසියාට උපකාර කළේය. නොඇදහිලිවන්තයා මවිතයට පත්වූයේය. තමාට උපකාර කළ අසල්වැසියා කිතුනුවකු නිසා එතරම් කරුණාවන්තවූ බව දැනගත් කල රෝගාතුර කාන්තාවට ද කිතුනුවකු වීමට අවශ්‍ය විය.

## අනතුරු ඇඟවීමයි! අන්‍යයන් අනුගමනය නොකරන්න

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:3-4***

*ගණන් කථාව 25:1-9 හි දැක්වෙන පෙයෝර්හි කළ පාපය පිළිබඳව ඔබගේ අසන්නන්ට පවසන්න. ඉශ්‍රායෙල් සෙනග පෙයෝර්හි සිටි නොඇදහිලිවතුන්ගේ රූප වන්දනාව සහ ලිංගික පාප අනුගමනය කිරීම පැහැදිලි කරන්න. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට මරණයෙන් දඬුවම් කළ බව අසන්නන්ට සිහිපත් කරන්න.*

කිතුනුවන් අපගේ ලෝකයේ තිබෙන පාපයන් අනුගමනය නොකළ යුතුය. දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේගේ ප්‍රමිතීන් අනුව ජීවත්විය යුතුය. උදාහරණයකට රූප, ආත්ම සහ අන්දෙවිවරුන් අප නමස්කාර නොකළ යුතුය. අප, මුදල් අපගේ දෙවියන් කර නොගත යුතුය. අප සැමවිටම සත්‍යය ප්‍රකාශ කළ යුතුය. නොඇදහිලිවතුන් මෙන් ජීවත්වන විට දෙවියන්වහන්සේ කිතුනුවන් ගැන ප්‍රසන්න නොවන සේක.

## ධෛර්යවත් කිරීමයි! දෙවියන්වහන්සේට කීකරුවී වෙනස් පුද්ගලයන් වන්න

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:6-8***

පොරොන්දු දේශයේදී ඉශ්‍රායෙල්වරුන් දෙවියන්වහන්සේට කීකරුවිය යුතුය (1, 5 පද). ඔවුන් අන් ජාතීන්ගෙන් බොහෝසේ වෙනස් විය යුතුය. එවිට කුමක් සිදුවනු ඇද්ද?

- ඉශ්‍රායෙල් සෙනඟ ඥානවන්ත යැයි අන්ජාතීන්ට අයත් සෙනඟ සිතනු ඇත (6 පදය).
- දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට ළංව සිටින බව අන්ජාතීන්ට අයත් සෙනඟ දකිනු ඇත (7 පදය).
- ඉශ්‍රායෙල්ගේ ව්‍යවස්ථාව සාධාරණ හා යුක්තිසහගත බව අන්ජාතීන්ට අයත් සෙනඟ දකිනු ඇත (8 පදය).

තමන්වහන්සේට නමස්කාර කිරීම සඳහා ජාතීන් ගෙන ඒම දෙවියන්වහන්සේට අවශ්‍යය. දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ තුළින් එය කරනු ඇත. උත්පත්ති 12:3හි දෙවියන්වහන්සේ ආබ්‍රහම්ගේ පවුල (ඉශ්‍රායෙල්) තෝරාගැනීමට හේතුව වූයේ මෙයයි.

අද දෙවියන්වහන්සේගේ සෙනඟ වන්නේ කිතුනුවෝය. කිතුනුවන් දෙවියන්වහන්සේට කීකරුවිය යුතුය. කිතුනුවන් ලෝකයෙන් වෙනස් විය යුතුය. එහෙත් ඉශ්‍රායෙල්වරුන් මෙන් කිතුනුවෝ ද නිතරම නොඇදහිලිවතුන්ගේ හැසිරීම් අනුගමනය කරති.

ⓘ **අදාළ කිරීම**: ලෝකයෙන් වෙනස්වී සෙනඟ දෙවියන්වහන්සේ වෙතට ආකර්ෂණය වන අයුරින් ජීවත්වීමට ඔබගේ සෙනඟ ධෛර්යවත් කරන්න.

⊕ **යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේට කීකරුවීමට හා ලෝකයෙන් වෙනස්ව ජීවත්වීමට ඔබගේ සභාවේ සාමාජිකයන්ට උපකාර කරන ලෙස උන්වහන්සේගෙන් අයදින්න. කිතුනුවන්ගේ ආදර්ශය තුළින් දෙවියන්වහන්සේ අනුගමනය කිරීමට සෙනග ගෙනෙන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලන්න.*

## ⬇ අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 4:9-20

# 8 රූප වන්දනා නොකරන්න

### පසුබිම
ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශයට ඇතුල්වීමට පෙර මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට දේශනා කරමින් සිටියි. සීනයි කන්දේ (හොරේබ්) ඔවුන් සිටි කාලය ගැන මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට සිහිපත් කරයි.

### 9-20 පද කියවන්න
*එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්
- **ද්විතිය නීති සංග්‍රහය** 4:10. "හොරේබ්" යනු සීනයි කන්දට තවත් නමකි.
- **ද්විතිය නීති සංග්‍රහය** 4:12. දෙවියන්වහන්සේ සෙනඟට "ගින්න තුළින්" කථා කළ සේක. සෙනඟ දෙවියන්වහන්සේ නොදුටුව ද උන්වහන්සේගේ හඬ ඇසුවෝය. දෙවියන්වහන්සේ වැඩසිටින බව ගින්න පෙන්නුවේය.
- **ද්විතිය නීති සංග්‍රහය** 4:15. "ඔබ සැම සුපරීක්ෂාකාරීව සිටිය යුතුය." ඉන් අදහස් වූයේ මේ ආඥාවට කීකරුවීම ඉශ්‍රායෙල් සෙනඟට පහසු නොවන බවය.
- **ද්විතිය නීති සංග්‍රහය** 4:16. "දූෂ්‍ය" (පවට) යන්නෙන් අදහස් වන්නේ වැරදි කිරීමය.
- **ද්විතිය නීති සංග්‍රහය** 4:20. "යකඩ ගිනි උඳුන" යොමු කරන්නේ මිසරයේ යකඩවලින් රූප සෑදීම වෙතය. "උරුමය" දක්වන්නේ ඒ කාලයේ ඉශ්‍රායෙල් සෙනඟ සමඟ දෙවියන්වහන්සේට පැවති විශේෂ සම්බන්ධතාවයි.

### කිරීමට යමක්
ඉශ්‍රායෙල් සෙනඟ සීනයි කන්ද වෙත ආවෝය (නික්මයාම 19). ඔවුහු එහි අවුරුද්දක් පමණ නතරවී සිටියෝය. දෙවියන්වහන්සේ ඔවුන්ට කථා කරමින් ව්‍යවස්ථාව දුන් සේක.

එකල බොහෝ ආගම්වලට නමස්කාරය සඳහා රූප තිබිණි. ඒවා සාදන ලද්දේ ලී හෝ ගල්වලිනි. රූප බොහෝවිට මනුෂ්‍යයන්, සතුන්, සර්පයන්, කුරුල්ලන් හෝ මාළුවන් මෙන් විය. බොහෝ ආගම් ඉර, සඳ සහ තාරකා ද නමස්කාර කළේය. රූප තබාගැනීමට ඉශ්‍රායෙල්වරුන්ට ඉඩ නොලැබිණි.

- *මෙයට හේතුව කුමක්ද?*

16-19 පද අපට උත්පත්ති 1:14-27 සිහිගන්වයි. මේ සියල්ල සාදන ලද්දේ දෙවියන්වහන්සේ විසිනි. අප නමස්කාර කළ යුත්තේ මැවුම්කරුවාණන් වන දෙවියන්වහන්සේ මිස උන්වහන්සේ සෑදූ දේවලට නොවේ.

දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට හේතුවන තවත් කරුණක් 20 පදයේ දැක්වේ. තමන්ගේම සෙනඟ වන පිණිස දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් මිසරයෙන් පිටතට ගෙනා සේක. ඉශ්‍රායෙල් අන් ජාතීන්ට වඩා වෙනස්විය යුතුය.

දෙවියන්වහන්සේ කෙබඳුද යන්න වඩා උන්වහන්සේ පවසන දෙය වැදගත්ය. අප උන්වහන්සේට ඇහුම්කන් දිය යුතුය. දෙවියන්වහන්සේ පෙනෙන ආකාරයට වඩා උන්වහන්සේ ස්වකීය සෙනඟට කළ දේ වැදගත්ය. උන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන් මිසරයෙන් මුදාගත් සේක.

### ප්‍රධාන කරුණ
**දෙවියන්වහන්සේට ශරීරික ස්වරූපයක් නැත. එබැවින් රූප වන්දනා නොකරන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 4:9-20

### ⊳ ආරම්භය

"දෙවියන්වහන්සේ කොයි වගේද?" යි ඇතැම්විට දරුවෝ අසති. උන්වහන්සේ සුදු ද කළු ද නැතිනම් ආසියානුවෙක් ද? උන්වහන්සේට රැවුලක් තිබේද? අප දන්නේ නැත. ඉශ්‍රායෙල් සෙනඟ හොරේබ්හි සිටි කාලයේ ඔවුහු දෙවියන්වහන්සේ නුදුටුවෝය. ඔවුන්ට උන්වහන්සේගේ හඬ පමණක් ඇසිණි.

### හොරේබ් (සීනයි) සිහිකරන්න

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:9-14***

හොරේබ් (සීනයි) කන්දේ සිටි අවස්ථාව මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට සිහිපත් කරයි. සෙනඟ කන්දට ළංව සිටියෝය. එහි ගින්න, වලාකුළු සහ අන්ධකාරය විය. එහි දෙවියන්වහන්සේගේ හඬ විය. එහෙත් සෙනඟ දෙවියන්වහන්සේ නොදුටුවෝය.

දෙවියන්වහන්සේ දස පනත සහ අනෙක් ව්‍යවස්ථාවන්හි වචන පැවසූ සේක (14 පදය).

මේ කොටසේ ප්‍රධාන කරුණ වන්නේ "සිහිපත් කරන්න" යන්නයි. දෙවියන්වහන්සේට ශාරීරික ස්වරූපයක් නැත. ඔවුන් එය අමතක නොකළ යුතුය. ඔවුන් තම දරුවන්ට සහ මුනුපුරන්ට ඒ බව පැවසිය යුතුය (9-11 පද).

### රූප සාදා නොගන්න

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:15-20***

දෙවියන්වහන්සේ යැයි නමස්කාර කිරීම සඳහා පිළිම සාදා නොගන්නා පිණිස සෙනඟ හොරේබ් මතකතබාගත යුතුය. බොහෝ නොඇදහිලිවතුන්ට පිළිම තිබේ.

- ඔබගේ රටේ නමස්කාරය සඳහා රූප, පිළිම සහ පින්තූර තිබෙන ආගම් තිබේද? ඔවුන්ගේ රූප කොයි වගේද?

16-20 දක්වා පදවල දැක්වෙන දේවලින් සෙනඟ රූප සාදති. *මේ දේවල් උත්පත්ති 1හි සඳහන් කර ඇත්තේ කෙසේදැයි ඔබගේ අසන්නන්ට පෙන්වන්න.* දෙවියන්වහන්සේ සෑදූ දේවල් නමස්කාර කිරීම සුදුසු නොවේ. අප නමස්කාර කළ යුත්තේ දෙවියන්වහන්සේට පමණී.

මිසරයේ සෙනඟ රූප සෑදූවෝය. දෙවියන්-වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ එයින් පිටතට ගෙන ආ සේක. අපට, දෙවියන්වහන්සේ ඇදහිලිවතුන් යේසුස්වහන්සේ තුළ මුදාගත් සේක. අප නමස්කාර කළ යුත්තේ දෙවියන්වහන්සේට පමණී.

- ඔබගේ ජීවිතය පිළිබඳව ඕනෑකමෙන් කල්පනා කරන්න. ඔබ නමස්කාර කරන වෙනත් දේවල් තිබේද? ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ තැන ගන්නා වෙනත් දේවල් තිබේද?

### දෙවියන්වහන්සේගේ වචනවලට සවන් දෙන්න

අද අපි බයිබලයේ තිබෙන දෙවියන්-වහන්සේගේ වචන කියවීමෙන් දෙවියන්-වහන්සේගේ හඬ අසන්නෙමු. දෙවියන්-වහන්සේ අපට බයිබලය තුළ කථා කරන අතර අප උන්වහන්සේගේ වචනවලට කීකරුවිය යුතුය. බයිබලය යනු අප උදෙසා වූ දෙවියන්වහන්සේගේ වචනයයි. එබැවින් අප බයිබලය වෙත සැලකිලිමත්ව අවධානය යොමු කළ යුතුය.

⊕ **නිදසුන**: ඇතැම් කිතුනුවන් යේසුස්-වහන්සේගේ හෝ මරියතුමීගේ හෝ වෙනත් පුද්ගලයන්ගේ පිළිම කෙරෙහි බලා සිටින නමුත් බයිබලයෙහි දෙවියන්වහන්සේ කථා කරන හඬට සවන් නොදෙති. මෙය අනතුරුදායකය. මෙය සෙනඟ අඥාන බවට පත්කරමින් අන්ධ විශ්වාසයන් කරා ගෙන යයි.

කිතුනුවන් බයිබලයේ තිබෙන දෙවියන්-වහන්සේගේ වචනවලට අවධානය යොමු කළ යුතු අතර ප්‍රවේසමෙන් ඒවාට කීකරු විය යුතුය.

⊙ **යාච්ඤා කරන්න**: *ඔබ බයිබලය කියවන විට දෙවියන්වහන්සේට සවන්දීමට ඔබට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් අයදින්න.*

## අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 4:21-31

# 9 ඊර්ෂ්‍යාකාර සහ දයාවන්ත දෙවි කෙනෙක්

### පසුබිම
සෙනඟ පොරොන්දු දේශයට ඇතුල්වීමට පෙර මෝසෙස් ඔවුන්ට දේශනා කරමින් සිටියි. රූප වන්දනා නොකරන ලෙස ඔහු ඔවුන්ට අනතුරු අඟවයි.

### 21-31 පද කියවන්න
*එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්
- **ද්විතිය නීති සංග්‍රහය** 4:23. "ගිවිසුම" යන්නෙන් අදහස් වන්නේ ස්ථිර සම්බන්ධතාවක්ය.
- **ද්විතිය නීති සංග්‍රහය** 4:24. "ඊර්ෂ්‍යා-කාර". ඊර්ෂ්‍යාකාරී යන්නෙන් අන් කෙනෙකුට අයිති දෙයක් වැරදි ලෙස අපට ගැනීමට උවමනා වීම අදහස් විය හැකිය. එහෙත් මෙහිදී අදහස් වන්නේ දෙවියන්වහන්සේට අයිති දේ උන්-වහන්සේට පමණක් තිබීම ඕනෑවීමයි. දෙවියන්වහන්සේගේ සෙනඟ උන්-වහන්සේ විසින් මුදාගත් නිසා ඔවුන් උන්වහන්සේට පමණක් අයිතිය.
- **ද්විතිය නීති සංග්‍රහය** 4:26. "වැනසෙනු" යනු විනාශවීම හෝ මරණයට පත්වීමය.
- **ද්විතිය නීති සංග්‍රහය** 4:29. "ස්වාමින්-වහන්සේ සොයන්න" යනු පාපය කෙරෙන් ඉවත්වී කමාව ලැබීම සඳහා ආපසු දෙවියන්වහන්සේ වෙතට හැරීමය. සෙනඟ ඔවුන්ගේ මුළු හදවතින් සහ ආත්මයෙන් දෙවියන්වහන්සේ සෙවිය යුතුය. ඔවුන්ට සැබවින්ම දෙවියන්-වහන්සේ ඕනෑ වියයුතුය.
- **ද්විතිය නීති සංග්‍රහය** 4:31. "දයාවන්තය" යන්නෙන් අදහස් වන්නේ දෙවියන්-වහන්සේ කමාව දී සෙනඟ නැවත පොරොන්දු දේශයට ගෙනෙන බවය. ඔවුහු මේ සඳහා සුදුස්සන් නොවෙති.

### කිරීමට යමක්
- *මේ ඡේදයේ තිබෙන දෙවියන්වහන්සේ දුන් ආඥාවන් මොනවාද ?*

දෙවියන්වහන්සේ ඊර්ෂ්‍යාකාරය (24 පදය). උන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේ වෙතින් ඉවතට හැරෙනවිට උන්වහන්සේ කෝපවන සේක. දෙවියන්වහන්සේ මෝසෙස් සමඟ කෝප වූයේ එනිසාය (ගණන් කථාව 20:12 සහ ද්විතිය නීති සංග්‍රහය 3:26 බලන්න). එබැවින් ගිවිසුම් පොරොන්දු අමතක නොකිරීමට දෙවියන්වහන්සේගේ සෙනඟ ප්‍රවේසම් විය යුතුය.

- *ඉශ්‍රායෙල් සෙනග දෙවියන්වහන්සේ වෙතින් හැරී රූප නමස්කාර කළහොත් උන්වහන්සේ කුමක් කරනු ඇතිද? (26-28 පද)*

දෙවියන්වහන්සේ දයාවන්තය (31 පදය). උන්වහන්සේගේ සෙනඟට සමාවදීමට උන්වහන්සේට අවශ්‍යය. ඉශ්‍රායෙල් සෙනඟ ස්වාමින්වහන්සේ සෙවිය යුතුය (29 පදය).

එවිට ඔවුන් නැවත දේශයට පැමිණෙනවා ඇත. ආබ්‍රහම්ට දුන් පොරොන්දුව දෙවියන්-වහන්සේ රකින නිසා උන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේ වෙතින් ඉවතට හැරුණුවිට පවා ඔවුන් අමතක කර දමන්නේ නැත.

ඉශ්‍රායෙල්වරුන් දෙවියන්වහන්සේ වෙතින් ඉවතට හැරුණු බැවින් අවුරුදු සිය ගණනකට පසුව දෙවියන්වහන්සේ ඔවුන්ට දඬුවම් කළ සේක. බබිලෝනියේ සෙනඟ ඉශ්‍රායෙල් පරාජය කළෝය. බොහෝ ඉශ්‍රායෙල්වරු බබිලෝනියට ගෙනයනු ලැබුවෝය. එහෙත් පසුව ඇතැම්හු දේශයට නැවත පැමිණියෝය.

### ප්‍රධාන කරුණ
**දෙවියන්වහන්සේ ඊර්ෂ්‍යාකාර වන්නා සේම දයාවන්ත ද වනසේක.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 4:21-31

**ආරම්භය**

- දෙවියන්වහන්සේ කෙබඳුද? උන්වහන්සේ ප්‍රේමයෙන් පිරී සිටින සේක්ද? උන්වහන්සේ කෝපවන සේක්ද? උන්වහන්සේ දෙකම විය හැකිද?

## දෙවියන්වහන්සේ ඊර්ෂ්‍යාකාරය

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:21-28***

**නිදසුන**: අපටම පමණක් අයිති ඕනෑම දෙයක් ගැන ඊර්ෂ්‍යා වීම නිවැරදිය. එනිසා ස්වාමිපුරුෂයකු සහ භාර්යාවක් තම සහකරුවා/සහකාරිය උදෙසා ඊර්ෂ්‍යා විය යුතුය. ඔවුන් අයිති වන්නේ ඔවුන් දෙදෙනාට පමණී. ස්වාමිපුරුෂයෙක් තම භාර්යාව වෙනත් පුරුෂයෙකුට ප්‍රේම කරන බව දැනගත්විට කෝපවීම වැරදි නැත. තම ස්වාමිපුරුෂයා වෙනත් කාන්තාවකට ප්‍රේම කරන බව භාර්යාව දැනගත්විට ඇය කෝපවීම වැරදි නැත.

දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ උදෙසා ඊර්ෂ්‍යාකරන සේක. ඔවුන් අයිති උන්වහන්සේට පමණී. ඔවුන් මුදාගනු ලැබුවේ දෙවියන්වහන්සේ විසින් පමණක්මය. තම සෙනඟ වෙනත් දෙවිවරුන් සහ රූප කෙරෙහි හැරුණුවිට දෙවියන්වහන්සේ කෝපවන සේක.

*23 පදයේ තිබෙන ප්‍රධාන ආඥාව ඔබගේ සවන්දෙන්නන්ට පැහැදිලි කරන්න.* **"ගිවිසුම සිහි නැති නොකරන්න."** ඉශ්‍රායෙල් සෙනඟ රූපයක් සාදාගන්නේ නම් ඔවුන් ගිවිසුම අමතක කර ඇත. තමන් දෙවියන්වහන්සේට පමණක් අයිති බව ඔවුන්ට අමතක වී ඇත.

*දෙවියන්වහන්සේගේ සෙනග උන්වහන්සේ අමතක කළහොත් කුමක් සිදුවනු ඇතිදැයි පැහැදිලි කරන්න (26-28 පද). පසුකලෙක ඉශ්‍රායෙල්වරුන්ට සිදුවූයේ මේ දෙය බව ඔබගේ අසන්නන්ට පවසන්න.*

## දෙවියන්වහන්සේ දයාවන්තය

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:29-31***

දෙවියන්වහන්සේ දයාවන්ත වනසේක. දෙවියන්වහන්සේට අවශ්‍ය උන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේ සෙවීමය. *සෙනග බොරුවට ඇඟවීමට හෝ දෙවියන්වහන්සේ රැවටීමට ක්‍රියානොකර හදවතින්ම අවංකව හා සැබෑකමෙන් එසේ කළයුතු බව ඔබගේ අසන්නන්ට පහදා දෙන්න.*

සෙනඟ දෙවියන්වහන්සේ වෙතට හැරී පාපයෙන් ඉවත් වුවහොත් දෙවියන්වහන්සේ ඔවුන් දේශය වෙත ආපසු ගෙනෙනු ඇත. දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුව ඉටුකරනු ඇත. තම සෙනඟ විශ්වාසය කඩකළ විට පවා දෙවියන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක.

නව ගිවිසුමෙහි දෙවියන්වහන්සේ ඊර්ෂ්‍යාකාර සහ දයාවන්ත බව දැක්වේ. සෙනඟ දෙවියන්වහන්සේ වෙතින් ඉවතට හැරුණු විට උන්වහන්සේ කෝපවූ බැවින් ඔවුන්ගේ පාප වෙනුවෙන් යේසුස්වහන්සේ කුරුසිය මත මරණයට අත්විඳි සේක. දෙවියන්වහන්සේ දයාවන්ත වෙමින් කමාව දෙන බවත් යේසුස්වහන්සේගේ මරණය පෙන්වයි.

**අදාළ කිරීම**: දෙවියන්වහන්සේ සමඟ වන ගිවිසුම අප පවත්වාගෙන යායුතු අතර අපගේ අසමත්කම්වලට කමාවීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කළ යුතුය. දෙවියන්වහන්සේ සෙවීමේදී අප අවංක විය යුතුය. ස්වාමි පුරුෂයෙකු හා භාර්යාවක එකිනෙකාට අයත් වන්නාක් මෙන් අප දෙවියන්වහන්සේට පමණක් අයත් විය යුතුය.

- දෙවියන්වහන්සේ ගැන ඔබ සිතන්නේ කෙසේද? ඔබ උන්වහන්සේට පමණක් අයිතිද? ඔබ දෙවියන්වහන්සේට විශ්වාසවන්ත ද? නැතහොත් ඔබට වෙනත් දෙවිවරු ද සිටිත්ද? ඔබගේ පාපයෙන් ඉවත්ව දෙවියන්වහන්සේ වෙතට ආපසු හැරීමට ඔබට අවශ්‍ය ද?

**යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේට පමණක් විශ්වාසවන්තව සිටීම සඳහා ඔබට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

## අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 4:32-40

# 10 වෙනත් දෙවි කෙනෙක් නැත

### පසුබිම

ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශයට ඇතුල්වීමට පෙර මෝසෙස් ඔවුන්ට දේශනා කරමින් සිටී. මෝසෙස්ට අවශ්‍ය වන්නේ සෙනඟ පාළුකරයේ ගතකල පසුගිය වසරවලින් ඔවුන් පාඩම් ඉගෙන ගැනීමයි. ඔහුට අවශ්‍ය වන්නේ සෙනඟ පොරොන්දු දේශයේදී හොඳ ජීවිත ගතකරනු දැකීමයි.

### 32-40 පද කියවන්න

*එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්

- **ද්විතීය නීති සංග්‍රහය** 4:32. "විභාග කරන්න" පළමුව, සෙනඟ කාලය හෝ ඉතිහාසය විමසුවෝය. මෙවැනි මහත් කිසිදෙයක් මින් පෙර කිසිදිනෙක සිදුවී නැත. දෙවනුව, සෙනඟ ස්ථානය ගැන විමසුවෝය ("අහසේ එක් කෙළවරක සිට අනෙක් කෙළවරට"). මෙවැනි මහත් දෙයක් වෙනත් කිසිදු තැනක සිදුවූයේ නැත.
- **ද්විතීය නීති සංග්‍රහය** 4:35. "උන්වහන්සේ මිස වෙන කෙනෙක් නැත." ස්වාමින්වහන්සේ තරම් ශ්‍රේෂ්ඨ වෙන දෙවිකෙනෙක් නැත.
- **ද්විතීය නීති සංග්‍රහය** 4:36. "අහසෙන් ... පොළොව පිට..." දෙවියන්වහන්සේ අහසේ සහ පොළොවේ දෙවියන්වහන්සේය.
- **ද්විතීය නීති සංග්‍රහය** 4:37. "පියවරුන්" හෝ ආදිපියවරුන් යනු ආබ්‍රහම්, ඊසාක් සහ යාකොබ්ය.

### කිරීමට යමක්

- *දෙවියන්වහන්සේ අනෙක් දෙවිවරුන්ට වඩා ශ්‍රේෂ්ඨ වන්නේ කුමන ආකාරවලින්ද?*

ද්විතීය නීති සංග්‍රහය 4:32-34 කොටසෙහි ප්‍රශ්න අසන්නේය. එම සෑම ප්‍රශ්නයටම පිළිතුර "නැත" යන්නයි. සීනයි කන්දේදී ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේගේ හඬ ඇසුවාක් මෙන් වෙන කිසිදු සෙනඟක් හඬ ඇසුවේ නැත. නික්මයාමේදී දෙවියන්වහන්සේ කළාක් මෙන් වෙනත් කිසිදු දෙවිකෙනෙක් වෙනත් ජාතියක් කෙරෙන් පුදුම හාස්කම් කරමින් බේරාගෙන ආවේ නැත. උන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ මිසරයෙන් පිටතට ගෙනා සේක.

කුමක් කළ යුතුද යන්න 35 පදය අපට පවසයි. ස්වාමින්වහන්සේ කළ දෙය වෙන කිසිදු දෙවිකෙනෙකුට කළ නොහැකිය. එනිසා වෙනත් රූප සහ අන් දෙවිවරුන් නමස්කාර නොකරන්න. මේ පදය ද්විතීය නීති සංග්‍රහය 5:7හි ඇති ප්‍රථම ආඥාව අපට සිහිගන්වයි.

ස්වාමින්වහන්සේ ශ්‍රේෂ්ඨතමයා බව සෙනඟ දැනගැනීම මෝසෙස්ට අවශ්‍ය විය. 36-39 පදවල මෝසෙස් මෙය නැවතත් පවසයි. දෙවියන්වහන්සේ ස්වර්ගයෙන් කථා කළ සේක. පොළොවේදී සෙනඟට උන්වහන්සේගේ හඬ ඇසුණි. දෙවියන්වහන්සේ සීනයි කන්දේදී ගින්දර ගෙනා සේක. පොළොවේදී දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ මිසරයෙන් පිටතට ගෙනා සේක.

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ මිසරයෙන් පිටතට ගෙන ඒමට හේතුව වූයේ ඔවුන් පොරොන්දු දේශය වෙත ගෙනයාමයි. දෙවියන්වහන්සේගේ බලය මිසරය පරාජයට පත් කළේය. දේශයේ සිටින ජාතීන් පරාජය කළ හැකි තරම් දෙවියන්වහන්සේ ශක්තිමත්ය.

### ප්‍රධාන කරුණ

**සැබෑ දෙවියන්වහන්සේ හැර වෙන දෙවි කෙනෙක් නැත.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 4:32-40

### ⊳ ආරම්භය

විශිෂ්ඨතම පාපන්දු ක්‍රීඩකයා කවුද යන්න හෝ ශ්‍රේෂ්ඨතම නළුවා කවුද යන්න හෝ ශ්‍රේෂ්ඨතම නායකයා කවුද යන්න පිළිබඳව ඇතැම්විට සෙනඟ සාකච්ඡා කරති. ශ්‍රේෂ්ඨතම දෙවියන් කවුද යන්න සිතන්නැයි ද්විතිය නිති සංග්‍රහය 4:32-35හි අපට පවසයි.

### අති ශ්‍රේෂ්ඨ කවුද?

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:32-35***

ස්වාමින්වහන්සේ අති ශ්‍රේෂ්ඨ බව කාරණා දෙකක් පෙන්වයි.

1. දෙවියන්වහන්සේ ගින්න තුළින් සෙනඟට කථා කළ සේක. එය සිදුවූයේ සීනයි කන්දේදීය.
2. දෙවියන්වහන්සේ වෙනත් ජාතියක් වෙතින් සෙනඟ පිටතට ගත් සේක. එය නික්මයාමේදී සිදුවිය.

*32-34 පදවල තිබෙන ප්‍රශ්නවලට පිළිතුර "නැත" යන්න බව ඔබගේ අසන්නන්ට පවසන්න. වෙන කිසි දෙවිකෙනෙක් ගින්න තුළින් ජාතියකට කථා කළේ නැත. වෙන කිසි දෙවිකෙනෙක් ස්වකීය සෙනග වෙනත් ජාතියකින් පිටතට ගත්තේ නැත. වෙනත් කිසි කාලයක හෝ තැනක එවැනි දේ සිදුවූයේ නැත.*

එසේනම් අති ශ්‍රේෂ්ඨ කවුද? ස්වාමින්වහන්සේය. උන්වහන්සේ වැනි කිසිවෙකුත් නැත (35 පදය). ස්වාමින්වහන්සේ ඉතාම හොඳය. ස්වාමින්වහන්සේ කථාකරන සේක. ශක්තිමත්ව සිටින්නේ ස්වාමින්වහන්සේය.

### නැවතත් අති ශ්‍රේෂ්ඨ කවුද?

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:36-39***

දෙවියන්වහන්සේ අති ශ්‍රේෂ්ඨය. මෝසෙස් මේ කරුණ නැවත නැවතත් සඳහන් කරන්නේ එය එතරම් වැදගත් නිසාය.

දෙවියන්වහන්සේ ස්වර්ගයෙන් කථා කළ සේක. දෙවියන්වහන්සේ පොළොව මත ක්‍රියා කළ සේක. දෙවියන්වහන්සේ ස්වර්ගයේත් පොළොවේත් ස්වාමින්වහන්සේය. ඉශ්‍රායෙල් සෙනඟ උන්වහන්සේගේ හඬ ඇසුවෝය. දෙවියන්වහන්සේ බල පරාක්‍රමයෙන් යුතුව මිසරය පරාජය කළ සේක.

39 පදය 35 පදය වැනිය. ස්වාමින්වහන්සේ දෙවියන්වහන්සේය. වෙන කිසිවෙකු නැත.

### විශ්වාස කර කීකරුවන්න

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 4:38, 40***

ඉශ්‍රායෙල් සෙනඟ කාරණා දෙකක් ඉගෙන ගතයුතුය.

1. දෙවියන්වහන්සේ බල පරාක්‍රමයෙන් යුතුව මිසරය පරාජය කළ බැවින් පොරොන්දු දේශයේ සිටින ජාතීන් පරාජය කිරීමට උන්වහන්සේට හැකි බව සෙනඟට විශ්වාස කළ හැකිය.
2. දෙවියන්වහන්සේ පමණක්ම දෙවියන්වහන්සේ වන නිසා උන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට කීකරුවන්න. එවිට සෙනඟ දීර්ඝ කාලයක් දේශය තුළ ජීවත්වනවා ඇත.

කිතුනුවන් තවදුරටත් දෙවියන්වහන්සේ විශ්වාස කර කීකරු විය යුතුය. අපගේ පාපයෙන් අප ගළවාගන්නට දෙවියන්වහන්සේ බලසම්පන්න බව අප විශ්වාස කළ යුතුය. උන්වහන්සේ කුරුසිය මත දී ස්වකීය බලය පෙන්වූ සේක. යේසුස්වහන්සේගේ මරණය බලසම්පන්නය. අප තවදුරටත් උන්වහන්සේට කීකරු විය යුතුය. උන්වහන්සේ අපට දුන් උන්වහන්සේගේ ආඥා යටතේ අප ජීවත්විය යුතුය.

අප වෙනත් දෙවිකෙනෙක් හෝ ආත්මයක් අනුගමනය කරමු යැයි යමෙක් යෝජනා කළහොත් වහාම නතර කරන්න. අති ශ්‍රේෂ්ඨතමයා ස්වාමින්වහන්සේය. අනෙක් දෙවිවරුන් වඩා හොඳයැයි අප සිතන්නේද? නවත්වන්න. ශ්‍රේෂ්ඨතමයා ස්වාමින්වහන්සේය. අප දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට කීකරු විය යුතු නැතැයි සිතෙන්නේ නම් වහාම නතර කරන්න. අති ශ්‍රේෂ්ඨතමයා ස්වාමින්වහන්සේය. අප උන්වහන්සේ පමණක් අනුගමනය කළ යුතුය.

⊕ **යාච්ඤා කරන්න**: *ඔබේ ජීවිතයේ සෑම දිනයකම උන්වහන්සේ විශ්වාස කරමින් සම්පූර්ණයෙන් කීකරුවීමට ඔබට උපකාර කරන ලෙස දෙවියන්වහන්සේගෙන් අයදින්න.*

# 11 දෙවියන්වහන්සේට පළමු තැන දෙන්න

### « පසුබිම

ද්විතිය නිති සංග්‍රහය 1-4 කොටස අතිත අත්දැකිම්වලින් ඉගෙනගැනිම පිළිබඳවය. ද්විතිය නිති සංග්‍රහය 5-26 දක්වා දෙවියන්වහන්සේ දුන් ව්‍යවස්ථාවන්ය. මෝසෙස් පටන්ගත්තේ දසපනත දක්වමින්ය.

### 6-11 පද කියවන්න

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය** 5:7. දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ සෙනඟ තමන්වහන්සේට පමණක් නමස්කාර කිරීමය.
- **ද්විතිය නිති සංග්‍රහය** 5:8. දෙවියන්වහන්සේගේ සෙනඟ රූප හෝ පිළිම සාදා නොගත යුතුය. දෙවියන්වහන්සේට භෞතික ස්වරූපයක් නැත. ද්විතිය නිති සංග්‍රහය 4:9-20 දෙස නැවතත් බලන්න. ඉශ්‍රායෙල් සෙනඟ සීනයි කන්දේදී දෙවියන්වහන්සේ නුදුටුවෝය.
- **ද්විතිය නිති සංග්‍රහය** 5:9-10. "ඊර්ෂ්‍යාකාර දෙවිකෙනෙක්". ද්විතිය නිති සංග්‍රහය 4:3 කියවන්න. දෙවියන්වහන්සේ වරදකාරී දෙමව්පියන්ට සහ රූප සාදාගන්නා දරුවන්ට දඬුවම් කරන සේක. "දරුවන්ට දඬුවම් කිරීම." මෙයින් අදහස් වන්නේ අහිංසක දරුවන් නොව දෙමව්පියන් කළ පාපයම කරන දරුවන්ය. "තුන්වන සතර වන පරම්පරාව ... පරම්පරා දහසකට." දෙවියන්වහන්සේගේ ප්‍රේමය සදහටම පවතින්නේය. දෙවියන්වහන්සේගේ දඬුවම පවතින්නේ ස්වල්ප කලකටය.
- **ද්විතිය නිති සංග්‍රහය** 5:11. "නිකරුණේ භාවිත කිරීම" යනු වැරදි ලෙස භාවිත කිරීමය. අප දෙවියන්වහන්සේගේ නාමය නිවැරදි ආකාරයෙන් භාවිත කළ යුතුය.

### ⊙ කිරීමට යමක්

ව්‍යවස්ථාවන් ආරම්භ වන්නේ දසපනත සමඟින්ය. මේ ආඥාවන් දෙවියන්වහන්සේගෙන් ලැබුණු ඉතා වැදගත් පනත්ය. දෙවියන්වහන්සේ ඒවා පැවසුවේ සියලු සෙනඟ උදෙසාය. දෙවියන්වහන්සේ ඒවා ගල් පුවරු මත ලියූ සේක. දසපනත සියලු ව්‍යවස්ථාවන්ගේ සාරාංශයකි.

- *සෙනඟ මේ පනත්වලට කීකරු විය යුත්තේ ඇයි?*

වැදගත් වන්නේ නිවැරදි හේතුන් නිසා සෙනඟ දෙවියන්වහන්සේට කීකරුවීමය. දැනටමත් ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට අයිති බව 6 වන පදය පවසයි. දෙවියන්වහන්සේ ඔවුන් මිසරයෙන් ගළවාගත් සේක. දෙවියන්වහන්සේගේ සෙනඟ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට කීකරු වන්නේ ඔවුන් උන්වහන්සේ විසින් ගළවාගත් සෙනඟ නිසාය. කීකරුකම අපට දෙවියන්වහන්සේ සමඟ සබඳතාවක් ඇති බව පෙන්වයි.

පළමු පනත් තුන දෙවියන්වහන්සේ සමඟ ඇති සම්බන්ධතාව පිළිබඳවය. දෙවියන්වහන්සේගේ සෙනඟට වෙන දෙවිවරුන් නොසිටිය යුතුය. දෙවියන්වහන්සේට පළමු තැන හිමිවන්නේ උන්වහන්සේ කළ දේවල් නිසාය. දෙවියන්වහන්සේ සීනයි කන්දේදී ඉශ්‍රායෙල් සෙනඟට කථා කළ සේක. දෙවියන්වහන්සේ මිසරයෙන් සෙනඟ මුදාගත් සේක.

### ⊕ ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේ අප ගළවාගත් නිසා උන්වහන්සේට පමණක් නමස්කාර කරන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 5:6-11

### දෙවියන්වහන්සේට කීකරු විය යුත්තේ ඇයි?

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 5:6***

- සෙනඟ දෙවියන්වහන්සේට කීකරු විය යුත්තේ ඇයි?

සෙනඟට බොහෝ හේතු තිබේ.

- ඔවුන් දෙවියන්වහන්සේට භය නිසා
- දෙවියන්වහන්සේ විසින් ප්‍රේමකරනු ලැබීම ඔවුන්ට අවශ්‍ය නිසා.

ප්‍රධාන හේතුව වන්නේ දැනටමත් දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ ගළවාගෙන තිබීමය. පරණ ගිවිසුමෙහි දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ මිසරයෙන් ගළවාගත් සේක. යේසුස්වහන්සේ කුරුසිය මත මිය යාම තුළින් දෙවියන්වහන්සේ සියලු ඇදහිලිවතුන් ගළවාගත් සේක.

අපගේ ප්‍රතිචාරය වන්නේ උන්වහන්සේට කීකරුවීමයි. *6 වන පදයේ වැදගත්කම ඔබගේ අසන්නන්ට පැහැදිලි කරදෙන්න.*

පළමු පනත් තුන දෙවියන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවක් තිබීම පිළිබඳවය.

### දෙවියන්වහන්සේට පළමු තැන දෙන්න: වෙන දෙවිවරුන් තබා නොගන්න

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 5:7***

අපට දෙවියන්වහන්සේටත් වෙනත් දෙවිවරුන්ටත් නමස්කාර කළ නොහැකිය. *ද්විතීය නීති සංග්‍රහයේ 4:32-40හි දැක්වෙන පනතට හේතුව ඔබගේ අසන්නන්ට පැහැදිලි කරදෙන්න.* ඉශ්‍රායෙල් මිසරයෙන් මුදාගෙන විත් සෙනඟට සීනයි කන්දේදී කථා කළේ දෙවියන්වහන්සේ පමණක්මය.

*ඔබගේ සංස්කෘතිය තුළ සිටින වෙනත් දෙවිවරුන් පිළිබඳ උදාහරණ කිහිපයක් දෙන්න. ඔවුන් අනෙක් ආගම්වල දෙවිවරුන් හෝ මුදල් පිළිබඳ හෝ දැඩි ආස්වාදයන් පිළිබඳ දෙවිවරුන් විය හැකිය. ඔබේ සංස්කෘතියේ බොහෝ දෙවිවරු සිටින්නේ නම් දෙවියන්වහන්සේට සහ වෙනත් දෙවිවරුන්ට එකට නමස්කාර කිරීමට සෙනඟ උත්සාහ කිරීම ඉතාමත් වැඩිය.*

### දෙවියන්වහන්සේට පළමු තැන දෙන්න: රූප තබා නොගන්න

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 5:8-10***

අප රූපයක්, පිළිමයක් හෝ පින්තූරයක් යොදාගනිමින් දෙවියන්වහන්සේට නමස්කාර නොකළ යුතුය. *මෙයට හේතුව ද්විතීය නීති සංග්‍රහය 4:9-20 පෙන්වමින් ඔබගේ අසන්නන්ට පවසන්න.* නමස්කාරය කිරීම සඳහා අපට ස්වරූපයක් නිර්මාණය කළ නොහැකිය.

- ඔබගේ සංස්කෘතියේ පිළිම තිබේද? කිතුනුවන් දෙවියන්වහන්සේගේ රූප හෝ පිළිම තබාගැනීමේ පරීක්ෂාවට ලක්වන්නේද?

### දෙවියන්වහන්සේට පළමු තැන දෙන්න: දෙවියන්වහන්සේගේ නාමය නිකරුණේ භාවිත නොකරන්න

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 5:11***

*"නිකරුණේ" හෙවත් අවභාවිතය යන්නෙහි තේරුම ඔබගේ අසන්නන්ට පැහැදිලි කරදෙන්න.* අප දෙවියන්වහන්සේ පිළිබඳ වැරදි දේ නොපැවසිය යුතුය. දිවුරීම සඳහා අප දෙවියන්වහන්සේගේ නාමය භාවිත නොකළ යුතුය. අප මන්ත්‍රයක් මෙන් දෙවියන්වහන්සේගේ නාමය භාවිත නොකළ යුතුය. ඔබ සිටින ස්ථානයේ සෙනඟ තමන් කෝපවූ විට යේසුස්වහන්සේගේ නාමය භාවිත කරන්නේ ද? කිතුනුවන් මෙය කිසිවිටෙකත් නොකළ යුතුය.

දෙවියන්වහන්සේ අපට කළ දේ සිහිපත් කරන්න. දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ තුළින් අප පාපයෙන් ගැළෙවූ සේක. අපගේ ජීවිතයේ සහ නමස්කාරයේ පළමු තැන දෙවියන්වහන්සේට දිය යුතුය. අප වෙනත් දෙවිකෙනෙකුට නමස්කාර නොකළ යුතුය. අප රූප සහ පිළිම තබා නොගත යුතුය. අප දෙවියන්වහන්සේගේ නාමය වැරදි ආකාරයෙන් භාවිත නොකළ යුතුය. අපි දෙවියන්වහන්සේට ස්තුතිවන්ත විය යුතු අතර දෙවියන්වහන්සේට ප්‍රේම කළ යුතුය.

**යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේට පළමු තැන දීමට හා කිසිවිටෙක උන්වහන්සේගේ නාමය වැරදි ආකාරයෙන් භාවිත නොකිරීමට ඔබට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් අයදින්න.*

# 12 දෙවියන්වහන්සේගේ සබත පිළිපදින්න

### පසුබිම

මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට දසපනත පිළිබඳව සිහිගන්වයි. සබත පිළිබඳ පනත සතරවන පනතයි.

### 12-15 පද කියවන්න

*ජේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය** 5:14. "සත්වන" දවස ආරම්භ වූයේ සිකුරාදා හිරු බැස යාමත් සමඟ වන අතර අවසන් වූයේ සෙනසුරාදා හිරු බැස යාමත් සමඟමය.
- **ද්විතිය නිති සංග්‍රහය** 5:14. "ආගන්තුකයන්" යනු ඉශ්‍රායෙල් සෙනඟට අයත්වීමට තම කැමැත්ත දැක්වූ විදේශීන්ය.

### කිරීමට යමක්

සබත් දවස සතියේ සත්වන දවසයි. උත්පත්ති 2:1-3 කියවන්න. මැවීම අවසන් කළ පසුව උන්වහන්සේ සත්වන දවසේ නිවාඩු ගත් සේක.

සෙනඟ දවස් සයක් වැඩ කළ යුතුය (13 පදය). ඇතැම් අය කම්මැලිය. ඔවුන් ප්‍රමාණවත් තරම් වැඩ නොකරනවා විය හැකිය. ඇතැම් අය මුළු කාලය පුරාම වැඩකරයි. ඔවුන් පමණට වඩා වැඩකරනවා විය හැකිය. සෙනඟට සතියට එක දවසක් වැඩ රහිතව තිබීම අවශ්‍ය වන්නේය.

- *ඇතැම් අය ඉතා වෙහෙසවී වැඩකරන්නේත් සමහර අය අලසව සිටින්නේත් ඇයි?*

12-14 පද. සබත් දවස ශුද්ධ දවසක් විය. එම දවස දෙවියන්වහන්සේට අයිතිය. මේ ව්‍යවස්ථාව දෙවියන්වහන්සේගේ සියලු සෙනඟට මෙන්ම ඉශ්‍රායෙල්හි සිටින වැඩකාරයන් හා ආගන්තුකයන් සඳහා ද විය.

මේ ව්‍යවස්ථාවට හේතුව 15 වන පදයේ දැක්වේ. මිසරයේ වහළුන්ව විසු සෙනඟ සෑම දිනකම වැඩ කළෝය. ඔවුහු සැමවිටම වැඩ කළෝය. දෙවියන්වහන්සේ ඔවුන් මිසරයෙන් පිටතට ගෙනා සේක. දැන් ඔවුන් විවේකය සඳහා සහ දෙවියන්වහන්සේ නමස්කාර කිරීම සඳහා එක දවසක් වෙන් කළ යුතුය. නික්මයාම 20:8-11 දක්වා කියවන්න. සබත් නීතිය සඳහා තවත් හේතුවක් වන්නේ දෙවියන්වහන්සේ දවස් හයකින් ලෝකය මවා සත්වන දවසේ විවේක ගැනීමය.

තමා වෙතට පැමිණ විවේකය අත්කර ගන්නා මෙන් යේසුස්වහන්සේ පැවසූ සේක (මතෙව් 11:28). හෙබ්‍රෙව් 4:9-11 දක්වා ස්වර්ගිය විවේක ගැනීමක් ගැන කතා කරයි. ස්වර්ගය දෙවියන්වහන්සේ සමඟ සදාතනික සබතක් පවතිනු ඇත. සබත් දවසින් දක්වන අනාගතය එයයි.

- *කිතුනුවන් සබත් දිනයක් පැවැත්විය යුතුද?*

කිතුනුවෝ මේ අදහස සමඟ එකඟ නොවෙති. විවේකය සහ නමස්කාරය සඳහා සතියකට එක දවසක් අවශ්‍ය බව බොහෝ කිතුනුවෝ පවසති. සාමාන්‍යයෙන් එය ඉරිදා දවසය. සභාපාලකවරුන් වැනි ඇතැම් කිතුනුවෝ ඉරිදා දවසේ වැඩකරති. ඔවුන්ට වෙනත් විවේක දවසක් අවශ්‍යය.

### ප්‍රධාන කරුණ

**සබත් දවසක් පවත්වන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 5:12-15

**ආරම්භය**

දෙදෙනෙකු ගැන සිතන්න. එක් පුද්ගලයෙක් කම්මැලියකු වන අතර කිසිවිටෙක වෙහෙසවී වැඩකරන්නේ නැත. අනෙක් තැනැත්තා දිනපතාම වෙහෙස මහන්සිවී වැඩකරයි. *සබත් දවස පිළිබඳ ආඥාව අලස අයට මෙන්ම ඉතා වෙහෙසවී වැඩකරන අයට ද කථා කරන බව ඔබගේ අසන්නන්ට පවසන්න. තමන් අලස ද නැතිනම් වෙහෙසවී වැඩකරන්නෙක් යන්න කල්පනා කරන ලෙස ඔබගේ අසන්නන්ට පවසන්න.*

**පරණ ගිවිසුමේ ව්‍යවස්ථාව පැවසුවේ කුමක්ද?**

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 5:12-15***

*සබත් දවස පැවැත්වීමට හේතුව 15 වන පදය අනුසාරයෙන් ඔබගේ අසන්නන්ට පැහැදිලි කරදෙන්න.* සබත් දවස ප්‍රීතිමත් දවසක් විය. එයින් දෙවියන්වහන්සේ විසින් ස්වකීය සෙනඟ මුදාගනු ලැබීම සමරන ලදි. වැඩකාරයන් හා ආගන්තුකයන් ඇතුළු සියලු සෙනඟ දෙවියන්වහන්සේ ඔවුන්ට කළ දේ සිහිකරනු පිණිස සබත් දවස පැවැත්විය යුතුය. එය නමස්කාරයේ හා දෙවියන්වහන්සේ සමඟ විවේකයේ දවසකි. දෙවියන්වහන්සේ සත්වන දවසේ විවේක ගත් නිසා දවස වෙනස්ය (නික්මයාම 20:11). දෙවියන්වහන්සේගේ සෙනඟ දවස් සයක් වැඩ කළයුතු බවද ව්‍යවස්ථාවේ පවසා ඇත.

**කිතුනුවන් තවමත් සබතක් පවත්වන්නේද?**

*පරණ ගිවිසුමේ මෙම ආඥාව කිතුනුවන්ට පවසන්නේ කුමක්දැයි අවබෝධ කරගැනීමට ඔබගේ අසන්නන්ට උපකාර කරන්න.* කිතුනුවන්ට සබත් දවස පැවැත්විය යුතු බවට ආඥාවක් අලුත් ගිවිසුමේ නැත.

සබත් දවසේ සිද්ධාන්තය වන්නේ විවේකය සහ නමස්කාරය සඳහා සතියකට එක් දවසක් වෙන්කිරීමය. කිතුනුවන් එම සිද්ධාන්තය රැකිය යුතු අතර එය සතියේ ඕනෑම දවසක් විය හැකිය. එම දවසේ සෙනඟට කළ හැකි හෝ කළ නොහැකි දේ පිළිබඳව අතිරේක නීති පැනවීම අප නොකළ යුතුය.

**මහා සබතක්**

විවේකය ලැබීම සඳහා තමා වෙතට එන්නැයි යේසුස්වහන්සේ සෙනඟට ආරාධනා කළ සේක. හොඳම විවේකය ඇත්තේ යේසුස්වහන්සේ සමඟය. දවසක මේ විවේකය ස්වර්ගයේදී අත්වනු ඇත.

සෑම සතියකම අපට විවේකය සහ නමස්කාරය සඳහා දවසක් තිබිය යුතුය. ඒ දවස ස්වර්ගයේ රසවිඳීමක් වැනිය. ඒ දවස විවේකය, නමස්කාරය සහ දෙවියන්වහන්සේ සමඟ කාලය ගතකරමින් ගෙවා දමන බවට සහතික වන්න.

සෙනඟ දවස් සතක් වැඩ කළයුතු බවද ව්‍යවස්ථාව පවසයි. අප හොඳින් වැඩකිරීම දෙවියන්වහන්සේට අවශ්‍යය. *වෙහෙස මහන්සිවී වැඩකරන්නන් වන පිණිස ඔබගේ අසන්නන් අතර සිටින අලස අය ධෛර්යවත් කරන්න.*

**අදාළ කිරීම**: අපගෙන් බොහෝදෙනෙක් ඉතා වෙහෙසවී වැඩකරමු. රැකියාව සඳහා අපි අපගේ සම්පූර්ණ කාලය යොදවමු. තම පවුල සඳහා අවශ්‍ය වන මුදල් උපයාගැනීම සඳහා වැඩකළ යුතුව ඇතැයි ඇතමෙකු නිදහසට කරුණු පැවසිය හැකිය. අප සතියකට එක් දවසක් නොවරදවාම විවේක ගතයුතු බව දෙවියන්වහන්සේ පවසන සේක.

අපි සෑම දවසක් වැඩකිරීම සඳහා යොදවන කළ දෙවියන්වහන්සේට ගෞරව නොකරමු. අපට අවශ්‍ය සියල්ල දෙවියන්වහන්සේ ලබාදෙනු ඇත. විවේක දිනයක් ගැනීමෙන් පෙන්නුම් කරන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි ඇති අපගේ විශ්වාසයයි.

**යාච්ඤා කරන්න**: *නමස්කාරය සහ විවේකය සඳහා සතියකට එක් දිනක් තිබීම වෙනුවෙන් ස්තුති දෙන්න.*

# 13 අනෙක් පුද්ගලයන්ට ප්‍රේමකරන්න

## පසුබිම
පොරොන්දු දේශයේ පිවත්වීම සඳහා මෝසෙස් සෙනඟ සුදානම් කරයි. මෝසෙස් දසපනත සෙනඟට සිහිපත් කරයි.

## 16-21 පද කියවන්න

## සටහන්
- **ද්විතිය නීති සංග්‍රහය** 5:16. "ගෞරව කරන්න" යන්නෙන් අදහස් වන්නේ ගරුබුහුමන් දැක්වීමයි. මේ පනත දී ඇත්තේ කුඩා දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ටත්ය.
- **ද්විතිය නීති සංග්‍රහය** 5:17. "මිනී මැරීම" යන්නට හදිසි අනතුරු ඇතුළත් නොවේ. ඉතා නපුරු වරදකරුවන් මරණයට පත් කිරීම ඊට ඇතුළත් නොවේ. ඇතැම් යුද්ධවලදී සිදුවන මරණයට පත්කිරීම්ද ඊට ඇතුළත් නොවේ.
- **ද්විතිය නීති සංග්‍රහය** 5:18. "කාමමිථ්‍යාචාරය කිරීම." විවාහයෙන් පිටත ලිංගික සබඳකම් පැවැත්වීම මෙයින් අදහස් වේ.
- **ද්විතිය නීති සංග්‍රහය** 5:21. "ආශා කිරීම" යනු වෙනත් පුද්ගලයෙකුට අයිති දෙයක් කෙරෙහි දැඩි ලෙස ගිජුවීමකි.

## කිරීමට යමක්
මතකතබාගන්න: දෙවියන්වහන්සේගේ සෙනඟ මේ පනත්වලට කීකරු විය යුත්තේ දෙවියන්වහන්සේ කුමනාකාර ද යන්න ඔවුන් දුටු නිසාය (ද්විතීය නීති සංග්‍රහය 5:6). දෙවියන්වහන්සේ ඔවුන් මිසරයෙන් පිටතට ගෙනා සේක. කිතුනුවන් ලෙස අප ද දෙවියන්වහන්සේට කීකරු වන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය කරණකොටගෙන අප ගැළවූ බැවිනි.

- *දෙවියන්වහන්සේට නමස්කාර නොකරන ලෙස තම දෙමව්පියන් පැවසුවහොත් කිතුනුවන් කුමක් කළ යුතු ද? දරුවකු දෙමව්පියන්ට ගරු කරන (16 පදය) අතර දෙවියන්වහන්සේට කීකරු වන්නේ කෙසේද?*

17-18 පද. දෙවියන්වහන්සේගේ සෙනඟ මිනිස් ජීවිතයට ගරු කළ යුතුය. සෙනඟ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇත (උත්පත්ති 1:26). එසේම දෙවියන්වහන්සේගේ සෙනඟ තම ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවට ප්‍රේමකිරීමට විශ්වාසවන්ත විය යුතුය. ලිංගික සබඳතා ඇත්තේ විවාහක පුද්ගලයන් උදෙසාය.

19 පදය. තවත් පුද්ගලයෙකුගේ දෙයක් සොරකම් කිරීම වැරදිය. අපගේ රැකියාවේදී වංචා කිරීම සහ රජයෙන් හෝ අපගේ රැකියා ස්ථානයෙන් මුදල් හෝ කාලය සොරාගැනීම මෙයට ඇතුළත් වේ.

20 පදය. දෙවියන්වහන්සේගේ සෙනඟ සත්‍යය කථා කළ යුතුය. අප බොරු නොකිව යුතුය. අප සෙනඟ රැවටීම හෝ මුළා කිරීම නොකළ යුතුය. උසාවියේදී සාක්ෂි දීමේදී සහ අනෙක් පුද්ගලයන් සමඟ අපේ කථා බහේදී අප මේ ආකාර පුද්ගලයන් විය යුතුය.

21 පදය. අනෙක් අයට අයිති දේවලට දැඩි ලෙස ආසාකිරීම මගින් අපගේ තණ්හාව දැක්වේ. අප වෙනත් දේවල් කෙරෙහි දැඩිව ආසා කිරීම යනු අපට දැන් ඇති දේවල් පිළිබඳව තෘප්තියක් නැත යන්නය.

අප දෙවියන්වහන්සේට පළමු තැන දිය යුතුය. දෙවියන්වහන්සේ අපට ලබාදෙන දේවල් වලින් සතුටුවිය යුතුය. අප අන් අය සමඟ පවත්වන සබඳතාවලදී තණ්හා හෝ ආත්මාර්ථකාමී නොවිය යුතුය.

## ප්‍රධාන කරුණ
**අනෙක් පුද්ගලයන්ට ප්‍රේම කිරීම මගින් දෙවියන්වහන්සේට පළමුතැන දෙන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 5:16-21

### ⊙ ආරම්භය

බොහෝදෙනා දසපනත දනිති. එහෙත් ඒවාට කීකරුවීම පහසු නොවේ. එහි සඳහන් පනත් දහයෙන්ම දක්වන්නේ දෙවියන්වහන්සේට පළමු තැන දීම පිළිබඳවය. දෙවියන්වහන්සේ තමන් මිසරයෙන් මුදාගත් බැවින් දෙවියන්වහන්සේගේ සෙනඟ මෙම පනත් පැවැත්විය යුතුය.

### අනෙක් පුද්ගලයන්ට ප්‍රේම කිරීම

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 5:16-21***

අපි අනෙක් පුද්ගලයන්ට ප්‍රේම කිරීම මගින් දෙවියන්වහන්සේට පළමු තැන දෙන්නෙමු. දෙවියන්වහන්සේගේ සෙනඟ තම දෙමව්පියන්ට ගෞරව කළ යුතුය, බුහුමන් දැක්විය යුතුය. යහපත් ආඥාවන්ට කීකරුවිය යුතුය (16 පදය). එහෙත් දෙමව්පියන් විසින් දෙවියන්වහන්සේට අකීකරුවීම වැනි නරක දෙයක් ආඥා කළොත් දෙවියන්වහන්සේගේ දරුවන් ඔවුන්ගේ දෙමව්පියන්ට අකීකරුව දෙවියන්වහන්සේට කීකරුවිය යුතුය.

- **මිනී මැරීම වැරදිය** (17). මනුෂ්‍යයන් නිර්මාණය කර ඇත්තේ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන්ය. අප අන් අය නොමැරිය යුතුය. වඩාත් මිනී මැරීම් සිදුවන්නේ ආත්මාර්ථකාමීවීම් සහ කෑදරවීම් හේතුවෙනි.
- **විවාහයෙන් පිටත ලිංගික සබඳකම් පැවැත්වීම වැරදිය** (18 පදය). ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් එකිනෙකාට විශ්වාසවන්ත විය යුතුය. දෙවියන්වහන්සේ ලිංගික හැසිරීම් තබා ඇත්තේ විවාහක යුවළවලට සතුටුවීම සඳහාය.
- **වෙනත් කෙනෙකුගේ දේ සොරකම් කිරීම, තණ්හාවීමත් සහ ආත්මාර්ථකාමීවීමත්ය** (19 පදය).

⊕ **නිදසුන**: මනුෂ්‍යයෙක් තමාට යම් මුදලක් ගැනීම සඳහා සභාවේ හෝ සමාගමේ ගිණුම් වෙනස් කරයි. තවත් මනුෂ්‍යයෙක් අනෙක් අයට අයිති සමහර දේවල් තමන් වෙත තබා ගනී. ඒවා නැතිවූ බව ඔහු බොරුවට අඟවයි. තවත් මනුෂ්‍යයෙක් වෙනත් කෙනෙකුට අයති කෑමක් තමන්ගේ ප්‍රයෝජනයට ගනී. මේ සියලු මනුෂ්‍යයන් කරන්නේ සොරකම්ය. දෙවියන්වහන්සේ තමන්ට ලබාදෙන දේ ගැන දෙවියන්වහන්සේගේ සෙනඟ ස්තුතිවන්ත විය යුතුය.

- **සත්‍යය වැදගත්ය** (20 පදය). අප කිසිදු හේතුවක් නිසා බොරු නොකිව යුතුය. අපගේ වචන සැමවිටම සත්‍යය විය යුතුය. අපි බොරු කියන කල විශ්වාසය හා සබඳතාවන් බිඳ දමන්නෙමු. ඊටත් වඩා අප දෙවියන්වහන්සේට අකීකරු වන්නෙමු.

⊕ **නිදසුන**: එක් මිනිසෙකුට තම ගනුදෙනුකරුවා ඉදිරියේ ලජ්ජාවීමට අවශ්‍ය නොවීය. ඔහු ගනුදෙනුකරුවාට කීම සඳහා නිදහසට කරුණක් සාදාගත්තේය. ඔහු බොරුවක් පැවසීය. සත්‍යය පැවසීම නිර්භීත ක්‍රියාවක් සේම එය සැමවිටම කළයුතු නිවැරදි දෙය ද වන්නේය. අපගේ පවුල සමඟ ද සැමවිටම අප ඇත්ත කථා කළ යුතුය. එක්තරා පියෙකු තම දරුවන් සමඟ නගරයට යාමට කැමති නොවීය. එනිසා, තමා එහි නොයන බව ඔහු ඔවුන්ට පවසයි. පසුව ඔහු රහසේම එහි යයි. එය බොරුකීමක්ය.

- **අන්‍යයන්ගේ දේවල් ගැන අප තණ්හා නොවිය යුතුය. තණ්හාව පැමිණෙන්නේ වැරදි හදවත්වලින්ය** (21 පදය). වෙනත් අයෙකුට අයත් ඇඳුම් හෝ අලුත් නිවසක හිමිකාරීත්වය ඔබට අවශ්‍යයද? එය තණ්හාවක් මෙන්ම වැරදි දෙයක්ය.

මෙම ආඥාවන් අද දවසේ ජීවත්වන සෑම කිතුනුවකුම සඳහාය. දෙවියන්වහන්සේ කුරුසිය මගින් ස්වකීය සෙනඟ මුදාගත් බැවින් ඔවුන් ඒවාට කීකරුවීම ඔවුන්ට අවශ්‍ය වනු ඇත.

⊙ **යාච්ඤා කරන්න**: *තණ්හා නොවීමටත්, සත්‍යය පැවසීමටත්, අනෙක් අයට ප්‍රේම කිරීමටත් ඔබට උපකාර කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

# 14 ඔබගේ මුළු හදවතින්ම දෙවියන්වහන්සේට ප්‍රේමකරන්න

## ≪ පසුබිම

මෝසෙස් සෙනඟට දෙවියන්වහන්සේගේ පනත් පිළිබඳව සිහිගන්වයි. ඔහු ආඥාවන් සියල්ල එක ශ්‍රේෂ්ඨ ආඥාවක් ලෙස සංක්ෂිප්ත කරයි.

## ⌵ 4-9 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

## ⩔ සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 6:4.** "එකම සමිඳුණන්වහන්සේ" යන්නෙන් අදහස් වන්නේ දෙවියන්වහන්සේ සමිඳුණන්-වහන්සේ පමණක්ම බවය. ද්විතිය නීති සංග්‍රහය 4:35 ද බලන්න.
- **ද්විතිය නිති සංග්‍රහය 6:5.** "හෘදයෙන්/සිතෙන්" යන්නෙන් ඔබගේ තිරණ, සිතිවිලි සහ හැඟිම් අදහස් වේ. "බුද්ධියෙන්/ආත්මයෙන්" යනු ඔබගේ සමස්ත ජිවිතයයි. "ශක්තියෙන්" යනු උත්සාහයන් සහ ලැදියාවන්ය.
- **ද්විතිය නිති සංග්‍රහය 6:7.** "ගෙයි ... මග ..." යන්නෙන් අදහස් වන්නේ ඕනෑම ස්ථානයක්ය. "සයනය කරන කල ... නැගිටින කල" යන්නෙන් අදහස් වන්නේ ඕනෑම වේලාවක්ය.
- **ද්විතිය නිති සංග්‍රහය 6:8.** "අතෙහි" යන්නෙන් අප කරන සියල්ල දෙවියන්-වහන්සේට කීකරුවිය යුතු බව දක්වයි. "ඇස් අතරෙහි/නළලෙහි" යන්නෙන් අප සිතන සියල්ල දෙවියන්වහන්සේට කීකරුවිය යුතු බව දක්වයි.

## ⊙ කිරීමට යමක්

සමිඳුණන්වහන්සේ පමණක් දෙවියන්-වහන්සේ බව 4 වන පදය පවසයි. ඉශ්‍රායෙල් සෙනඟට වෙනත් දෙවියන්-වහන්සේ කෙනෙක් නැත. ඉශ්‍රායෙල් සෙනඟ වෙනත් දෙවිවරුන් නමස්කාර නොකළ යුතුය.

ප්‍රධාන පනත 5 වන පදයයි. අවධානය "මුළු" යන්න කෙරෙහිය. සෙනඟ දෙවියන්වහන්සේට තමා මුළුමනින්මත් තමා සතු සියල්ලෙන්මත් ප්‍රේමකළ යුතුය. දෙවියන්වහන්සේට දක්වන නිවැරදි ප්‍රතිචාරය වන්නේ ප්‍රේමයයි. ප්‍රේමය, පක්ෂපාති සහ විශ්වාසවන්ත වන අතර දිගුකාලයක් පවති. ප්‍රේමය ක්‍රියාවලින් පෙන්වයි. ප්‍රේමය හුදු හැඟිමක් නොවේ. දෙවියන්වහන්සේගේ සෙනඟ දෙවියන්-වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවක් පවත්වාගත යුතුය.

දෙවියන්වහන්සේට කීකරුවීම පැමිණෙන්නේ ප්‍රේමණීය හදවතකින්ය. එබැවින් පනත් තිබිය යුත්තේ සෙනඟගේ හදවත් තුළය (6 පදය). දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව (වචනය) දිනපතා කියවමින් සිතා බලන්නැයි බයිබලය අපට පවසන්නේ එනිසාය (ගිතාවලිය 1:2).

- *අප දෙවියන්වහන්සේගේ වචනය අපගේ හදවත් තුළට ගන්නේ කෙසේද?*

7-9 පද. දෙමව්පියන් තම දරුවන්ට දෙවියන්වහන්සේගේ වචනය පිළිබඳව ඉගැන්විය යුතුය. මෙය සෑම තැනකදීම හා සෑම වේලාවකම කළ යුතුය. දෙවියන්-වහන්සේගේ පනත් කොපමණ වැදගත් දැයි මෙය පෙන්වයි. සෙනඟ කරන සහ සිතන සියල්ල දෙවියන්වහන්සේට කීකරුවිය යුතු බව 8 වන පදය අදහස් කරයි. අපගේ නිවෙස් දෙවියන්වහන්සේට කීකරුවිය යුතු බව 9 පදයෙන් අදහස් කෙරේ.

## ⊕ ප්‍රධාන කරුණ

**ඔබගේ මුළු හෘදයෙන් දෙවියන්වහන්සේට ප්‍රේම කරන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 6:4-9

**⊳ ආරම්භය**

"ශ්‍රේෂ්ඨතම ආඥාව කුමක්ද?" යි මනුෂ්‍යයෙක් යේසුස්වහන්සේගෙන් ඇසුවේය. "ඔබගේ ස්වාමිවූ දෙවියන්වහන්සේට මුළු හදවතින්ම ප්‍රේම කරන්න" යි යේසුස්වහන්සේ පැවසූ සේක. යේසුස්වහන්සේ උපුටා දැක්වූයේ ද්විතීය නීති සංග්‍රහය 6:5 ය. මේ ආඥාව ඉතාම වැදගත්ය.

**සමිඳුණන්වහන්සේ පමණක්ම දෙවියන්වහන්සේ වන සේක.**

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 6:4***

දෙවියන්වහන්සේ වන්නේ සමිඳුණන්වහන්සේ පමණක් බව මෝසෙස් දැනටමත් පවසා ඇත. වෙනත් කෙනෙක් නැත (ද්විතීය නීති සංග්‍රහය 4:35). ඉශ්‍රායෙල් සෙනඟට සමිඳුණන්වහන්සේ පමණක් දෙවියන්වහන්සේය. වෙන කිසිදු දෙවිකෙනෙක් සැබෑ නැත.

**ඔබේ මුළු හෘදයෙන් දෙවියන්වහන්සේට ප්‍රේම කරන්න**

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 6:5-6***

සමිඳුණන්වහන්සේ පමණක් දෙවියන්වහන්සේ වන්නේ නම් සෙනඟ ඔවුන්ගේ මුළු හෘදයෙන්, ආත්මයෙන් සහ ශක්තියෙන් උන්වහන්සේට ප්‍රේම කළ යුතුය. *හෘදයෙන්, ආත්මයෙන් සහ ශක්තියෙන් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඔබගේ අසන්නන්ට පවසන්න.* දෙවියන්වහන්සේට අපගේ මුළු ප්‍රේමයම අවශ්‍යය.

ප්‍රධාන දෙය වන්නේ ප්‍රේමයයි. අප ප්‍රේමයෙන් දෙවියන්වහන්සේට කීකරුවිය යුතුය. ප්‍රේමය හැඟීමක් පමණක් නොවේ. ප්‍රේමය ක්‍රියාවෙන් පෙන්නුම් කෙරේ. අප දෙවියන්වහන්සේගේ පනත්වලට අකීකරුවන කල අපි උන්වහන්සේට ප්‍රේම කරන්නෙමු යයි පැවසිය නොහැකිය.

- ඔබ දෙවියන්වහන්සේට කොපමණ ප්‍රේම කරන්නේද? අප අපගේ මුළු හෘදයෙන් දෙවියන්වහන්සේට ප්‍රේම කරනු පිණිස (5 පදය) දෙවියන්වහන්සේගේ පනත් අපගේ හදවත්වල තැන්පත් කරගත යුතුය (6 පදය).

**දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමට අපගේ හදවත් සකසා ගන්නේ කෙසේද?**

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 6:7-9***

දෙවියන්වහන්සේගේ පනත් අපගේ හදවත්වල තැන්පත් කරගැනීම සඳහා:

- සැමවිටම ඒවා අපගේ දරුවන්ට **ඉගැන්විය යුතුය** (7 පදය).
- අප කරන සහ සිතන දේ නිවැරදි විය යුතු බව **අපටම සිහි කරගනිමු** (8 පදය).
- අපගේ නිවෙස් තුළට ඇතුල්වන විට හා පිටවන විට දෙවියන්වහන්සේගේ පනත් **අපටම සිහිපත් කරගනිමු** (9 පදය).

අප මුළු කාලය පුරාම දෙවියන්වහන්සේගේ පනත් කල්පනාවේ තබාගත යුතුය. එසේ වන්නේ නම් පනත් අපගේ හදවත් සහ ජීවිතවල ගැඹුරට යනු ඇත. අප සැබෑවටම දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නේ නම්, අප උන්වහන්සේගේ පනත්වලට ආසා කර නිතර ඒවා කියවා අපගේ ජීවිතවල ඒවා අනුගමනය කරනු ඇත.

කිතුනුවන් වනාහි ඉශ්‍රායෙල් සෙනඟට සමාන පිරිසක් නොවේය. දෙවියන්වහන්සේගේ වචනය තමන්ගේ හදවත්වල ලියන පිණිස කිතුනුවන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ සිටී. අප දෙවියන්වහන්සේගේ පනත් නිතර කියවමින් ඒවා ගැන සිතන විට ආත්මයාණන් මෙය කරන සේක.

⊕ **නිදසුන**: ඇතැම් අය "යේසුස්වහන්සේ කුමක් කරනු ඇත්ද?" යන අදහස සංකේතවත් කරන පටියක් මැණික් කටුවෙහි පළඳති. ඒ ඔවුනට දෙවියන්වහන්සේට කීකරුවීම හා ප්‍රේමකිරීම සිහිපත් කරවනු පිණිසය.

*ඔබේ අසන්නන්ගෙන් මෙසේ අසන්න. දෙවියන්වහන්සේගේ පනත් ඔබට වඩාත් සිහිපත් කරවීම සඳහා ඔබ කරන්නේ කුමක්ද? දෙවියන්වහන්සේට වඩාත් ප්‍රේමකිරීම සඳහා ඔබ කරන්නේ කුමක්ද?*

⊕ **යාච්ඤා කරන්න**: *මුළු කාලය පුරාම දෙවියන්වහන්සේට ප්‍රේමකිරීමටත් කීකරුවීමටත් ඔබට උපකාර කරන මෙන් ඉල්ලා යාච්ඤා කරන්න.*

## අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 6:20-25

# 15 ඔබේ දරුවන්ට උගන්වන්න

### පසුබිම

පොරොන්දු දේශයට ඇතුල්වී එහි ජීවත්වීම සඳහා මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ සූදානම් කරයි. දෙවියන්වහන්සේ පසුගිය කාලයේ කළ දේ ගැනත් දෙවියන්වහන්සේගේ පනත්වලට ඔවුන් අවනත විය යුත්තේ කුමක් නිසාද යන්නත් තම දරුවන්ට උගන්වන්නැයි ඔහු සෙනඟට පවසයි.

### 20-25 පද කියවන්න

### සටහන්

- **ද්විතීය නීති සංග්‍රහය 6:21-22.** මෙහි දැක්වෙන්නේ නික්මයාම පිළිබඳවය. නික්ම. 7-14 බලන්න.
- **ද්විතීය නීති සංග්‍රහය 6:23.** "අපේ පියවරුන්" හෝ "ආදි පියවරුන්" වන්නේ ආබ්‍රහම්, ඊසාක් හා යාකොබ්ය. දේශය ආබ්‍රහම්ට දෙන බවට දෙවියන්වහන්සේ මුලින්ම පොරොන්දු වූයේ උත්. 12:7දීය.
- **ද්විතීය නීති සංග්‍රහය 6:24.** "ශුභ සිද්ධවන" යනුවෙන් අදහස් කරන්නේ සමෘද්ධිමත් හෝ සෙත සැලසෙන බවය.
- **ද්විතීය නීති සංග්‍රහය 6:25.** "ධර්මිෂ්ඨකම" යන්නෙන් අදහස් වන්නේ දෙවියන්වහන්සේ සමඟ නිවැරදි සබඳතාවකින් සිටින බවය.

### කිරීමට යමක්

"පනත්වලින් ඇති ප්‍රයෝජනය කුමක්ද?" මෙම ප්‍රශ්නය තම දෙමව්පියන්ගෙන් යම් දිනෙක අසනු ඇති දරුවකු මෝසෙස් සිහියට නගා ගනියි.

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට දරුවකු කීකරු විය යුත්තේ ඇයි? ඊට හේතුව දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ මිසරයෙන් පිටතට ගෙනවිත් පොරොන්දු වූ දේශයට පැමිණෙවූ නිසාය. පිළිතුර වෙතින් අවධානය යොමු කරන්නේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කෙරෙහිය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් පිළිපැදීමටත් දෙවියන්වහන්සේට "භය වෙන" පිණිසත් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ඔවුනට මඟපෙන්විය යුතුවේ. දෙවියන්වහන්සේට භයවීම ඇදහිල්ල තිබීම වැනිය.

ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේගේ පනත් පිළිපැදිය යුත්තේ ඇයි? ඒ ඔවුන් දැනටමත් දෙවියන්වහන්සේගේ සෙනඟ බවට පත්ව ඇති නිසාය. දෙවියන්වහන්සේ ඔවුන් ගළවාගත් සේක. දෙවියන්වහන්සේ ඔවුන් පොරොන්දු දේශය කරා ගෙන ආ සේක. ගළවාගනු ලැබූවන්ට ජීවත්වීමේ මාර්ගෝපදේශය වන්නේ පනතය.

දෙවියන්වහන්සේගේ පනත්වලට කීකරුවන ඉශ්‍රායෙල්වරුන් ධර්මිෂ්ඨයන් වනු ඇත. ඔවුන්ගේ කීකරුවීමෙන් අදහස් වන්නේ දැනටමත් ඔවුන්ට දෙවියන්වහන්සේ සමඟ සබඳතාවක් ඇති බවය. ඔවුහු උන්වහන්සේට භය වන්නෝය. ඇදහිල්ල කරණකොටගෙන ආබ්‍රහම් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨයෙක් විය (උත්. 15:6). නමුත් ඔහුගේ ඇදහිල්ල හා ක්‍රියාවන් එකට එක්ව සිදුවුණි (යාකොබ් 2:22). (අකීකරුකම හා ඇදහිල්ල නොමැතිකම එක්ව ක්‍රියාකරන බව දැකීමට අධ්‍යයනය 3 නැවත බලන්න). දෙවියන්වහන්සේ ඉදිරියේ නිවැරදි වූ ඉශ්‍රායෙල්වරයෙකු සතුව ඔහුගේ කීකරුකම තුළ පෙනියන ඇදහිල්ලක් ඇත.

දෙවියන්වහන්සේට කීකරුවීම සඳහා වූ හේතුව වැදගත්ය. දෙවියන්වහන්සේ විසින් පිළිගනු ලැබීම සඳහා එසේ කිරීම වැරදි හේතුවක්ය. නිවැරදි හේතුව වන්නේ දෙවියන්වහන්සේ විසින් දක්වනු ලැබූ අනුග්‍රහයට ප්‍රතිචාරය ලෙස එසේ කිරීමය. කීකරුකම තුළින් ඇදහිල්ල ප්‍රකාශ වන්නේය.

අපගේ දරුවන්ටද මෙය ඉගැන්වීම වැදගත් වේ. දෙවියන්වහන්සේට කීකරු වන්නේ කෙසේදැයි අප ඔවුන්ට ඉගැන්විය යුතුය. ඊටත් වඩා අවශ්‍ය වන්නේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ ශුභාරංචිය ඔවුන්ට ඉගැන්වීම මගින් කීකරුවීම සඳහා ඔවුන් ධෛර්යවත් කිරීමය.

### ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේ අප ගළවාගත් නිසා උන්වහන්සේ ප්‍රසන්න කරනු පිණිස අපි උන්වහන්සේට කීකරු වන්නෙමු.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 6:20-25

**ආරම්භය**

දරුවන් බොහෝ විට දෙමව්පියන්ගෙන් මෙසේ අසති. "ඇයි මා පිරිසිදු විය යුත්තේ?", "ඇයි මට මගේ යහළුවන් සමඟ සෙල්ලම් කරන්න බැරි?", "මා ගෙදරදොර වැඩපල කළ යුත්තේ ඇයි?" ඇතැම් දෙමව්පියන් දෙන පිළිතුරු වනු ඇත්තේ "මා කියන නිසා ඔබ එසේ කළ යුතුය" යන්නය.

- දෙවියන්වහන්සේගේ සෙනඟ දෙවියන්වහන්සේගේ පනත්වලට කීකරු විය යුත්තේ කුමක් නිසාද?

**ප්‍රශ්නය**

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 6:20***

තම දෙමව්පියන්ගෙන් ප්‍රශ්නයක් අසන දරුවකු පිළිබඳව මෝසෙස් සිතයි. "පනත්වල තේරුම කුමක්ද?" ප්‍රශ්නයෙන් අදහස් වන්නේ "ඇයි අප කීකරු වියයුත්තේ?" යන්නය. ඊට පිළිතුර කුමක්දැයි සෑම පරම්පරාවක්ම දැන සිටීම හා දෙවියන්වහන්සේගේ පනත්වලට කීකරුවීම සහතික කරගැනීමට මෝසෙස්ට අවශ්‍ය විය.

**පිළිතුර**

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 6:21-25***

පිළිතුර කොටස් 3කින් සමන්විතය.

1. දෙවියන්වහන්සේ තම සෙනඟ මිසරයෙන් මුදාගත් සේක (21-22 පද). *නික්මයාමේ කතන්දරය ඔබේ අසන්නන්ට පවසන්න.* සෙනඟ පනත්වලට කීකරුවිය යුත්තේ දෙවියන්වහන්සේ ඔවුන් මුදාගත් බැවිනි. දෙවියන්වහන්සේ පනත් ලබා දුන්නේ ඔවුන් උන්වහන්සේ උදෙසා ජීවත්වීම හා උන්වහන්සේට මුල්තැන දීම කරනු පිණිසය.
2. එමඟින් සෙනඟ පොරොන්දු දේශයෙහි යහතින් ජීවත්වනු ඇත (23-24 පද). දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ සෙනඟ සමෘද්ධිමත්ව දේශයේ යහතින් ජීවත්වීම දැකීමටය.
3. ඔවුන් කීකරුවන්නේ නම් ධර්මිෂ්ඨයන් වනු ඇත. *ධර්මිෂ්ඨකම යනු දෙවියන්වහන්සේ සමග නිවැරදිව සිටීම බව ඔබේ අසන්නන්ට පැහැදිලි කරන්න.* දෙවියන්වහන්සේ ඔවුන් පිළිබඳව සතුටුවන සේක. කීකරුකම තුළ දැකගත හැකිවූ ඇදහිල්ල මගින් ආබ්‍රහම් ධර්මිෂ්ඨයකු බවට පත්විය. සෙනඟ ඇදහිල්ල තුළින් කීකරුවිය යුතුය.

**අදාළ කිරීම**: දෙවියන්වහන්සේ කළ දෙය දෙමව්පියන් දරුවන්ට පැවසිය යුතුය. කීකරුවන්නේ කෙසේද, දෙවියන්වහන්සේගේ සෙනඟ ලෙස ජීවත්වන්නේ කෙසේද යන්න දෙමව්පියන් දරුවන්ට කියාදිය යුතුය. ඇදහිල්ල ඇතිව දෙවියන්වහන්සේට කීකරුවීමට හේතු දෙමව්පියන් දරුවන්ට පැහැදිලි කර දියයුතුය. *දෙවියන්වහන්සේ ගැන තම දරුවන්ට ඉගැන්වීමට ඔවුන් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව දෙමව්පියන්ට අභියෝග කරන්න.*

ඇදහිලිවන්තයන් පාපයෙන් බේරාගන්නට යේසුස්වහන්සේ මරණය වැළඳගත් සේක. කිතුනුවන්ට දෙවියන්වහන්සේට කීකරුවීමට අවශ්‍ය වන්නේත් සෑම දෙයකදීම මුල්තැන දෙවියන්වහන්සේට දියයුතු වන්නේත් මේ නිසාය. යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල කරණකොටගෙන අප ධර්මිෂ්ඨ කරනු ලැබ ඇත්තෙමු. දෙවියන්වහන්සේට කීකරුවීම මගින් අපි අපගේ ඇදහිල්ල පෙන්වන්නෙමු.

සියලු මිනිසුන් පව්කරන නිසා දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ එවූ සේක. යේසුස්වහන්සේගේ මරණය නිසා අපි ධර්මිෂ්ඨ කරනු ලැබ ඇත්තෙමු. කීකරුකම තුළ දැකගත හැකි ඇදහිල්ලක් සහිත ජීවිත අප ගතකළ යුතුය. සැබවින්ම යේසුස්වහන්සේ අනුගමනය කරන සියල්ලන්ට ඉදිරියේදී ලැබීමට ඇති දේ ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. ඔබගේ දරුවන්ට ඒ ගැන උගන්වන්න.

**යාච්ඤා කරන්න**: *කුරුසිය මතදී යේසුස්වහන්සේ ඔබ වෙනුවෙන් කළ දේ මතකයේ තබාගැනීමට ඔබට උපකාර කරන ලෙසත් වඩ වඩාත් උන්වහන්සේට කීකරුවීමට හා ප්‍රේම කිරීමට හැකිවනු පිණිසත් දෙවියන්වහන්සේගේ උපකාරය ඉල්ලන්න.*

# 16 ශුද්ධව සිටිනු පිණිස තෝරාගනු ලැබීම

**« පසුබිම**

පොරොන්දු දේශයට ඇතුල්ව එහි ජීවත්වීම පිණිස මෝසෙස් සෙනඟ සූදානම් කරයි. ලොකුම ප්‍රශ්නය වන්නේ දේශයේ ජීවත්වන ජාතීන්ය. මේ ජාතීන් නමස්කාර කරන්නේ ඔවුන්ගේ දෙවිවරුන්ටය. මෙම මිථ්‍යාදෘෂ්ටික දෙවිවරුන් නමස්කාර නොකරන ලෙස මෝසෙස් සෙනඟට අනතුරු අඟවන්නේය.

**1-11 පද කියවන්න**

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

**සටහන්**

- **ද්විතීය නීති සංග්‍රහය 7:1.** මෙම ජාතීන් සතම ජීවත්වූයේ පොරොන්දු දේශයේය.
- **ද්විතීය නීති සංග්‍රහය 7:2.** "සහමුලින්ම විනාශ කර දමන්න" සතුරු ජාතීන්ගෙන් එකෙකුවත් පණ පිටින් නොසිටිය යුතුය.
- **ද්විතීය නීති සංග්‍රහය 7:5.** "අෂේරා කණු" යනුවෙන් දැක්වෙන්නේ බොරු මිථ්‍යාදෘෂ්ටික දෙවිවරුන් නමස්කාරය සඳහා සදාගනු ලැබූ උස ලී කණුය.
- **ද්විතීය නීති සංග්‍රහය 7:6.** "සන්තක" වටිනා දෙය යනු තමන්ට අයත් ඉතාම අගනා දෙයයි. ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට අයත් ඉතා අගනා දෙයකි.
- **ද්විතීය නීති සංග්‍රහය 7:7.** "නුඹලා ස්වල්ප වූහ" යන්නෙන් අදාළ කර දක්වන්නේ ආබ්‍රහම් හා සාරාය. එහි වූයේ මනුෂ්‍යයන් දෙදෙනෙකු පමණක්ය.

**කිරීමට යමක්**

1 පදය. ජාතීන් ඉශ්‍රායෙල්ට වඩා බලවත්ය. නමුත් දෙවියන්වහන්සේ එම ජාතීන්ට වඩා බලවත්ය. එබැවින් ඉශ්‍රායෙල් සෙනඟ ජයගනු ඇත.

2-5 පද. ප්‍රධාන ගැටලුව වූයේ ජාතීන් වඩා බලවත් වීම නොවේ. ප්‍රධානතම ප්‍රශ්නය වූයේ ඔවුන්ගේ බොරු දෙවිවරුන්ය. ජාතීන්ගේ දෙවිවරුන් ඉශ්‍රායෙල් සෙනඟට අනතුරක් හෝ පරීක්ෂාවක් විය. එබැවින් ඉශ්‍රායෙල් සෙනඟ අනෙක් ජාතීන් සහමුලින්ම විනාශකර දැමිය යුතුය. ඔවුන් මේ ජාතීන්ගෙන් කිසිවෙකුත් සමඟ ආවාහ විවාහ නොවිය යුතුය. ඔවුන් මිථ්‍යාදෘෂ්ටික නමස්කාර කරන ස්ථාන හා පිළිම විනාශකර දැමිය යුතුය.

6 පදය. ඉශ්‍රායෙල් වෙනස් ආකාර අය විය යුතුය. ඔවුන්ට පිළිම හෝ වෙනත් දෙවිවරු නොසිටිය යුතුය. ඔවුන් දෙවියන්වහන්සේට මුල්තැන දියයුතුය. ශුද්ධව සිටීම යන්නෙන් අදහස් වන්නේ මෙයයි. ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේ විසින් තෝරාගෙන ඇත. ඔවුන් උන්වහන්සේගේ විශේෂිත සන්තක පිරිසකි. ඉශ්‍රායෙල් සෙනඟට දෙවියන්වහන්සේ ප්‍රේම කරන්නේය.

7-11 පද. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට ප්‍රේම කරන්නේ කුමක් නිසාද? ඒ උන්වහන්සේ ආබ්‍රහම්ට වූ පොරොන්දුව රකින නිසාය. ඉශ්‍රායෙල් සෙනඟ යනු ආබ්‍රහම්ගෙන් පැවත එන්නන්ය. ඔවුන් මිසරයෙන් ගළවාගනු ලැබිණි. එබැවින් ඔවුන් අන්‍යජාතීන්ට වඩා වෙනස් ආකාරයෙන් හැසිරිය යුතුය.

- *දෙවියන්වහන්සේ සමඟ ඇති සම්බන්ධතාව අප හැසිරෙන ආකාරය වෙනස් කරන්නේ කෙසේද?*

**⊕ ප්‍රධාන කරුණ**

**කිතුනුවන් යනු දෙවියන්වහන්සේට ශුද්ධ වූ සෙනඟක්ය.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 7:1-11

**ආරම්භය**
නරක දේ කිරීම සඳහා අප අවට සිටින පුද්ගලයන් පහසුවෙන් අපට මඟපෙන්වනු ඇත. නිදසුනක් ලෙස දරුවන් හා තරුණ අය තම පාසලේදී මත්ද්‍රව්‍ය ගැනීම හෝ දිවුරීම වැනි නරක පුරුදු කරා යොමුවීමට ඉඩ ඇත. වැඩිහිටියන්ද රැකියාව කරන කාලයේදී වංචාකිරීම හෝ මත්පැන් පානය වැනි වැරදි ක්‍රියාවන්ට යොමුවීමට ඉඩ ඇත. *ඔබ සිටින ස්ථානයේ දැකගත හැකි නරක ආදර්ශ පිළිබඳ අදහසක් ඔබගේ අසන්නන්ට ලබාදෙන්න.*

**වැරදි ආදර්ශ**
***කියවන්න: ද්විතීය නීති සංග්‍රහය 7:1-5***

ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශයට ඇතුල්වීමට ඉතාම ආසන්නව සිටියි. දේශයෙහි සිටින ජාතිහු වෙනත් දෙවිවරුන් නමස්කාර කරති. එබැවින් දෙවියන්වහන්සේගේ සෙනඟට එම ජාතීන් මෙන්ම ඔවුන්ගේ නමස්කාර කරන ස්ථානද විනාශ කර දැමීමට සිදුවිය. කුමක් නිසාද යත් මෙම ජාතීන් දෙවියන්වහන්සේගේ සෙනඟට නරක ආදර්ශයක් වන බැවිනි.

ඉශ්‍රායෙල් සෙනඟ මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ පිළිම සහ පූජාසන විනාශ කළයුතුය. වැරදි නමස්කාරයක් කිරීමේ පරීක්ෂාව මේවා මගින් ඔවුන්ට ලැබෙනු ඇත. පරීක්ෂාවන්ට එරෙහිව සටන් වැදීමට තරම් අප ශක්තිමත් බව ඇතැම් විට අපි සිතන්නෙමු. නමුත් සෙනඟ බොහෝ විට දුර්වලය. අප පරීක්ෂාවක් වෙතින් ඉවතට දිව යායුතුය. එබැවින් ඉශ්‍රායෙල් සෙනඟ පිළිම ඉවත්කර දැමිය යුතුය. එවිට ඔවුන් වෙත පරීක්ෂාවක් නොවනු ඇත.

**දෙවියන්වහන්සේගේ සෙනඟ වෙනස් පිරිසක් වන්නේ ඇයි?**
***කියවන්න: ද්විතීය නීති සංග්‍රහය 7:6-8***
*දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනග තෝරාගන්නේ කුමක් නිසාදැයි ඔබේ අසන්නන්ට පැහැදිලි කර දෙන්න.*

ඇතැම් විට අප සිතන්නේ "ශුද්ධ" යනු විශේෂ සාන්තුවරුන් ගැන දක්වන්නක් ලෙසය. එහෙත් දෙවියන්වහන්සේගේ සියලුම සෙනඟ ශුද්ධවතුන්ය. ඉන් අදහස් වන්නේ අප දෙවියන්වහන්සේට අයත් බවය. එය සිදුකරන්නේ අප තමන්වහන්සේට අයත්කරගැනීමට දෙවියන්වහන්සේ කළ තෝරාගැනීම තුළය.

**අදාළ කිරීම**: *මේවා ගැන ඔබේ අසන්නන්ට අභියෝග කරන්න. ඔවුන් සැබවින්ම දෙවියන්වහන්සේට අයත් වන්නේද? ඔවුන් ශුද්ධ ද? ඔවුන් තම ජීවිතවල මුල්තැන දෙන්නේ දෙවියන්වහන්සේටද? ඔවුන් ජීවත් වන්නේ/ හැසිරෙන්නේ නොඇදහිලිවන්තයන්ට වඩා වෙනස් ආකාරයකින්ද?*

**නිදසුන**: ඇදහිලිවන්තයකු නොවන්නෙකු වෙනත් රටක සංචාරය කරමින් සිටී. කිතුනුවකු මුණ ගැසුණු සෑම විටකදීම ඔවුන් වෙනස් ආකාරයකින් හැසිරෙනු ඔහු දැක ඇත. ඔවුන් අවංකය. ඔවුන් ආදරණීය පුද්ගලයන්ය. ඔවුන් වෙනස් පුද්ගලයන්ය. ඔහුගේ මුදල් පසුම්බිය නැතිවූ අවස්ථාවේ ඔවුන් ඔහුට උපකාර කළේය. ඔහු අසනීපව සිටින විට ඔවුහු උවටැන් කළෝය.

**වෙනස් අය වන්න**
***කියවන්න: ද්විතීය නීති සංග්‍රහය 7:9-11***
දෙවියන්වහන්සේ විශ්වාසවන්තය. දෙවියන්වහන්සේ තවමත් තම සෙනඟට ප්‍රේමකරන සේක. 11 වන පදයේ ඇති පනතෙන් දැක්වෙන්නේ මෙම මුළු පරිච්ඡේදය ගැනමය. දෙවියන්වහන්සේගේ සෙනඟ ශුද්ධ නිසා, දෙවියන්වහන්සේගේ සෙනඟ වෙනස් අය නිසා, දෙවියන්වහන්සේගේ සෙනඟ දෙවියන්වහන්සේ විසින්ම තෝරාගෙන ප්‍රේමකරනු ලබන නිසා දෙවියන්වහන්සේගේ ආඥා අනුගමනය කළ යුතුය. එබැවින් දෙවියන්වහන්සේගේ සෙනඟ දෙවියන්වහන්සේට කීකරුව උන්වහන්සේගේ පනත් රැකිය යුතුවේ.

- ඔබේ පිවිතය ගැන සිතන්න. ඔබ ජීවත් වන ආකාරය ගැන නොඇදහිලිවන්තයන්ට කුමක් පවසනු ඇතිද?

**යාච්ඤා කරන්න**: *ඇදහිලිවන්තයන් නොවන අයට වෙනස්ව සිටීම සඳහා දෙවියන්වහන්සේගේ සෙනගට ශක්තිය දෙන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

## ⬇ අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 8:1-20

# 17 නිහතමානී වන්න, ආඩම්බර නොවන්න

### « පසුබිම

සෙනඟ පාළුකරයෙහි වසර 40කට ආසන්න කාලයක් සිටියෝය. පාළුකරය තුළ දෙවියන්-වහන්සේ සෙනඟ පරීක්ෂා කළ සේක. පාළුකරය දුෂ්කර හා වියළි ස්ථානයක් විය. එහි ජීවත්වීම පහසු නොවීය. පොරොන්දු දේශය මෙයට හාත්පසින්ම වෙනස්ය.

### 1-20 පද කියවන්න

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 8:3.** "මන්නා" යනු දෙවියන්වහන්සේගෙන් ලැබුණු විශේෂ කෑමකි. "මන්නා" යන වචනයේ තේරුම "මේ මොනවාද" යන්නය. ඒවා කුමක්දැයි කිසිවෙකුත් දැන සිටියේ නැත.
- **ද්විතිය නිති සංග්‍රහය 8:12.** "තෘප්තියට" පත්වීම. සෙනඟට අවශ්‍ය සියලු දේ ලැබෙනු ඇත.
- **ද්විතිය නිති සංග්‍රහය 8:17.** "නුඹේ සිතින් නොකියන" යන්න මුල් වචනයේ ඇත්තේ "ඔබේ හදවතින් කියා නොගන්නා" යනුවෙනි.

### කිරීමට යමක්

8 වන පරිච්ඡේදය කියවා "සිහිකර පන්න", "මතක නැති නොකරන්න", "උඩඟු නොවන්න" හා "සටහන් කර" යන වචන සිතට ගන්න. මේ වචන මෙම පරිච්ඡේදයේදී ඉතා වැදගත් වේ.

1-6 දක්වා පද. වසර සතළිසක් පාළුකරයේ සිටීම දෙවියන්-වහන්සේ දුන් පරීක්ෂාවකි. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට බඩගින්නේ ඉන්නට සලස්වා අමුතුම ආහාරයක් දුන්සේක. දෙවියන්වහන්සේ පළමුවරට මන්නා දුන්නේ නික්මයාම 16දිය. සබත් දිනට පෙර රාත්‍රියේ හැරෙන්නට අනෙක් සෑම රාත්‍රියකම එය නරක් විය. සෙනඟ යටහත් පහත් කරනු පිණිස දෙවියන්වහන්සේ කළ එක් ප්‍රාතිහාර්යක් මෙයයි.

7-10 පද. පාළුකරයේ ආහාර එතරම් නොවීය. පොරොන්දු දේශයේ ආහාර සුලබය.

11-14 පද. දේශයේ ටික කලක් වාසය කළ පසු සෙනඟ සතු දේ වැඩි වන්නට පටන්ගනී. ඔවුන් තෘප්තියට පත්වනු ඇත. නමුත් අනතුර වන්නේ ආඩම්බරයකි. උඩඟු පුද්ගලයන් දෙවියන්වහන්සේ මත යැපෙන්නේ නැත.

15-18 පද. දේශයේ සිටින කල ආඩම්බර නොවනු පිණිස පාළුකරයේ සිටි කාලය මතකතබාගන්නැයි මෝසෙස් සෙනඟට පවසයි. 17 වන පදයේ ඇති වචන පැන නගින්නේ උඩඟු හදවතකින්ය. "වස්තුව" යනු ධනවත්කමකි.

19-20 පද. උඩඟුකම මගින් රූප වන්දනය, වෙනත් දෙවිවරුන් නමස්කාරය යනාදිය වෙත මඟ පෙන්වයි. වෙනත් දෙවිවරුන් නමස්කාර නොකරන ලෙස මෝසෙස් සෙනඟට අනතුරු අඟවයි.

- *මිනිසුන්ගේ හදවත් එතරම් ආඩම්බර වන්නේ ඇයි? හදවත්/ සිත් ආඩම්බර වන්නේ කුමක් නිසාදැයි ඔබ දන්නේ නම් ඔබේ දේශනාව වඩා බලවත් වනු ඇත. ආඩම්බරකම ඇතිවන්නේ පාළුකරය වැනි දුෂ්කර කාලයන්හිද නැතිනම් පොරොන්දු දේශය වැනි පහසු කාලයන්හිද?*

### ⊕ ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේ ඔබ යටහත් පහත්/ නිහතමානී කෙනෙකු කළ අයුරු මතක තබාගන්න. තවදුරටත් නිහතමානී වෙමින් උන්වහන්සේ මත යැපෙන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 8:1-20

⊕ **නිදසුන**: කෙනෙකුගේ බිරිඳ මිය යන්නේය. ඔහුට රැකියාවක්ද නැත. ඔහු බඩගින්න නිසා දෙවියන්වහන්සේට ඒ බව කියන්නේය. ඔහුගේ ඇඳහිල්ල ගිලිහී යන්නේය. මේ අතර වෙනත් කාන්තාවක් තමාගේ ජීවිතය යහපත්ව තිබෙනු දකින්නිය. ඇයට තවත් බොහෝ දේවල් ලැබෙන අතර පොහොසත් වන්නිය. නමුත් ඇය දෙවියන්වහන්සේ වෙතින් ඉවතට යන්නිය.

- මිනිසුන් දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගෙන යන්නේ නරක කාලයන්ද හොඳ කාලයන්ද?

### පාළුකරයේ පරීක්ෂාව මතකතබාගන්න.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 8:1-6***

පාළුකරයේ වසර සතළිසක් ජීවත් වූ ආකාරය මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට සිහිපත් කරයි. *දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට බඩගින්නේ ඉන්නට සලස්වා ඉන්පසු මන්නා කෑමට දීමෙන් ඔවුන් යටහත් පහත් කළ අයුරු ඔබේ අසන්නන්ට පැහැදිලි කර දෙන්න.* යටහත් පහත් වීම/ නිහතමානී වීම යනු මෙයයි. එය දෙවියන්වහන්සේ මත යැපීම පිළිබඳවය. ඉශ්‍රායෙල් සෙනඟ අතීතය අමතක නොකර සිහියේ තබාගත යුතුය.

### පොරොන්දු දේශය ඉතා වෙනස්ය.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 8:7-11***

පොරොන්දු දේශය පාළුකරයට හාත්පසින්ම වෙනස් තැනකි. පොරොන්දු දේශයේ බොහෝ යහපත් දේ ඇත. ජලය පිරුණු ගංගාවන්, බහුලව හවබෝග, බොහෝ පළතුරු, තඹ යනාදිය ඇත. පළමුව සෙනඟ දෙවියන්-වහන්සේට ස්තුති කරනු ඇත (10 පදය).

### පොරොන්දු දේශයද පරීක්ෂාවක්ය

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 8:12-18***

පොරොන්දු දේශයේදී ඉශ්‍රායෙල් සෙනඟට සතුන්, රිදී, රත්රන් වැනි දේවල් ලැබෙනු ඇත. ඔවුන්ට සියල්ල තිබෙනු ඇත. නමුත් මේ අනතුර ඇත. සෙනඟ දෙවියන්වහන්සේ සහ උන්වහන්සේ කළ දේ අමතක කළහොත් ඔවුන් ආඩම්බරයට පත්වනු ඇත. තමන් පොහොසත් වූයේ දෙවියන්වහන්සේ නිසා නොව තමන්ගේම ශක්තියෙන් යැයි ඔවුන් සිතනු ඇත.

පාළුකරයේ පරීක්ෂාව ඉශ්‍රායෙල් සෙනඟ යටහත් පහත් කරනු ලැබීම සඳහා විය. පොරොන්දු දේශයේදී ද ඔවුන් තවදුරටත් යටහත් පහත්ව සිටිය යුතුය. ආඩම්බරකම බොහෝ විට දක්නට ඇති පාපයක්ය. ආඩම්බර පුද්ගලයා සිතන්නේ තමන් දෙවියන්වහන්සේ මත යැපිය යුතු නැතැයි කියාය. තමන්ට අවශ්‍ය දේ තමන්ටම ලබාගත හැකි යැයි ආඩම්බර පුද්ගලයකු සිතන්නේය (17 පදය). එබැවින් ප්‍රවේසම් වන්න. ඔබ ආඩම්බර අයෙක්ද?

### රූප වන්දනාත් අනතුරුය

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 8:19-20***

සෙනඟ ආඩම්බර වන්නේ නම් ඔවුන් වෙනත් දෙවිවරුන් නමස්කාර කරනු ඇත. ඔවුන් සැබෑ දෙවියන්වහන්සේ විශ්වාස නොකරනු ඇත. රූප වන්දනයට එරෙහිව මෝසෙස් සෙනඟට තරයේ අවවාද කරයි.

ⓘ **අදාළ කිරීම**: දෙවියන්වහන්සේගේ සෙනඟ සැමවිටම දෙවියන්වහන්සේ මත පදනම් වියයුතුය. අප නිහතමානී අය කරගැනීමට අප වගබලා ගතයුතුය. ඉශ්‍රායෙල් සෙනඟට පාළුකරයේ දෙවියන්-වහන්සේ කළ දෙය සිහිපත් කරගන්න. යේසුස්වහන්සේ කුරුසය තුළින් ඔබ උදෙසා දෙවියන්වහන්සේ කළ දෙය සිහිපත් කරගන්න. උන්වහන්සේ ඔබට සපයා දෙමින් උපකාර කළ අයුරු මතක්කරගන්න.

⊕ **යාච්ඤා කරන්න**: *ඔබගේ ආඩම්බරය දකින්නට ඔබට උපකාර කරන මෙන් දෙවියන්-වහන්සේගෙන් ඉල්ලන්න. උන්වහන්සේ ඔබට දෙන සියලු දේ ගැන උන්වහන්සේට ස්තුති කරන්න.*

# 18 ඔබ අසාර්ක වූ අයුරු මතකතබාගන්න

### 4-24 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 9:4.** බොහෝ විට "ධර්මිෂ්ඨ" යන්නෙන් අදහස් කරන්නේ දෙවියන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවකින් සිටීමය. මෙම පදයේ ඉන් අදහස් කරන්නේ "යහපත්" යන්නය.
- **ද්විතිය නිති සංග්‍රහය 9:6.** "තද කුළල්" ඇති යනු මුරණ්ඩු/ හිතුවක්කාර බවය. හරියටම ඔබට අවශ්‍ය තැනට යන්නට අකමැති ගොනෙකු හෝ බුරුවෙකු වැනිය.
- **ද්විතිය නිති සංග්‍රහය 9:9.** "ගිවිසුම් ලැලි" යනුවෙන් දක්වන්නේ දෙවියන්-වහන්සේ දසපනත ලියා දුන් ගල්ලැලිය. "ගිවිසුම" යනුවෙන් අදහස් කරන්නේ විවාහයක් වැනි ශක්තිමත් එකට බැඳ තබන සම්බන්ධතාවක්ය.
- **ද්විතිය නිති සංග්‍රහය 9:18.** "වැටී/ මුණින් තළා වැඳ වැටී" (නව) යනු මුහුණ බිමට සිටින සේ බිම දිගාවී වැඳ වැටීමය.

### කිරීමට යමක්

නමස්කාර කිරීම සඳහා සෙනඟ සීනයි කන්දේදී රන් වස්සෙකු සාදාගැනීම මගින් ඉශ්‍රායෙල්වරුන් විප්ලව කළ අයුරු මෝසෙස් ඔවුන්ට සිහිපත් කරවයි.

- *දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනගට දේශයක් ලබාදුන්නේ ඇයි?*

4-6 පද. දෙවියන්වහන්සේ පොරොන්දු වූ දේශය සෙනඟට දෙනවිට තමන් අනෙක් ජාතින්ට වඩා යහපත් යැයි සෙනඟ සිතන්නට ඉඩ ඇත. දේශය දෙවියන්-වහන්සේ දුන් ත්‍යාගයක් ලෙස ඔවුන් සිතන්නට ඉඩ තිබේ. එබැවින් ඔවුන් අනෙක් ජාතින්ට වඩා ධර්මිෂ්ඨ අය නොවන බව මෝසෙස් සෙනඟට පවසයි. දේශය දෙවියන්වහන්සේගෙන් ලැබෙන ත්‍යාගයක්ය. සෙනඟ මුරණ්ඩුය. ඔව්හු දෙවියන්වහන්සේට කීකරුවීම ප්‍රතික්ෂේප කරති.

7, 22-24 පද. මිනිසුන් සැමවිටම දෙවියන්-වහන්සේට එරෙහිව කැරලි ගසති. නික්මයාම හා ගණන් කථාවේ අපට පෙනෙන්නේ ඉශ්‍රායෙල්වරුන් නිතරම මැසිවිලි නගමින් දෙවියන්වහන්සේට එරෙහිවූ අයුරුය. මෝසෙස් මෙහිදී ඒ ගැන සාරාංශ වශයෙන් දක්වයි. දෙවියන්-වහන්සේට එරෙහිව කැරලි ගැසීම යනු අකීකරු බව හා දෙවියන්වහන්සේ විශ්වාස නොකිරීමය. පොරොන්දු දේශය ලැබීමට සෙනඟ සුදුස්සෝ නොවෙති.

8-17 පද. සෙනඟ කළ ලොකුම පාපය වන්නේ නමස්කාර කිරීම සඳහා රන් වස්සකු සාදා ගැනීමය. සම්පූර්ණ කතන්දරය දැනගැනීමට නික්මයාම 32-34 දක්වා කියවන්න. සෙනඟ දස පනතේ මුල් ආඥා දෙකටම අකීකරු වූවෝය. එය ඔවුන් මිසරයෙන් මුදාගෙන ආවාවූ දෙවියන්-වහන්සේට ගොරහැඩි ලෙස නරක ආකාරයෙන් සැලකීමකි.

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ සමඟ කෝප වූ සේක. දෙවියන්වහන්සේට ඔවුන් විනාශ කිරීමට අවශ්‍ය විය. මෝසෙස් ගල්ලැලි දෙක කඩා දැමුවේය. මෙය හරියටම ලියන ලද එකඟතා පත්‍රයක් හෝ විවාහ සහතිකය ඉරා දැමීමක් හා සමානය. එය තමන්වහන්සේගේ සෙනඟ සමඟ ඇති සියලු සබඳතා නවත්වා දැමීමට දෙවියන්-වහන්සේට අවශ්‍ය වූ බවට සංඥාවක්ය. උන්වහන්සේට ගිවිසුම අහෝසි කිරීම අවශ්‍ය විය.

### ප්‍රධාන කරුණ

**ඔබ පව්කාරයකු බව කිසිවිට අමතක නොකරන්න.**

# ➙ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 9:4-24

**ආරම්භය**

දෙවියන්වහන්සේව ලැබීමට අප සුදුස්සන් යැයි සිතිම පහසුය. එනම් අප එතුමාණන් උපයා ගෙන ඇත හෝ ඒ සඳහා අයිතිවාසිකමක් ඇත යන්නය. “මා අර පුද්ගලයාට වඩා යහපත් අයෙකි මා යහපත් නිසා ස්වර්ගයට යාමට මට සුදුසුකම් ඇතැයි අපට සිතිය හැකිය.”

- ඇතැම් විට ඔබත් එසේ සිතනවාද?

**දේශය ලැබීමට සෙනඟට සුදුසුකමක් නොමැත.**

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 9:4-6***

ඉශ්‍රායෙල්වරුන් දේශයට ඇතුල් වනවිට තමන් අනෙක් ජාතීන්ට වඩා යහපත් යැයි ඔවුන් සිතන්නට ඉඩ ඇත. දේශය ලැබීමට තමන් සුදුස්සන් යැයිද ඔවුන්ට සිතෙන්නට පුළුවන. මෝසෙස් ඔවුන්ට පවසන්නේ ඔවුන් සුදුස්සන් නොවන බවය. ඉශ්‍රායෙල් සෙනඟ මුරණ්ඩු පිරිසක්ය.

**නිදසුන**: සමහරවිට ඔබගේ වත්තේ හෝ කුඹුරුවල ප්‍රයෝජනයට ගන්නා සතෙකු සිටිනවා වියහැකිය. එම සතා මුරණ්ඩු වූ විට තම බෙල්ල තදකරගෙන සිටියි. ඉශ්‍රායෙල් සෙනඟත් එවැන්නන් විය.

**සෙනඟ නිතරම දෙවියන්වහන්සේට විරුද්ධව අරගල කරති.**

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 9:7,22-24***

සෙනඟ මිසරයෙන් පිටත්ව ආපසු බොහෝවර ආහාර, ජලය, තම නායකයන් හා පාළුකරය ගැන බොහෝ චෝදනා කළෝය.

**සෙනඟගේ ලොකුම පාපය වූයේ රූප වන්දනයයි**

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 9:8-21***

සෙනඟ කළ ලොකුම පාපය නම් සීනයි කන්දේදී රූපයක් අඹා ගැනීමය. එම රූපය රනින් සාදා තිබූ අතර වස්සකු වැනි විය. දෙවියන්වහන්සේ කෝපව තම සෙනඟ විනාශකර දමන්නට තීරණය කළ සේක. රූපයක් සාදා ගැනීම ආත්මික කාම-මිථ්‍යාචාරයක් වැනිය. දෙවියන්වහන්සේ දැඩිව කෝප වුයේ එබැවින්ය. දස පනත ලියා තිබු ගල්ලෑලි දෙක මෝසෙස් විසින් බිඳ දමනු ලැබුවේද ඒ නිසාය.

**නිදසුන**: එය ඔබගේ විවාහය සිදුවන දවස යැයි සිතන්න. දිනය අවසානයේ රාත්‍රිය ගතකිරීම සඳහා ඔබ ඔබගේ කාමරයට යන්නේය. ඒ වන විටත් ඔබේ සැමියා/ බිරිඳ කාමරයේ සිටී. ඔබ උද්යෝගයෙන් හා සතුටින් සිටී. ඔබ දොර විවෘත කළ විට දකින්නේ ඔබේ සැමියා/ බිරිඳ වෙනත් අයෙකු සමඟ යහනේ සිටින අයුරුය. ඔබ අතිශය කෝපයට පත්වේ. විවාහ සහතිකය ඉරා දමන්නේය. සම්බන්ධතාවන් කෙළවර වන්නේය.

**අදාළ කිරීම**: ඉශ්‍රායෙල් සෙනඟ දේශයට ඇතුල්වීමට තරම් සුදුස්සෝ නොවෙති. නමුත් අනුග්‍රහය නිසා දෙවියන්වහන්සේ පසුව ඉශ්‍රායෙල් සෙනඟට දේශය දුන්සේක. ස්වර්ගයට ඇතුලුවීමට තරම් අපි සුදුස්සන් නොවෙමු. අතීතයේ අප දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගැසූ අයුරු සිහිපත් කරගන්න. අප සුදුසු වන්නේ නිරයටය. දෙවියන්වහන්සේ ස්වර්ගයට ඇතුලුවීමට අපට අවසර දෙන්නේ යේසුස්වහන්සේ තුළ උන්වහන්සේ දක්වන අනුග්‍රහය කරණකොට පමණක්මය. අප කිසිවිටෙක ස්වර්ගයට යාමට සුදුස්සන් ලෙස නොදැකිය යුතුවේ.

**යාච්ඤා කරන්න**: *ඔබගේ කිසිදු සුවිශේෂීත්ව-යක් නොමැති බව මතකතබාගන්නට ඔබට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය හා සමාව ගැන උන්වහන්සේට ස්තුති කරන්න.*

# 19 අන්‍යයන් උදෙසා යාච්ඤා කරන ආකාරය

**⪡ පසුබිම**

මෝසෙස් සෙනඟට ඔවුන් කළ පාපය, එනම් සිනයි කන්දේදී රූපයක් සාදාගැනීම සිහිපත් කරයි. සෙනඟ විනාශ කර දැමීමට දෙවියන්වහන්සේට අවශ්‍ය විය. මෝසෙස් සෙනඟ උදෙසා යාච්ඤා කළේය.

**⌄ 25-29 පද කියවන්න**

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

**⩔ සටහන්**

- **ද්විතිය නිති සංග්‍රහය 9:26.** "උරුමය" මෙයින් අදහස් වන්නේ දෙවියන්වහන්සේගේ දරුවන් වැනි බවය. "මුදාගන්නාවූ" යනු බේරා ගැනීම හෝ වහල්කමින් මිලදී ගැනීමය.

**⊙ කිරීමට යමක්**

- *ඔබගේ සෙනග අකීකරු හා මුරණ්ඩු වන විට ඔවුන් උදෙසා යාච්ඤා කිරීම ඔබ කොපමණ බරපතළ ලෙස සලකන්නේද?*

මෝසෙස් තම ජනතාව උදෙසා යාච්ඤා කළ ආකාරය දකින කල අපට පෙනෙනුයේ මෙම ඡේදය නායකයන්ට මහත් අභියෝගයක් වන බවය.

මෝසෙස් දෙවියන්වහන්සේ ඉදිරියේ බිම දිගාවී දහවල් සතළිසක් හා රාත්‍රි සතළිසක් ගත කළේය (18, 25 පද). ඔහු නිරාහාරව යාච්ඤා කළේය.

සෙනඟගේ පාපය නිසා ඔවුන් විනාශ කර දමන බව දෙවියන්වහන්සේ පවසනු 12 පදයේ අපි දකිමු. ඉශ්‍රායෙල් සෙනඟ විනාශකර නොදමන මෙන් මෝසෙස් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියේය. ඔවුන් විනාශ කර නොදැමීම සඳහා **හේතු තුනක්** මෝසෙස් දෙවියන්වහන්සේට දක්වා සිටී.

- *ඉදිරියට කියවාගෙන යාමට පෙර ඔබට ඒවා ඡේදයෙන් සොයාගත හැකිද?*

26 පදය. *පළමු හේතුව:* සෙනඟ අයිති වන්නේ දෙවියන්වහන්සේටය. දෙවියන්වහන්සේ ඔවුන් මිසර දේශයෙන් මුදාගෙන (මිලදීගෙන) බේරාගත්සේක. සෙනඟ දෙවියන්වහන්සේට අයත් උරුමයක්ය. දෙවියන්වහන්සේ ඔවුන් විනාශකර දැමුවහොත් ඔවුන් බේරාගැනීමට දෙවියන්වහන්සේ කළ දෙය අපතේ යාමක් වන්නේය.

27 පදය. *දෙවන හේතුව:* ආබ්‍රහම්, ඊසාක්, යාකොබ් සිහි කරන්න. උත්පත්ති 12:1-7 දක්වා කොටසෙහි දෙවියන්වහන්සේ දේශයක් හා බොහෝ පැවත එන්නන් දෙන බවට ආබ්‍රහම්ට පොරොන්දු වූ සේක. දෙවියන්වහන්සේ සෙනඟ විනාශකර දැමුවහොත් ආබ්‍රහම්ට දුන් පොරොන්දුව කඩවන්නේය. තම පොරොන්දුව රක්ෂා කරන මෙන් මෝසෙස් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියි.

28 පදය. *තුන්වන හේතුව:* මිසරයේ සෙනඟ දෙවියන්වහන්සේ ගැන වරදවා සිතනු ඇත. ජාතීන් තමන්වහන්සේගේ නාමයට ගෞරව කරනු දැකීම දෙවියන්වහන්සේට අවශ්‍යය. දෙවියන්වහන්සේ සෙනඟ විනාශ කළහොත් මිසර වාසීන් දෙවියන්වහන්සේ දුර්වල හෝ ඉශ්‍රායෙල් සෙනඟට වෛර කරන අයෙකු ලෙස සිතනු ඇත. උන්වහන්සේගේ අරමුණු ඉටු නොවන්නේය.

පව්කාර ඇදහිලිවතුන් උදෙසා ඔබ යාච්ඤා කරන්නේ කෙසේද? මෙම යාච්ඤාව සමාව දීම පිළිබඳව කදිම නිදසුනකි. ඉශ්‍රායෙල් කළ පාපය සඳහා නිදහසට කරුණු නැත. යාච්ඤාව යොමුව ඇත්තේ දෙවියන්වහන්සේගේ විශ්වසනියත්වය හා අරමුණු කෙරෙහිය. ඔබේ යාච්ඤාවන් කෙබඳු වන්නේද? දෙවියන්වහන්සේ මෝසෙස්ගේ යාච්ඤාවට පිළිතුරු දුන්සේක (ද්විතිය නිති සංග්‍රහය 9:19 සහ 10:1-5 බලන්න).

**⊕ ප්‍රධාන කරුණ**

**අන්‍යයන්ට සමාව දෙන මෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කිරීම.**

# ➔ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 9:25-29

### ⊳ ආරම්භය

- පව් කරන්නාවූ ඇදහිලිවන්තයන් උදෙසා ඔබ කොපමණ යාච්ඤා කරන්නේද?

ඉශ්‍රායෙල් සෙනඟ තමන්ට රූපයක් සාදාගත් පසු ඔවුන් විනාශකර දැමීමට දෙවියන්වහන්සේට අවශ්‍ය විය. නමුත් මෝසෙස් යාච්ඤා කරන්නේය. පව්කරන ඇදහිලිවන්තයන් වෙනුවෙන් ඕනෑකමින් යාච්ඤා කරන ආකාරය ගැන ඔහු නිදසුනක් සපයන්නේය. ආහාර නොමැතිව දිවා සතලිසක් සහ රාත්‍රි සතලිසක් මුණින් දිගාවී ඔහු යාච්ඤා කළේය. දෙවියන්වහන්සේට ඉශ්‍රායෙල් විනාශ නොකිරීම සඳහා හේතු තුනක් ඔහු ඉදිරිපත් කරන්නේය.

### දෙවියන්වහන්සේ සෙනඟ ගළවාගත් සේක

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 9:26, 29***

සෙනඟ අයිති වන්නේ දෙවියන්වහන්සේට බව මෝසෙස් දෙවියන්වහන්සේට සිහිපත් කරයි. ඔවුන් උන්වහන්සේගේ දරුවන්ය. දෙවියන්වහන්සේ දැනටමත් ඔවුන් ගළවාගෙන ඇත. දෙවියන්වහන්සේ දැන් ඔවුන් විනාශකර දැමුවහොත් මිසරයෙන් ගළවාගැනිම කිසි තේරුමක් නැති දෙයක් වනු ඇත.

### දෙවියන්වහන්සේ පොරොන්දු දුන්සේක

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 9:27***

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට, ඊසාක්ට හා යාකොබ්ට දුන් පොරොන්දුව මෝසෙස් සිහිපත් කරවයි. දේශය හා පැවත එන්නන් දෙවියන්වහන්සේගේ පොරොන්දුව විය. දෙවියන්වහන්සේගේ සෙනඟ විනාශකර දැමුවහොත් පොරොන්දුවල අර්ථයක් නැතිවනු ඇත.

### අනෙක් ජාතීන් දෙවියන්වහන්සේට ගෞරව නොකරනු ඇත

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 9:28***

ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශය කරා ගෙන එන්නට දෙවියන්වහන්සේට නොහැකි යැයි හෝ දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට වෛර කරන්නේ යැයි මිසරයේ සෙනඟ සිතනු ඇතැයි මෝසෙස් පවසයි. දෙවියන්වහන්සේට අවශ්‍ය වුයේ ජාතීන් තමන්වහන්සේට ගෞරව කරනු දැකීමටය. දෙවියන්වහන්සේ පිළිබඳව වැරදි දේ ජාතීන් සිතනු දැකීමට මෝසෙස්ට අවශ්‍ය නොවීය.

වර්තමාන ඇදහිලිවතුන් සඳහා කුමන පාඩම් මෙහි තිබේද? පව් කළ පුද්ගලයන් උදෙසා අප යාච්ඤා කරන කල මෝසෙස්ගේ යාච්ඤාවේ සඳහන් හේතු තුන අපටද යොදාගත හැකිය.

1. **"මා උදෙසා මැරුණු යේසුස්වහන්සේ නිසා"**: ඉශ්‍රායෙල් සෙනඟ ගළවාගන්නා සේ දෙවියන්වහන්සේ යේසුස්වහන්සේගේ මරණය මගින් තම සෙනඟ ගළවාගත් සේක.
2. **"ඔබේ පොරොන්දු සිහිකරන්න"**: යේසුස්වහන්සේගේ මරණය තුළින් පව්කාර මිනිසුන් ගළවනු ලබන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වන සේක.
3. **"විශ්වාස නොකරන්නාගේ යහපත උදෙසා"**: ඇදහිලිවන්තයන් පව්කළ විට දෙවියන්වහන්සේ ඔවුන්ට දඬුවම් දෙන කල විශ්වාස නොකරන්නන් දෙවියන්වහන්සේ දුර්වල යැයි සිතනු ඇත. දෙවියන්වහන්සේගේ නාමය අගෞරවයට පත්වනු ඇති අතර විශ්වාස නොකරන්නන් දෙවියන්වහන්සේ අනුගමනය කරන්නට නොසිතනු ඇත.

- ඔබ දන්නා පව්කළ ඇදහිලිවන්තයන් සිටින්නේද? දෙවියන්වහන්සේ විසින් ඔවුන් ආපසු ගෙනඑනු පිණිස ඔවුන් උදෙසා යාච්ඤා කිරීම ගැන ඔබ බරපතළව සිතන්නේද?

මෝසෙස් ඉල්ලාසිටි දෙයට දෙවියන්වහන්සේ සවන් දී එකඟත්වය පළකළසේක. දස පනත කෙටුම්පත් කළ තවත් ගල්ලැලි දෙකක් දෙවියන්වහන්සේ දුන්සේක (ද්විතීය නීති සංග්‍රහය 10:1-5). දෙවියන්වහන්සේ හා ඉශ්‍රායෙල් අතර වූ සුවිශේෂී සබඳතාව නැවත ඇතිකරනු ලැබීය. කොතරම් සමාව දෙන දෙවියන්වහන්සේ කෙනෙක්ද!

⇧ **යාච්ඤා කරන්න**: *යේසුස්වහන්සේගේ මරණය අපතේ යාමක් නොවන පිණිසත්, දෙවියන්වහන්සේගේ විශ්වාසනීයත්වය දැකගත හැකිවනු පිණිසත්, අනෙක් මිනිසුන් දෙවියන්වහන්සේගේ නාමයට අගෞරව නොකරනු පිණිසත් පව්කළ ක්‍රිස්තු භක්තිකයන් උදෙසා දෙවියන්වහන්සේගේ සමාව ඉල්ලා සිටින්න.*

⬇ අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 10:12-22

# 20 දෙවියන්වහන්සේ ඉල්ලා සිටින්නේ කුමක්ද?

## ⪡ පසුබිම

පොරොන්දු දේශයේ ජීවත්වීම සඳහා මෝසෙස් සෙනඟ සූදානම් කරයි. දෙවියන්වහන්සේ තම සෙනඟගෙන් බලාපොරොත්තු වන්නේ මොනවාදැයි ඔහු සාරාංශ ගතකර දක්වයි.

## ⌄ 12-22 පද කියවන්න

## ⪢ සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 10:12.** "භය" නැතහොත් "ගරුබිය" යන්නෙන් අදහස් වනුයේ බුහුමන් දැක්වීමත් ගෞරව කිරීමත්ය. දෙවියන්වහන්සේ ගරුබිය ගෙනදෙන දෙවියන්වහන්සේ කෙනෙක්ය. අප උන්වහන්සේට ගෞරව කරන්නෙමු නැතහොත් බිය වන්නෙමු.
- **ද්විතිය නිති සංග්‍රහය 10:13.** "පැවැත්වීම" යනු දෙවියන්වහන්සේගේ ආඥාවන්ට කීකරුවීමය.
- **ද්විතිය නිති සංග්‍රහය 10:16.** "චර්මාග්‍රය ඡේද්‍ය කරගැනීම" අධ්‍යයනය 35 බලන්න. උත්පත්ති 17 පරිච්ඡේදයේ දැක්වෙන්නේ ආබ්‍රහම් තමාමත් තම පවුලේ අයත් ශාරීරිකව චර්මඡේදනය කළ බවය. නමුත් සැබෑ චර්මඡේදනය සිදුවිය යුත්තේ හදවතෙහිය (රෝම 2:28-29). තමන්වහන්සේට කීකරු වී ප්‍රේමකරන පිණිස අනාගතයේ මිනිසුන්ගේ හදවත් චර්මඡේදනය කරන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වන සේක (ද්විතිය නීති සංග්‍රහය 30:6).
- **ද්විතිය නිති සංග්‍රහය 10:17.** "තරාතිරම් නොබලන" හෙවත් "පැත්තක් නොගන්නා" යන්නෙන් අදහස් වන්නේ දෙවියන්වහන්සේ සැමටම එකසේ සලකන බවය.
- **ද්විතිය නිති සංග්‍රහය 10:18.** "විදේශියා" යනු සැමවිටම ඉශ්‍රායෙලයේ ජීවත්වන්නට කැමතිවූ විදේශිකයාය.

## ⊙ කිරීමට යමක්

12-13 පද. දෙවියන්වහන්සේ තම සෙනඟගෙන් දේවල් පහක් ඉල්ලා සිටින සේක. ක්‍රියාවට නැංවීමේදී ඒ එකිනෙකින් අදහස් වන්නේ කුමක්දැයි සිතන්න.

1. **දෙවියන්වහන්සේට භය වන්න:** දෙවියන්වහන්සේට බියෙන් තැතිගෙන සිටිය යුතු බවක් මෙයින් අදහස් නොකෙරේ. ඉන් අදහස් වන්නේ දෙවියන්වහන්සේ පාරිශුද්ධ හා ප්‍රතාපවත් බවය. අප ගරුසරු ඇතිව උන්වහන්සේට සැලකිය යුතුය.
2. **උන්වහන්සේගේ මාර්ග ඔස්සේ යන්න:** මෙයින් අදහස් වන්නේ අප දවස් පතාම දෙවියන්වහන්සේ පවසන දෙයට කීකරු වීමය.
3. **දෙවියන්වහන්සේට ප්‍රේමකරන්න:** මෙය හදවතින්ම සිදුවිය යුතුය. ඉන් අදහස් වන්නේ මුල්තැන දෙවියන්වහන්සේට දියයුතුය යන්නය.
4. **දෙවියන්වහන්සේට සේවය කරන්න:** මෙයින් අදහස් කරන්නේ තනිවම හෝ අන්‍යයන් සමඟ දෙවියන්වහන්සේට නමස්කාර කිරීමය.
5. **දෙවියන්වහන්සේගේ පනත් රක්ෂා කරන්න:** මෙයින් අදහස් කරන්නේ දෙවියන්වහන්සේගේ නිතිරීති වලට කීකරු වීමය.

14-15 පද. දෙවියන්වහන්සේගේ සෙනඟ මේ දෙවල් පහ කළ යුත්තේ ඇයි? ඒ දෙවියන්වහන්සේ කවුරුන්ද යන්න නිසාය. උන්වහන්සේ ශ්‍රේෂ්ඨ මැවුම්කරුවාණන් සේම තම සෙනඟට ප්‍රේමකරන තැනන්වහන්සේය.

16 පදය. දෙවියන්වහන්සේ ඉල්ලන දෙය කිරීමට නම් මිනිසුන්ගේ හදවත්වල වෙනසක් සිදුවිය යුතුය. ඔවුන්ගේ හදවත්/සිත් මුරණ්ඩුය, ආඩම්බරය.

17-19 පද. අවශ්‍යතාවෙන් පෙළෙන අයට දෙවියන්වහන්සේ ප්‍රේමකරන සේක. එසේම තම සෙනඟ අවශ්‍යතාවෙන් පෙළෙන අයට ප්‍රේමකිරීම උන්වහන්සේ බලාපොරොත්තු වන සේක. ඒ පියා නොමැති අය, වැන්දඹුවන් හා විදේශීන් වැනි අයයි.

20-22 පද. නැවත වතාවක් දෙවියන්වහන්සේගේ සෙනඟ දෙවියන්වහන්සේට භය පක්ෂපාතීව සේවය කළ යුතුය. තම සෙනඟ මිසරයෙන් ගෙන ආ බැවින් ඔවුන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළ යුතුය.

## ⊕ ප්‍රධාන කරුණ

**ස්වාමීන්වහන්සේට භය හා ප්‍රේමය ඇතිව සේවය කරන්න.**

# ⮕ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 10:12-22

### ⊙ ආරම්භය

- තමන්වහන්සේගේ සෙනඟගෙන් දෙවියන්වහන්සේ ඉල්ලා සිටින්නේ කුමක්ද? වඩාත්ම වැදගත් දෙය කුමක්ද?

### දෙවියන්වහන්සේ ඉල්ලා සිටින්නේ කුමක්ද?

⊙ **කියවන්න: *ද්විතීය නීති සංග්‍රහය 10:12-13***

මෙම පදවලින් වඩාත්ම වැදගත් වන්නේ කුමක්දැයි අපට පවසයි. *මේ දේවල් පහ එකින් එක ඔබගේ අසන්නන්ට පවසන්න. ඒවා කළ හැකි ආකාර ගැන නිදසුන් දෙන්න.*

### දෙවියන්වහන්සේට මේ දේ වුවමනා ඇයි?

⊙ **කියවන්න: *ද්විතීය නීති සංග්‍රහය 10:14-15***

දෙවියන්වහන්සේ ශ්‍රේෂ්ඨ දෙවියන්වහන්සේ වන නිසා හා තම සෙනඟ උන්වහන්සේට සුවිශේෂී පිරිසක් වන නිසා අපගේ මුළු කැපවීමම/භක්තියම උන්වහන්සේට වුවමනා වන්නේය. මේ කාරණය උදෙසා උන්වහන්සේ ඔවුන් තෝරාගත් සේක. දෙවියන්වහන්සේ තම සෙනඟට ප්‍රේමකරන සේක. තමන්ගේ හදවත්වලින්ම උන්වහන්සේට ප්‍රේමකිරීම හා කීකරුවීම උන්වහන්සේ තම සෙනඟගෙන් බලාපොරොත්තු වන සේක.

### ගැටලුව

⊙ **කියවන්න: *ද්විතීය නීති සංග්‍රහය 10:16***

*ආබ්‍රහම්ට ඔහුගේ පවුලේ අය චර්මඡේදනය කරන්නට දෙවියන්වහන්සේ පැවසූ ආකාරය ඔබගේ අසන්නන්ට පැහැදිලි කරන්න.* මෙය ඔවුන් සදාකාලයටම දෙවියන්වහන්සේට අයත්වන බව දැක්වීම සඳහා ශාරීරික ලක්ෂණයක් විය (උත්. 17:13). නමුත් සැබෑ ගැටලුව ඇත්තේ මනුෂ්‍යයන්ගේ හදවත්වලය. මේ දේවල් පහකරනු සඳහා දෙවියන්වහන්සේ විසින් අපගේ හදවත් වෙනස් කිරීම අපට අවශ්‍යව ඇත. අපට අපවම වෙනස් කරගත නොහැකිය.

අපගේ හදවත් වෙනස් කළ හැක්කේ යේසුස්වහන්සේට පමණක්මය. අප යේසුස්වහන්සේ කෙරෙහි අදහාගත්විට උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ අප ඇතුලාන්තයෙන් වෙනස් කිරීම සඳහා අපගේ හදවත් තුළ ජීවත්වන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ අප වඩාත් යේසුස්වහන්සේ මෙන් කරන සේක.

### දෙවියන්වහන්සේ අන්‍යයන් සමඟ හැසිරෙන ආකාරයෙන් අන්‍යයන් සමඟ හැසිරෙන්න.

⊙ **කියවන්න: *ද්විතීය නීති සංග්‍රහය 10:17-19***

*17 වන පදයේ දැක්වෙන පරිදි දෙවියන්වහන්සේ කෙබඳුදැයි පැහැදිලි කරන්න.* උන්වහන්සේ වෙනස් දෙවිවරුන් හෝ බලවේගයන්ට වඩා මහත් සේ උතුම්ය. දෙවියන්වහන්සේ සාධාරණ බැවින් සියල්ලන්ට සමානව සලකන සේක. අවශ්‍යතාවෙන් පෙළෙන මිනිසුන්ට දෙවියන්වහන්සේ ප්‍රේමකරන සේක. උන්වහන්සේට අවශ්‍ය ඔවුන්ට සාධාරණව හා කරුණාවන්තව සත්කාර කිරීම වේ. පියෙකු නොමැති අය හා වැන්දඹුවන් බොහෝ විට දුප්පතුන්ය. විදේශීන් සතුව ඉඩම් නොමැත. මොවුනට උපකාර අවශ්‍ය වියහැකිය. දෙවියන්වහන්සේ මේ සියලු මිනිසුන්ට ප්‍රේම කරන සේක. දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ ඉශ්‍රායෙල් සෙනඟගෙන් මේ මිනිසුන්ට ප්‍රේමකරනු දකින්නටය.

### දෙවියන්වහන්සේට ප්‍රේමකරමින් ප්‍රශංසා කරන්න.

⊙ **කියවන්න: *ද්විතීය නීති සංග්‍රහය 10:20-22***

ඡේදය අවසන් වන්නේ එය පටන්ගත් තැනින්මය-ස්වාමීන්වහන්සේට භයව සේවය කරන්න. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ මිසර දේශයෙන් බේරාගත් සේක. එබැවින් දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේට ප්‍රශංසා කළ යුතුය.

ⓘ **අදාළ කිරීම**: දෙවියන්වහන්සේ ඉල්ලූ දෙය ඔබ කෙතරම් හොඳින් කරන්නේද? ඔබ සැමවිටම දෙවියන්වහන්සේට මුල්තැන දෙන්නේද? 12-13 පදවල ඇති ප්‍රධාන කරුණ ඔබ මතකතබාගන්න. ඔබ අවශ්‍යතාවෙන් පෙළෙන අයට ප්‍රේම කරන්නේද?

මෙම ඡේදයේ සඳහන් දේ කිරීම ඉතා අසීරුය. උන්වහන්සේට අවශ්‍ය දෙය අප කරන්නේ කෙසේද? අපට උපකාර වන පිණිසත් අපගේ හදවත් වෙනස් කරනු පිණිසත් යේසුස්වහන්සේ තම ආත්මයාණන් අපට දෙන සේක.

⊙ **යාච්ඤා කරන්න**: *උන්වහන්සේ බලාපොරොත්තු වන දෙය කිරීමට ඔබට හැකිවනු පිණිස දෙවියන්වහන්සේගේ උපකාරය ඉල්ලන්න. සියලු ඇදහිලිවතුන්ට උපකාර පිණිස තම ආත්මයාණන් දීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.*

## ⬇ අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 12:1-7

# 21 දෙවියන්වහන්සේගේ ආකාරයට නමස්කාර කරන්න

### « පසුබිම

පොරොන්දු දේශයේ ජීවත්වීම සඳහා මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ සූදානම් කරයි. ජීවිතයේ සියලු කාරණා පිළිබඳව බොහෝ නීති දැන් ඔහු ලබාදෙයි.

### ⌄ 1-7 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### ⌄ සටහන්

- **ද්විතීය නීති සංග්‍රහය** 12:3. "රූපස්ථම්භ" යනු පිරිමි දෙවිවරුන් නියෝජනය කල විශේෂිත ගල්ය. ලී වලින් සෑදූ "අෂේරා කණු" නියෝජනය කළේ ගැහැණු දේවතාවියන්ය.
- **ද්විතීය නීති සංග්‍රහය** 12:5. "තමන් නාමය තබන පිණිස" දෙවියන්වහන්සේ තම සෙනඟ අතර ජීවත්වනු ඇත.

### ⊙ කිරීමට යමක්

2-4 පද. කානාන් දේශයේ වැසියන් බොහෝ විට නමස්කාර කළේ කඳු මුදුන්වල හෝ දැවැන්ත ගස් යටය. කඳු අහසට ළංව පිහිටා තිබුණි. දැවැන්ත වෘක්ෂ ජීවිතය හා සවිලත්වයේ ලක්ෂණයකි.

කානාන් වැසියන් විශ්වාස කළේ ඔවුන්ගේ දෙවිවරුන් වැස්ස, භවබෝග, සතුන් හා දරුවන් තමන්ට ලබාදෙන බවය. මේවා ලබාගැනීම සඳහා ඔව්හු වැරදි ලිංගික ක්‍රියා, විශේෂිත ගල් හා විශේෂිත කණු යොදාගත්තෝය.

සැබෑ දෙවියන්වහන්සේ නමස්කාර කිරීම සඳහා ඉශ්‍රායෙල් සෙනඟ මේ ස්ථානම හෝ දේවල් යොදා නොගත යුතුය. තමන් පරීක්ෂාවට වැටීමෙන් වැලකී සිටීම සඳහා ඔවුන් මේ දේවල් විනාශ කර දැමිය යුතුය.

- *ඔබ සිටින ස්ථානයේ මිනිසුන් නමස්කාරය සඳහා යොදාගන්නා වැරදි දේ මොනවාද (නිදසුනක් ලෙස ගුරුකම්, වෙනත් දෙවිවරුන්ගේ රූප, ගල් යනාදිය)? ඒ අයට ඒවා විනාශකර දැමීමට නොහැකි නමුත් ඒවායින් දුරස්ව සිටීම කළ හැකිය.*

5 පදය. මෙය වැදගත් පදයකි. සමස්ත දේශයෙන්ම ස්වාමීන්වහන්සේ එක ස්ථානයක් තෝරාගන්නා සේක. එම ස්ථානය තෝරාගත්තේ ඉශ්‍රායෙල් සෙනඟ නොවේ.

6-7 පද. මේ ස්ථානයේදී සෙනඟ නිවැරදි යාගයන් හා පූජාවන් සිදුකළ යුතුය (ලෙවී ව්‍යවස්ථාව 1-7 බලන්න). "කා" සහ "ප්‍රීතිවන්න" යන්නෙන් අදහස් වන්නේ දෙවියන්වහන්සේට ස්තුති කිරීම සඳහා ඉශ්‍රායෙල්වරුන්ට බොහෝ කාරණා තිබූ බවය. දෙවියන්වහන්සේ ආශීර්වාද කරමින් සපයා දෙන සේක. අනෙක් දෙවිවරු එය නොකරති.

- *මෙය කිතුනුවන්ට පවසන්නේ කුමක්ද?*

අපි විශේෂිත ස්ථානයක් කරා නොයන්නෙමු. සැබෑ දේවමාලිගය තමන්වහන්සේගේ උත්ථානවූ ශරීරය බව යේසුස්වහන්සේ පැවසූ සේක (යොහන් 2:21). යේසුස් යන නාමය සියලු නාමයන්ට වඩා උතුම් නාමය වන්නේය. කිතුනුවන් එක ස්ථානයකදී නොව සෑම තැනකදීම යේසුස්වහන්සේට නමස්කාර කළ යුතුය. යේසුස්වහන්සේ යනු දෙවියන්වහන්සේ තම සෙනඟ හමුවන ස්ථානයයි.

### ⊕ ප්‍රධාන කරුණ

**අනෙක් ආගම්වල මිනිසුන් මෙන් නමස්කාර නොකරන්න. දෙවියන්වහන්සේ පවසන ආකාරයට උන්වහන්සේට නමස්කාර කරන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 12:1-7

**ආරම්භය**: අපට එකට එකතු වී නමස්කාර කළ හැක්කේ කෙසේද යන කාරණයේදී කිතුනුවෝ බොහෝ විට එකඟතාවකට නොඑති.

- කිතුනු නමස්කාරයේදී වඩාත්ම වැදගත් දේවල් වන්නේ මොනවාද?

## දෙවියන්වහන්සේගේ සෙනඟ නමස්කාර නොකළ යුතු තැන් මොනවාද?

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 12:2-4***

*දේශයේ මිත්‍යාදෘෂ්ටික නමස්කාරය සඳහා භාවිත කළ දේ ගැන ඔබගේ අසන්තෘප්ති පවසන්න. එසේම ඉශ්‍රායෙල් සෙනඟ එම ස්ථාන හා යොදාගත් දේ විනාශ කර දැමූ අයුරු පවසන්න.*

*ඔබගේ ප්‍රදේශයේ අනික් දෙවිවරුන් නමස්කාරයේදී සිදුවන වැරදි ගැන කතා කරන්න.* අනෙක් ආගම් කරන ආකාරයෙන් නමස්කාර කිරීමේ පරීක්ෂාවට කිතුනුවන් නොවැටිය යුතුය.

## දෙවියන්වහන්සේගේ සෙනඟ නමස්කාර කළයුත්තේ කොතැනද?

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 12:5***

තමන්ට නමස්කාර කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා දෙන බව දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට පැවසූ සේක. මෝසෙස්ගෙන් දිගු කාලයකට පසුව දෙවියන්වහන්සේ යෙරුසලම තෝරාගත් සේක. දේවමාලිගාව එහි ඉදිකරනු ලැබිණි. දේවමාලිගාව මධ්‍යයේ වැඩ සිටින්නට දෙවියන්වහන්සේ තෝරාගත් සේක.

වත්මන් කිතුනුවන්ට මෙය පවසන්නේ කුමක්ද? සැබෑ දේවමාලිගාව වන්නේ උත්ථාන වූ යේසුස්වහන්සේගේ ශරීරයයි. යොහන් 2:21 කියවන්න. පරණ ගිවිසුමේ දේවමාලිගාවේ නමස්කාරය යොමු කළේ යේසුස්වහන්සේ වෙතටය. යේසුස්වහන්සේ පැමිණි පසු දේවමාලිගාවේ නමස්කාරය තවදුරටත් අවශ්‍ය නොවීය. සෙනඟ අතර පොළොවේ ජීවත්වන දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ වූ සේක. සියලු කිතුනුවන් නමස්කාර කළ යුතු වන්නේ යේසුස්වහන්සේටය. එබැවින් කිතුනුවන්ට ඕනෑම තැනක නමස්කාර කළහැකිය. යේසුස්වහන්සේට නමස්කාර නොකරන්නාවූ ආගම් සැබෑ ඒවා නොවේ.

## දෙවියන්වහන්සේගේ සෙනඟ නමස්කාර කළයුතු ආකාරය

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 12:6-7***

දෙවියන්වහන්සේ තෝරාගන්නා ස්ථානයෙහි ඉශ්‍රායෙල්වරුන් යාග හා පූජා ඔප්පු කළයුතුය. ඇතැම් යාගයන් කරන ලද්දේ පව් වෙනුවෙන්ය. අනෙක්වා දෙවියන්වහන්සේට ස්තුති කිරීම සඳහාය. දෙවියන්වහන්සේ තෝරාගනු ලබන ස්ථානයේදී ඉශ්‍රායෙල් ජනයා කා බී ප්‍රීතිවිය යුතුය. දෙවියන්වහන්සේ කළ දෙය නිසා මහත් ප්‍රීතියක් ඇත. මේ යාගයන් සියල්ලම යේසුස්වහන්සේ ඉදිරියේ කරන්නාවූ දේ වෙත යොමුව ඇත. සැබෑ යාගය වන්නේ යේසුස්වහන්සේය. කිතුනුවන් සත්ව යාග පවත්වන්නේ නැත. යේසුස්වහන්සේ අපගේ යාගය වන සේක.

**අදාළ කිරීම**: කිතුනුවන් සඳහා මේ ඡේදයේ අප දකින්නේ,

- නමස්කාරය කළ හැකිව ඇත්තේ යේසුස්වහන්සේ නිසාය.
- යේසුස්වහන්සේ කුරුසිය මත කළාවූ යාගය නිසා පමණක් අපට දෙවියන්වහන්සේ වෙත පැමිණිය හැකිවේ.
- අනෙක් ආගම්වල ක්‍රමය හෝ පිළිම ඇතිව අපි නමස්කාර නොකරන්නෙමු.
- යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ කළ දෙය නිසා නමස්කාරයේදී අපට ප්‍රීතියක් ඇත.
- අපි තනි තනි පුද්ගලයන් ලෙස නොව දෙවියන්වහන්සේගේ සෙනඟ ලෙස එකට එකතු වී නමස්කාර කරන්නෙමු.

නමස්කාරය සඳහා දෙවියන්වහන්සේගේ සෙනඟ ඔබට හමුවන කළ ඔබ මේ දේවල් ගැන සිතන්නේද? ඔබ නමස්කාර කරන්නේ යේසුස්වහන්සේටද?

**යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේගේ සෙනඟ සමග එකතුව ප්‍රීතියෙන් යුතුව යේසුස්වහන්සේට නමස්කාර කරන්නට ඔබට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

## ⬇ අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 13:1-11

# 22 ඔබ දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගෙනයන්නට කිසිවෙකුට ඉඩ නොදෙන්න

### ≪ පසුබිම

පොරොන්දු දේශයේ ජීවත්වීම සඳහා සූදානම් වීමට ඉශ්‍රායෙල් සෙනඟට මෝසෙස් උපකාර කරමින් සිටී.

### ⌄ 1-11 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### ⩔ සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය** 13:1-3. ඇතැම් බොරු ප්‍රොපේතවරුන්ටද ආශ්චර්යවත් දේ කිරීමේ බලය තිබුණි. ඇතැම් අය සිහින ලෙස දකින දේ බෙදාගනිති.
- **ද්විතිය නිති සංග්‍රහය** 13:5. "නපුර පහකරපල්ලා" යනුවෙන් අදහස් කරන්නේ සෙනඟ අතරින් නපුරට මුල්වූ දෙය මුලිනුපුටා දැමීමය.
- **ද්විතිය නිති සංග්‍රහය** 13:7. "පොළඹ-වන්නට" යනු ආකර්ෂණය කරවන්නට හෝ ඇදගන්නට උත්සාහ කිරීමය.

### ⊙ කිරීමට යමක්

- *කෙනෙකුට ආශ්චර්යවත් ක්‍රියාවක් කළ හැකි වීමෙන් පෙන්නුම් කරන්නේ ඔවුන් දෙවියන්-වහන්සේ වෙතින් ආ බවක්ද? එම ආශ්චර්යවත් ක්‍රියාව රෝගයක් හෝ මරණයක් වැනි නපුරු දෙයක් නම් එම ආශ්චර්යවත් ක්‍රියාව දෙවියන්-වහන්සේගෙන් නොවේ. නමුත් යහපත් ආශ්චර්යවත් ක්‍රියාවක් ගැන කිව හැක්කේ කුමක්ද?*

1-5 පද. බොරු ප්‍රොපේතවරයකුට පවා ආශ්චර්යවත් ක්‍රියාවක් කළ හැකිවනු ඇත. මෙය දෙවියන්වහන්සේගේ බලයෙන් කරන්නේ යැයි මිනිසුන් සිතිය හැකිය. නමුත් බොරු ප්‍රොපේතවරුන් මඟ පෙන්වන්නේ මිනිසුන්ට අනෙක් දෙවිවරුන් පස්සේ යන්නටය. මිනිසුන් වියවුල් වීමට ඉඩ ඇත. වැදගත් වන්නේ එම ප්‍රොපේතවරයා අනුගමනය කරන්නේ කුමන දෙවියන්ද යන්න ය. සෙනඟ බොරු ප්‍රොපේතවරුන් මරණයට පත්කළ යුතුය.

6-11 පද. පවුලේ සාමාජිකයෙකු ඔබට වෙනත් දෙවිවරුන් නමස්කාර කරන්නට ආරාධනා කළහොත් කුමක් කරන්නේද? මිනිසුන් බොහෝ විට බලපෑමට යටත් වන්නේ එය තමන් ආදරය කරන පවුලේ සාමාජිකයෙකුගෙන් එන විටය. පවුලේ සාමාජිකයා වෙනත් දෙවිවරුන් පස්සේ යන්නට සෙනඟට මඟපෙන්වන්නේ නම් ඒ තැනැත්තා මරා දැමිය යුතුය.

මරණ දඬුවම පැමිණ වීමට හේතුව වූයේ පාපය පැතිරීම වැලැක්වීමය. අනෙක් පුද්-ගලයන්ට දඬුවම ගැන දැනගන්නට ලැබුණු විට එම වරදම නොකරන මෙන් අනතුරු ඇඟවීමක් ලබාදේ. ඉශ්‍රායෙල් සෙනඟ පවිත්‍ර ශුද්ධ ජාතියක් ලෙස ජීවත්විය යුතුය. බරපතළ පාපයට දඬුවම් දිය යුතුමය.

ⓘ **අදාළ කිරීම**: කිතුනුවන් අපගේ රටවල වෙසෙන බොරු ප්‍රොපේතවරුන් මරා දැමීමට උත්සාහ නොකළ යුතුය. **නමුත් අප ඔවුන්ට ඇහුම්කන් නොදිය යුතුවේ.** අප ඔවුන්ගේ ඉගැන්වීම් ප්‍රතික්ෂේප කළ යුතුය. ඔවුන් ආශ්චර්යවත් දෙයක් කළහොත් හෝ ඔවුන්ගේ සිහිනයක් බෙදාගත් පමණින් අප වෙනත් දෙවිවරුන් පස්සේ නොයා යුතුය. අප එම පුද්ගලයා මරා දමන්නේ නැත. නමුත් ඔවුන් තවදුරටත් සභාවේ සාමාජික-යන් නොවිය යුතුය. ඔවුන්ගේ නරක ඉගැන්-වීම් අනෙක් අය වෙතද පැතිරී නොයායුතුය.

### ⊕ ප්‍රධාන කරුණ

**සෙනඟ දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගමන් කිරීමට මඟපෙන්වන පුද්ගලයන් දෙවියන්වහන්සේගේ සෙනඟ විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.**

# ➝ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 13:1-11

### ⊳ ආරම්භය

- පුද්ගලයෙකු ආශ්චර්යවත් ක්‍රියාවක් කළ පමණින් දෙවියන්වහන්සේ එම පුද්ගලයා ගැන සතුටට පත්ව සිටින බවක් අදහස් වේද?

### බොරු ප්‍රොපේතවරු අනුගමනය නොකරන්න

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 13:1-5***

බොරු ප්‍රොපේතවරු ආශ්චර්යවත් ක්‍රියාවන් කරනු ඇත. සිහිනද දකිනු ඇත. වැදගත් දෙය වන්නේ සෑම ප්‍රොපේතවරයෙකුම හෝ දේශනාකරුවෙකුම උගන්වන්නේ කුමක්ද'යි සොයාබැලීමය. ඔවුන් උගන්වන්නේ සත්‍යයද?

**නිදසුන**: එක් දේශකයකු ගමකට පැමිණ ආශ්චර්ය ක්‍රියාවන් සිදුකළේය. ඔහු යේසුස්වහන්සේගේ නම පිළිබඳව කතාකළේය. නමුත් දේශකයා පැවසුවේ තමන් නැවත පැමිණි යේසුස්වහන්සේ බවය. ඔහු කළ ආශ්චර්යවත් ක්‍රියාවන් නිසා බොහෝ දෙනෙක් ඔහු පස්සේ ගියෝය. නමුත් ඔහු බොරු ප්‍රොපේතවරයෙකි. දෙවියන්වහන්සේගේ නම භාවිත කළ පමණින් දේශකයා දෙවියන්වහන්සේ වෙතින් ආ අයෙකු නොවන්නේය.

### වෙනත් දෙවිවරුන් කරා මඟපෙන්වන පවුලේ සාමාජිකයන් අනුගමනය නොකරන්න.

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 13:6-11***

අප ප්‍රේමකරන අයෙකු වෙනත් දෙවි කෙනෙකු අනුගමනය කරන්නැයි ඉල්ලා සිටින විට ඉතා අසීරු තත්වයකට අපි පත්වෙමු. අප කෙනෙකුට ප්‍රේමකරන විට ඒ පුද්ගලයා සමඟ එකඟවීමට අපට අවශ්‍ය වේ.

දෙවියන්වහන්සේගේ සෙනඟ මුළු හදවතින්ම දෙවියන්වහන්සේට ප්‍රේමකළ යුතුවේ. ඔවුන් තම පවුලේ උදවිය හෝ මිතුරන්ට වඩා දෙවියන්වහන්සේට ප්‍රේමකළ යුතුය. පවුලේ සාමාජිකයෙකු හෝ මිතුරෙකු වෙනත් දෙවිකෙනෙකු අනුගමනය කරන්නට අපට මඟපෙන්වනනේ නම් අප ඔවුන්ට සවන් නොදිය යුතුය.

**නිදසුන**: බලවත් ආශ්චර්යවත් ක්‍රියාවන් සිදුකරන අලුත් දේශනාකරුවකු ගැන තමන් ඇසූ බව බිරිඳක් සැමියාට පවසන්නිය. එම ප්‍රොපේතවරයාට සවන් දීම සඳහා තම සැමියා කැඳවාගෙන යාමට ඇයට දැඩි අවශ්‍යතාවක් ඇත. සැමියා ඊට අකමැති වෙයි. නමුත් බිරිඳ දිගටම ඇවිටිලි කරන්නීය. ඔහු තම බිරිඳට ප්‍රේමකරන නිසා අදහස් වෙනස් කරගනිමින් ඔහු ඇය සමඟ යයි. ඔහුට වැරදි මඟපෙන්වීමක් දී ඇත.

කිතුනුවන් වර්තමානයේ සිටින බොරු ගුරුවරුන් මරණයට පත්කළ යුතු නැත. නමුත් අප බොරු ප්‍රොපේතවරුන්ට සවන් නොදිය යුතුය. අප ඔවුන් සභාවෙන් එළවා දැමිය යුතුය. දෙවියන්වහන්සේගේ සෙනඟ අතර ඔවුනට තැනක් නැත.

බොහෝ දෙනෙකු බොරු ගුරුවරුන්ට ආදරය දක්වනවා වියහැකිය. ඇතැම් විට පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් එසේ කරනු වියහැකිය. නමුත් බොරු ගුරුවරුන් අනතුරුදායකය. හරි දෙය කුමක්ද වැරදි දෙය කුමක්ද යන්න වෙන්කර හඳුනාගැනීමට දෙවියන්වහන්සේගේ සෙනඟට හැකිවිය යුතුය.

- සෙනඟ කතාකරන වචන ඔබ පරීක්ෂා කර බලන්නේද?
- ඔබේ දේශනාකරුගේ වචන හා දෙවියන්වහන්සේගේ වචන ඔබ ගලපා බලන්නේද?

**යාච්ඤා කරන්න**: *සත්‍යය දැනගැනීම සඳහා උන්වහන්සේගේ සභාව ශක්තිමත්ව හා ප්‍රඥාවන්තව සිටීමට උපකාර වන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. බොරු ගුරුවරුන්ගෙන් උන්වහන්සේගේ සභාව ආරක්ෂා කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

## ⬇ අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 14:1-21

# 23 දෙවියන්වහන්සේගේ සෙනඟ ශුද්ධව සිටිය යුතුය

### « පසුබිම

පොරොන්දු දේශයේ ජිවත්වීම සඳහා මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ සුදානම් කරමින් සිටී. දෙවියන්වහන්සේගේ සෙනඟ අනෙක් ජාතීන්ට වඩා වෙනස් ආකාරයෙන් ජිවත්විය යුතුය.

### 1-21 පද කියවන්න

*ජේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය** 14:2, 21. "ශුද්ධ" යන්නෙන් අදහස් කරන්නේ දෙවියන්වහන්සේට අයිති බවය. දෙවියන්වහන්සේගේ සෙනඟ ලෝකයට අයිති නොවේ.
- **ද්විතිය නිති සංග්‍රහය** 14:7. "අපවිත්‍ර". සත්වයා කිලුටු බවක් අදහස් නොකෙරේ. දෙවියන්වහන්සේ පවසන්නේ තම සෙනඟ උන් ආහාරයට නොගත යුතු බවය.

### ⊙ කිරීමට යමක්

1-2, 21 පද. ඉශ්‍රායෙල් සෙනඟ "ශුද්ධ" ය. ඔවුහු දෙවියන්වහන්සේගේ දරුවෝය. ඔවුන් දෙවියන්වහන්සේට වුවමනා ආකාරයට ජිවත්විය යුතුය. ඇතැම් මිනිසුන් කෙනෙකු මියගිය විට තම ශෝකය හැඟවීමට තමන්ම කපාගනිති. ඇතැම් මිථ්‍යාදෘෂ්ටිකයෝ එවැනි අවස්ථාවක එළු පැටවකු උගේම මවගේ කිරිවලින් උයා රහස් පානයක් සේ පිළිගන්වති. දෙවියන්වහන්සේගේ සෙනඟ එබඳු දේ නොකළ යුතුය.

3-8 පද. ගවයන් පවිත්‍ර සතුන් වන්නේත් ඌරන් අපවිත්‍ර සතුන් වන්නේත් ඇයි? දෙවියන්වහන්සේ අනෙක් ජාතීන් නොව ඉශ්‍රායෙල් සෙනඟ තෝරාගත්තේ ඇයි (2 වන පදය)? අප එය නොදන්නා නමුත් දෙවියන්වහන්සේ එසේ පවසා ඇත. ඉශ්‍රායෙල් සෙනඟ මෙන් ඇතැම් සතුන් පවිත්‍රය. අනෙක් ජාතීන් සේම අනෙක් සතුන් අපවිත්‍රය. ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට අයත් වන බැවින් ඔවුන් අපවිත්‍ර ලෙස හඳුන්වන සතුන් ආහාරයට නොගත යුතුවේ.

9-20 පද. ඉස්සන් හා කකුළුවන් වැනි ඇතැම් මත්ස්‍යයින්ද ඇතැම් පක්ෂින් හා කෘමින්ද අපවිත්‍රය.

කිතුනුවන් මෙම නීති පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය නොවේ. සියලු ආහාර පවිත්‍ර බව යේසුස්වහන්සේ පැවසූ සේක (මාර්ක් 7:19). සියලු ආහාර පවිත්‍ර බව දක්වන දර්ශනයක් පේත්‍රුස්තුමාද දුටුවේය (ක්‍රිය 10:9-15). මෙම වෙනසට හේතුව යේසුස්වහන්සේය. දැන් ශුභාරංචිය සියල්ලන්ම සඳහාය. යුදෙව්වන් හා අන්‍යජාතීන් සියල්ලන්ටමය. නමුත් දෙවියන්වහන්සේගේ සෙනඟ තවමත් නොඇදහිලිවතුන්ට වඩා වෙනස්ව සිටිය යුතුය.

තමන් පව්කාරයන් බවට පත් කරන්නේ යැයි ඇතැම් අය සිතන ආහාර නොගෙන සිටීමට කිතුනුවන් ප්‍රවේසම් විය යුතුය (1 කොරින්ති 8:4-13).

- *ඔබ සිටින ස්ථානයේත් ආහාර පිළිබඳව වැරදි අවබෝධයක් පවතින්නේද? ඇතැම් අය තවමත් පැරණි ගිවිසුමේ නීති පිළිපදින්නේද? ක්‍රිස්තුස්වහන්සේ තුළ නිදහස් වීමට ඔවුන්ට උපකාරී වීම ඔබට කළ හැක්කේ කෙසේද?*

### ⊕ ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේගේ සෙනඟ නොඇදහිලිවතුන්ට වඩා වෙනස්ව සිටිය යුතුය.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 14:1-21

### ⊳ ආරම්භය

- වෙනත් ආගමකට අයත් ආගමික ආහාර වේලක් සඳහා ඔබට ඇරයුම් ලැබුණ හොත් ඔබ කුමක් කරන්නේද? මෙන්න තවත් ප්‍රශ්නයක්. ඌරු මස් ආහාරයට නොගන්නා ලෙස පැරණි ගිවිසුමේ සඳහන් වේ. ඔබ මෙයට කීකරු වියයුතුද?

ද්විතීය නීති සංග්‍රහය 14හි සඳහන් ආහාර පිළිබඳ නීති බොහෝ දෙනෙකුට නුහුරු දේවල්ය. ඒවා ඔබට උගන්වන්නේ කුමක්ද?

### දෙවියන්වහන්සේගේ සෙනඟ වන ඉශ්‍රායෙල් ආහාරයට ගත යුත්තේ පවිත්‍ර දේ පමණක්මය

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 14:3-20***

ඉශ්‍රායෙල් සෙනඟ කෑමට ගත යුත්තේ පවිත්‍ර ආහාර පමණක්ය. පවිත්‍ර ආහාරයක් වන්නේ කුමක්දැයි තීරණය කරන්නේ දෙවියන්වහන්සේය. විශේෂයෙන් හොඳ හෝ සෞඛ්‍යදායක බවක් ඉන් අදහස් නොකෙරේ. ඉන් අදහස් වන්නේ තම සෙනඟ එම ආහාර ගැනීම ගැන දෙවියන්වහන්සේ සතුටු වන බවය. එළුවන්, මාළුන්, කුකුලන් වැනි ඇතැම් සතුන් පවිත්‍රය. ඌරන්, ඉස්සන් හා රාජාලින් වැනි ඇතැම් සතුන් අපවිත්‍රය.

- මෙම නීති ඇති කිරීමට හේතුව කුමක්ද?

### ඔබ ශුද්ධය

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 14:1-2,21***

*දෙවියන්වහන්සේගේ සෙනග ශුද්ධ බව පැහැදිලි කරන්න. එබැවින් ඔවුන් අනෙක් ජාතීන්ගෙන් වෙනස් වියයුතුය.* දෙවියන්වහන්සේ ඇතැම් සතුන් පවිත්‍ර ලෙසත් අනෙක් සතුන් අපවිත්‍ර ලෙසත් දැක්වූයේ කුමක් නිසාදැයි අප නොදනිමු. ඒ තෝරාගැනීම කිරීමේ අයිතිය දෙවියන්වහන්සේට ඇත. එම කාලයේදී දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟ දෙවියන්වහන්සේ තෝරා දුන් ආහාර ආඥාව අනුව කටයුතු කළ යුතුය. මේ මගින් ඉශ්‍රායෙල් සෙනඟ වෙනස් පුද්ගලයන් බව පෙන්වාදෙයි.

### අනෙක් ආගම්වල මිනිසුන් මෙන් නොවන්න

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 14:1,21***

ඇතැම් මිථ්‍යාදෘෂ්ටියකයෝ කෙනෙකු මියගිය විට තමන්ගේ සිරුර කපා ගනිති. ඇතැම් මිථ්‍යාදෘෂ්ටිකයන් එළුපැටවකු උගේ මවගේ කිරිවලින්ම උයා රහස් පානයක් ලෙස දෙති. ඉශ්‍රායෙල් සෙනඟ වෙනස් ආකාරයේ අය විය යුතුමය. මිථ්‍යාදෘෂ්ටිකයන්ගෙන් වෙනස්ව ආහාර ගනිමින් ජීවත්විය යුතුය.

ⓘ **අදාළ කිරීම**: කිතුනුවන්ට සෑම ආහාරයක්ම අනුභව කළ හැකිය. සියලු ආහාර පවිත්‍ර බව යේසුස්වහන්සේ පැවසූ සේක (මාක් 7:19). සියලු ආහාර පවිත්‍ර බව පෙන්වීමට පේත්‍රුස්තුමාට දර්ශනයක් දක්වනු ලැබිණි. යේසුස්වහන්සේගේ ශුභාරංචිය සියලු පුද්ගලයන් සඳහාය. යේසුස්වහන්සේ දෙන්නාවූ ආහාර ගැනීමේ නිදහස ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

ද්විතීය නීති සංග්‍රහය 14හි පනත දීම සඳහා වූ හේතුව තවමත් වැදගත්ය. දෙවියන්වහන්සේගේ සෙනඟ නොඇදහිලිවතුන්ගෙන් වෙනස් විය යුතුය. පාවුල්තුමා කොරින්ති වාසීන්ට කියා සිටියේ පිළිමවලට පූජාකළ ආහාර ඔවුන්ටද අනුභව කළහැකි නමුත් වෙනත් කිතුනුවකු පාපයක් යැයි සිතන දේ කිරීමේ පරීක්ෂාවට ඔවුන් ලක්වන්නේ නොමැතිනම් පමණක් එසේ කරන ලෙසය. කෑමට ගැනීම හෝ නොගැනීමේ නිදහස කිතුනුවන්ට ඇත. නමුත් අප අන්‍යයන්ට ප්‍රේමකරමින් ඔවුන්ට උපකාරයක් වියයුතුය.

කිතුදහම අනුව නොවන ආගමික ආහාර වේලකට ඔබට ඇරයුම් කරනු ලැබුවහොත් හොඳින් සිතා බලන්න. ඔබ ආහාර ගතහොත් ඔබ වෙනත් ආගමක් වැළඳගෙන ඇතැයි අනෙක් අය සිතනු ඇත්ද?

⊙ **යාච්ඤා කරන්න**: *යම් දෙයක් ආහාරයට නොගෙන සිටීම වඩා හොඳ වන්නේ කුමන අවස්ථාවන් හිදී දැයි දැනගැනීමේ ප්‍රඥාව දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. අනෙක් කිතුනුවන් පාපයේ පරීක්ෂාවට ඔබ විසින් ලක් නොකරනු පිණිස ඔවුන්ට ප්‍රේමකරන්නට දෙවියන්වහන්සේගෙන් ප්‍රේමය ඉල්ලා සිටින්න.*

# 24 කිතුනුවන් දසයෙන් කොටසක් දිය යුතුද?

**පසුබිම**

පොරොන්දු දේශයේ ජිවත්විය යුතු ආකාරය සම්බන්ධව නිති ඉශ්‍රායෙල් සෙනඟට මෝසෙස් දෙමින් සිටින්නේය. දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නේ කෙසේද යන්නත් අනෙක් මිනිසුන්ට ප්‍රේමකරන්නේ කෙසේද යන්නත් නිති මගින් පෙන්වා දේ.

**22-29 පද කියවන්න**

*එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

**සටහන්**

- **ද්විතිය නිති සංග්‍රහය** 14:23. "දසයෙන් කොටස" යනු කොටස් දහයකට බෙදා ඉන් එකකි.
- **ද්විතිය නිති සංග්‍රහය** 14:23. "භය වෙන්ට": එනම් ගෞරවය දක්වන්න.
- **ද්විතිය නිති සංග්‍රහය** 14:27. "කොටසක්වත් උරුමයක්වත්": ලෙවී වංශයේ අයට ඉඩම් හිමි නැත.

**කිරීමට යමක්**

- *දසයෙන් කොටස දීම දෙවියන්වහන්සේට බියවීම/ගෞරව කිරීම උගන්වන්නේ කෙසේද?*

23 පදය. පොහොසත් වීමට හෝ අසිරු කාලයන්හි ප්‍රමාණවත් තරම් තිබීම සඳහා අපි ධාන්‍ය හෝ මුදල් ඉතිරි කිරීමට උත්සාහ ගන්නවා ඇත. අප එය කරන විට අප විශ්වාසය තබන්නේ අප කෙරෙහිමය. දසයෙන් කොටසක් දීම තුළ දෙවියන්වහන්සේගේ සෙනඟට තිබෙන ප්‍රමාණය අඩුවේ. නමුත් ඔවුන් දෙවියන්වහන්සේට මුල්තැන දීමටත් උන්වහන්සේට ගෞරවය දැක්වීමටත් ඉගෙන ගනිති.

24-26 පද. පූජාවන් කළ යුතු ස්ථානය වන්නේ ද්විතිය නීති සංග්‍රහය 12:5හි දැක්වෙන නමස්කාර කරන ස්ථානයටය. බොහෝ දෙනෙකු පූජා ඔප්පු කරන ස්ථානයෙන් දුර බැහැර ජිවත් වනු ඇත. සියලු ධාන්‍ය හා සතුන් රැගෙන යාම දුෂ්කර කාර්යයකි. එබැවින් ඉශ්‍රායෙල් සෙනඟට තම දසයෙන් කොටස විකුණා මුදල් ගෙන නමස්කාර කරන ස්ථානයට ගොස් එහිදී පූජා කිරීම සඳහා ආහාර මිලදී ගතහැකිය.

27 පදය. ලෙවී වංශයේ අය පූජකයන්ය. ඔවුන් සතුව ඉඩම්, භවභෝග හෝ සතුන් නොවීය. ලෙවීවරුන්ද පූජා කරන්නන් සමඟ එක්වී ඔවුන් සමඟ ආහාර ගන්නේය.

28-29 පද. සෑම තුන්වන අවුරුද්දේදීම දසයෙන් කොටස දුප්පතුන්ට දෙනු ලැබීය. දුප්පත් මිනිසුන් සතුව ඉඩම් නොතිබිණි. දුප්පතුන් වුයේ ලෙවීවරුන්, විදේශින්, පියකු නොමැති වුවන් හා වැන්දඹුවන්ය. දුප්පතුන් රැකබලා ගැනීමට දසයෙන් කොටස උපකාරී විය.

මෙම නීතිය කිතුනුවන්ට පවසන්නේ කුමක්ද? නව ගිවිසුමෙහි දසයෙන් කොටස ගැන නීතියක් නොදේ. නමුත් කිතුනු සේවය හා දුප්පතුන් සඳහාත් දෙවියන්වහන්සේට ස්තුති කිරීමට හා ගෞරවය දැක්වීම සඳහාත් ඉතා සතුටින් නොමසුරුව දෙන මෙන් නව ගිවිසුම කිතුනුවන් දිරිමත් කරන්නේය. මෙයින් බොහෝ දුරට අදහස් වන්නේ ඇතැම් පුද්ගලයන් දසයෙන් කොටසකට වඩා දෙන බවය.

- *ඔබේ සභාවේ සිටින අය දසයෙන් කොටස දෙන්නේද? එසේ දීමට හේතු ලෙස ඔවුන් දක්වන්නේ මොනවාද?*

**ප්‍රධාන කරුණ**

**නොමසුරුව දෙවියන්වහන්සේට දෙන්න.**

## → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 14:22-29

**ආරම්භය**

දෙවියන්වහන්සේ සතුටු සිතින් දෙන්නාට ප්‍රේමකරන සේක.

- ඔබ සතුටු සිතින් දෙන්නේද?

### දෙවියන්වහන්සේට දෙන්න

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 14:22-27***

දෙවියන්වහන්සේ සෙනඟට සියල්ලම දී තිබේ. ඔවුන්ගේ බෝග වැඩෙන විට සහ සතුන් බෝවන විට දෙවියන්වහන්සේ මතකතබාගත යුතුය. අවුරුද්දකට වරක් සියලු ඉශ්‍රායෙල් සෙනඟ සියල්ලෙන්ම දසයෙන් කොටස දියයුතු වන්නේය. දෙවියන්වහන්සේ තෝරාගත් යාග පූජා ඔප්පු කරන ස්ථාන වෙත ඔවුන් යායුතුය. සෙනඟ පූජාව අනුභව කරන විට ඉඩම් හිමි නැති ලෙවී පූජකවරුන්ද ඊට සහභාගි කරවා ගතයුතුය.

### අනෙක් අයට දෙන්න

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 14:28-29***

තුන්වන අවුරුද්දේදී දසයෙන් කොටස දුප්පතුන් එනම් ලෙවීවරුන්, විදේශීන්, පියා අහිමිවූවන් හා වැන්දඹුවන් සඳහා දෙනු ලැබේ. මේ අයට ඉඩම් හිමි නැත. ඔවුන්ට දීමට බෝග හෝ සතුන් නොමැතිය. ඔවුන්ට අන්‍යයන්ගේ උපකාර අවශ්‍ය වේ. දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ බොහෝ දේ ඇති අය ස්වල්පයක් ඇති අයට දෙනු දැකීමය. දිය යුත්තේ ඇයි?

දීම සඳහා හේතු හතරක් ඇත.

1. **තමන් දුන් ආශිර්වාද වෙනුවෙන් තම සෙනඟ තමන්ට ස්තුතිකිරීම දෙවියන්වහන්සේ බලාපොරොත්තු වනසේක.** සෙනඟ ප්‍රීතිවිය යුතුය (26 පදය).
2. **ස්වාමින්වහන්සේට ගෞරවාදරය දැක්වීම තම සෙනඟගෙන් දෙවියන්වහන්සේ බලාපොරොත්තු වනසේක** (23 පදය). *දසයෙන් කොටස දීම සෙනගට දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට හා උන්වහන්සේට බියවීමට උපකාරී වන්නේ කෙසේදැයි ඔබේ අසන්නන්ට පැහැදිලි කරන්න.*
3. **පූජකවරුන් සඳහා ද්‍රව්‍ය සපයාදීම තම සෙනඟගෙන් දෙවියන්වහන්සේ අපේක්ෂා කරන සේක.** පූජකවරු සෙනඟට සේවය කරති, ව්‍යවස්ථාව උගන්වති, යාග පූජා සූදානම් කරති.
4. **දුප්පත් ඉශ්‍රායෙල්වරුන් රැකබලාගැනීම තම සෙනඟගෙන් දෙවියන්වහන්සේ අපේක්ෂා කරන සේක.**

**අදාළ කිරීම**: තමන් උපයාගන්නා හා නිෂ්පාදනය කරන දෙයින් දසයෙන් කොටසක් දීම ගැන කිතුනුවන් තුළ එකඟත්වයක් නොමැත. සෑම දෙයකින්ම දසයෙන් කොටසක් දෙන ලෙස නව ගිවිසුම කිතුනුවන්ට උගන්වන්නේ නැත. නමුත් නව ගිවිසුම මෙම නීතිය වළක්වන්නේද නැත.

මෙම නීතිය තවමත් වලංගුව පැවතීමට හේතු සතරක් ඇත. 1. දෙවියන්වහන්සේට ස්තුතිකිරීම සඳහා කිතුනුවන් දියයුතුමය. 2. කිතුනුවන් දෙවියන්වහන්සේට බියවිය යුතුය. 3. කිතුනු සේවය සඳහා කිතුනුවන් දියයුතුමය. 4. දුප්පතුන් රැකබලාගැනීම කිතුනුවන් විසින් කළයුතුමය.

පැරණි ගිවිසුමේ දක්වා ඇති හේතු සියල්ලම කිතුනුවන් සඳහා ද වලංගුය.

බොහෝ කිතුනුවන්ට දසයෙන් කොටසට වඩා වැඩියෙන් දියහැකිය. ඇතැම් කිතුනුවන්ට හදවතින්ම දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නේ කෙසේද යන්නත් අප අපට ප්‍රේම කරන්නා සේ අපේ අසල්වැසියාට ප්‍රේම කරන්නේ කෙසේද යන්නත් මෙම ඡේදය අපට පෙන්වා දෙයි. අපි ප්‍රේම කරන්නේ නම් අපි නොමසුරුව දෙන්නෙමු.

**යාච්ඤා කරන්න**: *අප නොමසුරුව, ස්තුතිවන්ත හා ප්‍රීතිමත් අය බවට පත්කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. දෙවියන්වහන්සේ දුප්පතුන් සඳහාත් ප්‍රේමයක් අපට දෙන ලෙසත් දෙවියන්වන්සේගෙන් ඉල්ලන්න. අපට දී ඇති උන්වහන්සේගේ බොහෝ ආශීර්වාද ගෙන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.*

# 25 අවශ්‍යතාවයෙන් පෙළෙන අයට නොමසුරුව දෙන්න

### පසුබිම

පොරොන්දු දේශයේ ජීවත්වීම සඳහා මෝසෙස් ඉශ්‍රායෙල්වරුන් සූදානම් කරයි. දෙවියන්වහන්සේ වෙතින් ලැබුණාවූ පනත්වලට කීකරුවන ලෙස ඔහු ඔවුන් ධෛර්යවත් කරයි.

### 1-18 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය** 15:7,10. "හෘදය දැඩිකරගන්නේ" නැතහොත් "සිත් දැඩි-කරගන්නේ" යනු අකැමැත්තෙන් යන්නය.
- **ද්විතිය නිති සංග්‍රහය** 15:7,11. "අත පිස ගැනීම" යනු ආත්මාර්ථකාමී වීමය. "අත විදහා" යනු ණයට දීමට කැමැති බවය. දෙවියන්වහන්සේගේ සෙනඟ පරිත්‍යාග-ශීලි වියයුතුය.

### කිරීමට යමක්

මෙම නීති මගින් අවශ්‍යතාවෙන් පෙළුනු ඉශ්‍රායෙල්වරුන් රැකගනු ලැබිණි. පළමුවන නීතිය මගින් (1-11 පද) ණය අහෝසි කරනු ලබයි. දෙවන නීතිය වහලුන් සම්බන්ධවය.

1-6 පද. යම් ඉශ්‍රායෙල්වරයෙක් ඔබෙන් ණයට මුදල් ගෙන ඇත්නම් හත්වන අවුරුද්දේදී ඔබ එම ණය කපා හැරිය යුතුවේ. ඊට හේතුව මිනිසුන් දිගටම දුප්පත්ව සිටීම වැළැක්වීමය (4 පදය). ඉශ්‍රායෙල් සෙනඟ බෙදාහදා ගන්නේ නම් දෙවියන්වහන්සේ එම සෙනඟට ආශිර්වාද කරනු ඇත. එවිට සියල්ලන්ටම ප්‍රමාණවත් වන තරම් තිබෙනු ඇත.

- *මෙම නීතිය රැකීම අපහසුවන්නේ ඇයි?*

7-11 පද. හත්වන අවුරුද්ද ආසන්නව ඇතැයි සිතන්න. ඉශ්‍රායෙල්වරයෙකු ඔබෙන් ණයට ගන්නට බලාපොරොත්තු වේ. "එහෙත්, ඔහුට මගේ ණය ආපසු ගෙවන්නට කාලයක් නොමැතිය. ඒ නිසා ණයට නොදෙමි" යි ඔබ සිතන්නේය. දෙවියන්-වහන්සේගේ සෙනඟ මෙසේ නොසිතිය යුතුය. ඔවුන් තණ්හා නොවී පරිත්‍යාගශීලි වියයුතුවේ.

4 පදය පවසන්නේ "ඔබ අතර දුප්පතෙකු නොසිටිය යුතුය යුතුය" කියාය. 11 වන පදය පවසන්නේ "දුප්පතුන් කවදාත් දේශයෙහි ඉන්නේමය" කියාය. 4 වන පදය දක්වන්නේ වියයුතු දෙයයි. නමුත් සෙනඟ කෑදර නිසා 11 වන පදය සත්‍ය වන්නේය.

12-18 පද. යම් ඉශ්‍රායෙල්වරයෙක් සැබවින්ම දුප්පත් නම් ඔහුට වහලෙකු වියහැකිය. ඔහුගේ ස්වාමියා ඉශ්‍රායෙල්-වරයෙක් වියයුතුය. ස්වාමියා විසින් ඔහු රැකබලා ගතයුතුවේ. වසර හයකට පසුව වහලාට නිදහස ලැබේ. ස්වාමියා ඔහුට බොහෝසේ ආහාර ලබාදිය යුතුවේ.

කිතුනුවන්ට ණය කපාහැරීම සඳහා නිශ්චිත කාල වකවානු නොමැත. නමුත් නීතිය පැනවීම පිටුපස වූ කාරණා එලෙසින්ම පවත්වන්නේය. අවශ්‍යතාවෙන් පෙළෙන කිතුනුවන් ගැන අප සැලකිලිමත් වියයුතුය. අපට අවශ්‍ය ප්‍රමාණයට වඩා ඇත්නම් අපි ඒවා බෙදාගත යුතුය (ක්‍රියා 4:32). රැකියාවක් නොමැති සහෝදර කිතුනුවන්ට අප උපකාරී වියයුතුය.

- *ඔබ සිටින ස්ථානයෙන් කුමන නිදසුන් ඔබේ අසන්නන්ට ඔබට දියහැකිද?*

### ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේගේ සෙනඟ අතර අවශ්‍ය-තාවෙන් පෙළෙන පුද්ගලයන් කිසිවෙකුත් නොසිටිය යුතුය.**

# ➝ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 15:1-18

### ⊙ ආරම්භය

විශේෂිත අවශ්‍යතාවකදී අපගේ සහෝදර-යන්ට හා සහෝදරියන්ට අප උපකාර කරන්නේ කෙසේද? පුරාතන ඉශ්‍රායෙලයේ දුප්පතුන්ට උපකාර කිරීම පිණිස දෙවියන්-වහන්සේගේ සෙනඟට නීති තිබුණි.

### අවශ්‍යතාවයෙන් පෙළෙන අයට නොම-සුරුව ණයට දෙන්න

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 15:1-11***

ණය අහෝසි කිරීම පිළිබඳ නීතියෙන් කියැවෙන්නේ කුමක්දැයි ඔබේ අසන්නන්ට පවසන්න. බොහෝ හේතු නිසා දෙවියන්-වහන්සේගේ සෙනඟ දුප්පතුන් වියහැකිය. ඇතැම්විට රෝගාතුර වීම නිසාය. ඇතැම් විට ඔවුන් හොඳ ගොවීන් නොවන නිසා වියහැකිය. තමන්ගේ සියලු සෙනඟට ප්‍රමාණවත් තරම් දෙන බවට දෙවියන්-වහන්සේ පොරොන්දු වන සේක. නමුත් ඔවුන් අතර ඒවා බෙදාගත යුතුය.

**නිදසුන**: *9-10 පද කෑදර ලෙස සිතීම පිළිබඳ නිදසුනක් ලෙස යොදාගන්න. මෙම නීතියෙන් පැවසන්නේ දෙවියන්වහන්සේගේ සෙනග නොමසුරුව අත දිගහැර දියයුතු බවය.*

**අදාළ කිරීම**: අද කිතුනුවන් මෙම නීතියට කීකරුවන්නේ කෙසේද? අවශ්‍යතාවෙන් පෙළෙන කිතුනුවන් අනෙක් කිතුනුවන් විසින් රැකබලා ගතයුතුය. අපි නොමසුරුව දීමටත් අවශ්‍ය අවස්ථාවලදී ණයට දීමටත් සූදානම් වියයුතුය. අප සිටින ස්ථානයේ හා වෙනත් රටවල සිටින අවශ්‍යතාවෙන් පෙළෙන කිතුනුවන්ට අප උපකාර කළයුතුය. නිදසුන්:

- අවශ්‍යතාවෙන් පෙළෙන කිතුනුවෙකුට ඔබ ණය මුදලක් දෙයි. වසර හයකට පසු ඔබ එය කපාහරියි.
- කිතුනුවකු තමාගේ අයෝජනයක් සඳහා ඔබෙන් ණයට මුදල් ඉල්ලයි. ඔහු දුප්පතකු නොවන නිසා ඔබ ණයට මුදල් නොදෙයි. මෙම නීතිය ඇත්තේ මෙවැනි අවස්ථාවක් සඳහා නොවේ.
- වෙනත් රටක දුප්පත් කිතුනුවන් සිටී. ඔබ සහා සංවිධානයක් මගින් මුදල් ලබාදෙයි.

### දුප්පතුන්ට වැඩ ලබාදෙමින් පරිත්‍යාගශීලි වන්න.

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 15:12-18***

යම් ඉශ්‍රායෙල්වරයෙකු කෙතරම් දුප්පත්ව සිටින්නේද යත් ඔහුට වෙනත් කිසිවකුගේ වැඩක් ඉල්ලාගෙන කිරීමට සිදුවන්නේය. ඇතැම් විට ඔහුට ඔහුගේම ගොවිපලක් නොමැති වනු ඇත. එහෙත් තමා වහලෙකු සේ විකිණීමට ඔහුට හැකිවනු ඇත. වහලා අයිතිකරු ඔහු හොඳින් රැකබලාගෙන වසර හයකට පසු ඔහු නිදහස් කළ යුතුවේ.

**අදාළ කිරීම**: දුප්පත් හා රැකියාවක අවශ්‍යතාවෙන් සිටින කිතුනුවන්ට උපකාර කළහැකි ආකාරයෙන් අනෙක් කිතුනුවන් විසින් සොයාබැලිය යුතුය. මෙය යහපත් මෙන්ම පරිත්‍යාගශීලි දෙයකි. එය රැකියාව ලබාදෙන්නාට වියදමක් වනු ඇත.
සිතාබැලීමට නිදසුන් කිහිපයක්:

- සභාවේ වැඩකටයුතු කිරීම සඳහා දුප්පත් සාමාජිකයෙකුට රැකියා අවස්ථාවක් ලබාදීම.
- කිතුනු ව්‍යාපාරිකයෙකු සහෝදර කිතුනු-වන්ට වැඩක් කිරීමට රැකියාවක් ලබාදීම.
- දුප්පත් කිතුනුවන් සඳහා වෙනත් රටවල රැකියා අවස්ථාවන් සපයාදෙන කිතුනු සංවිධානවලට කිතුනුවන්ගේ නම් ලබාදීම.

දෙවියන්වහන්සේ තම සෙනඟට ආශිර්වාද කරන සේක. නමුත් තම සෙනඟ පරිත්‍යාග-ශීලි වීමද දෙවියන්වහන්සේ අපේක්ෂා කරනසේක. අප දෙවියන්වහන්සේගේ ආශිර්වාද කෙරෙහි විශ්වාස කළ යුතුවේ. දෙවියන්වහන්සේ නොමසුරුව අපට දෙන සේක. අප සතු සියල්ලම ලැබී ඇත්තේ දෙවියන්වහන්සේගෙන්ය.

**යාච්ඤා කරන්න**: *ඔබට වඩා වැඩි අවශ්‍යතා-වකින් පෙළෙන සහෝදර සහෝදරියන්ට නොමසුරුව දීමටත් ණයට දීමටත් ඔබට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

## ⬇ අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 16:1-17

# 26 දෙවියන්වහන්සේ කළ දෙය මතකතබාගෙන සමරන්න

### « පසුබිම
දෙවියන්වහන්සේගේ නීතිවලට කීකරුවීම සඳහා මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ දිරිගන්වමින් සිටියි.

### ⌄ 1-17 පද කියවන්න

### ⌄ සටහන්
- **ද්විතිය නීති සංග්‍රහය** 16:3. "මුහුන්" යීස්ට් වැනි පැසීම් කාරකයකි. මුහුන් නොදැමූ රොටි ඉක්මනින්ම පිසගත හැකිය.
- **ද්විතිය නීති සංග්‍රහය** 16:13. "කූඩාරම්" යනු තාවකාලිකව අටවාගත් ආවරණයන්ය. පාළුකරයේ තමන් කූඩාරම්වල ජීවත්වූ ආකාරය සිහිකිරීම සඳහා සැමරීම් උත්සව කාලයන්හි සෙනඟ කූඩාරම්වල සිටියෝය.

### ⊙ කිරීමට යමක්
ඉශ්‍රායෙල්වරුන්ට මංගල්‍යයන් (සැමරීම් උත්සව) තුනක් තිබුණි: 1. **පාස්කු මංගල්‍යය** (නික්මයාම 12:1-28; ලෙවී කථාව 23:4-8), **2. සති මංගල්‍යය** (ලෙවී කථාව 23:15-21), **3. කූඩාරම් මංගල්‍යය** (ලෙවී කථාව 23:33-44).

- *මේ එක් එක් මංගල්‍යය සඳහා සෙනග කුමක් මතකතබාගත යුතුද? ඔවුන් සමරන්නේ කුමක්ද?*

1-8 පද. දෙවියන්වහන්සේගේ සෙනඟට තමන් මිසරයෙන් බේරාගෙන එනු ලැබීම පාස්කුව මගින් සිහිපත් කරන්නේය. සෙනඟ කලබලයෙන් හදිසියේම මිසරයෙන් පිටතට ආ බැවින් මෙම මංගල්‍යයේදී ඔවුන් භාවිත කරන්නේ නුමුහුන් රොටිය.

9-12 පද. සති මංගල්‍යය පවත්වන්නේ ධාන්‍ය අස්වැන්න සඳහා ස්තුති කිරීමටය. දෙවියන්වහන්සේගේ ආශිර්වාද ගැන සෙනඟ ප්‍රීති ප්‍රමෝද වියයුතුය. ඉඩම්වලට හිමිකමක් නොමැති අයද මෙම උත්සවයට හවුල්කර ගතයුතුය. තමන් මිසරයේ වහලුන්ව සිටිය බව සෙනඟ සිහිපත් කළ යුතුය.

13-15 පද. කූඩාරම් මංගල්‍යය පැවැත්වෙන්නේ අස්වැන්න එකතුකර අවසානයේදීය. ඉඩම් හිමිකමක් නොමැති දුප්පතුන්ද මෙයට එකතුකර ගතයුතුය. දෙවියන්වහන්සේ තමන්ට දුන් සියල්ල සිහිපත් කරමින් සෙනඟ උත්සව පැවැත්විය යුතුය.

16-17 පද. මේ උත්සව තුනම පැවැත්වෙන්නේ දෙවියන්වහන්සේ විසින් තෝරාගනු ලැබූ ස්ථානයේය.

- *මෙම මංගල්‍යයන් තුන මගින් කිතුනුවන්ට පැවසෙන්නේ කුමක්ද?*

1. **යේසුස්වහන්සේ අපගේ පාස්කු බැටළු පැටවාණෝය** (1 කොරින්ති 5:7). අප උදෙසාවූ යේසුස්වහන්සේගේ මරණය කිතුනුවන් සමරන්නේ ස්වාමීන්වහන්සේගේ රාත්‍රි භෝජනය හෙවත් සත්ප්‍රසාදය අවස්ථාවේදීය.
2. **සති මංගල්‍යය ග්‍රීක භාෂාවෙන් හඳුන්වන්නේ පෙන්තකොස්ත කියාය.** අපගේ හදවත්වල තමන්වහන්සේගේ ව්‍යවස්ථාව ලිවීමට දෙවියන්වහන්සේ විසින් ශුද්ධාත්මයාණන් දීම කිතුනුවන් මේ දිනයේ සමරති.
3. **කූඩාරම් මංගල්‍යය** යොහන් 7:37-39 සඳහන් වේ. යේසුස්වහන්සේ ශුද්ධාත්මය නමැති ජීවමාන ජලධාරාව දෙනසේක. කිතුනුවන් යේසුස්වහන්සේ හා ශුද්ධාත්ම දීමනාව ලැබීම සමරන්නේය.

### ⊕ ප්‍රධාන කරුණ
**දෙවියන්වහන්සේගේ සෙනඟ තමන් උදෙසා දෙවියන්වහන්සේ කළ දේ සිහියේ රඳවාගෙන සැමරීම් කළ යුතුය.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 16:1-17

### ⊙ ආරම්භය

දෙවියන්වහන්සේ ගැන මතකතබාගැනීමටත් ප්‍රීති ප්‍රමෝද වීමටත් දෙවියන්වහන්සේගේ සෙනඟට උත්සව තිබීම වැදගත් වේ. පැරණි ගිවිසුමේ සඳහන් දෙවියන්වහන්සේගේ සෙනඟට වැදගත් මංගල්‍යයන් තිබුණි.

### පාස්කු මංගල්‍යය

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 16:1-8***

*පාස්කුවට පසුබිම්වූ කාරණයත් මිසරයේ සෙනග ගළවාගැනීම ගැනත් ඔබේ අසන්නන්ට පවසන්න.* වැදගත් කාරණා වන්නේ:

- දෙවියන්වහන්සේ කළ දේ **මතකතබාගැනීම** (1,3,6 පද).
- **ප්‍රීතිවන්න** (1 පදය)

මේ මංගල්‍යය මගින් කිතුනුවන්ට පැවසෙන්නේ කුමක්ද? යේසුස්වහන්සේ අපගේ පාස්කු බැටළු පැටවාණෝය. පාපයේ වහල්කමෙන් අප ගළවාගත්තේ උන්වහන්සේගේ මරණයයි. මෙය ඉශ්‍රායෙල් සෙනඟ මිසරයේ වහල්කමින් මුදාගැනීමට වඩා වැදගත් කාරණයකි. අප මෙය සිහිපත් කරමින් ප්‍රීතිවිය යුතුය.

### සති මංගල්‍යය

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 16:9-12***

*මෙම මංගල්‍යය පැවැත්වීමට හේතුවූ කාරණා ඔබගේ අසන්නන්ට පවසන්න.* වැදගත් කාරණා වන්නේ,

- **සිහිකරන්න.** තමන් මිසරයේ වහලුන්ව සිටිය බව සෙනඟ මතකතබාගත යුතුය (12 පදය).
- **ප්‍රීතිවන්න** (10,11 පද)
- සියලු සෙනඟ **ඇතුළත් කරගන්න** (11 පදය)

මෙම මංගල්‍යය කිතුනුවන්ට පවසන්නේ කුමක්ද? නව ගිවිසුමෙහි මෙම මංගල්‍යය හඳුන්වන්නේ **පෙන්තකොස්තය** කියාය. පෙන්තකොස්ත යනු දෙවියන්වහන්සේ තම ශුද්ධාත්මයාණන් තම සියලු සෙනඟට දුන් අවස්ථාවය. ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ හදවත් මත දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ලියන සේක. අප දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ට ස්තුති පුද කරමින් ආත්මයාණන් තුළ හැසිරෙමු.

### කූඩාරම් මංගල්‍යය

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 16:13-15***

*මෙම මංගල්‍යයේ පසුබිම ඔබේ අසන්නන්ට පවසන්න.* වැදගත් කරුණු වන්නේ,

- **සිහිකරන්න.** පාලුකරයේ තමන් කූඩාරම්වල ජීවත්වූ ආකාරය සෙනඟ සිහිපත් කරන්නේය. දෙවියන්වහන්සේ එම කාලයේදී ඔවුන්ට අවශ්‍ය සියලුම දේ දුන්සේක.
- **ප්‍රීතිවන්න** (14,15 පද)
- සියලු සෙනඟ **ඇතුළත් කරගන්න** (14 පදය)

මෙම මංගල්‍යය කිතුනුවන්ට පවසන්නේ කුමක්ද? යොහන් 7 පරිච්ඡේදයේ යේසුස්වහන්සේ කූඩාරම් මංගල්‍යය සැමරූ අවස්ථාවේ උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් ජීවනදායක ජලය ඇති ගංගාවක් සේ දීමට පොරොන්දු වූ සේක (යොහන් 7:37-39). දෙවියන්වහන්සේ පාළුකරයේදී ජලය සපයා දුන්සේක. යේසුස්වහන්සේ තම ආත්මයාණන් තුළ ජීවනදායක ජලය ලබාදෙන සේක.

ⓘ **අදාළ කිරීම**: යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ තමන් වෙනුවෙන් කළ දෙය සිහිපත් කරමින් කිතුනුවා මෙම මංගල්‍යය පැවැත්විය යුතුවේ. යේසුස්වහන්සේගේ මරණය සිහිකිරීමේ අපගේ ප්‍රධාන උත්සවය වන්නේ ස්වාමීන්වහන්සේගේ භෝජනය හෙවත් ශුද්ධ සහභාගිකමය. අපගේ හදවතින්ම යේසුස්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමින් විධිමත්ව අප මෙය සැමරිය යුතුවේ. ඉශ්‍රායෙල් සෙනඟට මංගල්‍යයන් පැවැත්වීම සඳහා දිගු වන්දනා ගමනක් යාමට සිදුවිය. කිතුනුවන්ට ඕනෑම තැනක මංගල්‍යය පැවැත්විය හැකිය.

⊙ **යාච්ඤා කරන්න**: *අප පාපයෙන් බේරාගත් යේසුස්වහන්සේ ගැනත් කුරුසිය මත සිදුවූ උන්වහන්සේගේ මරණය ගැනත් දෙවියන්වහන්සේට ස්තුති කරන්න. සියලු ඇදහිලිවතුන් තුළ ජීවත්වන්නාවූ දෙවියන්වහන්සේගේ විස්මිත දීමනාව වන ශුද්ධාත්මයාණන් ගැන උන්වහන්සේට ස්තුතිකරන්න.*

# 27 දෙවියන්වහන්සේගේ පාලනය යටතේ සිටීම

### පසුබිම
රජ කෙනෙකු ඇතිව සිටීම සඳහා මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ සූදානම් කරමින් සිටී. ඔවුන්ට සිටිය යුතු වන්නේ කෙබඳු රජ කෙනෙකු දැයි ඔහු ඔවුන්ට පවසයි.

### 14-20 පද කියවන්න
*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්
- **ද්විතිය නිති සංග්‍රහය** 17:16. "බොහෝ අශ්වයන්" යනුවෙන් අදහස් කරන්නේ ශක්තිමත් හමුදාවක් බවය. "මිසරයට හැරීයන්ට" යන්නෙන් අදහස් කරන්නේ වෙනත් රටක් මත පදනම් වීමය.
- **ද්විතිය නිති සංග්‍රහය** 17:17. "සපයා" ගැනීම හෙවත් එක්රැස් කරගැනීමෙන් අදහස් කරන්නේ විශාල වශයෙන් රැස්කර ගැනීමය.
- **ද්විතිය නිති සංග්‍රහය** 17:18. "මේ ව්‍යවස්ථාවෙන් පිටපතක්" යන්නෙන් අදහස් කරන්නේ ද්විතිය නිති සංග්‍රහයේ පිටපතක්ය.

### කිරීමට යමක්
පසුව ඉශ්‍රායෙල් සෙනඟ රජකු ඉල්ලා සිටිනු ඇත (1 සාමුවෙල් 8). ඉන් පෙර යෝෂුවා සහ ගිඩියොන් හා සම්සොන් වැනි විනිශ්චයකාරයන් සෙනඟට මඟපෙන්වනු ඇත.

රජෙකු සතුවිය යුතු ලක්ෂණ මොනවාදැයි සිතට ගන්න:
- දෙවියන්වහන්සේ තෝරාගත් මනුෂ්‍යයෙකු වීම (15 පදය)
- විදේශිකයෙකු නොව ඉශ්‍රායෙල්වරයෙකු වීම (15 පදය)
- හමුදාව හෝ වෙනත් ශක්තියක් ගැන විශ්වාසය නොතබන අයෙකු වීම (16 පදය)
- දෙවියන්වහන්සේ වෙතින් තම හදවත වෙනතක යොමු කරවනු පිණිස බොහෝ භාර්යාවන් නොසිටීම (17 පදය)
- පමණට වඩා මුදල් තිබෙන අයෙකු නොවීම (17 පදය)
- දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කියවන්නටත් ලියන්නටත් දත් අයෙකු වීම (18-19 පද)
- දෙවියන්වහන්සේට ගරුබුහුමන් දක්වමින්, ගෞරවය දෙමින්, කීකරුවන අයෙකු වීම (19 පදය)
- ආඩම්බර අයෙකු නොවීම (20 පදය)

ශක්තිමත් හමුදාවක්, බොහෝ භාර්යාවන් හා බොහෝ මුදල් පරීක්ෂාවන් වන්නේය. රජෙකු දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගෙනයාමට ඒවාට හැකිවන්නේය. රජතුමා විසින් ව්‍යවස්ථාවේ පිටපතක් තමා විසින්ම ලියාගත යුතු වන්නේ ඒ නිසාය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කුමක්දැයි දැනගන්නා පිණිසත් ඒවාට කීකරුවනු පිණිසත් රජු දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කියවිය යුතුවේ. ඉන් අදහස් වන්නේ රජු දෙවියන්වහන්සේගේ පාලනය යටතේ සිටින බවය. දෙවියන්වහන්සේගේ සියලු සෙනඟ දෙවියන්වහන්සේගේ වචනය කියැවිය යුතුය (ගීතාවලිය 1:2). රජු හා සෙනඟ අතර වෙනසක් නොමැත.

බොහෝමයක් රජවරු මේ ව්‍යවස්ථාවට කීකරු නොවූහ. 1 රාජාවලිය සහ 2 රාජාවලියේ සඳහන් සෑම රජෙකුම පාහේ නරක පුද්ගලයන් විය. සලමොන් (1 රාජාවලිය 2-11) මේ ව්‍යවස්ථාවේ සඳහන් සියලුම නරක දේ කළේය. ඔහුට අශ්වයන් බොහෝ විය. භාර්යාවන් බොහෝ විය. බොහෝ ධනය තිබුණි. ඔහුගේ හදවත දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගියේය.

සැබෑ රජු වන්නේ දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේ තම ව්‍යවස්ථාව තුළින් ඉශ්‍රායෙල් රජවරුන් පාලනය කළ සේක. රජවරුන් පිළිබඳ නීතිය පරිපූර්ණ රජිඳාණන් වන යේසුස්වහන්සේ දෙස බැලීමට අපට උපකාරී වේ. යේසුස්වහන්සේ සභාවේ රජුය. මේ නීතියෙන් දැක්වෙන්නේ අද කාලයේ රජුන් හා ජාතීන්ගේ පාලකයන් පිළිබඳව නොවේ.

### ප්‍රධාන කරුණ
**දෙවියන්වහන්සේගේ සෙනඟගේ නායකයා දෙවියන්වහන්සේ යටතේ සිටින්නෙකු වියයුතුමය. මෙය පරිපූර්ණව සිදුකළේ යේසුස්වහන්සේ පමණක්මය.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 17:14-20

### ⊳ ආරම්භය

බොහෝ රටවලට රජවරු සිටිති. රජවරුන් වනාහි ප්‍රබල පාලකයන්ය.

- පරමාදර්ශී හෝ හොඳම රජු කෙබඳු අයෙක්ද?

ඉශ්‍රායෙල් ජනතාවට බොහෝ දුෂ්ඨ රජවරු සිටියෝය. ඔවුන්ගෙන් කිසිවෙකුත් සර්ව සම්පූර්ණ අය නුවූහ.

### රජෙකු පිළිබඳ අනතුරු ඇඟවීම් තුනක්

**⌄ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 17:16-17***

රජවරුන්ට බොහෝ අශ්වයන් නොසිටිය යුතුය. බොහෝ අශ්වයන් සිටීම තුළ රජවරු දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබනු වෙනුවට තමන්ගේ ශක්තිය කෙරෙහි විශ්වාසය තබන්නෝය.

රජවරුන්ට බොහෝ භාර්යාවන් නොසිටිය යුතුය. බොහෝ භාර්යාවන් විසින් රජෙකුට දෙවියන්වහන්සේ වෙතින් ඉවතට යාමේ පරීක්ෂාව ගෙනෙනු ඇත.

රජවරුන්ට බොහෝ ධනය නොතිබිය යුතුය. දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගෙනයන එක පරීක්ෂාවක් වන්නේ මුදල්ය.

*මේ කාරණා තුනේදී සලමොන් රජු අසාර්ථක වූ අයුරු ඔබේ අසන්නන්ට පවසන්න.*

### දෙවියන්වහන්සේ යටතේ සිටින රජෙක්

**⌄ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 17:14-15, 18-20***

රජු දෙවියන්වහන්සේ යටතෙහි සිටිය යුතුය. තමා සිතන පතන ආකාරයට ඔහු ක්‍රියා නොකළ යුතුය. රජු ඉශ්‍රායෙල් ජාතිකයකු වියයුතුය. ඔහු ව්‍යවස්ථාවේ පිටපතක් තමා විසින්ම ලියාගෙන ඔහුගේ සියලු දවස්වල එය කියැවිය යුතුය. රජු විසින් දෙවියන්වහන්සේට ගෞරව දැක්විය යුතුය. රජු ආඩම්බර නොවිය යුතුය.

කිතුනුවන් පුරාතන ඉශ්‍රායෙල් සෙනඟ මෙන් ජාතියක් නොවේ. ඔවුන්ට සිටි ආකාරයෙන් අපට රජෙකු නොමැත. අද දෙවියන්වහන්සේගේ සෙනඟ වන්නේ සභාවය. සභාවේ නායකයන් පිළිබඳව මේ ව්‍යවස්ථාව අපට පවසයි. සභා නායකයන් දෙවියන්වහන්සේගේ පාලනය යටතේ සිටිය යුතුය. සභා නායකයන් සැබෑ ඇදහිලිවන්තයන් වියයුතුය. සභා නායකයන් දෙවියන්වහන්සේගේ වචනය දන්නා නිහතමානී අය වියයුතුය.

ඇතැම් සභා නායකයෝ දෙවියන්වහන්සේගේ පාලනය යටතේ නොසිටිති. ඇතැම් අය දෙවියන්වහන්සේගේ වචනය හොඳින් දන්නේ නැත. ඇතැම් අය ආඩම්බරය. සමහර සභා නායකයන්ට අවශ්‍ය වන්නේ බලය හා මුදල්ය. ඇතැම් සභා නායකයන් ලිංගික පාපයන්හි නියැළෙති. මේවා යහපත් දේවල් නොවන්නේය. මෙබඳු නායකයන් ගැන දෙවියන්වහන්සේ සතුටු නොවන සේක.

### පරිපූර්ණ රජු

*ඉශ්‍රායෙල් සෙනගට කිසිදාක පරිපූර්ණ රජෙකු නොවූ බව ඔබේ අසන්නන්ට පැහැදිලි කර දෙන්න.* දාවිත්ගේ පුත්‍රයාණන් වූ යේසුස්වහන්සේ පමණක් පරිපූර්ණ රජතුමා වූසේක. උන්වහන්සේ සැමවිටම දෙවියන්වහන්සේගේ නීතිය යටතේ සිටීසේක. බොහෝ අශ්වයන්, භාර්යාවන් හෝ මුදල් මගින් යේසුස්වහන්සේ පරීක්ෂාවට නොවැටුණු සේක. යේසුස්වහන්සේ සභාවේ රජතුමාණෝය. කිතුනුවන් අයත්වන්නේ උන්වහන්සේගේ රාජධානියටය. කිතුනුවන් ජීවත්විය යුත්තේ උන්වහන්සේගේ පාලනය යටතේය.

**! අදාළ කිරීම**: ඔබගේ ස්ථානයේ සභාවේ නායකයන්ට ඇති පරීක්ෂාවන් මොනවාද? *දෙවියන්වහන්සේගේ වචනය යටතේ ජීවත්වීමට සභා නායකයන් දිරිමත් කරන්න. සභා නායකයන් උදෙසා යාච්ඤා කරන්නට සභා සාමාජිකයන් උනන්දු කරවන්න.*

**↑ යාච්ඤා කරන්න**: *පරිපූර්ණ රජතුමා වන යේසුස්වහන්සේ ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න. සභාවේ නායකයන් උදෙසා යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේගේ පාලනය යටතේ ඔවුන් සිටිනු පිණිස යාච්ඤා කරන්න.*

# 28 දෙවියන්වහන්සේගේ ප්‍රොපේතවරුන්ට ඇහුම්කන් දෙන්න

## ⊗ පසුබිම

මෝසෙස් ඉක්මනින් මියයනු ඇත. ඔහුගේ මරණින් පසුව දෙවියන්වහන්සේ තම සෙනඟට ප්‍රොපේතවරුන් මගින් කතාකරනු ඇත.

## ⊙ 9-19 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

## ⊗ සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය** 18:9. "පිළිකුල්" යන්නෙන් අදහස් කරන්නේ දෙවියන්වහන්සේ අතිශයින් අකැමැති දේය.
- **ද්විතිය නිති සංග්‍රහය 18:10.** "ජේන" කීම යනු ආත්ම හෝ ඉන්ද්‍රජාල යොදාගනිමින් අනාගතය පෙන්වන හෝ යම් දෙයක් සඳහා වගකිව යුත්තේ කවුරුන්දැයි දැක්වීමය. "නිමිති" බැලීම යනු සිදුවනු ඇත්තේ කුමක්දැයි පිළිබඳව ආත්මයන්ගෙන් හෝ ලකුණු පෙන්වීමය.
- **ද්විතිය නිති සංග්‍රහය** 18:11. "මතුරන්නෙක්වත් ආත්ම බන්ධන කාරයෙක්වත්" යනු තමන්ට මළවුන් සමඟ කතාකළ හැකියැයි පවසන අයය. "අනවින" යනු වෙනත් අයකු මත මන්ත්‍ර භාවිතයෙන් වරදක් කිරීමය.

## ⊙ කිරීමට යමක්

9-14 පද. වෙනත් දෙවිවරුන් නමස්කාර කරන ඇතැම් පුද්ගලයෝ දෙවිවරුන්ට පූජාවක් ලෙස තම දරුවන් පූජා කරති. මෙය නොකළයුතු වැරදි දෙයක්ය. වෙනත් ආගම්වල තමන්ට අනාගතය ගැන කිවහැකි යැයි පවසන පුද්ගලයෝ සිටිති. කට්ටඩියන් හෝ ගුරුකම් කරන්නන් මෙන් ඔවුහු සෙනඟ මත ඉන්ද්‍රජාල දමති. අනාගතය ගැන දැනගන්නට ඔවුන් මළවුන්ට කතාකිරීමට හෝ ආත්ම කැඳවීමට උත්සාහ දරනු ඇත.

- *ඔබගේ ප්‍රදේශයේ සිදුවන මෙබඳු දේ මොනවාද?*

මේ සියලු දේවල් මගින් සෙනඟ නොමඟ යවනු ලබයි. බොරු කියන සාතන් වෙතින් ඒවා පැමිණේ. මේවා දෙවියන්වහන්සේට පිළිකුල් හා අප්‍රසන්න දේවල්ය. දෙවියන්වහන්සේගේ සෙනඟ මන්ත්‍ර ගුරුකම් කරන්නන්, ජේන කියන්නන් හෝ වෙනත් එවැනි පුද්ගලයන් වෙත නොයා යුතුය.

සියලු දෙයකම පාලනය ඇත්තේ දෙවියන්වහන්සේ අතය. තමන්වහන්සේගේ සෙනඟ දැනගත යුතු සියල්ල දෙවියන්වහන්සේ ඔවුන්ට පවසන සේක. 9-14 පදවල ඇති නරක දේවල් වලට පසුව 15-18 පදවල නිවැරදි දේ දක්වා ඇත්තේ ඒ නිසාය.

15-18 පද. දෙවියන්වහන්සේ විසින් මෝසෙස් වැනි වූ ප්‍රොපේතවරයෙක් තම සෙනඟට එවනු ඇත. ප්‍රොපේතවරයා දෙවියන්වහන්සේගේ වචන පවසනු ඇත.

මෝසෙස් වැනි වූ බොහෝ ප්‍රොපේතවරුන් අපට පරණ ගිවිසුමෙහි දැකගත හැකිය. එලියා, එලිෂා, ආමොස් සහ තවත් එවැනි අය දැකිය හැකිය. නමුත් මෝසෙස් මෙන්වූ ප්‍රධාන ප්‍රොපේතවරයා වන්නේ යේසුස්වහන්සේය. යේසුස්වහන්සේගේ බව්තිස්මය සිදුවූ අවස්ථාවේ ස්වර්ගයෙන් නිකුත්වූ දෙවියන්වහන්සේගේ හඬ පැවසුවේ "මොහුට සවන් දෙන්න" කියාය. අද දවසේ කිතුනුවන් හට දෙවියන්වහන්සේ තමන්ගේ ලිඛිත හා පැහැදිලි කරදුන් වචනය වන බයිබලය තුළින් කතාකරන සේක.

## ⊕ ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේ තම ප්‍රොපේතවරුන් මගින් කතාකරන කල්හි ඔවුනට ඇහුම්කන් දෙන්න. ඉන්ද්‍රජාල හෝ මන්ත්‍ර ගුරුකම් පස්සේ නොයන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 18:9-19

## ⊳ ආරම්භය

අනාගතය ගැන දැනගැනීමට මිනිසුන් කැමතිය. නමුත් අනාගතය ගැන දැනගැනීමට මිනිසුන් බොහෝ විට යන්නේ වැරදි පුද්ගලයන් වෙතය. *ඔබේ ප්‍රදේශයෙන් නිදසුන් දෙන්න.*

## දෙවියන්වහන්සේ පවසන දෙය වැරදි ආකාරයෙන් බැලීම

**⊙ කියවන්න: *ද්විතීය නීති සංග්‍රහය 18:9-14***

තමන්ට මළවුන් හා කතාකළ හැකි යැයිද ඔවුන්ගේ පණිවිඩ ලැබෙන්නේ යැයිද පවසන අය වෙත නොයන්නැයි මෝසෙස් සෙනඟට පවසයි. මේ ඇතැම් පුද්ගලයෝ සෙනඟ මත ඉන්ද්‍රජාල ක්‍රියා යොදති. ඒ පුද්ගලයන්ගෙන් ඇතමෙකු අනාගතය සඳහා ලකුණු සොයති. ඇතැම් නොඇදහිලිවන්තයෝ තම දෙවිවරුන්ට පූජා පිණිස තම දරුවන් පවා බිලිදෙති. මේ සියල්ල ඉතාම නරක දේවල්ය. කේන්දර බැලීම, යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම්, අවතාර යන මේ සියල්ලම වැරදි දේවල්ය. දෙවියන්වහන්සේ මේ දේවල් තදින්ම අප්‍රිය කරන සේක.

*මේ දේවල් සාතන් විසින් ඔවුන් රැවටීමට කරන ප්‍රයත්නයක් බව ඔබේ අසන්නන්ට පැහැදිලි කර දෙන්න.* ඔබ රවටන්නට ඉඩ නොදෙන්න. ග්‍රහ තාරකා සහ ඉන්ද්‍රජාල අප පාලනය නොකරයි. පාලනය කරන්නේ දෙවියන්වහන්සේ පමණක්මය. ඇතැම් කිතුනුවන් පවා මේවා අනුව කටයුතු කිරීමට ඉඩ ඇති නමුත් ඔබ ඔවුන් අනුගමනය නොකරන්න. ඔබ රවටන ඔබට බොරු කියන සාතන්ගෙන් ඈත්ව සිටින්න. ජීවිතය හා මරණය පාලනය කරන්නේ දෙවියන්වහන්සේය. සාතන්ට අවශ්‍ය දෙවියන්වහන්සේ නොමැති මරණයක් ඔබට අත්වනු දැකීමය. නමුත් දෙවියන්වහන්සේ නොමැති මරණය වන්නේ නිරයයි.

මෙවැනි වැරදි දේවලට බිය නොවන්න. මන්ත්‍රකරුවකු ඔබට හුනියමක් හෝ මන්ත්‍ර ජප කිරීමක් කළහොත් කුමක් සිදුවනු ඇතිද? දෙවියන්වහන්සේ ඊට වඩා බලවත් බව මතකතබාගන්න. යේසුස්වහන්සේ තුළ ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප ඈත්කර තබන්නට කිසිවෙකුට නොහැකිය.

## දෙවියන්වහන්සේ පවසන දෙය ඇසීමේ නිවැරදි මාර්ගයන්

**⊙ කියවන්න: *ද්විතීය නීති සංග්‍රහය 18:15-19***

දෙවියන්වහන්සේ අපට පවසන්නේ කුමක්දැයි දැනගන්නට අපට අවශ්‍ය නම් එය පහසුවෙන් කළ හැකිය. මෝසෙස් මියගිය පසු මෝසෙස් වැනි වෙනත් ප්‍රොපේතවරුන් දෙවියන්වහන්සේ නැගිටෙවූ සේක. මෙම ප්‍රොපේතවරුන් දෙවියන්වහන්සේගේ වචන සෙනඟට පවසනු ඇත. *පැරණි ගිවිසුමේ සඳහන් ඇතැම් ප්‍රොපේතවරුන් ගැන ඔබේ අසන්නන්ට පවසන්න.* සැබෑ ප්‍රොපේතවරුන්ට පමණක් සවන් දියයුතු බවට දෙවියන්වහන්සේගේ සෙනඟට අනතුරු ඇඟෙවූසේක.

## ශ්‍රේෂ්ඨතම ප්‍රොපේතවරයා සහ අද දවසේ ඇදහිලිවන්තයන්

ශ්‍රේෂ්ඨතම ප්‍රොපේතවරයා වන්නේ යේසුස්වහන්සේය. උන්වහන්සේ බව්තීස්මය ලැබූ අවස්ථාවේ ස්වර්ගයෙන් නිකුත් වූ දෙවියන්වහන්සේගේ හඬ පැවසුවේ **"මොහුට සවන්දෙන්න"** කියාය.

අද දවසේ ඇදහිලිවන්තයන් දෙවියන්වහන්සේ පවසන දෙයට ඇහුම්කන් දියයුතුමය. දෙවියන්වහන්සේ බයිබලය තුළින් කතාකරන සේක. දෙවියන්වහන්සේ තම ප්‍රොපේතවරුන් හා තමන්වහන්සේගේ පුත් යේසුස්වහන්සේ තුළින් කතාකළ සේක (හෙබ්‍රෙව් 1:1-4). අප ඒවාට ඇහුම්කන් දී කීකරු වියයුතුය.

දෙවියන්වහන්සේ පැහැදිලිව කතාකරන සේක. උන්වහන්සේගේ වචන අපහසු නොවන්නේය. අනාගතය ගැන දැනගන්නට අප අනෙක් දෙවිවරුන්ගේ මාර්ග අනුගමනය නොකළ යුතුමය. දෙවියන්වහන්සේගේ වචනය වන බයිබලයට අප ඇහුම්කන් දියයුතු අතර ඊට කීකරු වියයුතුය.

**⊕ යාච්ඤා කරන්න:** *තමන්වහන්සේගේ වචනය තුළින් පැහැදිලිව අපට කතාකරන බැවින් දෙවියන්වහන්සේට ස්තුති කරන්න. වඩ වඩාත් උන්වහන්සේගේ වචනයට ඇහුම්කන් දෙමින් ඊට කීකරුවීමට ඔබට හැකිවනු පිණිස යාච්ඤා කරන්න.*

## අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 22:1-12

# 29 ජීවිතයේ සෑම දෙයක්ම දෙවියන්වහන්සේ වෙනුවෙන් කළ යුතුය

### පසුබිම

පොරොන්දු දේශයේ ජීවත්වීම සඳහා මෝසෙස් සෙනඟ සූදානම් කරමින් සිටී. ඔහු ඔවුන්ට දෙවියන්වහන්සේගේ පනත් ලබාදෙයි. ඒ පනත් ජීවිතයේ සියලු අංශයන් පිළිබඳවය.

### 1-12 පද කියවන්න

*ජේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 22:8.** "පවුරක්"/ "බිත්තියක්" (නව) යනු කෙටි තාප්පයක් සමතලා පියස්ස වටේ ඉදිකිරීමය. එය මිනිසුන් බිමට ඇද වැටීම වළක්වනු පිණිසය.
- **ද්විතිය නිති සංග්‍රහය 22:12.** "දාවලු" යනු කබායක, ඇඳුමක හෝ කෙළවරෙහි එල්ලා වැටෙන කොටසය.

### කිරීමට යමක්

ඇතැම් පනත් නුහුරු ඒවාය. ඉදිරියට කියවාගෙන යාමට පෙර මේ එක් එක් පනත ඇතිකිරීමට හේතුව වන්නට ඇත්තේ කුමක්දැයි ඔබම සිතා බලන්න.

1-4 පද. දෙවියන්වහන්සේගේ සෙනඟ අනෙක් ඉශ්‍රායෙල්වරුන්ගේ සතුන්ද රැකබලා ගතයුතුය. මෙය අපගේ අසල්වැසියාට ප්‍රේමකළ හැකි එක් ආකාරයකි. කිතුනුවන් අනෙක් කිතුනුවන් රැකබලා ගතයුතුය. ඔබගේ සහෝදරයාගේ එළුවා ඉබාගාතේ ගියතොත් කුමක් සිදුවනු ඇත්ද? ඔබ ඌ රැකබලාගෙන ආපසු භාරදිය යුතුය.

5 පදය. මේ පනත දෙවියන්වහන්සේ තමන් මැවූ ආකාරයෙන් වෙනස්වීමට සෙනඟ දරන උත්සාහය පිළිබඳවය. කාන්තාවක් දිග කලිසම් ඇඳීම හෝ පිරිමියකු රෙද්දක් ඇඳීම නොකළ යුතු බවක් ඉන් අදහස් නොකෙරේ.

6-7 පද. අනාගතයේ ආහාර බහුලව තිබීම ගැන සහතික වීම මෙම පනත මගින් සිදුකෙරේ. අප අපගේ ආහාර සැපයුම හා සම්පත් රැකබලා ගතයුතුය.

8 පදය. පුරාතන ඉශ්‍රායෙලයේ නිවෙස්වලට තිබුණේ සමතලා වහලයකි. ඇතැම් විට එය වැඩකිරීම සඳහාත් නිදාගැනීම සඳහාත් යොදාගනු ලැබිණි. කෙටි තාප්පය මගින් මිනිසුන් ඉන් පහළට ඇද වැටීම වළකාලනු ලබයි. දෙවියන්වහන්සේගේ සෙනඟ තමන්ගේ ගොඩනැගිලි අනෙක් අය සඳහා සුරක්ෂිත බව සහතික කරගත යුතුය.

- *ඔබ සිටින ස්ථානයේ සිටින අයට තමන්ගේ නිවෙස් සුරක්ෂිත කරගත හැක්කේ කෙසේද? ආහාර පිසින ස්ථාන දරුවන්ට සුරක්ෂිතද? විදුලි සැපයුම් සුරක්ෂිතද?*

9-11 පද. බීජ මිශ්‍රකිරීම, සතුන් මිශ්‍රව යෙදීම හා ඇඳුම් මිශ්‍ර ද්‍රව්‍යවලින් සාදාගැනීම ඇතැම් විට අනෙක් ආගම්වල සෙනඟ කරන්නට ඇත. අනෙක් ආගම්වල පුද්ගලයන් කරන දේ දෙවියන්වහන්සේගේ සෙනඟ නොකළ යුතුය.

12 පදය. දාවලු මගින් දෙවියන්වහන්සේගේ සෙනඟට ව්‍යවස්ථාව රැකිය යුතු බව සිහිපත් කරවයි. ගණන් කථාව 15:38-39 කියවන්න. වර්තමානයේ දෙවියන්වහන්සේගේ සෙනඟට දාවලු අවශ්‍ය නොවන්නේය. අප සැබෑ ඇදහිලිවන්තයන් නම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් අපගේ හදවත්වල දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ලියා ඇත. නමුත් අප දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව මතක තබාගත යුතුය.

### ප්‍රධාන කරුණ

**සියල්ල දෙවියන්වහන්සේ උදෙසා කරන්න.**

# ➔ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 22:1-12

**⊳ ආරම්භය**

මෙම පනත් අමුතු ඒවා යැයි ඔබට සිතෙන්නේද? එම පනත් ලබාදීමට හේතු වූ කාරණා අප දැනගත් විට ඒවා අද අපට පවසන්නේ කුමක්දැයි අපට සිතිය හැකිය.

**අනෙක් කිතුනුවන්ගේ නැතිවූ දේවල් රැකබලාගන්න.**

**⊙ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 22:1-4***

මෙම පනත් ඇතිකිරීමට හේතු වූ කාරණා ඔබේ අසන්නන්ට පවසන්න. අනෙක් අයගේ ප්‍රශ්න නොසලකා හැරීම අද කිතුනුවන්ට පහසු දෙයක්ය. නමුත් අප දෙවියන්-වහන්සේගේ සෙනඟ ලෙස එකිනෙකාට බැඳී සිටින්නෙමු. අප එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වියයුතුය. රැකබලාගත යුතුය. *ඔබේ ස්ථානය සඳහා නිදසුනක් දෙන්න.*

**දෙවියන්වහන්සේ ඔබ වියයුතුයැයි සිතූ පුද්ගලයා වන්න.**

**⊙ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 22:5***

ඇතැම් රටවල පිරිමින් කාන්තාවන් බවටත් කාන්තාවන් පිරිමින් බවටත් වෙනස් කරන සැත්කම් සිදුකරනු ලබයි. කිතුනුවන් මෙවැනි දේ නොකළ යුතුය. අප කවුරුන්ද යන්න අප පිළිගත යුතුය. අප සැදුවේ දෙවියන්වහන්සේය.

**අනාගතයේ ආහාර අවශ්‍යතා ගැන සිතන්න.**

**⊙ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 22:6-7***

අපගේ දරුවන්ටත් දරුවන්ගේ දරුවන්ටත් අනාගතයේ ආහාර තිබීම ගැනද අප සහතික වියයුතුය. අපගේ දේශයේ ඇති මූලාශ්‍රයන් හා සම්පත් අප රැකබලා ගතයුතුය.

**අපගේ නිවෙස්වල සුරක්ෂිතතාව ගැන සහතික වන්න.**

**⊙ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 22:8***

*ඉශ්‍රායෙල් සෙනඟට මෙම පනත අවශ්‍ය වුයේ කුමක් නිසාදැයි ඔබගේ අසන්නන්ට පවසන්න.*

- ඔබගේ නිවස සුරක්ෂිතද? ඔබගේ සභා ගොඩනැගිල්ල සුරක්ෂිතද? *ඔබගේ නිවෙස් සුරක්ෂිත කරගත හැකි ආකාරයන් පිළිබඳ නිදසුන් දෙන්න.* වැඩිහිටියන් හා දරුවන් ගැන සිතන්න. ඔබගේ නිවසේදී ඔවුන්ට ආපදා සිදුවිය හැකිද? පඩිපෙළවල් ආරක්ෂිතද? ඔබගේ නිවස වඩාත් ආරක්ෂිත කිරීම සඳහා ඔබ කළයුතු මොනවාද?

**වෙනත් ආගම්වල ක්‍රියාමාර්ග අනුගමනය නොකරන්න**

**⊙ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 22:9-11***

ඇදහිලිවන්තයන් නොවන්නන් සතුන්, බීජ සහ ද්‍රව්‍ය මිශ්‍රකර භාවිත කරනවා වියහැකිය. ඇතැම් විට කිසියම් ගුරුකම් බලයක් තිබෙනු ඇත. වැරදි ආගම්වල තිබෙන දේ දෙවියන්වහන්සේගේ සෙනඟ නොකළ යුතුය.

**ව්‍යවස්ථා මතකතබාගන්න**

**⊙ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 22:12***

*ඉශ්‍රායෙල් සෙනඟ දාවලු භාවිත කළේ කුමක් සඳහාදැයි ඔබේ අසන්නන්ට පවසන්න. කිතුනුවන් සඳහා මේවා අවශ්‍ය නොවන්නේ මක්නිසාදැයි පවසන්න. දෙවියන්වහන්සේගේ වචනය තමන්ට අමතක නොවීම සහතික කරගැනීමට ඔබේ සවන්දෙන්නන්ට අභියෝග කරන්න.*

අපගේ ජීවිතයේ සෑම අංගයක්ම - ගෙදර ජීවිතය, ඇඳුම්, ආහාර, අසල්වැසියා සතු සත්වයන් - දෙවියන්වහන්සේ උදෙසා ජීවත්-විය යුතුය. අප නිතරම අප කටයුතු කරනු ඇතැයි දෙවියන්වහන්සේ අපේක්ෂා කරන දෙය සිතිය යුතුය. දෙවියන්වහන්සේ අපගේ ජීවිතය පුරාම සිටින දෙවියන්වහන්සේය. සියල්ල උන්වහන්සේ උදෙසා කළයුතුය.

**⊕ යාච්ඤා කරන්න**: *වර්තමානයේ උන්වහන්සේ අණ පනත්වලට කීකරුවන්නේ කෙසේදැයි තේරුම් කරදෙන මෙන් ඉල්ලා සිටින්න. අප අසමත් වූ කල යේසුස්වහන්සේ තුළ අපට සමාව දී ඇති නිසා ස්තුති කරන්න.*

# 30 ඔබ ලිංගික පාපයන් නොකළ යුතුය

### ≪ පසුබිම

පොරොන්දු දේශයේ ජීවත්වීම සඳහා මෝසෙස් සෙනඟ සූදානම් කරමින් සිටී. ඔහු ඔවුන්ට දෙවියන්වහන්සේගේ පනත් දෙමින් එයට අවනත වීමට සෙනඟ උනන්දු කරවයි.

### ⌄ 13-30 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### ⩔ සටහන්

- **ද්විතීය නීති සංග්‍රහය 22:14.** "කන්‍යාභාවයෙහි ලකුණු" මගින් කාන්තාව විවාහයට පෙර කිසිවිටෙකත් සංසර්ගයේ යෙදී නොමැති බව දක්වයි. මෙම සාක්ෂිය මංගල රාත්‍රියේ ඇය සැතපී සිටි ඇඳ ඇතිරිල්ලේ ඇති ලේ මගින් තහවුරු වේ.
- **ද්විතීය නීති සංග්‍රහය 22:21.** "වේශ්‍යාකම්" යනු එක පුද්ගලයකුට වඩා වැඩි සංඛ්‍යාවක් සමඟ සංසර්ගයේ යෙදීමය.
- **ද්විතීය නීති සංග්‍රහය 22:22.** "සයනය කරනවා" යනු කෙනෙකු සමඟ සංසර්ගයේ යෙදෙනවා යන්නය.
- **ද්විතීය නීති සංග්‍රහය 22:23.** "විවාහ බස් දී" යනු විවාහ ගිවිස ගැනීමය.
- **ද්විතීය නීති සංග්‍රහය 22:25.** "බලහත්කාරකොට" යනු බලහත්කාරයෙන් පුරුෂයෙකු ස්ත්‍රියක සමඟ සංසර්ගයේ යෙදීමය.

### ⊙ කිරීමට යමක්

ලිංගික ක්‍රියාකාරකම් යනු කතා කරන්නට පහසු විෂයක් නොවේ. ඇතැම් අය එසේ කරන්නට ලජ්ජා වෙති. ඇතැමෙකුට එය විහිළුවකි. බයිබලය ලිංගික හැසිරීම් ගැන බොහෝවර කතාකරයි. ලිංගික හැසිරීම්වල යෙදීම බොහෝ දෙනෙකුට ඇති පරීක්ෂාවක්ය. පවිත්‍රව සිටීම පිණිස ඇදහිලිවන්තයා දිරිගැන්වීම අවශ්‍ය වේ.

13-22 පද. තම බිරිඳ විවාහයට පෙර සංසර්ගයේ යෙදී ඇති බවට කතන්දරයක් මිනිසෙකු විසින් ගෙතිය හැකිය. මෙය ඇතැම් විට විවාහය අවසන් කිරීම සඳහා ඉදිරිපත් කරන නිදහසට කාරණය වියහැකිය. පුරුෂයා බොරු කියන බව ඇතැම් විට දෙමව්පියන්ට ඔප්පුකළ හැකිවනු ඇත. විවාහය වැදගත් වන අතර දික්කසාදය පහසුවෙන් සිදු නොවිය යුතුය.

23-27 පද. විවාහ ගිවිසගෙන ඇති ස්ත්‍රියකට මිනිසෙකු බලහත්කාරකම් කරන්නට උත්සාහ කරන කල ඇය උපකාර ඉල්ලා කෑගසනු ඇත. නගරයේ දී නම් සෙනඟට ඇගේ හඬ ඇසෙනු ඇත. ගම්බද පෙදෙස්වල එසේ නොවනු ඇත. මිනිසුන් ස්ත්‍රීන්ට බලහත්කාරකම් නොකළ යුතුය. එය නරක දෙයකි.

28-30 පද. විවාහ ගිවිසගෙන නොමැති ස්ත්‍රියක පුරුෂයකු හා සංසර්ගයේ යෙදුන හොත් ඇතිවන තත්වය කුමක්ද? පුරුෂයා විසින් ඇයට බලහත්කාරකමින් එය සිදුකළත් නැතහොත් ඇය පොළඹවා ගත්තත් ඔවුන් විවාහ වියයුතුය. එයට හේතුව එවැනි ස්ත්‍රියක සමඟ විවාහ වීමට පුරුෂයෙකු සොයාගැනීම අසීරුවන නිසාය. පුරුෂයා විසින් එම ස්ත්‍රිය රැකබලා ගතයුතුය.

ක්‍රිස්තියානි විවාහය ක්‍රිස්තුස්වහන්සේ සහ සභාව අතර පවත්නා සබඳතාවක් වැන්නක් වීම අපේක්ෂා කෙරේ (එපීස 5:22-33).

### ⊕ ප්‍රධාන කරුණ

**ඔබේ බිරිඳට නැතහොත් ඔබේ සැමියාට විශ්වාසවන්තව සිටින්න. විවාහයෙන් බාහිරව ලිංගික ක්‍රියාකාරකම් වල නොයෙදෙන්න.**

# ➞ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 22:13-30

### ⊳ ආරම්භය

අපගේ ලෝකයේ සිටින පුද්ගලයෝ ලිංගික ක්‍රියාකාරකම්වලට ආශාවක් දක්වති. ඉතාමත් වැරදි ලිංගික ක්‍රියාකාරකම් සෑම තැනකම සිදුවනු දැකිය හැකිය. මේ වැදගත් මාතෘකාව ගැන කිතුනුවන් නිහඬව සිටීම නොකළ යුතුය. මේ ගැන කීමට දෙවියන්වහන්සේට බොහෝ දේ ඇති අතර අපද එසේ කළ යුතුය.

ලිංගික ක්‍රියාකාරකම් විවාහය සඳහා දෙවියන්වහන්සේ දුන් කදිම තෑග්ගකි. එය ඇත්තේ සැමියාට හා බිරිඳට ප්‍රීතිවීම සඳහාය. නමුත් විවාහයෙන් බාහිරව ලිංගික ක්‍රියාකාරකම් වල යෙදීම වැරදිය.

පුරාතන ඉශ්‍රායෙලයේ දුෂ්ඨ පව්කාරයන් මරණයට පත්කරනු ලැබිණි. කිතුනුවන් ගැන සලකා බැලීමේදී නරක පව්කාරයන්ට සභාව තුළ සිටිය නොහැකිය. ඔවුන් සභා සාමාජිකත්වයෙන් ඉවත්කළ යුතුය.

### විවාහයේදී විශ්වසනීයව පවිත්‍රව සිටින්න.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 22:13-22***

*මෙම පදවලින් කියැවෙන්නේ කුමක්දැයි ඔබේ අසන්නන්ට පවසන්න.* දෙවියන්වහන්සේගේ සෙනඟට විවාහය විශේෂිත දෙයක් ලෙස සැලකිය යුතුය. කිතුනු භාර්යාවන් හා ස්වාමිපුරුෂයන් තම විවාහ ජීවිතය ශක්තිමත්ව හා ප්‍රේමණීයව තබාගැනීම සඳහා කළහැකි සෑම දෙයම කළ යුතුය.

### ස්ත්‍රියකට බලහත්කාරකම් නොකරන්න.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 22:23-37***

විවාහ ගිවිසගත් ස්ත්‍රියක පුරුෂයෙකු සමඟ සංසර්ගයේ යෙදුණහොත් ඇතිවන තත්වය කුමක්ද? දෙදෙනාගේම එකඟත්වය ඇතිව සිදුවුවක් නම් දෙදෙනාම මරා දැමිය යුතුය. පුරුෂයෙකු ස්ත්‍රියක බලහත්කාරයෙන් සංසර්ගයේ යෙදුනේ නම් ඇතිවන තත්වය කුමක්ද? ස්ත්‍රියට බලහත්කාරකම් වූ බැවින් පුරුෂයා මරණයට පත්කළ යුතුය.

බොහෝ පුරුෂයන්ට තම ලිංගික ආශාවන් පාලනය කරගත නොහැකිය. ඔවුහු තම ලිංගික සංතර්පනය පිණිස ස්ත්‍රීන්ට බලහත්කාරකම් කරති. දෙවියන්වහන්සේ මේ ගැන සතුටු නොවන සේක. ස්ත්‍රියට ගෞරවයෙන් සැලකිය යුතුය.

යම් පුරුෂයකු ස්ත්‍රියකට බලහත්කාරකම් කළ බව අප දන්නේ නම් පොලිසියට ඒ බව දැනුම්දිය යුතුය.

### වෙනත් තත්වයක්

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 23:28-29***

විවාහ ගිවිසගෙන නොමැති ස්ත්‍රියකට පුරුෂයකු බලහත්කාරකම් කළහොත් ඇතිවන තත්වය කුමක්ද? එබඳු අවස්ථාවක ඔවුන් විවාහ වියයුතුය. මේ නීතිය මගින් ස්ත්‍රියට ආරක්ෂාව සැපයිණි. එමඟින් ස්ත්‍රිය රැකබලාගැනීමට පුරුෂයාට බලකරනු ලබයි. ස්ත්‍රියට එම පුරුෂයා සමඟ විවාහවීමට අවශ්‍ය නොවන්නේ නම් ඇතැම් විට ඇයට ඔහු හා විවාහ නොවී සිටිය හැකිය. වර්තමානයේ යම් ස්ත්‍රියකට පුරුෂයෙකු බලහත්කාරකමක් කළේ නම් කිතුනුවන් ඇයට රැකවරණය සැලසිය යුතුය. ලජ්ජාවට පත්වීමට ඇයට ඉඩ නොතිබිය යුතුය.

ලිංගික ක්‍රියාකාරකම් පිළිබඳ බොහෝ නීති බයිබලයේ ඇත. වැරදි ලිංගික ක්‍රියාකරකම් බලගතු පරීක්ෂාවන්ය. දෙවියන්වහන්සේ සමඟ පවිත්‍ර පුද්ගලයන් වියයුතුය. විවාහයට ගෞරවය දැක්විය යුතුය.

දෙවියන්වහන්සේ තම සෙනඟට ප්‍රේමකරන පරිදි සැමියා හා බිරිඳ එකිනෙකාට ප්‍රේමකළ යුතුය. එපීස 5:22-33 දක්වා පදවල බිරිඳ හා සැමියා අනුගමනය කළ යුත්තේ යේසුස්වහන්සේ හා සභාව අතර පෙන්නුම් කරන ආදර්ශය බව පාවුල්තුමා පවසයි.

⊙ **යාච්ඥා කරන්න**: *ලිංගික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔබ පවිත්‍ර අයෙකු කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලාසිටින්න. අතීතයේ කරන ලද පව්වලට යේසුස්වහන්සේ සමාව දීම ගැන දෙවියන්වහන්සේට ස්තුතිකරන්න.*

# 31 දෙවියන්වහන්සේ කළාවූ දෙය ගැන ස්තුති කරන්න

**« පසුබිම**

මෙය අණ පනත්වල අවසානය දක්වන කොටසය. දෙවියන්වහන්සේගෙන් ලැබූ සියලු අණ පනත් මෝසෙස් සෙනඟට පවසා අවසානය.

**⌄ 1-11 පද කියවන්න**

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

**⌄ සටහන්**

- **ද්විතිය නිති සංග්‍රහය 26:5.** "අරාමිය": යාකොබ්ගේ ආදි පියවරුන් පැමිණියේ පොරොන්දු දේශයෙන් පිටත තිබූ හාරාන් හා අරාම් රටවලින්ය.
- **ද්විතිය නිති සංග්‍රහය 26:9.** "කිරෙන් හා මී පැණියෙන්" යනු යහපත්, මිහිරි රසැති ආහාර හා පාන ඇති බවය.

**⊙ කිරීමට යමක්**

මෙය මෝසෙස් සෙනඟට දුන් අවසන් පනතය. එය සෙනඟ දේශයට ගිය පසු ස්තුති කිරීමක් ලෙස සිදුකරන විශේෂ පූජාවක් පිළිබඳවය. එය එක්වරක් පමණක් පිළිපැදිය යුතු පනතක් විය.

1-4 පද. මෝසෙස් උපදින්නටත් බොහෝ කලකට පෙර මෙම දේශය දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට පොරොන්දු වී තිබුණි. දෙවියන්වහන්සේ තමන්ගේ පොරොන්දු ඉටුකරන සේක. දේශය ඉතා හොඳ භූමියකි. එය බොහෝ භවභෝග හා පශු සම්පත් ලබාදෙනු ඇත.

ඉශ්‍රායෙල් සෙනඟ දේශයෙහි පදිංචි වූ විට ඔවුන් භූමියෙන් ලැබෙන පළමු ඵලදාව දෙවියන්වහන්සේට පූජාකළ යුතුය.

5-9 පදය. මෙම පදවලින් දෙවියන්වහන්සේගේ සෙනඟගේ කතන්දරය පැවසේ. යාකොබ් තම පුත්‍රයා සිටි මිසරය කරා ගියේය (උත්පත්ති 46). යාකොබ් එහිදී මියගිය අතර ඔහුගේ පවුල නික්මයාම පොත ආරම්භ වන විට විශාල ජාතියක් බවට වර්ධනය වී තිබුණි. එවිට මිසරයේ රජු වූ පාරාවෝ ඉශ්‍රායෙල් සෙනඟ වහලුන් බවට පත්කළේය (නික්මයාම 1). සෙනඟ දෙවියන්වහන්සේට මොරගැසුවෝය (නික්මයාම 2:23-25). දෙවියන්වහන්සේ ඔවුන්ගේ හඬට සවන්දුන් සේක. සෙනඟට මිසර දේශයෙන් ඉවතට යාමට මඟපෙන්වීම සඳහා දෙවියන්වහන්සේ මෝසෙස් එවූ සේක. "බලවත් හස්තය" හා "මහත් බිය" යනුවෙන් දක්වන්නේ පාරාවෝට එරෙහිව දෙවියන්වහන්සේ ගෙනදුන් දඬුවම්ය (නික්මයාම 7-12).

දෙවියන්වහන්සේ කළ දෙය දෙවියන්වහන්සේගේ සෙනඟ මතකතබාගැනීම වැදගත්ය.

- *කිතුනුවන් ලෙස අපට මතකතබාගෙන සැමරීම සඳහා ඇත්තේ මොනවාද? අපි මේ දෙය කොතරම් හොඳින් කරන්නෙමුද?*

10-11 පද. දෙවියන්වහන්සේ විශ්වාසවන්තව සිටි බැවින් සෙනඟ ස්තුති දීමක් ලෙස භූමියෙන් ලැබූ ප්‍රථම අස්වැන්න ආපසු දෙවියන්වහන්සේට දියයුතුය. දෙවියන්වහන්සේ ආහාර දෙන සේක. වෙනත් දෙවිවරුන් එසේ කරන්නේ නැත. සෙනඟ ප්‍රීති ප්‍රමෝද වියයුතුය. දෙවියන්වහන්සේ අපට දෙන දේවලට අප කෙතරම් ප්‍රීති ප්‍රමෝද වන්නෙමුද? පිලිප්පි 4:4 කියවන්න.

**⊕ ප්‍රධාන කරුණ**

**දෙවියන්වහන්සේගේ සෙනඟ දෙවියන්වහන්සේට ස්තුති කළ යුතුය.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 26:1-11

**ආරම්භය**

- දේවල් හොඳින් සිදුවන විට ඔබට ඇතැම් විට දෙවියන්වහන්සේ අමතක වනවාද?

දෙවියන්වහන්සේට ස්තුති කිරීම දෙවියන්වහන්සේගේ සෙනඟට සිහිපත් කර දෙන්නට මෙම පනත උපකාරී වේ.

## ප්‍රථම දෙය හා හොඳම දෙය දෙවියන්වහන්සේට පූජා කරන්න.

***කියවන්න**: ද්විතීය නීති සංග්‍රහය 26:1-4*

සෙනඟ දේශයේ පදිංචි වූ කළ පළමු අස්වැන්නත් භූමියේ ඵලත් දෙවියන්වහන්සේ ඉල්ලා සිටින සේක. ඉන් අදහස් වන්නේ දෙවියන්වහන්සේට දීම මුල්තැන ගන්නා බවය.

- දෙවියන්වහන්සේට මුල්තැන දෙමින් උන්වහන්සේට අප ස්තුති කරන්නේ කෙසේද?

## දෙවියන්වහන්සේ කළ දෙය මතකතබාගන්න.

***කියවන්න**: ද්විතීය නීති සංග්‍රහය 26:5-9*

මෙම වචන දෙවියන්වහන්සේගේ සෙනඟගේ කතන්දරය වන්නේය. *යාකොබ්, මිසරය, ජාතිය, වහල්බව, ගළවාගැනීම හා පොරොන්දු දේශයට යාමේ කතන්දරය ඔබේ අසන්නන්ට පවසන්න.*

දෙවියන්වහන්සේ කළ දෙය දෙවියන්වහන්සේගේ සෙනඟ මතකතබාගැනිම අවශ්‍යම දෙයක් වන්නේය. බයිබල් කතන්දර කියැවීම වැදගත් වන්නේ ඒ නිසාය. අපගේ කතන්දරය කුමක්ද? කිතුනුවන් වන අපගේ කතන්දරයේ කේන්ද්‍රස්ථානය වන්නේ කුරුසිය මත යේසුස්වහන්සේ සිටීමය. අප මුදාගත්තේ එයින්ය. යේසුස්වහන්සේ පව්කාරයන් පාපයේ වහල්කමෙන් මුදාගන්නා සේක. උන්වහන්සේගේ සෙනඟ ආත්මික මරණයෙන් ආත්මික ජීවනය කරා ගෙන එයි.

- යේසුස්වහන්සේගේ මරණය හා පුනරුජ්ජීවනය පිළිබඳ කතන්දරය පැවසෙන කුමන ගීතිකාවන් ඔබේ සභාවේ ගයන්නේද?

## නමස්කාර කරමින් ප්‍රීතිවන්න.

***කියවන්න**: ද්විතීය නීති සංග්‍රහය 26:10-11*

හිස නමා ප්‍රීතිවන්නැයි ආඥා කරමින් ජේදය අවසන් වේ. දෙවියන්වහන්සේගේ සෙනඟට ප්‍රීතිවීම ඉතා වැදගත් දෙයකි. කිතුනුවන්ට ප්‍රීතිවන්නැයි නව ගිවිසුමද ආඥා කරයි. අප උදෙසා දෙවියන්වහන්සේ කර ඇත්තේ කුමක්දැයි අප සිතන විට අපගේ හදවත් තුළ ප්‍රීතියක් ඇතිවේ. දෙවියන්වහන්සේ අපට දෙන්නේ කුමක්දැයි සිහිපත් වන විට අපගේ හදවතින්ම අපි ස්තුතිවන්ත වෙමු.

හොඳ උදාහරණයක් වන්නේ එපීස 1:3-14 ය. දෙවියන්වහන්සේ එපීසවරුන් වෙනුවෙන් කළේ කුමක්දැයි පාවුල්තුමා ඔවුන්ට සිහිපත් කරදෙයි. ඔවුන්ට එසේ පවසද්දී ඔහු ස්තුතිවන්ත වෙමින් ප්‍රීතියෙන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරයි.

- ඔබ කෙතරම් ප්‍රීතිමත්ද?
- ඔබ දෙවියන්වහන්සේට කෙතරම් ස්තුතිවන්ත වන්නේද?

*දෙවියන්වහන්සේ තමන් උදෙසා කර ඇති සියලුම දේ ලියන්නට ඔබේ අසන්නන් උනන්දු කරවන්න. දෙවියන්වහන්සේ ඔවුන් උදෙසා කළ දෙය අන්‍යයන්ටද පවසන්නට ඔවුන් උනන්දු කරවන්න. ප්‍රීතියෙන් යුතුව දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් නමස්කාර කරන්නට ඔබේ අසන්නන් උනන්දු කරවන්න.*

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟ තෝරාගත් සේක. දෙවියන්වහන්සේ තම සෙනඟ මුදාගත් සේක. හොඳ දේශයක් වෙත දෙවියන්වහන්සේ තම සෙනඟ ගෙන ආ සේක. කිතුනුවන් වන අප තෝරාගන්නේ දෙවියන්වහන්සේය. යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ අප මුදාගත් සේක. පරිපූර්ණ ස්වර්ගීය දේශයක් කරා දෙවියන්වහන්සේ අප ගෙනයන සේක. ප්‍රීතිවන්න! *යේසුස්වහන්සේ අප උදෙසා කළ දෙය පැවසෙන ගීත කිහිපයක් ගායනා කරන්න. ප්‍රශංසාකරමින් උන්වහන්සේට නමස්කාර කරන්න.*

**යාච්ඤා කරන්න**: *ඔබ උදෙසා දෙවියන්වහන්සේ කර ඇති සියලු දෙය ගැන ස්තුති දෙන්න. ස්වාමීන් තුළ ප්‍රීතිවන්න.*

# 32 දෙවියන්වහන්සේ ඉදිරියේ නිවැරදිව සිටින්න

**පසුබිම**

දේශයට ඇතුල්වූ පසු උත්සවයක් පවත්වන්නැයි මෝසෙස් සෙනඟට පවසයි. මෙය විශේෂිත තැනක එක් වරක් පමණක් පවත්වනු ලබන උත්සවයකි.

**1-13 පද කියවන්න**

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

**සටහන්**

- **ද්විතිය නිති සංග්‍රහය 27:3.** "ව්‍යවස්ථාවේ වචන" යන්නෙන් අදහස් වන්නේ ද්විතිය නිති සංග්‍රහය 1-26 දක්වාය.
- **ද්විතිය නිති සංග්‍රහය 27:12.** "ශබ්ද-නඟා" යනු ප්‍රසිද්ධියේ පැවසීමය.

**කිරීමට යමක්**

ඉශ්‍රායෙල් සෙනඟ විසින් කළ යුතුම වූ දේවල් සතරක් ඇත.

1. **ඔවුන් ද්විතිය නිති සංග්‍රහය 1-26 දක්වා වචන විශාල ගල් මත ලියා තැබිය යුතුය.** මෙම ගල් මතුයෙහි බදාම තට්ටුවක් අතුරා ඇත්තේ ඇතැම්විට අකුරු පැහැදිලිව දැකගත හැකිවනු පිණිසය (2-3, 8 පද).
2. **ඔවුන් ගල්වලින් පූජාසනයක් ඉදිකළ යුතුය.** එක ගලක්වත් යකඩ ආයුධ යොදා ගනිමින් නොකැපිය යුතුය (5-6 පද).
3. **ඔවුන් දවන පූජාවක් ඔප්පු කළ යුතුය (6 පදය).** දවන පූජාවක් ඔප්පුකරන ආකාරය ලෙවී කථාව 1 හි දැක්වේ. එය පව් සඳහා පූජාවක් වේ.
4. **ඉන්පසු ඔවුන් සහභාගිකමේ පූජාවක් ඔප්පු කළ යුතුය.** සහභාගිකමේ පූජාවක් ඔප්පු කරන ආකාරය ලෙවී කථාවේ 3 හි දැක්වේ. එය දෙවියන්වහන්සේ සමඟ සහභාගිත්වය ප්‍රීතියෙන් භුක්ති විඳින්නා වූ පූජාවකි. ඇතැම් සතුන් මිනිසුන්ට ආහාර පිණිස වෙන්කරන ලදී (7 පදය).

- *මෙම උත්සවයෙන් අදහස් වන්නේ කුමක්ද?*

ගල් සහ පූජාසනය ඒබාල් කන්ද මත සිටුවිය යුතුය. 13 පදය අනුව ඒබාල් කන්ද යනු ශාපයේ කන්දය.

- *ආශීර්වාදයේ කන්ද වූ ගෙරිසිම් කන්දෙහි ගල් සහ පූජාසනය නොසිටවූයේ ඇයි?*

මෙම උත්සවයෙන් අදහස් වූයේ දෙවියන්-වහන්සේගේ අණ පනත් පිළිනොපැද්දේ නම් ශාපයක් උදාකරන බවය. සෙනඟ ව්‍යවස්ථාව රැකීමට අපොහොසත් වනු ඇත. ඔවුන් දෙවියන්වහන්සේගේ ශාපයට ලක්වනු ඇත. ද්විතිය නිති සංග්‍රහය 27:26 කියවන්න. නමුත් දෙවියන්වහන්සේ ශාප-යෙන් ගැළවෙන මාර්ගයක් සපයාදෙන සේක. එනම් පාපය සඳහා දවන පූජාවක් කිරීමය. එවිට සෙනඟට සහභාගිකමේ පූජාව මගින් දෙවියන්වහන්සේ සමඟ සහභාගිත්වය භුක්ති විඳිය හැකිය.

- *දවන පූජාව සහ සහභාගිකමේ පූජාව යන දෙකම නව ගිවිසුමෙහි සම්පූර්ණ කෙරුණු ආකාරය අප දකින්නේ කෙසේද?*

ගලාති 3:10-14 කියවන්න.

*දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කැඩීමේ ශාපයෙන් අද දවසේ සභාවට බේරී සිටිය හැක්කේ කෙසේද?*

**ප්‍රධාන කරුණ**

**තමන් සමඟ නිවැරදි සබඳතාවක් අත්කර-ගන්නට පාපිෂ්ඨ මනුෂ්‍යයාට දෙවියන්-වහන්සේ මාර්ගයක් සපයා දෙන සේක.**

# ➔ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 27:1-13

## ⊳ ආරම්භය

*ඔබ සිටින ස්ථානයේ පවත්වනු ලබන විශේෂ උත්සවයක් සඳහා උදාහරණයක් දෙන්න.* විශේෂිත සැමරීම් උත්සවයක් සඳහා දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට නීති මාලාවක් දුන්සේක. මෙම උත්සවය පවත්වනු ඇත්තේ ඉශ්‍රායෙල්වරුන් පොරොන්දු දේශයට ඇතුළු වූ පසුවය. මෙම උත්සවය පවත්වනු ලබන්නේ එකම එක වරක් පමණි.

### සෙනඟ කළ යුතුම වූ දේවල් සතර

**⊙ කියවන්න: *ද්විතීය නීති සංග්‍රහය 27:2-7***

*ඉශ්‍රායෙල් සෙනග කළ යුතුම වූ දේවල් සතර කුමක්දැයි ඔබේ අසන්නන්ට පවසන්න:*

1. බදාමයෙන් ආවරණයවූ ගල් පුවරු මත ව්‍යවස්ථාව ලිවිය යුතුය.
2. පූජාසනයක් ගොඩනැගිය යුතුය.
3. පව් සඳහා දවන පූජාවක් ඔප්පු කළයුතුය.
4. සහභාගිත්වයේ යාග පූජාවක් පැවැත්විය යුතුය.

*මෙම උත්සවය පැවැත්වීමේ තේරුම කුමක්දැයි ඔබේ අසන්නන්ට පැහැදිලි කරදෙන්න.* උත්සවය පැවැත්වූයේ ඒබාල් කන්ද මතය. මෙය සාපයේ කන්ද විය (13 පදය). කිසිවකුටත් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථා සියල්ලම පිළිපැදිය නොහැකිය. සෙනඟ පව්කරන අතර ඔවුන්ගේ දෙවියන්වහන්සේට ඇති අකීකරුකම නිසා ශාපයකට යටත්ව සිටිති (26 පදය).

නමුත් මෙම ශාපයෙන් මිදෙන්නට මාර්ගයක් දෙවියන්වහන්සේ දෙන සේක. පාපයෙන් සමාව ලැබීම සඳහා දවන පූජාවක් පැවැත්වීමේ පනත දෙවියන්වහන්සේ දෙනසේක. එවිට දෙවියන්වහන්සේ සමඟ සහභාගිත්වයේ සතුට සෙනඟට සැමරිය හැකිය.

### යේසුස්වහන්සේ මෙම චාරිත්‍රය සම්පූර්ණ කළසේක.

වර්තමානයේ අප උදෙසා යේසුස්වහන්සේ මෙම පනත හා යාගය සම්පූර්ණ කරන සේක. අප එවිට පූජා පැවැත්විය යුතු නැත. පාපය සඳහා අපගේ යාග පූජාව වන්නේ යේසුස්වහන්සේය. ඇදහිලිවතුන් තමන්ගේ පව් උදෙසා තවදුරටත් ශාපය යටතේ නොවන්නේය. යේසුස්වහන්සේ අපගේ ශාපය ඉවත් කරන සේක. යේසුස්වහන්සේ නිසා අපට දෙවියන්වහන්සේ සමඟ සහභාගිත්වය භුක්ති විඳිය හැකිය.

*ගලාති 3:10-14 දක්වා කියවා ඔබේ අසන්නන්ට ප්‍රවේසමෙන් ඒවා පැහැදිලි කර දෙන්න. අප යේසුස්වහන්සේ කෙරෙහි අදහාගන්නේ නම් පමණක් දෙවියන්වහන්සේ අපගේ පව්වලට සමාව දෙන බැව් ඔවුන්ට පෙන්වාදෙන්න.*

පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව අප යේසුස්වහන්සේ කරා යොමු කරවයි. පරිපූර්ණව ව්‍යවස්ථාව අනුගමනය කළේ යේසුස්වහන්සේ පමණකි. අපට නොහැකිය. අප පාපයන් සිදුකර ව්‍යවස්ථාව රැකීමට අපොහොසත් වූ කල සමාව ලැබීම සඳහා අප යේසුස්වහන්සේ වෙත හැරිය යුතුය.

**ⓘ අදාළ කිරීම**: *ඇදහිලිවන්තයන් වූ ඔබේ අසන්නන්ට මෙම පණිවුඩය අධික ප්‍රීතියක් ගෙනෙනු ඇත.* 7 වන පදය පවසන්නේ ඉශ්‍රායෙල් සෙනඟ ප්‍රීතිවිය යුතු බවය. කිතුනුවන්ට ඊටත් වඩා ප්‍රීතිවීමට හේතුවක් ඇත. සත්ව යාග පූජාවන්ට වඩා ක්‍රිස්තුස්වහන්සේගේ පූජාව උතුම්ය.

*ඇදහිලිවන්තයන් නොවන ඔබේ අසන්නන්ගෙන් යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන මෙන් ඉල්ලා සිටින්න.* කුරුසිය මතදී යේසුස්වහන්සේ පාපයේ ශාපය ඉවත්කළ සේක. එබැවින් යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන ඕනෑම අයෙකු අකීකරුකම නිසා පැමිණෙන ශාපයෙන් නිදහස් වන්නේය. ඔවුන්ට දෙවියන්වහන්සේ සමඟ සහභාගිත්වය ප්‍රීතියෙන් භුක්තිවිඳිය හැකිය.

**⊙ යාච්ඤා කරන්න**: *පාපයේ ශාපයෙන් නිදහස් වීමට මාර්ගයක් අපට දීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න. යේසුස්වහන්සේ දීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න. සමාව ලැබීම සඳහාත් දෙවියන්වහන්සේ සමග සහභාගිත්වය ලැබීම සඳහාත් යේසුස්වහන්සේ කෙරෙහි තම විශ්වාසය තබනු සඳහා ඇදහිලිවන්තයන් නොවන අය වෙනුවෙන් යාච්ඤා කරන්න.*

## අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 28:1-14

# 33 දෙවියන්වහන්සේගෙන් ආශීර්වාද ලබන්න

### පසුබිම
දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට දුන් සියලුම ව්‍යවස්ථාවන්ට කීකරුවන්නැයි මෝසෙස් සෙනඟ ධෛර්වත් කරන්නේය. දෙවියන්වහන්සේට කීකරු වුවහොත් ඔවුන්ට ආශීර්වාද ලැබෙන බව මෙම කොටසේදී ඔහු පවසන්නේය.

### 1-14 පද කියවන්න
*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්
- **ද්විතීය නීති සංග්‍රහය 28:3.** "නුවරෙහි" සහ "කෙතේහි" - නගරය හා ගම් යන්නෙන් අදහස් වන්නේ සෑම තැනකදීම යන්නය. එනම් ඕනෑම තැනක.
- **ද්විතීය නීති සංග්‍රහය 28:6.** "ඇතුළට එනවිට" හා "පිටත්ව යනවිට" යනු සෑමවිටම යන්නය.
- **ද්විතීය නීති සංග්‍රහය 28:7.** "සත් මගකින් ඔබෙන් පලා යන්නේය" යන්නෙන් අදහස් වන්නේ සතුරා පරාජය වී හිස් ලුලු අත පැන දුවන බවය.
- **ද්විතීය නීති සංග්‍රහය 28:14.** "වල්ගය නොව හිස" යන්නෙන් අදහස් වන්නේ ඉශ්‍රායෙල් සෙනඟ ජාතීන්ට මඟපෙන්වන බවය.

### කිරීමට යමක්
ආශීර්වාදයන්හි වර්ග දෙක කුමක්දැයි සිතන්න.

1. දේවල් වැඩි කරන්නාවූ ආශීර්වාදයන් ඇති පද ලයිස්තුගත කරන්න. මෙයට වර්ෂාව, ආහාර භෝග, සත්වයන්, දරුවන් වැනි බොහෝ දේ අයත්ය.

- *දෙවියන්වහන්සේ විසින් ඉශ්‍රායෙල්ට ආශීර්වාද කරනු ලැබුවහොත් ඔවුන් කෙබඳු පිරිසක් වනු ඇත්ද?*

රටේ සිටි නොඇදහිලිවතුන් සිතුවේ තමන්ට වර්ෂාව හා දරුවන් ලබා දෙන්නේ වෙනත් දෙවිවරුන් බවය. නමුත් වර්ෂාව හා දරුවන් ලබා දුන්නේ සැබෑ දෙවියන්වහන්සේය.

2. අනෙක් ජාතීන් හා දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟ ආරක්ෂා කරනු ලබන බව දැක්වෙන ආශිර්වාද හා පද ලයිස්තුගත කරන්න.

- *ආශීර්වාදලත් ඉශ්‍රායෙල්වරුන් අනෙක් ජාතීන්ට වඩා වෙනස් වන්නේ කුමන ආකාරයෙන්ගෙන්ද?*

දෙවියන්වහන්සේගෙන් ආශිර්වාද ලැබීම සඳහා ඔවුන් විසින් කළ යුතුම දේ සෙනඟට පවසන පද මොනවාදැයි සොයාගන්න. සෙනඟ මුළුමනින්ම කීකරු වියයුතුය.

- *අද දවසේ කිතුනුවන් සඳහාද මෙම ආශීර්වාද එලෙසම පවතින්නේද?*

කිතුනුවන් අයත් වන්නේ දෙවියන්වහන්සේගේ රාජ්‍යයටය. අපි පොළොවේ ජාතියක් නොවන්නෙමු. කිතුනුවන්ගේ ආශිර්වාද ප්‍රධාන වශයෙන් ආත්මික ඒවාය (එපිස 1:3). කන්ද උඩ දේශනාවේ ආශිර්වාදවලින් දැක්වෙන්නේ ස්වර්ග රාජ්‍යය පිළිබඳවය (මතෙව් 5:1-12). බොහෝ කිතුනුවෝ මෙය වරදවා වටහා ගනිති. ඔවුන් සිතන්නේ පොළොවේ ඔවුන් ධනවත් වීම දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ යැයි කියාය. අපගේ වස්තුව ඇත්තේ ස්වර්ගයේය.

අප වෙනුවෙන් යේසුස්වහන්සේ මැරුණු නිසා දැනටමත් උන්වහන්සේ තුළ අපට ආත්මික ආශිර්වාද තිබෙන බවට සහතික වියහැකිය. ඇදහිල්ල තුළින් කිතුනුවෝ යේසුස්වහන්සේ තුළ ධර්මිෂ්ඨයෝ වෙති. එහෙත් අපගේ ඇදහිල්ල අපගේ ජීවිතවල ඇති කීකරුකම පෙන්විය යුතුමය.

### ප්‍රධාන කරුණ
**දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ තම සෙනඟට ආශිර්වාද කරන්නටය.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 28:1-14

⊙ **ආරම්භය**

- දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කර තිබේද? දෙවියන්වහන්සේ ඔබට දුන් ආශිර්වාද මොනවාද?

**බොහෝ දේ දෙමින් ආශීර්වාද කිරීම**

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 28:3-6,8,11,12***

වර්ෂාව, දරුවන්, බෝග, ආහාර, සත්වයින් වැනි බොහෝ දේ මගින් ඉශ්‍රායෙල් සෙනඟට ආශිර්වාද කරනු ලබන බවට දෙවියන්වහන්සේ ඔවුන්ට පොරොන්දුව සිටිසේක. (3-6,8,11,12 පද). ඔවුන් පොහොසතුන් වන්නේය.

**ශක්තිමත් ජාතියක් ලෙස ආශීර්වාද ලැබීම**

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 28:7,10,13***

ඉශ්‍රායෙල් ශක්තිමත් ජාතියක් වන බවටද දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක. සතුරන්ට ඔවුන් පරාජය කළ නොහැකිවනු ඇත. අනෙක් ජාතීන් ඔවුන් පාලනය නොකරනු ඇත (7,10,13 පද).

අනෙක් ජාතීන්ද දෙවියන්වහන්සේගෙන් ආශිර්වාද ලබනු පිණිස තම සෙනඟ ශක්තිමත් හා ආශිර්වාදලත් සෙනඟක් වීම දෙවියන්වහන්සේට අවශ්‍ය විය.

**ආශීර්වාද ලබන ආකාරය**

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 1-2,9, 13-14***

5-26 දක්වා පරිච්ඡේදයන්හි මෝසෙස් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවන් සෙනඟට ලබාදෙන්නේය. දෙවියන්වහන්සේ ඔවුන්ට අණකළ සියල්ලටම කීකරුවන මෙන් දැන් ඔහු ඔවුන් ධෛර්යවත් කරන්නේය. පූර්ණ කීකරුකම දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේය.

- මේ ආශිර්වාද තවමත් කිතුනුවන් සඳහා වලංගුව පවතින්නේද?

# **නිදසුන**: දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ කිතුනුවන් ධනවත්ව සිටිනු දැකීමට යැයි දේශනාකරුවෙකු තම අසන්නන්ට පවසන්නේය. ධනවත්ව සිටීම දෙවියන්වහන්සේගේ ආශිර්වාදයක් බවත් මිල අධික වාහන, බොහෝ ඉඩකඩම්, නිවාස, රත්‍රං වැනි දෑ තිබීම යහපත් බවත් ඔහු කියයි. මේ අසන ඇතැම් කිතුනුවන් බොහෝ සේ දුක්වන්නේ තමන් දුප්පත් නිසාය. තමන්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කර නැතැයි ඔවුන් සිතන්නට ගනී. තමන් ධනවත් නිසා තමන් ඉතා යහපත් පුද්ගලයන් යැයි පොහොසත් කිතුනුවන් සිතයි. මෙය හරිද?

! **අදාළ කිරීම**: යේසුස්වහන්සේ ස්වර්ග රාජ්‍යය ගැන දේශනා කළ සේක. දෙවියන්වහන්සේගේ සෙනඟ වත්මන් පොළොවට අයත් ජාතියක් නොවන්නේය. මතෙව් 5:1-12 දක්වා ඇතැම් ආශිර්වාද යේසුස්වහන්සේ ඉගැන්වූ සේක. *මෙම පදවල සඳහන්වන ආශිර්වාද මොනවාදැයි ඔබේ අසන්නන්ට පවසන්න.* එපිස 1:3-14 දක්වා කියවන්න. මෙම පදවල සඳහන් වන ආශිර්වාද ආත්මික ඒවාය. ඒවා සමාවදීම, දෙවියන්වහන්සේගේ දරුවෙකු වීම හා ශුද්ධාත්මය ලැබීම වැනි සුන්දර දේවල්ය.

අපට දෙවියන්වහන්සේගෙන් බොහෝ භෞතික ආශිර්වාද ලැබී ඇත. එහෙත් යේසුස්වහන්සේ නිසා ඉතාම වැදගත් ආශිර්වාද වන ආත්මික හෝ ස්වර්ගීය ආශිර්වාද අපට ලැබී ඇත. අපට මුලින්ම අවශ්‍ය වියයුත්තේ මේවාය.

ඇදහිල්ල තුළින් යේසුස්වහන්සේ තුළ මෙම ආත්මික ආශිර්වාද අපට හිමිවී ඇත (එපිස 1:3). දෙවියන්වහන්සේට ඇති කීකරුකම අපගේ ඇදහිල්ල පෙන්විය යුතුය. අප පදනම් වන්නේ අපගේ කීකරුකම තුළ නොව යේසුස්වහන්සේ මතය.

↑ **යාච්ඤා කිරීම**: *යේසුස්වහන්සේ තුළින් වූ ආත්මික ආශීර්වාද සඳහා දෙවියන්වහන්සේට ස්තුති කරන්න. ඔබව තෝරාගැනීම, ඔබට සමාවදීම, ඔබ උන්වහන්සේගේ දරුවකු කරගැනීම හා ඔබට ශුද්ධාත්මය දීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.*

# 34 දෙවියන්වහන්සේට අකීකරු නොවන්න

### පසුබිම

ද්විතිය නිති සංග්‍රහය 5-26 දක්වා දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව මෝසෙස් සෙනඟට ලබාදෙයි. ඉන්පසු ද්විතිය නිති සංග්‍රහය 28:1-14 දක්වා ඇති ආශිර්වාද දක්වමින් මෝසෙස් ඒවාට කිකරුවන මෙන් ඔවුන් ධෛර්යවත් කරන්නේය. තමන්වහන්සේගේ ව්‍යවස්ථාවන්ට අකිකරු වුවහොත් දෙවියන්වහන්සේ කරන්නට යන්නේ කුමක්දැයි දැන් මෝසෙස් ඔවුන්ට අනතුරු අඟවයි.

### 15-44 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 28:15.** "ශාප" යනු ආශිර්වාදයන්ට විරුද්ධ දෙය වන්නේය. ඒවා හූනියම් හෝ ඉන්ද්‍රජාල නොවේ. ශාප යනු පාපය සඳහා වූ දෙවියන්වහන්සේගේ දඬුවමය.
- **ද්විතිය නිති සංග්‍රහය 28:23.** "නුඹේ හිසට උඩින් තිබෙන අහස පිත්තල වන්නේය" යන්නෙන් අදහස් වන්නේ වර්ෂාව නොලැබෙන බවය.

### කිරීමට යමක්

සියලු දෙයම දෙවියන්වහන්සේගේ පාලනය යටතේ පවතින්නේ කෙසේදැයි සිතන්න. කාලගුණය, ජිවිතය හා මරණය, බෝග හා සත්වයන්, රෝග හා වෙනත් ජාතින් යනාදිය පිළිබඳව පාලනය දෙවියන්වහන්සේ සතු බව දක්වන පද මොනවාදැයි බලන්න.

- *1-14 දක්වා පදවල ඇති ආශිර්වාදවල අනෙක් පැත්ත වන ශාප මොනවාද?*
- *30-34 දක්වා පදවලින් යමෙකු දෙවියන්වහන්සේගේ ශාපයට ලක්වී ඇති බවක් පෙන්වන්නේද?*
- *ඔබට දැනෙන්නේ කෙසේද?*

### 45-68 පද කියවන්න.

- *මෙම පදවල ඇති දේ 15-44 දක්වා පදවල ඇති දෙයට වඩා අසීරුවන්නේ ඇයි?*

පුරාණ ඉශ්‍රායෙලය දෙවියන්වහන්සේට අකිකරු වුයේ නම් සෙනඟට දෙවියන්වහන්සේ ශාප කරන සේක. මෙම ඡේදය සියලුම සෙනඟ පිළිබඳවය. එය එක් පුද්ගලයෙකුට ශාප කිරීමක් නොවන්නේය. සෙනඟ එකට එකතුවී අකිකරු වුවහොත් සමස්ත ඉශ්‍රායෙල් ජාතියම පීඩාවට ලක්වන්නේය.

බරපතළම පාපය වන්නේ වැරදි දෙවිවරුන් නමස්කාර කිරීමය. ප්‍රයෝජනයක් නොමැති පිළිම නමස්කාර කරන්නට දෙවියන්වහන්සේගේ සෙනඟට අවශ්‍ය වන්නේ නම්, ලී හෝ ගල්වලින් සාදාගත් වැඩකට නැති දෙවිවරුන් නමස්කාර කරන්නට දෙවියන්වහන්සේ ඔවුන් වෙනත් දේශයකට යවනු ඇත (36 පදය).

අවසාන ශාපය වන්නේ දේශයෙන් එළියට යැවීමය. අනෙක් ශාප පළමුව පැමිණේ. පළමු ශාපය උදාවූ කල දෙවියන්වහන්සේගේ සෙනඟට ආපසු දෙවියන්වහන්සේ වෙත හැරිය හැකිය. නිදසුනක් ලෙස ආමොස් 4:6-12 කියවන්න.

කිතුනුවන්ට සුබ ආරංචිය ඇත. සියල්ලෝම දෙවියන්වහන්සේට අකිකරු වෙති. නමුත් යේසුස්වහන්සේ අප වෙනුවෙන් ශාපය දැරූසේක. ගලාති 3:13-14 කියවන්න. යේසුස්වහන්සේගේ මරණය විශ්වාස කිරීමෙන් ව්‍යවස්ථාවට අකිකරු වීම සඳහා වූ ශාපයෙන් ඇදහිලිවන්තයන් මිදෙන්නේය. අපි බියක් නැතිව ජිවත්විය යුතුය. සියල්ලේ පාලනය ඇත්තේ දෙවියන්වහන්සේගේ අතේය.

### ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේට අකිකරු නොවන්න. උන්වහන්සේ අකිකරුකමට දඬුවම් කරන සේක.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 28:15-68

⊕ **නිදසුන**: උත්පත්ති 4දී දෙවියන්වහන්සේ පව් නොකරන ලෙස කායින්ට අනතුරු අඟවන සේක. නමුත් කායින් ඇහුම්කන් නොදෙයි. කායින් තම සහෝදරයා වන ආබෙල් මරා දමයි. දෙවියන්වහන්සේ කායින්ට ශාපකර ඔහු දේශයෙන් එළියට යවන සේක.

පව් නොකරන ලෙස දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට අනතුරු ඇඟවූ සේක. ඉශ්‍රායෙල්වරුන් දෙවියන්වහන්සේට අකීකරු වුවහොත් දෙවියන්වහන්සේ ඔවුන්ට ශාප කරනු ඇත. උන්වහන්සේ ඔවුන් පොරොන්දු දේශයෙන් එලියට යවනු ඇත.

**මෙම ශාප මොනවාද?**

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 28:15, 20-21, 24-25, 28-29, 36***

*ඉශ්‍රායෙල් සෙනග අකීකරු වුවහොත් ඔවුන්ට සිදුවනු ඇති දේ ඔබේ අසන්නන්ට පවසන්න.*

**දෙවියන්වහන්සේ තම සෙනඟට ශාප කරන්නේ කුමක් නිසාද?**

⊙ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 28:45***

ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට අකීකරු වුවහොත් උන්වහන්සේ ඔවුන්ට ශාප කරනු ඇත. ඉශ්‍රායෙල්වරු දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථා දැන සිටියෝය. ඔවුන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරු වියයුතුය. නැතහොත් ඔවුන් දෙවියන්වහන්සේගේ ශාපයට අසුවනු ඇත.

**ශාප කළ හැක්කේ දෙවියන්වහන්සේට පමණක්මය**

*දෙවියන්වහන්සේගේ පාලනය යටතේ සියල්ලම ඇති බව ඔබේ අසන්නන්ට පවසන්න.* දෙවියන්වහන්සේ කාලගුණය, රෝග, ජීවිතය හා මරණය, බෝග හා සත්වයන් හා අනෙක් ජාතීන් පාලනය කරන සේක. පාලනය ඇත්තේ දෙවියන්වහන්සේ අත පමණක්ය. ශාප යනු හුනියම් කොඩිවින නොවන්නේය. ශාප කිරීමේ බලය වෙනත් කිසිවකුටත් නැත්තේය.

**ඉශ්‍රායෙල් මෙම අනතුරු ඇඟවීමට ඇහුම්කන් දුන්නේද?**

දෙවියන්වහන්සේට අකීකරුවීම නිසා ඉශ්‍රායෙල් සෙනඟ මත ශාප පැමිණි බව පසුව පැරණි ගිවිසුමෙහි දැක්වේ. ආමොස් 4හි ඇති නිදර්ශනය ඔබේ අසන්නන්ට පැහැදිලි කරදෙන්න. ශාපයන්ද තමන්වහන්සේගේ සෙනඟ තමන්වහන්සේ වෙත ආපසු හරවා ගැනීම සඳහා වූ දෙවියන්වහන්සේගේ කාරුණික මාර්ග වන්නේය. කණගාටුව නම් ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේගේ අනතුරු ඇඟවීම්වලට කන් නොදීමය. ඔවුන් දෙවියන්වහන්සේ වෙත ආපසු හැරුණේ නැත. එබැවින් දෙවියන්වහන්සේ ඔවුන් පොරොන්දු දේශයෙන් එළියට ගෙන වහලුන් ලෙස බබිලෝනියට යැවූ සේක.

**කිතුනුවන් ශාපයට ලක්ව සිටීද?**

සුබ ආරංචිය නම් පාපය සඳහා වූ ශාපය යේසුස්වහන්සේ කුරුසිය මත දැරූ බවය. යේසුස්වහන්සේ තුළ ඇදහිලිවතුන් ශාපයක් යටතේ නොවන්නේය. යේසුස්වහන්සේ තුළ අදහන්නන් ශාපයෙන් නිදහස්ය. සෑම කෙනෙකුම පව් කරයි. තමන්ගේ අකීකරුකම නිසා සෑම පුද්ගලයෙක්ම ශාපයට ලක්ව සිටී. අපට දෙවියන්වහන්සේගේ ආශිර්වාද අත්වීම පිණිස ශාපය ඉවත්කිරීමට යේසුස්වහන්සේ මැරුණු සේක.

ⓘ **අදාළ කිරීම**: ඇතැම් අසන්නන් ඇදහිලිවන්තයන් නොවීමට ඉඩ ඇත. යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්නට ඔවුන් උනන්දු කරවන්න. ඇතමෙකු ශාපයට ලක්වේ යැයි බියෙන් පසුවනු ඇත. යේසුස්වහන්සේ තුළ සිටින ඇදහිලිවන්තයකුට ශාප කරන්නට වෙනත් කිසිවකුටත් නොහැකි බව පවසා ඔවුන් ධෛර්යවත් කරන්න. දෙවියන්වහන්සේ සමාව දෙනු ඇති නිසා උන්වහන්සේට අකීකරු වුවාට කමක් නැතැයි ඇතැම් අසන්නන් සිතනු ඇත. දෙවියන්වහන්සේට අකීකරු නොවන මෙන් ඔවුන්ට අනතුරු අඟවන්න. සැබෑ ඇදහිලිවතුන්ට නිතරම අවශ්‍ය වන්නේ දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීමය.

⊕ **යාච්ඤා කරන්න**: *අපගේ අකීකරුකම සඳහා වූ ශාපය ඉවත්කිරීමට යේසුස්වහන්සේ මරණය විඳීම ගැන ස්තුති දෙන්න. යේසුස්වහන්සේ කෙරෙහි අදහාගෙන බියෙන් නිදහස්ව ජීවත්වීම සඳහා උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

## අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 30:1-10

# 35 දෙවියන්වහන්සේ හදවත් වෙනස් කරනු ඇත

### පසුබිම

සෙනඟ අකීකරු වනු ඇති බව මෝසෙස් දනියි. තමන්ට කීකරුවීමට හැකිවනු පිණිස සෙනඟගේ හදවත් වෙනස් කරන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වන සේක.

### 1-10 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 30:2.** "ආපසු එන්න/දෙසට හැරී" යන්නෙන් අදහස් වන්නේ පසුතැවිලිවීම, පාපයෙන් ඉවත්වීම යන්නය.
- **ද්විතිය නිති සංග්‍රහය 30:6.** "චර්ම-ඡේද්‍යය" යනු චර්මයේ අග කපා දැමීමය. මෙම පදයේ දැක්වෙන්නේ හදවතින් චර්මඡේද්‍ය වන්නටය. ඉන් අදහස් කෙරෙන්නේ තමන්වහන්සේ සමඟ නිවැරදි වනු පිණිස දෙවියන්වහන්සේ ඔබේ හදවත වෙනස් කරන බවය.

### කිරීමට යමක්

ද්විතිය නිති සංග්‍රහය 29:18-28 දක්වා කියවන්න. තමන්වහන්සේගේ සෙනඟගේ හදවත් තමන්වහන්සේ වෙතින් ඉවතට හැරෙන බව දෙවියන්වහන්සේ දන්නා සේක (18 පදය). සෙනඟ දෙවියන්වහන්සේ වෙතින් ඉවතට යනු ඇත (25-28 පද). ඔවුන්ට පොරොන්දු දේශයෙන් ඉවතට යාමට සිදුවනු ඇත.

සුබ ආරංචියක්! දෙවියන්වහන්සේ තම සෙනඟ මුදාගෙන නැවත පොරොන්දු දේශයට ගෙනෙන සේක. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ වචනය සෙනඟගේ හදවත් වෙත ගෙනෙන සේක (1 හා 6 වැනි පද). එවිට ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්-වහන්සේ වෙතට හැරී උන්වහන්සේට කීකරුවෙමින් ප්‍රේමකරනු ඇත (2, 6, 8, 10 පද).

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ නැවත පොරොන්දු දේශය වෙත ගෙනවිත් ඔවුන්ට ආශීර්වාද කරනු ඇත (3-5, 9 පද). උත්පත්ති 12:2-3හි ආබ්‍රහම්ට දෙවියන්-වහන්සේ දුන් පොරොන්දු රක්ෂා කරන සේක.

උත්පත්ති 17:10-14 දක්වා කියවන්න. චර්මඡේදනය කරගන්නා ලෙස දෙවියන්-වහන්සේ ආබ්‍රහම්ට පැවසූසේක. ශාරීරික චර්මඡේදනය දෙවියන්වහන්සේ සමඟවූ විශේෂිත සම්බන්ධතාව පෙන්වීය. නමුත් සැබෑ ගැටලුව පැවතියේ ශරීරයේ නොව සිතෙහිය. සැබෑ චර්මඡේදනය සිදුවිය යුත්තේ හදවතෙහිය. ද්විතිය නිති සංග්‍රහය 10:16හි තමන්ගේ හදවත් චර්මඡේදනය කරගන්නා මෙන් දෙවියන්වහන්සේ ඉශ්‍රා-යෙල් සෙනඟට පැවසූසේක. රෝම 2:28-29 කියවන්න.

මෙයින් අදහස් වන්නේ තමන්ගේ සෙනඟ මුළු හදවතින්ම තමන්ට ප්‍රේමකරනු දැකීම දෙවියන්වහන්සේට අවශ්‍ය වූ බවය. නමුත් දෙවියන්වහන්සේගේ සෙනඟට තිබුණේ හිතුවක්කාර හා පිටුපාන හදවත්ය. දෙවියන්වහන්සේ තම හදවත් වෙනස් කිරීම සෙනඟට අවශ්‍ය විය. වෙනස් කරනු ලැබූ හදවත් ඇතිව ඔවුන් දෙවියන්වහන්සේට ප්‍රේමකරමින් කීකරුවනු ඇත (6-8 පද).

- *දෙවියන්වහන්සේ හදවත් වෙනස් කරන්නේ කුමන අවස්ථාවන්හිදීද?*

කොලොස්සි 2:10-11 කියවන්න. දෙවියන්-වහන්සේගේ සෙනඟ යේසුස්වහන්සේ කෙරෙහි අදහාගන්නා විට දෙවියන්වහන්සේ ඔවුන්ගේ හදවත් වෙනස් කරන සේක.

### ප්‍රධාන කරුණ

**තමන්ගේ සෙනඟ තමන්ට කීකරුවනු පිණිස දෙවියන්වහන්සේ ඔවුන්ගේ හදවත් වෙනස් කරන සේක.**

# ➡ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 30:1-10

**නිදසුන**: මිනිසෙකුට සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේට කීකරුවීමට අවශ්‍ය විය. දෙවියන්වහන්සේ උදෙසා සෑම දෙයක්ම නිවැරදි කිරීමට ඔහු දිනපතාම තිරණය කරන්නේය. නමුත් දිනක් ඔහු වෙනත් අයෙකු සමඟ කෝපවිය. තවත් දිනෙක වැඩිපුර මුදල් ලබාගැනීමට ඔහු කෑදර විය. තවත් දිනක තම අසල්වැසියාට අයත් දේ ඔහුට ඕනෑවිය.

මිනිසුන් පූර්ණ වශයෙන් දෙවියන්වහන්සේට කීකරු නොවන්නේ කුමක් නිසාද? දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පැහැදිලිය. ගැටලුව ඇත්තේ අප තුළය. අපගේ හදවත් නිවැරදිව නැත. මිනිසුන්ට අලුත් හදවත් අවශ්‍ය වන්නේය.

පොරොන්දු දේශයේදී දෙවියන්වහන්සේගේ මිනිසුන් දෙවියන්වහන්සේට පූර්ණව කීකරුවීමට අසමත් වනු ඇත. ඉශ්‍රායෙල්වරුන් මත දෙවියන්වහන්සේගේ ශාප පැමිණෙනු ඇත (පරිච්ඡේද 28:15-68). ඔවුන් දේශයෙන් ඉවතට ගෙනයනු ඇත.

නමුත් මෙය අවසානය නොවේ. සුබ ආරංචියක්ද ඇත!

## දෙවියන්වහන්සේ කුමක් කරනු ඇත්ද?

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 30:1,6***

*උත්පත්ති 17:10-14 දක්වා සඳහන් වන ශාරීරික චර්මඡේදනය ගැන ඔබේ අසන්නන්ට පවසන්න. එය දෙවියන්වහන්සේ සමගවූ ගිවිසුම් සබඳතාවයේ ලකුණක් බව ඔවුන්ට පවසන්න. සැබෑ චර්මඡේදනය සිදුවිය යුත්තේ හදවතෙහිය. රෝම 2:28,29 කියවා පැහැදිලි කරදෙන්න.*

## ඉශ්‍රායෙල්වරුන් කුමක් කරනු ඇත්ද?

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 30:2,6,8,10***

දෙවියන්වහන්සේ ඉශායෙල්වරුන්ගේ හදවත් වෙනස් කළවිට සෙනඟ ආපසු දෙවියන්වහන්සේ වෙත පැමිණ උන්වහන්සේට කීකරුවනු ඇත. සෙනඟ තමන්ගේ පව් ගැන පසුතැවිලිවනු ඇත. සෙනඟ නැවත දෙවියන්වහන්සේ වෙත එනු ඇත. සෙනඟ දෙවියන්වහන්සේට ප්‍රේමකරනු ඇත (6 පදය).

## එවිට දෙවියන්වහන්සේ කුමක් කරනු ඇත්ද?

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 30:3-5,9***

සෙනඟ ආපසු දෙවියන්වහන්සේ වෙත හැරුණු කල්හි දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කරන සේක. උන්වහන්සේ ඔවුන් නැවත දේශය කරා ගෙනඑන සේක. දෙවියන්වහන්සේ නැවතත් ඔවුන්ට බොහෝ යහපත් දේ දෙනසේක. ඔවුන් නැවතත් බොහෝ සෙනඟක් වනු ඇත. දෙවියන්වහන්සේ තමන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුව රක්ෂා කරන සේක.

## මෙය සිදුවන්නේ කවදාද?

මෙය සුබ ආරංචියකි. නමුත් එය සිදුවන්නේ කවරදාකද? සෙනඟ යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන විට දෙවියන්වහන්සේ ඔවුන්ගේ හදවත් වෙනස් කරන සේක. *ඔබගේ අසන්නන්ට කොලොස්සි 2:10-11 කියවා පැහැදිලි කරදෙන්න.* කෙනෙකු යේසුස්වහන්සේ විශ්වාස කරන කළ ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්ගේ හදවත්වලට වැඩමකර හදවත් වෙනස්කරන සේක.

**අදාළ කිරීම**: ඇතැම් අසන්නන් යේසුස්වහන්සේ කෙරෙහි අදහාගත් අය නොවිය හැකිය. තමන්ගේ පව් වෙතින් ඉවත්වීමට ඔවුන් දිරිමත් කරන්න. යේසුස්වහන්සේ වෙතට හැරී දෙවියන්වහන්සේගේ ආත්මයාණන් ඉල්ලා සිටින්නට ඔවුන් උනන්දු කරවන්න. ඔවුන් යේසුස්වහන්සේ විශ්වාස කොට තමන්ගේ පව්වලින් හැරෙන්නේ නම් දෙවියන්වහන්සේගේ ආත්මය ඔවුන්ගේ හදවත් තුළ ඇත. තමන්ගේ හදවත් තුළ දෙවියන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය මත පදනම් වන්නට ඔවුන් දිරිමත් කරන්න.

**යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමට අපට හැකිවනු පිණිස අපගේ හදවත් වෙනස් කිරීමට උන්වහන්සේ දුන් විස්මිත අනුග්‍රහය ගැන ස්තුති කරන්න. දිනෙන් දින යේසුස්වහන්සේ මෙන් වනු පිණිස අඛණ්ඩව අප වෙනස් කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.*

# 36 ජීවනය තෝරාගන්න

### පසුබිම

පොරොන්දු දේශයේ ජීවත්වීම පිණිස මෝසෙස් සෙනඟ සූදානම් කරයි. ඔහුගේ දේශනාව මෙම පදවලින් අවසන් වේ.

### 11-20 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න. එක් එක් පදය කියවා එය ඔබගේම වචනවලින් ඔබටම පැහැදිලි කරන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 30:19.** "සාක්ෂි පිණිස අහසටත් පොළොවටත් හඬගසමි". දෙවියන්වහන්සේ තම සෙනඟට පොරොන්දු ලබාදෙයි. තමන්ට කීකරුවීමේ එකඟතාවකට ඔවුන් පැමිණීම උන්වහන්සේ අපේක්ෂා කරන සේක.

### කිරීමට යමක්

11-14 පද. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරුවන ලෙස මෝසෙස් සෙනඟ උනන්දු කරයි. ඔවුන්ට එසේ කළහැකි වනු පිණිස දෙවියන්වහන්සේ එය ඔවුන්ගේ හදවත්වල තැන්පත් කරන බැවින් එසේ කිරීම අසීරු දෙයක් නොවන බව ඔහු පවසයි. අන්තිම කොටසේදී අප කියැවූ දෙය ඔබට මතකද? ගැටලුව ඇත්තේ මනුෂ්‍ය හදවතෙහිය. තම සෙනඟට ව්‍යවස්ථාවට කීකරුවීමට හැකිවනු පිණිස දෙවියන්වහන්සේ ඔවුන්ගේ හදවත් චර්මඡේදනය හෙවත් වෙනස් කිරීම සිදුකරන සේක.

- *නව ගිවිසුමෙහි මෙම පද උපුටා දක්වා ඇත්තේ කොතැනකද?*

රෝම 10:5-9 දක්වා කියවන්න. එම වචනය නම් යේසුස්වහන්සේ පිළිබඳ සුබ ආරංචියයි. අපගේ හදවත්වල හා මුඛයෙහි යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ වචන තබන බව පාවුල්තුමා පවසයි. මෝසෙස් පෙන්වා දුන්නේ අනාගතයයි. ඒ වනාහි දෙවියන්වහන්සේගේ වචන අපගේ හදවත්වල තැන්පත් කර දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීමට අපට උපකාර වන යේසුස්වහන්සේ පිළිබඳ සුබ ආරංචියයි. ශුභාරංචිය අසීරු දෙයක් නොවේ. එය අපට දුරස් දෙයක්ද නොවන්නේය. මක්නිසාද යේසුස්වහන්සේ ශුභාරංචිය අප වෙත ගෙනෙන බැවිනි.

15-20 පද. මෙය මෝසෙස්ගේ දේශනාවේ අවසාන කොටසයි. දෙවියන්වහන්සේ වෙතට හැරෙන මෙන් ඉශ්‍රායෙල් සෙනඟට මෝසෙස් අභියෝග කරයි. ඔහුට අවශ්‍ය වන්නේ සෙනඟ ජීවිතය, සමෘද්ධිය හා ආශිර්වාද තෝරාගැනීමය. "ස්වාමීන්වහන්සේ ... නුඹේ ජීවනය ..."යි 20 වන පදය පවසයි. ජීවිතය ලැබෙන්නේ ව්‍යවස්ථාවෙන් නොව දෙවියන්වහන්සේගෙන්ය. තමන්වහන්සේ සෙනඟගේ හදවත් උන්වහන්සේ වෙනස් කරන විට දෙවියන්වහන්සේ ඔවුන්ට ජීවනය දෙන්නේය (6 පදය).

- *වර්තමානයේ කිතුනුවන්ට දෙවියන්වහන්සේ තම ජීවනය වන්නේ කෙසේද?*

යේසුස්වහන්සේ අපගේ ජීවනය වනසේක. මාර්ගයද, සත්‍යයද, ජීවනයද වන්නේ යේසුස්වහන්සේය. ජීවනය ලැබෙන්නේ මළවුන්ගෙන් නැගිටුණාවූ යේසුස්වහන්සේ වෙතින්ය. උන්වහන්සේට ප්‍රේමකරමින් සදාකාලිකව පූර්ණව ජීවත්වීම සඳහා යේසුස්වහන්සේ අපගේ හදවත් වෙනස් කරන සේක. අප යේසුස්වහන්සේ තෝරාගත යුතුය.

### ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ තම සෙනඟ උන්වහන්සේ අනුගමනය කිරීමට තෝරාගනිමින් ජීවත්වනු දකින්නටය.**

# ➔ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 30:11-20

### ⊳ ආරම්භය

කෙනෙකු අවසන් වරට පවසන වචන බොහෝවිට මතකයේ රැඳෙන්නේය.

- යම් කෙනෙකු ඔබට පැවසූ අවසන් වචන ඔබට මතකද? දේශනයක අවසන් වචන ඔබගේ මතකයට එන්නේද?

මෝසෙස් තම දේශනය අවසන් කරන්නේ ප්‍රබල අභියෝගයක් සමගිනි. ජීවිතය තෝරාගන්න.

### වචනය ඔබ ආසන්නයේය.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 30:11-14***

ද්විතීය නීති සංග්‍රහය 30:1-10 කොටස ඔබට මතකද? දෙවියන්වහන්සේ තම සෙනඟගේ හදවත් වෙනස්කරන සේක. ඉශ්‍රායෙල් සෙනඟට මෝසෙස් පවසන්නේ දෙවියන්වහන්සේගේ වචනය කරන්නට අසීරු දෙයක් හෝ ඔවුන්ට දුරස්තවූ දෙයක් නොවන බවය. එය ඇත්තේ ඔවුන්ගේ හදවත්වල හා මුවෙහිය.

මෝසෙස් කතා කරන්නේ කුමක් ගැනද? පාවුල්තුමා මෙම ඡේදය රෝම 10:5-9 දක්වා යොදාගනී. වචනය වන්නේ යේසුස්වහන්සේ පිළිබඳ සුබ ආරංචියයි. සුබ ආරංචිය වන්නේ යේසුස්වහන්සේ කෙරෙහි අදහා-ගැනීමය. මෙය අප දෙවියන්වහන්සේ සමඟ නිවැරදි බවට පත්කරන්නේය. අපට ව්‍යවස්ථාව තුළින් දෙවියන්වහන්සේ සමඟ නිවැරදි බවට පත්විය නොහැකිය. මක්නිසාද අපගේ හදවත් නිවැරදි නොවන නිසාය.

### ජීවනය තෝරාගන්න.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 30:15-20***

ජීවනය තෝරාගන්නා මෙන් පවසමින් මෝසෙස් තම දේශනාව අවසන් කරයි. සෙනඟට මරණය, විනාශය හා ශාපය තෝරාගත හැකිය. මෙයින් අදහස් වන්නේ සෙනඟ දෙවියන්වහන්සේට අකීකරුවෙමින් වෙනත් දෙවිවරුන් වෙත හැරීමය. එසේ නැත්නම් ඔවුන්ට දෙවියන්වහන්සේ විශ්වාස කරමින් දෙවියන්වහන්සේ අනුගමනය කළ හැකිය. දෙවියන්වහන්සේගේ ජීවිතය දෙන සේක. මෙයින් අදහස් වන්නේ සෙනඟ දෙවියන්වහන්සේට කීකරුවනු ඇති බවය.

අපට ජීවනය තෝරාගැනීම යනු යේසුස්-වහන්සේ තෝරාගැනීමය. යේසුස්වහන්සේ අපගේ ජීවිතයයි. මාර්ගයද සත්‍යයද ජීවනයද වන්නේ උන්වහන්සේය. උන්-වහන්සේ තමන් ජීවනදායක ආත්මයාණන් අපට දෙනසේක. ජීවනයද පුනරුප්පීවනයද යේසුස්වහන්සේය. ජීවනය තෝරාගැනීම යනු දෙවියන්වහන්සේගේ අනුග්‍රහය තෝරා-ගෙන යේසුස්වහන්සේගේ සුබ ආරංචිය පිළිගැනීමය.

සෙනඟට කළ හැක්කේ කෙතරම් විශිෂ්ඨ තෝරාගැනීමක්ද? ජීවිතය, සමෘද්ධිය, ආශිර්වාද, ජීවත්වෙමින් වැඩි වර්ධනය වීම, දේශයේ දිගු කාලයක් ජීවත්වීම හා දෙවියන්වහන්සේට ප්‍රේමකිරීම. දෙවියන්-වහන්සේට “එසේය” කීමට මෙම ලයිස්තුව සෙනඟ උනන්දු කරන්නේය. දෙවියන්-වහන්සේ තෝරාගැනීම කෙතරම් හොඳ දෙයක් දැයි ඔබේ අසන්නන්ට පවසන්න.

ⓘ **අදාළ කිරීම**: ඇතැම් අසන්නන් ඇදහිලිවතුන් නොවන්නට ඉඩ ඇත. යේසුස්වහන්සේ තෝරාගෙන ජීවත්වන්නට ඔවුන් උනන්දු කරන්න. ඔවුන්ගේ පාපය හා ශාපය යේසුස්වහන්සේගේ මරණය මගින් ඉවත්කරන බව විශ්වාස කරන්නට ඔවුන් දිරිමත් කරන්න. ඇතැම් අසන්නන් දෙවියන්වහන්සේ කෙරෙන් ඉවතට යමින් සිටිනු ඇත. ආපසු උන්වහන්සේ වෙතට ඇවිත් උන්වහන්සේ තෝරාගැනීමට ඔවුන් උනන්දු කරන්න. යේසුස්වහන්සේ තෝරා-ගැනීම තුළ ලැබෙන්නාවූ යහපත් දේ දකින්නට ඔවුන් දිරිමත් කරන්න.

⊕ **යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේ තෝරාගෙන ජීවත්වීම සඳහා අපගේ හදවත් සූදානම් කරන මෙන් උන්වහන්සේගෙන් ඉල්ලන්න. අප කීකරුවනු පිණිස සුබ ආරංචියේ වචනය අප ආසන්නයටම යේසුස්වහන්සේ ගෙන ඒම ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න.*

# 37 දෙවියන්වහන්සේට බිය වන්න. සතුරාට බිය නොවන්න

## පසුබිම

මෝසෙස් ඉක්මනින්ම මිය ඇදෙනු ඇත. ඔහු වසර සතළිසක් ඉශ්‍රායෙල් සෙනඟට මඟපෙන්වූයේය. තමාගේ අවසන් දේශනාවට පසු මෝසෙස් නායකත්වය යෝෂුවාට පවරන්නේය.

## 1-13 පද කියවන්න

## සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 31:2.** "යොර්දානයෙන් එතෙර නොයන්නේය" මෝසෙස්ට දේශයට ඇතුළුවන්නට අවසර නොලැබිණ. මෙයට හේතුව ගණන් කථාව 20:9-12 සඳහන් වූ මෝසෙස්ගේ පාපයයි.
- **ද්විතිය නිති සංග්‍රහය 31:4.** "ෂිහොන් සහ ඕග්": ද්විතිය නිති සංග්‍රහය 2:24-3:11 දක්වා කියවන්න.
- **ද්විතිය නිති සංග්‍රහය 31:10.** "කූඩාරම් මංගල්‍යය": ද්විතිය නිති සංග්‍රහය 16:13-15 කියවන්න.

## කිරීමට යමක්

1-6 පද. මෝසෙස් ඉශ්‍රායෙල් ජනතාව අමතයි. තමා දේශයට ඇතුල් නොවන බව ඔහු ඔවුන්ට පවසයි. යෝෂුවා ඔවුන්ට මඟපෙන්වනු ඇතිබව ඔහු සෙනඟට පවසන්නේය. ව්‍යවස්ථාවට කීකරුවන ලෙස මෝසෙස් සෙනඟට පවසන්නේය.

- *යෝෂුවාටත් සෙනගටත් මෝසෙස් දුන් ආඥාව කුමක්ද?*
- *මේ ගැන මෝසෙස් අවධානය යොමුකළේ ඇයි?*

වසර සතළිසකට පෙරදී ඉශ්‍රායෙල් ජනතාව දේශයට ඇතුළු නොවූහ. ඔව්හු දේශයේ ජීවත්වූ ජනතාවට බියවූහ. ද්විතිය නිති සංග්‍රහය 1:27-28 කියවන්න. ඔවුන් බිය වියයුතු නැති බව දැන් මෝසෙස් ඔවුන්ට පවසයි. ඉතා ධෛර්යවත්ව ශක්තිමත්ව සිටින ලෙස ඔහු ඔවුන්ට පවසයි. දෙවියන්වහන්සේ ඔවුන් සමඟ සිටින බවත් දෙවියන්වහන්සේ ඔවුන් වෙනුවෙන් සටන් කරන බවත් ඔහු සෙනඟට සිහිපත් කරවයි.

7-8 පද. මෝසෙස් යෝෂුවා අමතයි. යෝෂුවාටද බිය නොවන්නැයි මෝසෙස් පවසයි. යෝෂුවා ශක්තිමත්ව ධෛර්යවත්ව සිටිය යුතුය. ආබ්‍රහම්ගෙන් පැවත එන්නන් හට දෙවියන්වහන්සේගේ දේශය දීමට පොරොන්දු වූ බව දෙවියන්වහන්සේ යෝෂුවාට මතක්කර දෙනසේක. දෙවියන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. දෙවියන්වහන්සේ යෝෂුවා සමඟ සිටින බව මෝසෙස් ඔහුට සිහිපත් කරවයි.

- *සෙනග සහ යෝෂුවා ශක්තිමත් කරන්නේත් ධෛර්යවත් කරන්නේත් කුමක්ද?*
- *සතුරාට ඔවුන් බිය නොවන්නේ කුමක් නිසාද?*

9-13 පද. සෑම අවුරුදු සතකටම වරක් පූජකවරුන් සියලුම අණ පනත් සෙනඟ ඉදිරියේ කියවිය යුතුය. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සෙනඟ අමතක නොකළ යුතුය. දෙවියන්වහන්සේගේ සෙනඟගේ සැබෑ නායකයා වන්නේ දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේ තම වචනයෙන් හා යෝෂුවා මගින් තම සෙනඟට මඟපෙන්වනු ඇත. යෝෂුවා දෙවියන්වහන්සේගේ පාලනය යටතේ සිටිය යුතු අතර දෙවියන්වහන්සේගේ වචනය අනුගමනය කළයුතුය.

- *දෙවියන්වහන්සේගේ සෙනගට මෙම ඡේදය පවසන්නේ කුමක්ද?*
- *නායකයන්ට එය පවසන්නේ කුමක්ද?*

## ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේගේ වචනයට ඇහුම්කන් දෙන්න. දෙවියන්වහන්සේට බිය වන්න, සතුරාට බිය නොවන්න.**

# ➝ උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 31:1-13

### ආරම්භය

දෙවියන්වහන්සේගේ සෙනඟගේ නායකයන් ඔවුන් අතහැර ගියහොත් හෝ මියගියහොත් අනාගතය ගැන සෙනඟ බියට පත්වනු ඇත. දෙවියන්වහන්සේගේ සෙනඟගේ ශ්‍රේෂ්ඨතම නායකයෙකු වන්නේ මෝසෙස්ය. මෝසෙස් මැරෙන්නට යන බව සෙනඟ දනිති.

### මෝසෙස් සෙනඟ ධෛර්යවත් කරයි

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 31:1-6***

ශක්තිමත්ව හා ධෛර්යවත්ව සිටින්නැයි මෝසෙස් සෙනඟට පවසයි. සෙනඟට ශක්ති-මත්ව හා ධෛර්ය සම්පන්නව සිටිය හැක්කේ දෙවියන්වහන්සේ ඔවුන්ට නායකත්වය දෙන නිසාය. දෙවියන්වහන්සේ බලවත්ය, විශ්වාස ගතහැකිය. සතුරා ශක්තිමත්ය. නමුත් දෙවියන්වහන්සේ වඩා ශක්තිමත්ය.

### මෝසෙස් යෝෂුවා දිරිගන්වයි

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 31:7-8***

ශක්තිමත්ව හා ධෛර්යමත්ව සිටින්නැයි මෝසෙස් යෝෂුවාට පවසයි. දේශය පිළිබඳ පොරොන්දුව දෙවියන්වහන්සේ ඉටුකරන බව ඔහු යෝෂුවාට සිහිපත් කරවයි. දෙවියන්වහන්සේ විශ්වාසගත හැකි නිසා හා බලවත් නිසා යෝෂුවාට ශක්තිමත්ව ධෛර්ය සම්පන්නව සිටිය හැකිය.

### දෙවියන්වහන්සේගේ වචනයට සෙනඟ සවන්දිය යුතුමය.

**කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 31:9-13***

සෑම අවුරුදු සතකටම වරක් සෙනඟ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ඇසිය යුතුය. පූජකවරුන් එය ඔවුන්ට කියවිය යුතුය. දෙවියන්වහන්සේට බියවීමට සෙනඟ ඉගෙන-ගත යුතුය. සෙනඟ දෙවියන්වහන්සේට බිය වන්නේ නම් සතුරකුට ඔවුන් බිය වන්නේ නැත.

මෝසෙස් මියගිය පසුව යෝෂුවා සෙනඟට මඟපෙන්විය. එසේම සෙනඟට මඟපෙන්වීම දෙවියන්වහන්සේගේ වචනයෙන්ද ලැබුණි. සෙනඟගේ සැබෑ නායකයා දෙවියන්-වහන්සේය. දෙවියන්වහන්සේ තම වචනය තුළින් හා මනුෂ්‍ය නායකයකු තුළින් සෙනඟට මඟපෙන්වූ සේක.

**නිදසුන**: තමන්ගේ සභාපාලකවරයා ලෙස කෙනෙකු තෝරාගැනීමට සභාවකට අවශ්‍ය විය. සියල්ලන්ම සතුටෙන් තබන්නට සැමවිටම උත්සාහ කරන, කිසිවකුටත් කරදරයක් නැති අයකු ජනප්‍රියතාව දිනා ඇත. අනෙක් පුද්ගලයා ජනප්‍රිය අයෙකු නොවීය. ඔහු ජනප්‍රිය නොවුයේ සභාව පාලනය කරන්නට උවමනා වූ බලවත් හෝ ධනවත් පුද්ගලයන්ට ඔහු බිය නොවූ නිසාය. ඇතැම් විට ඔහු දෙවියන්වහන්සේගේ වචනය එළිපිට ප්‍රකාශ කිරීම මගින් අධිකාරීත්වයේ සිටින්නන් කළඹන්නේය.

සභාපාලකවරයා වීමට වඩාත් සුදුස්සා කවුරුන්ද?

**අදාළ කිරීම**: දෙවියන්වහන්සේගේ සෙන-ඟගේ හොඳම නායකයන් වන්නේ කවුරුන්ද? හොඳම නායකයෝ දෙවියන්වහන්සේගේ වචනය යටතේ සිටිති. නායකයකු ශක්තිමත් හා ධෛර්යවත් අයෙකු වන්නේ ඔහු හෝ ඇය දෙවියන්වහන්සේ විශ්වාස කරමින් දෙවියන්වහන්සේට කීකරුවන්නේ නම් පමණකි.

යෝෂුවා තෝරාගනු ලැබුවේ ඔහුට සටන් කිරීමේ දක්ෂතාව තිබූ නිසා නොවේ. ඒ ඔහු දෙවියන්වහන්සේට කීකරුවෙමින් උන්-වහන්සේ විශ්වාස කළ නිසාය. ඔබ සභාව සඳහා නායකයකු තෝරන්නේ නම් වඩාත් වැදගත් වන්නේ කුමක්දැයි මතකතබාගන්න.

දෙවියන්වහන්සේගේ සෙනඟ සියලු දෙනාම ශක්තිමත් හා ධෛර්යවත් අය වියයුතුය. නායකයා යනු විශේෂිත අයෙකු හෝ වෙනස් අයෙකු නොවේ. ශක්තිමත්ව ධෛර්යෙන් පිරී සිටීමේ මාර්ගය වන්නේ දෙවියන්-වහන්සේගේ වචනය විශ්වාස කිරීමය.

- ඔබ නිතරම දෙවියන්වහන්සේගේ වචනය කියවනවාද? ඔබ එයට සාවධානව ඇහුම්කන් දී ඊට කීකරු වනවාද?

**යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේ විශ්වාස කරන උන්වහන්සේට කීකරුවන නායකයන් උන්-වහන්සේගේ සභාවට සපයා දෙන මෙන් දෙවියන්-වහන්සේගෙන් ඉල්ලන්න. සභාවේ සැබෑ නායකයා වන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.*

## අධ්‍යයනය: ද්විතීය නීති සංග්‍රහය 32:1-18

# 38 ඉගෙනගන්නටත් සිහිකරන්නටත් ගීත ගයන්න

**පසුබිම**

තමා මියගිය පසු සෙනඟට ගැයීම සඳහා මෝසෙස් ගීතයක් ලියුවේය.

**1-18 පද කියවන්න**

**සටහන්**

- **ද්විතිය නිති සංග්‍රහය 32:2.** "පිනි" යනු සීතල රාත්‍රියකට පසු බිම හා පැළෑටි මත දැකිය හැකි තැන්පත්ව ඇති දිය බිංදුය.
- **ද්විතිය නීති සංග්‍රහය 32:5.** "දුෂිතව" යනු දුෂ්ටව, වැරදිව සිටීමට.
- **ද්විතිය නීති සංග්‍රහය 32:9.** "ස්වාමීන්-වහන්සේගේ කොටස" යන්නෙන් අදහස් වන්නේ ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්-වහන්සේ විශේෂයෙන් තෝරාගත් පිරිසක් බවය.
- **ද්විතිය නිති සංග්‍රහය 32:15.** "යෙෂුරුන්" යනු ඉශ්‍රායෙල් සෙනඟ සඳහා වූ තවත් නමකි. "පුෂ්ටිමත්" යනු නිරෝගිමත් යන්නය.

**කිරීමට යමක්**

- *අදහස: මෙම වචන දේශීය සංගීතයට අනුව ඔබට ගැයිය හැකිද?*
- *ඉශ්‍රායෙල් සෙනඟට මෝසෙස්ගේ ගීතය ඉගැන්වූයේ කුමක්ද?*

1-2 පද. ගීතය ආරම්භ වන්නේ දෙවියන්-වහන්සේට ඇහුම්කන් දී ඉගෙනගන්නා ලෙස අණකරමිනි. ඉශ්‍රායෙල් දේශයේ පැළෑටිවලට පිනි ඉතා වැදගත් වන්නේ ඉන් ජලය ලැබෙන නිසාය. දෙවියන්වහන්සේගේ වචන ජීවනය ගෙනදෙයි.

3-4 පද. *දෙවියන්වහන්සේ පර්වතයක් බඳු වන්නේ කෙසේද?*

5-6 පද. ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්-වහන්සේ වෙතින් ඉවතට ගියේය. දෙවියන්වහන්සේ ඔවුන්ගේ පියාණන් වුවත් ඔවුන් උන්වහන්සේගේ දරුවන් මෙන් හැසිරුණේ නැත.

- *පාළුකරයේ සිටියදී දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේ වෙතින් ඉවතට ගිය අවස්ථාවලට නිදසුන් ඔබට මතකද?*

නික්මයාම 32:1-10; ගණන් කථාව 13:1-33 බලන්න.

- *මෝසෙස් මියගිය පසු ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගිය අවස්ථාව ඔබට මතකද?*

යෝෂුවා 7:1-21; 1 රාජාවලිය 12:25-33 බලන්න.

7-14 පද. තමන්වහන්සේගේ සෙනඟ වෙනුවෙන් දෙවියන්වහන්සේ කළ දේ ලයිස්තුවක් සාදන්න. මේවා පාළුකරයේ ඔවුන් ගතකළ කාලයට අදාළ වනු ඇත. මේවා දෙවියන්වහන්සේ ගැන අපට පවසන්නේ මොනවාද?

15-18 පද. දෙවියන්වහන්සේ තම සෙනඟ හොඳින්ම රැකබලාගත් සේක. දෙවියන්-වහන්සේගේ සෙනඟගේ කුස පිරුණු කල්හි ඔවුන් දෙවියන්වහන්සේ වෙතින් ඉවත්ව වෙනත් දෙවිවරුන් වෙත හැරෙනු ඇත. නිදසුනක් ලෙස සලමොන් රජුගේ කාලයේදී මේ දේ සිදුවිය.

ගීත මගින් අපට සත්‍යය ඉගැන්විය යුතු අතර දෙවියන්වහන්සේ පිළිබඳව අපට සිහිපත් කළ යුතුය.

- *ඔබගේ සභාවේ ඔබ ගයන ගීතිකා මගින් සත්‍යය උගන්වන්නේද?*

ඔබටම ඉගෙනගන්නා පිණිස 19-43 දක්වා ඇති මෝසෙස්ගේ ගීතයේ ඉතිරි කොටස කියවා දෙවියන්වහන්සේ ගැනත් උන්-වහන්සේගේ සෙනඟ ගැනත් තවදුරටත් ඔබට ඉගෙනගත හැක්කේ මොනවාදැයි බලන්න.

**ප්‍රධාන කරුණ**

**දෙවියන්වහන්සේ අමතක නොකරන්න. ඔබ දෙවියන්වහන්සේ වෙතින් ඉවතට ගිය බවද අමතක නොකරන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 32:1-18

### ⊳ ආරම්භය

දෙවියන්වහන්සේ ගීතවලට කැමතිය. බයිබලයේ ගීත බොහොමයක් ඇත. මෝසෙස්ගේ ගීතය ශෝක ගීතයකි. එහෙත් ඉගෙනීම සඳහා එය වැදගත්ය. වැදගත් වන්නේ අපගේ ගීත අපට සත්‍යය ඉගැන්වීමය.

මෙය දෙවියන්වහන්සේ සහ දෙවියන්වහන්සේගේ සෙනඟ පිළිබඳ ගීතයක්ය. දෙවියන්වහන්සේ විශ්වාසවන්ත වනසේක. දෙවියන්වහන්සේගේ සෙනඟ විශ්වාසවන්ත අය නොවූහ. ගීතිකාවේ ඉලක්කය වූයේ ජීවිතය ලබාදීමය (1-2 පද).

### දෙවියන්වහන්සේ කෙබඳුද යන්න ගැන ගයන්න

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 32:3-4***

මේ පදවලින් අපට පවසන්නේ දෙවියන්වහන්සේ ශ්‍රේෂ්ඨය, පරිපූර්ණය, සාධාරණය, විශ්වසනීයය, කෙලින් වැඩකරන්නේය හා පර්වතයක් බඳුය කියාය. පර්වතයක් යනු ශක්තිමත් විශ්වාසය තැබිය හැකි දෙයකි. දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේට ප්‍රශංසා ගැයිය යුතුය (3 පදය).

### දෙවියන්වහන්සේගේ සෙනඟ කෙබඳුද යන්න ගැන ගයන්න.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 32:5-6***

දෙවියන්වහන්සේගේ සෙනඟ දෙවියන්වහන්සේ මෙන් නොවන්නේය. මේ පද අපට පවසන්නේ ඉශ්‍රායෙල් සෙනඟ දූෂිතය (අවංක නොවේ), වංචනිකය (වැරදි මාර්ගවල ගියේය), මෝඩය, ප්‍රඥාවන්තව කටයුතු නොකරයි යන්නය. දෙවියන්වහන්සේ ඔවුන්ගේ පියාණන්ය. නමුත් ඉශ්‍රායෙල් සෙනඟ උන්වහන්සේගේ දරුවන් මෙන් ක්‍රියා නොකළෝය. *පාඨකරයේදී දෙවියන්වහන්සේගේ සෙනග උන්වහන්සේ වෙතින් ඉවත්ව ගිය ඇතැම් අවස්ථා ඔබේ අසන්නන්ට පවසන්න.*

### දෙවියන්වහන්සේ කළ දෙය ගැන ගයන්න

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 32:7-14***

*මෙම පදවල සඳහන් වන පාඨකරයේදී ඉශ්‍රායෙල්වරුන් උදෙසා දෙවියන්වහන්සේ කළ දේවල් මොනවාදැයි ඔබේ අසන්නන්ට පවසන්න.* දෙවියන්වහන්සේ ඔවුන්ට මඟපෙන්වමින්, පෝෂණය කරමින් දේශය කරා රැගෙන ආසේක. උන්වහන්සේගේ සෙනඟ බොහෝවර උන්වහන්සේ වෙතින් ඉවතට ගිය නමුත් දෙවියන්වහන්සේ මේ සියල්ල තම සෙනඟ උදෙසා කළසේක.

### දෙවියන්වහන්සේගේ සෙනඟ කළ දෙය ගැන ගයන්න.

⌄ **කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 32:15-18***

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟට සෑම දෙයක්ම සැපයූ නිසා ඔවුන්ට කෑම බොහෝ විය. ඔව්හු කා තර වූහ. නමුත් ඔවුහු වෙනත් දෙවිවරුන් වෙතට හැරී යක්ෂයන්ට යාග පූජා ඔප්පු කළෝය. මෙම ගීතය සෙනඟට ඔවුන් කෙතරම් නරකදැයි සිහිපත් කරන්නේය.

ⓘ **අදාළ කිරීම**: දෙවියන්වහන්සේගේ සෙනඟ බොහෝවර උන්වහන්සේ වෙතින් ඉවත්ව ගිය බව අපට සිහිපත් කරවයි. නමුත් දෙවියන්වහන්සේ කිසිදා අත් නොහැරිය සේක. දෙවියන්වහන්සේ විශ්වසනීයය. මෙම ගීතයේ ඇති කතන්දරය පරණ ගිවිසුමෙන් අවසන් නොවේ. කථාව දිගු වන්නේ යේසුස්වහන්සේ දෙසටය. දෙවියන්වහන්සේ පාපී මිනිසුන්ට කෙතරම් ප්‍රේම කරන්නේද යන්න යේසුස්වහන්සේ අපට පෙන්වා දෙනසේක.

දෙවියන්වහන්සේ ගැනත් උන්වහන්සේගේ සෙනඟ ගැනත් ඉගෙනගෙන සිහිකරමින් ගායනා කිරීම වැදගත් බවද මෙම ගීතය අපට පවසයි. සැබෑ දෙය කුමක්දැයි අපගේ ගීතිකා පැවසිය යුතුය.

- දෙවියන්වහන්සේ කෙබඳුද යන්නත් ඔබ කෙබඳුද යන්නත් දැක්වීම සඳහා ඔබේම ගීතයක් නිර්මාණය කරගැනීමට මෝසෙස්ගේ ගීතය ඔබට යොදාගත හැකිද?

⇧ **යාච්ඤා කරන්න**: *දෙවියන්වහන්සේ විශ්වාසවන්තව හා තමන්ගේ සෙනගට ප්‍රේමකරන නිසා උන්වහන්සේට ස්තුති කරන්න.*

# 39 දෙවියන්වහන්සේගේ විශ්‍රාමය බලාපොරොත්තු වන්න

### පසුබිම

මෝසෙස් වසර සතළිසක් තිස්සේ ඉශ්‍රායෙල් සෙනඟට මඟපෙන්වූයේය. පොරොන්දු දේශයට ඇතුළු වන්නට මෝසෙස්ට අවසර නොලැබිණ. යෝර්දාන් නදියෙන් මෙපිට කඳුකරයේ ඔහු මිය ගියේය.

### 1-12 පද කියවන්න

*ඡේදය 2 වරක් හෝ 3 වරක් කියවන්න.*

### සටහන්

- **ද්විතිය නිති සංග්‍රහය 34:1.** "නෙබෝ", "මෝවබ්" සහ "පිස්ගා" යනු පොරොන්දු දේශයෙන් පිටත වූ ස්ථානයන්හි නම්ය. ඒවා පිහිටියේ යොර්දාන් නදියෙන් මෙපිට වන අතර මෙම ස්ථානයන්හිදී මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟ ඇමතුවේය.
- **ද්විතිය නිති සංග්‍රහය 34:9.** "ප්‍රඥාවේ ආත්මයෙන් පූර්ණ විය": සෙනඟට මඟපෙන්වනු පිණිස දෙවියන්වහන්සේ තම ආත්මයාණන් යෝෂුවාට දුන්සේක.
- **ද්විතිය නිති සංග්‍රහය 34:10.** "මුහුණට මුහුණ" යන්නෙන් අදහස් වන්නේ දෙවියන්වහන්සේ මෝසෙස් පෞද්ගලික-වම සමීපව දැනසිටීමය. කිසිවකු දෙවියන්-වහන්සේගේ මුහුණ දකින්නේ නැත.

### කිරීමට යමක්

දේශයට ඇතුළුවීමට මෝසෙස්ට අවසර නොලැබුණේ ඇයි? ගණන් කථාව 20:2-13; ද්විතිය නිති සංග්‍රහය 1:37, 3:25-28, 4:21, 32:48-52 කියවන්න. මේ සියලු පදවලින් පැවසෙන්නේ මෝසෙස් දේශයට ඇතුළු නොවන බවය.

මෙය සාධාරණ යැයි ඔබ සිතන්නේද? දිගු කාලයක් පුරා මෝසෙස් ශ්‍රේෂ්ඨ නායකයකු විය. ඔහු වැරදියට කළේ එක දෙයක් පමණකි. නමුත් ඔහු කල දෙය බරපතළය. ඒ නිසා එය සාධාරණය. එහිදී මෝසෙස් දෙවියන්වහන්සේට ගෞරව කළේ නැත. නමුත් දෙවියන්වහන්සේ කරුණාවන්තය. උන්-වහන්සේ මෝසෙස්ට මුළු පොරොන්දු දේශයම දකින්නට ඉඩ සැලැස්වූ සේක (1-4 පද).

10-12 පද. ද්විතිය නිති සංග්‍රහය 18:15-18 කොටසේදී දෙවියන්වහන්සේ අනාගතයේ මෝසෙස් වැනි ප්‍රොපේතවරයකු දෙන බවට පොරොන්දු වූ සේක. ද්විතිය නිති සංග්‍රහය 34 ලියැවෙන අවස්ථාවේදී එම ප්‍රොපේත-වරයා පැමිණ තිබුණේ නැත.

- *පසුව එන මෝසෙස් වැනි ප්‍රොපේතවරයා කවුද?*

මෝසෙස් වැනි ප්‍රොපේතවරයා යේසුස්-වහන්සේය. යේසුස්වහන්සේ දෙවියන්-වහන්සේගේ වචන කතාකළ සේක. යේසුස්-වහන්සේද පුදුම ක්‍රියා හා හාස්කම් කළසේක. යේසුස්වහන්සේ මෝසෙස්ට වඩා අධිකාරිත්-වයක් ඇතිව ඉගැන්වූ සේක.

- *මේවා අපට දෙවියන්වහන්සේ ගැන පවසන්නේ කුමක්ද?*

**දෙවියන්වහන්සේ ශුද්ධය, පාපය විනිශ්චයට ලක්කරන සේක.** මෝසෙස් වැනි ශ්‍රේෂ්ඨ නාය-කයන්ගේ පාපය පවා විනිශ්චය කරනු ලැබේ.

**දෙවියන්වහන්සේ විශ්වසනීයය.** මෝසෙස් වැනි ප්‍රොපේතවරයකු දෙන බවට දෙවියන්-වහන්සේ පොරොන්දු වූ සේක. යේසුස්-වහන්සේ එම ප්‍රොපේතවරයාය.

- *මෙය අපට පවසන්නේ කුමක්ද?*

හෙබ්‍රෙව් 3:7-4:11 දක්වා රචකයා ස්වර්ගයට ඇතුළුවීම වරද්දා නොගන්නැයි සෙනඟට අනතුරු අඟවයි. මෝසෙස්ගේ ජීවිතය අපටද අනතුරු ඇඟවීමකි. ඔහු මෙන් වරද්දා නොගන්නට අප සිතට ගත යුතුය.

සුබ ආරංචිය නම් මෝසෙස් ස්වර්ගයේ සිටීමය (හෙබ්‍රෙව් 11:25-26). ඔහු ස්වර්ගයේ සිටින්නේ යේසුස්වහන්සේ තුළ දෙවියන්-වහන්සේගේ අනුග්‍රහය හේතුවෙනි. නායක-යන් ඇතුළු සියලුම කිතුනුවන්ට යේසුස්-වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ අනුග්‍ර-හය අවශ්‍ය වන්නේය. අප සැමවිටම යේසුස්වහන්සේ විශ්වාස කළ යුතුවේ. යේසුස්වහන්සේ නිසා අපට ස්වර්ගයට ඇතුළුවීමට හැකිවන බව නිසැකය.

### ප්‍රධාන කරුණ

**දෙවියන්වහන්සේගේ විශ්‍රාමයට ඔබේ ඇතුළුවීම නිසැක කරගන්න.**

# → උගන්වන්න: ද්විතීය නීති සංග්‍රහය 34:1-12

**⊳ ආරම්භය**

මිනිසුන්ට තම ඉලක්කය කරා ළඟාවීමට නොහැකිවීම කණගාටුවට කරුණකි. තම දරුවාගේ විවාහ මංගලයය දිනට පෙර පියා මියයනු අප දැක ඇත. *ඔබ සිටින ස්ථානයෙන් නිදසුන් දෙන්න.*

- *මෝසෙස් ගැන කිවහැක්කේ කුමක්ද?*

**මෝසෙස්ට දේශයට ඇතුළුවිය නොහැකිය.**

**⊙ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 34:1-8***

මෝසෙස් මිසරයේ වහල්භාවයේ සිට පොරොන්දු දේශය කරා වසර සතළිහක් තිස්සේ ඉශ්‍රායෙල් සෙනඟට මඟපෙන්විය. නමුත් ඔහු මියගියේ පොරොන්දු දේශයෙන් පිටතය. දෙවියන්වහන්සේ මෝසෙස්ට දේශය දකින්නට සැලැස්වුවද ඔහුට එහි ඇතුළුවීමට නොහැකි විය.

*ගණන් කථාව 20:10-12 වෙතින් මෝසෙස්ට දේශයට ඇතුළුවීමට නොහැකි වූයේ කුමක් නිසාදැයි ඔබේ අසන්නන්ට සිහිපත් කරන්න.* මෝසෙස් ශ්‍රේෂ්ඨ නායකයකු වුවත් බොහෝ යහපත් දේ කළත් ඔහු ඉතා නරක ලෙස අසමත් විය.

**ⓘ අදාළ කිරීම**: අප මෝසෙස් මෙන් නොවිය යුතුය. මෝසෙස්ගේ ජීවිතය අපට අනතුරු ඇඟවීමක්ය, මෝසෙස්ගේ ජීවිතය විශේෂයෙන්ම කිතුනු නායකයන්ට අනතුරු ඇඟවීමක් කරයි. නොඇදහිල්ල සහ අකීකරුකම නිසා ස්වර්ගයට ඇතුළුවීමෙන් අප අසාර්ථක නොවිය යුතුය. දෙවියන්වහන්සේ වෙනුවෙන් තමන් කරන්නාවූ සියලු යහපත් දේ නිසා තමන් ස්වර්ගයට යනු ඇතැයි ඇතැම් නායකයන් සිතනු ඇත. ඔබේ යහපත් ක්‍රියා මත පදනම් නොවන්න.

මෝසෙස් භූමික දේශයට ඇතුළු වූයේ නැත. නමුත් වඩාත් වැදගත් වන්නේ සත්‍ය පොරොන්දු දේශය වන ස්වර්ගයෙහි ඔහු සිටීමය. *හෙබ්‍රෙව් 11:26හි පැවසෙන්නේ කුමක්දැයි ඔබේ අසන්නන්ට පවසන්න.* දෙවියන්වහන්සේ කරුණාවන්තය. දෙවියන්වහන්සේ සමාව දෙන සේක. දෙවියන්වහන්සේ අනුග්‍රහය, උන්වහන්සේගේ ත්‍යාගය වන නොමිලයේ සමාව යේසුස්වහන්සේ තුළින් සෙනඟ ස්වර්ගය කරා ගෙන එනු ලබයි. ස්වර්ගය කරා යාහැකි එකම මාර්ගය වන්නේ යේසුස්වහන්සේ මගින් යාමය.

**මෝසෙස් වැනි ප්‍රොපේතවරයෙක්**

**⊙ කියවන්න**: ***ද්විතීය නීති සංග්‍රහය 34:9-12***

මෝසෙස් වැනි ප්‍රොපේතවරයකු දෙන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක. ප්‍රොපේතවරයා දෙවියන්වහන්සේගේ වචන කතාකරන අතර ලකුණු හා පුදුම ක්‍රියා කරන්නේය. ද්විතීය නීති සංග්‍රහය 34 ලියනු ලැබූ අවධියේ එම ප්‍රොපේතවරයා පැමිණ තිබුණේ නැත. මෝසෙස් වැනි ප්‍රොපේතවරයා වන්නේ යේසුස්වහන්සේය. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ වචන කතාකළ අතර බොහෝ ලකුණු හා විස්මිත ක්‍රියා කළසේක.

දෙවියන්වහන්සේ තම වචනය මගින් තම සෙනඟට කතාකළ සේක. මෝසෙස් දෙවියන්වහන්සේගේ වචන කතාකළේය. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ වචනයයි. බයිබලය තුළ දෙවියන්වහන්සේගේ වචනය ඇසෙන්නේය.

**ⓘ අදාළ කිරීම**: මෝසෙස්ට ඇහුම්කන් දෙන ලෙස ඉශ්‍රායෙල් සෙනඟට දෙවියන්වහන්සේ පැවසූ සේක. ද්විතීය නීති සංග්‍රහය 18:15හි දෙවියන්වහන්සේ සෙනඟට පැවසුවේ මෝසෙස් වැනිවූ ප්‍රොපේතවරයාට සවන් දෙන මෙන්ය. දෙවියන්වහන්සේගේ සෙනඟ යේසුස්වහන්සේට සවන්දිය යුතුමය. දෙවියන්වහන්සේගේ වචන කියවීමෙන් අපි යේසුස්වහන්සේට සවන් දෙන්නෙමු.

- අපි කෙතරම් දෙවියන්වහන්සේගේ වචනය කියවන්නෙමුද? කෙතරම් ඕනෑකමකින් අපි එයට කීකරු වන්නෙමුද?

**⊕ යාච්ඤා කරන්න**: *යේසුස්වහන්සේ තුළින් ස්වර්ගයට ඇතුළු වියහැකි වීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන්න. දෙවියන්වහන්සේගේ ස්වර්ගීය විශ්‍රාමයට අප ඇතුල්වනු පිණිස යාච්ඤා කරන්න. යේසුස්වහන්සේ පිළිබඳ දෙවියන්වහන්සේගේ වචනයට නිතරම ඕනෑකමෙන් සවන්දෙනු පිණිස අපට උපකාර කරන මෙන් යාච්ඤා කරන්න.*

# උපග්‍රන්ථය: පරණ ගිවිසුමේ පනත් අද දවසට අදාළ කරගන්නා ආකාරය

ද්විතිය නිති සංග්‍රහයේ බොහෝ පරිච්ඡේද (විශේෂයෙන් 12-26 දක්වා) ඉශ්‍රායෙල් සෙනඟ උදෙසාවූ දෙවියන්වහන්සේගේ පනත් දක්වන්නේය. එබැවින් ද්විතිය නීති සංග්‍රහයේ වැදගත් වන්නේ පනත්ය. මේ ඇතැම් පනත් අද දවසට අදාළ වන්නේ කෙසේදැයි අපි ඉදිරිපත් කරන්නෙමු. පොදුවේ ගත්කළ පරණ ගිවිසුමේ පනත් කිතුනුවන්ට අදාළ වන්නේ කෙසේදැයි අපි සිතා බලමු. ඒ ගැන සිතිමේ පියවර පහත දැක්වේ.

### 1. එක් එක් පනත පිහිටුවීමට හේතුවුයේ කුමක්ද?

ඔබ පරණ ගිවිසුමේ පනතක් කියවන කල, *"මේ පනත් ඇතිකිරීමට හේතුවූයේ කුමක්ද?"* යන්න සිතිමට උත්සාහ ගන්න. ඔබේ අසල්වැසියාට ප්‍රේමය දැක්විය යුතු වීම අදාළ පනත්වලට හේතුව වියහැකිය. ඇතැම් ඒවා දෙවියන්වහන්සේට පමණක් නමස්කාර කිරීම පිළිබඳවය. ඇතැම් ඒවා ඉශ්‍රායෙල් සෙනඟ අන්‍යජාතීන්ට වඩා වෙනස් ආකාරයට සිටිය යුතු වීම පිළිබඳවය. ඇතැම් පනත් ආරක්ෂාව පිළිබඳවය. ඇතැම් ඒවා සාධාරණ විනිශ්චයක් සඳහාය. ඇතැම් ඒවා මගින් දුප්පතුන් ආරක්ෂා කරනු ලැබීය.

පරණ ගිවිසුමේ බොහෝ පනත් උදාහරණ වන්නේය. කෙනෙකු තම අසල්වැසියාගේ ගොනෙකුට හෝ බූරුවෙකුට උපකාර කළ යුතුය (ද්විතිය නිති සංග්‍රහය 22:4). නමුත් අසල්වැසියාගේ බැටළුවා ගැන පවසන්නේ කුමක්ද? සැබවින්ම පනත බැටළුවාටද අදාළ වන්නේය. මේ උදාහරණයේදී පනත ඇතිකිරීමේ හේතුව වූයේ තම අසල්වැසියාගේ සතුන් පිළිබඳව සැලකිලිමත් වීමේ වගකීම පැවරීමය. එබැවින් පනත අනෙක් සතුන් සඳහා ද අදාළ වන්නේය.

සැමවිටම පනත ඇතිකිරීම සඳහා හේතුවූ කාරණය සොයාගැනීම පහසු නොවන්නේය. එළු පැටවකු උගේ මවගේ කිරිවලින් තැම්බීම නොකළ යුතුය යන පනත ඇති කිරීමේ හේතුව කුමක්ද? එය දැනගැනීම අපට අසීරුය. නමුත් ඇතැම් විට ඒ ඉශ්‍රායෙල් සෙනඟ අන්‍ය ආගමිකයන්ගේ සිරිත් විරිත් හෝ හැසිරීම් අනුකරණය නොකළ යුතු බව දැක්වීම සඳහා වන්නට පුළුවන.

### 2. බොහෝ හේතු අද දවසට ද අදාළ වන්නේය.

පනත් ඇතිකිරීමේ බොහෝ හේතු අද දවසටද උචිත වන්නේය. පනත් ඇතිකිරීමට හේතුවූ කාරණා බොහෝමයක් නව ගිවිසුම මගින් වෙනස් නොවන්නේය. අසල්වැසියාට ප්‍රේමකිරීම, දෙවියන්වහන්සේට පමණක් නමස්කාර කිරීම, ආරක්ෂිත ස්ථාන තබාගැනීම, අපක්ෂපාතී හා සාධාරණ වීම, නොඇදහිලිවන්තයන්ට වඩා වෙනස්ව සිටීම කිතුනුවන් කළ යුතුවේ. බොහෝ පනත් තවමත් කිතුනුවන්ට අදාළ වන්නේය. ප්‍රේමය හා ශුද්ධත්වය පිළිබඳ දෙවියන්වහන්සේගේ ප්‍රමිතිය වෙනස් වී නොමැත.

### 3. ඇතැම් හේතු අදාළ වුවත් අපගේ සංස්කෘතිය ඊට වෙනස්ය.

අපගෙන් බොහෝ දෙනෙකු ජීවත්වන්නේ පුරාණ ඉශ්‍රායෙල් සංස්කෘතියට වඩා වෙනස් සංස්කෘතීන් තුළය. එක උදාහරණයක් වන්නේ නිවෙස්ය. පැරණි ගිවිසුම් යුගයේ නිවෙස්වල තිබුණේ පැතලි සමතලා වහලකි. ආරක්ෂාව උදෙසා ඔවුන් ඒ වටා කෙටි තාප්පයක් හෝ වැටක් ඉදිකළ යුතුවිය (ද්විතිය නිති සංග්‍රහය 22:8). බොහෝ සංස්කෘතීන්හි නිවෙස්වල වහලය සමතලා නැත. එබැවින් ඒ වටා වැටක් ඉදිකිරීමේ පනත අදාළ නොවේ. නමුත් ආරක්ෂාව යන කාරණය තවමත් අදාළය. අපේ නිවෙස්වල ආරක්ෂිත බව රැකගැනීම සඳහා ගතයුතු වෙනත් ක්‍රියාමාර්ග ඇත. උදාහරණයක් ලෙස විදුලි රැහැන් හා ආහාර පිසින ස්ථානය දරුවන්ට ආරක්ෂිත දේ වියයුතුය.

## 4. ඇතැම් හේතු වෙනස්වී ඇත්තේ යේසුස්වහන්සේ එම පනත් සම්පූර්ණ කර ඇති නිසාය.

පැරණි ගිවිසුමේ සඳහන් ප්‍රජාවන් යේසුස්වහන්සේ ඉටුකර ඇත. එනිසා කිතුනුවන් සත්ව පූජාවන් ඔප්පු කිරීම අවශ්‍ය නොවේ. කිතුනුවන් දෙවියන්වහන්සේ සමඟ නිවැරදි සබඳතාවට පැමිණ ඇත්තේ අපගේ පාප උදෙසා යේසුස්වහන්සේ කුරුසිය මත කළාවූ පූජාව ගැන විශ්වාසය තැබීම මගින් පමණක්මය. පැරණි ගිවිසුමේ ඇති පූජාවන්හි අවසානය දක්වන්නේ කුරුසිය මත යේසුස්වහන්සේ කළ පූජාවය. අද දවසේ ඇදහිලිවන්තයන් සඳහා සැබෑ හා එකම පූජාව වන්නේ යේසුස්වහන්සේගේ පූජාවය (හෙබ්‍රෙව් 10:11-12). එසේම දෙවියන්වහන්සේ ජීවමාන දේවමාළිගාව වනසේක (යොහන් 2:21). දෙවියන්වහන්සේට නමස්කාර කිරීම සඳහා කිතුනුවෝ කූඩාරමකට හෝ දේවමාළිගාවට හෝ යෙරුසලම වෙත නොයති. දෙවියන්වහන්සේ නමස්කාර කිරීම සඳහා කිතුනුවන් යන්නේ යේසුස්වහන්සේ වෙතටය. තවදුරටත් නමස්කාර කිරීම සඳහා විශේෂිත වූ ස්ථානයක් නොමැත. පූජාවන් හා දේවමාළිගාව පිළිබඳ පැරණි ගිවිසුමේ පනත් කිතුනුවන් අදාළ කරගන්නේ යේසුස්වහන්සේ තුළින්ය.

එසේම යේසුස්වහන්සේ මෙම න්‍යායයන් පුළුල් කළ සේක. කිතුනුවන් තමන්ගේ සතුරන්ටද ප්‍රේමකළ යුතු වන්නේය. වෛරකිරීම හෝ රාගාධිත ආශාවන් කිතුනුවන්ට යෝග්‍ය නොවේ.

## 5. ඇතැම් හේතු වෙනස් වන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ තවදුරටත් එකම ජාතියකට අයත් නොවන බැවිනි.

දෙවියන්වහන්සේගේ සෙනඟ වන්නේ සෑම ජාතියකම තිබෙන සභාවක්ය. පැරණි ඉශ්‍රායෙල් ජාතියේ සම්පූර්ණත්වය වන්නේ ජගත් සභාවය. පරණ ගිවිසුමේ පනත්වලට හේතු පාදක වූයේ ජාතියක් ලෙස දෙවියන්වහන්සේගේ සෙනඟ සැලකිල්ලට ගැනීම තුළය. එබැවින් ජාතියක් පිළිබඳ වූ පැරණි ගිවිසුමේ පනත් ඇති කිරීමට හේතු වූ කාරණා වෙනස් වී ඇත. එක නිදසුනක් මෙසේය. ද්විතීය නීති සංග්‍රහයෙහි වැරදි ලිංගික සබඳතාවක යෙදුණාවූ ඉශ්‍රායෙල්වරයෙකු මරණයට පත්කළ යුතු බව දැක්වේ. වර්තමානයේ වැරදි ලිංගික සබඳතාවක් පවත්වන අයෙකු සිටී නම් ඔහු සභාවෙන් නෙරපා හැරිය හැකිය (1 කොරින්ති 5:1-5). ජාතියක් පිළිබඳව වූ පැරණි ගිවිසුමේ පනත් දෙවියන්වහන්සේගේ සෙනඟගේ සභාවට අදාළ කරගත යුතුවේ.

## 6. ඇතැම් හේතූන් වෙනස් වන්නේ පොළොවේ පොරොන්දු දේශය ස්වර්ගීය රාජ්‍යය මගින් ප්‍රතිස්ථාපනය වන බැවිනි.

පුරාතන ඉශ්‍රායෙලය මෙන් කිතුනුවන්ට භූමික පොරොන්දු දේශයක ජීවත්වීමේ අවශ්‍යතාවක් නොමැත. වඩා වැදගත් වන්නේ ස්වර්ගික භූමියයි. එබැවින් භූමි භාගයක් අත්පත් කරගැනීම පිළිබඳ පනත කිතුනුවන්ට අදාළ නොවේ. තමන් ස්වර්ගය කරා යාම සහතික කරගැනීම සඳහා ආත්මික යුද්ධයක් කිතුනුවන්ට ඇත. අපගේ ප්‍රධාන සතුරා වන සාතන් කුරුසිය මතදී යේසුස්වහන්සේ විසින් පරාජය කරනු ලැබීය. යේසුස්වහන්සේ නිසා කිතුනුවන්ට තමන්ගේ ජයග්‍රහනය ගැන නිසැක වියහැකිය.

## 7. ඇතැම් හේතු වෙනස් වන්නේ වර්තමානයේ දෙවියන්වහන්සේගේ සෙනඟ වන්නේ යුදෙව්වන් හා අන්‍යජාතීන් යන දෙකොටසම බැවිනි.

පැරණි ගිවිසුමෙහි විදේශියයන්ට සළකනු ලැබුවේ දෙවියන්වහන්සේගේ සෙනඟට වඩා වෙනස් ආකාරයකිනි. ඉශ්‍රායෙල්වරුන් විදේශිකයන්ට වඩා වෙනස් ආකාරයකට හැසිරිය යුතුවිය. නිදසුනක් ලෙස, ද්විතිය නිති සංග්‍රහය 14 හි ඇති ආහාර පිළිබඳ නිති මෙය පෙන්වා දෙයි. යේසුස්වහන්සේ පැමිණි කළ පව්වලට සමාව දී ඇති බැවින් සුභ පණිවුඩය අන්‍යජාතීන් හා යුදෙව්වන් යන දෙකොටසටම විය. ක්‍රියා 10හි පෙන්වා දෙන්නේ සියලු ආහාර පවිත්‍ර කර ඇති බවය. ක්‍රිස්තුස්වහන්සේ නිසා දැන් යුදෙව් හා අන්‍යජාතික කිතුනුවන් අතර වෙනසක් නැත.

## 8. අපි දෙවියන්වහන්සේට කීකරුවිය යුතු හේතුව

අප දෙවියන්වහන්සේගේ පනත්වලට කීකරුවන්නේ කුමක් නිසාදැයි අප මතකතබාගත යුතුමය. ඉශ්‍රායෙල් සෙනඟ මිසර දේශයෙන් මුදාගත් බැවින් ඔවුන් දෙවියන්වහන්සේට භයව කීකරු වියයුතුය. යේසුස්වහන්සේ කුරුසිය මතදී අප මුදාගත් නිසා කිතුනුවන් උන්වහන්සේ අදහාගෙන කීකරුවිය යුතුය. අපට ගැළවීම ඇත්තේ යේසුස්වහන්සේ තුළ පමණක්මය. ඉශ්‍රායෙල්වරුන් හා කිතුනුවන් දෙවියන්වහන්සේගේ සියලු පනත්වලට කීකරුවීම මත පමණක් රඳා නොසිටිය යුතුය. පරණ ගිවිසුමේ මෙන්ම අලුත් ගිවිසුමේද දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ තම සෙනඟගේ කීකරුකම තුළ ඇදහිල්ල දැකීමය. ඇදහිලිවන්තයන් ගළවනු ලබන්නේ පනත් රැකීම මගින් නොවේ. ඇදහිලිවන්තයන්ට ගැළවීම ඇත්තේ ඇදහිල්ල තුළින් ක්‍රිස්තුස්වහන්සේ මගින් පමණක්මය. ඇදහිල්ල දැකගත හැක්කේ ඔවුන් දක්වන කීකරුකම තුළය. යේසුස්වහන්සේට වටිනා ආකාරයේ ජීවිත අප ගතකළ යුතුය (එපීස 4:1).

## 9. සාරාංශය

එබැවින් පැරණි ගිවිසුමේ පනත් පිටුපස ඇති ඊට හේතු වූ කාරණා සොයා බලන්න. එකල සිට මෙකල දක්වා යම් දෙයක් වෙනස් වී තිබේදැයි සිතන්න. යේසුස්වහන්සේ කරණකොට යම් දෙයක් වෙනස් වී තිබේද? එමගින් පනත පිළිබඳ ඇතිකළ වෙනස්කම කුමක්ද? එය ඔබගේ ජීවිතයට අදාළ වන්නේ කෙසේදැයි සිතන්න. ඉන්පසු ඇදහිල්ලෙන් පිළිපදින්න. ඔබට නිසැකකමක් නැත්නම් යාච්ඤා කරමින් ඔබට මඟපෙන්වීම පිණිස ප්‍රඥාවන්ත කිතුනුවෙකුගෙන් උපකාරය පතන්න.

---

# ඊ. ද්විතීය නීති සංග්‍රහයෙන් පාඩම්

දෙවියන්වහන්සේගේ වචනයෙන් අපගේ ජීවිතවලට පාඩම් ඉගෙනීම වැදගත් වන්නේය. ඒවා ඔබගේ සෙනඟට කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කර ඒවා ගැන යාච්ඤා කරන්නට උපකාරී වන්නේය. මෙම පොතෙහි ඇති ප්‍රධාන පාඩම් සමහරක් ගැන ඉගෙනගන්නට ප්‍රශ්න අපට උපකාරී වේ. ද්විතීය නීති සංග්‍රහය ගැන ඔබේ කතා පැවැත්වීම අවසන් වූ පසුව මෙම ප්‍රශ්න ඔබට යොදාගත හැකිය. නැතහොත් සෑම කොටසකටම පසුව ඒවා යොදාගැනීම ඔබට අවශ්‍ය වන්නට පුළුවන.

### 1. ද්විතීය නීති සංග්‍රහය 1:1-8

- ද්විතීය නීති සංග්‍රහය කුමක් පිළිබඳවද? දෙවියන්වහන්සේගේ වචනය ගැන අපට සිහිපත් කළයුත්තේ ඇයි?
- පොරොන්දු දේශයේ ඇති වැදගත්කම කුමක්ද (8 පදය)?

### 2. ද්විතීය නීති සංග්‍රහය 1:9-18

- 10-11 පදවල ඇති දෙවියන්වහන්සේගේ පොරොන්දු දෙස බලන්න. ඔබට විශ්වාස කිරීමේදී ගැටලුවක් ඇත්තේ කුමන පොරොන්දු පිළිබඳවද?
- සභාවේ නායකයන් වියයුත්තේ කෙබඳු ආකාරයේ පුද්ගලයන්ද (15-18 පද)?

### 3. ද්විතීය නීති සංග්‍රහය 1:19-33

- 28 පදය බලන්න. ඔබ බියවන්නේ කුමකටදැයි සිතන්න. මේවාට ඔබ බියවන්නේ ඇයි?
- දැන් 32-33 පද බලන්න. ඔබ දෙවියන්වහන්සේට අකීකරු වන්නේ ඔබ උන්වහන්සේ විශ්වාස නොකරන නිසාද?

### 4. ද්විතීය නීති සංග්‍රහය 1:34-46

- මෝසෙස් හා වැඩිහිටි ඉශ්‍රායෙල්වරුන් පොරොන්දු දේශයට ඇතුළු නොවූහ. විශ්වාස කරමින් කීකරු වූ නිසා කාලෙබ් හා යෝෂුවා එහි ඇතුල්විය (34-38 පද). ස්වර්ගීය පොරොන්දු දේශයට ඇතුළුවීම සඳහා සෑම උත්සාහයක්ම ඔබ දරන්නේ කෙසේද? හෙබ්‍රෙව් 4:11 සැලකිල්ලට ගන්න.

- ඉශ්‍රායෙල් සෙනඟ සැබවින්ම පසුතැවිලි නොවූ බව ක්‍රියාවෙන් පෙන්වූයේ කෙසේද (41-45 පද)?

## 5. ද්විතීය නීති සංග්‍රහය 2:1-3:11
- ඔබ බියවන සතුරන් කවුරුන්ද? මෙම සතුරන්ගෙන් ඔබ ආරක්ෂා කිරීමට දෙවියන්වහන්සේට හැකිවන්නේ කෙසේද?
- දෙවියන්වහන්සේ ජාතීන් කෙරෙහි දෙවියන්-වහන්සේය. මෙය වත්මන් ලෝකයේ ඔබට බලාපොරොත්තුවක් ඇති කරන්නේ කෙසේද?

## 6. ද්විතීය නීති සංග්‍රහය 3:23-29
- ඔබගේ සභා නායකයන් පාපයට නොවැටෙනු පිණිස ඔබ ඔවුන් උදෙසා යාච්ඤා කරන්නේ කෙසේද?
- ඔබ දෙවියන්වහන්සේගේ සෙනඟගේ නායකයෙකු නම් ඔබ දෙවියන්වහන්සේට දිගටම කීකරුව සිටින බව සහතික කරගන්නේ කෙසේද?

## 7. ද්විතීය නීති සංග්‍රහය 4:1-8
- 4 පදය බලන්න. ඔබ දෙවියන්වහන්සේට විශ්වසනීයව/අත් නොහැර සිටින්නේ කෙසේද?
- නැවත 6-8 දක්වා පද බලන්න. කිතුනුවන්ගේ කීකරුකම නිසා නොඇදහිලිවන්තයන් දෙවියන්-වහන්සේ වෙත එනු ඔබ දැක තිබේද?

## 8. ද්විතීය නීති සංග්‍රහය 4:9-20
- 9 පදය දෙස බලන්න. දෙවියන්වහන්සේ කළ හා කී දේ අමතක නොවනු පිණිස ඔබ කරන්නේ කුමක්ද?
- පිළිම ගැන 15-16 පද පවසන්නේ කුමක්දැයි බලන්න. ඔබ සිටින ස්ථානයේ පොදුවේ දැකගත හැකි පිළිම මොනවාද? ඔබ පිළිම හෝ බොරු දෙවිවරුන් නමස්කාර නොකරන බව ඔබ සහතික කරගන්නේ කෙසේද?

## 9. ද්විතීය නීති සංග්‍රහය 4:21-31
- 24 පදය දෙස බලන්න. දෙවියන්වහන්සේ ඊර්ෂ්‍යාකාර දෙවියන්වහන්සේය යන්නෙන් ඔබගේ ජීවිතයට අදහස් වන්නේ කුමක්ද?
- 31 පදය බලන්න. දෙවියන්වහන්සේ දයාවන්ත දෙවියන්වහන්සේය යන්නෙන් ඔබගේ ජීවිතයට අදහස් වන්නේ කුමක්ද?

## 10. ද්විතීය නීති සංග්‍රහය 4:32-40
- බයිබලයේ සිටින දෙවියන්වහන්සේ ඔබ සිටින ස්ථානයේ ඇති අනෙක් සෙනඟගේ දෙවිවරුන්ට වඩා ශ්‍රේෂ්ඨ වන්නේ කෙසේද?
- වෙනත් දෙවිවරුන්ට නමස්කාර කරන්නෙකුට ඔබ කතා කරන විට ඔබ ඔවුන්ගේ දෙවිවරුන් බයිබලයේ දෙවියන්වහන්සේ සමග සංසන්දනය කර බලන්නේ කෙසේද?

## 11. ද්විතීය නීති සංග්‍රහය 5:6-11
- 7 වන පදයේ ඇති ආඥාව බලන්න. සැබෑ දෙවියන්වහන්සේ නමස්කාර කරන අතරම ඔබගේ ප්‍රදේශයේ කිතුනුවන් නමස්කාර කරන වෙනත් දෙවිවරුන් කවුරුන්ද?
- 8-9 පද බලන්න. ඔබ සිටින ස්ථානයේ ඇති කුමන පිළිම ඔබට පරීක්ෂාවක් වී තිබේද?

## 12. ද්විතීය නීති සංග්‍රහය 5:12-15
- සෑම සතියකම ඔබ විවේකගන්නේ කෙසේද?
- 15 පදය බලන්න. ඔබට විවේකය දීම සඳහා දෙවියන්වහන්සේ කළ දෙය ඔබ මතක තබාගන්නේ කෙසේද?

## 13. ද්විතීය නීති සංග්‍රහය 5:16-21
- 17 පදය බලන්න. සෙනඟ සමග කෝප වීමෙන් අප යේසුස්වහන්සේගේ ආඥාව කඩන බව උන්-වහන්සේ පැවසූ බව සිහිපත් කරන්න (මතෙව් 5:21-22). ඔබ කෝපයෙන් සිටින්නේ කා සමඟද?
- 18 වන පදය බලන්න. රාගය ඇතිව අප කෙනෙකු දෙස බලන්නේ නම් අප කාමමිථ්‍යාචාරය කර ඇති බව යේසුස්වහන්සේ පැවසූසේක (මතෙව් 5:28). ඔබ වළකාගත යුත්තේ කෙබඳු රාගය සහිත සිතුවිලිද?

## 14. ද්විතීය නීති සංග්‍රහය 6:4-9
- 5 පදය බලන්න. ඔබ දෙවියන්වහන්සේට කොපමණ ප්‍රේම කරන්නේද යන්න 100 මිනුමකින් මැන්නහොත් කොපමණ වනු ඇත්ද?
- දැන් 6 වන පදය බලන්න. ඔබගේ හදවතට දෙවියන්වහන්සේගේ වචන ඇතුළු කරගැනීම සඳහා ඔබ උත්සාහ දරන්නේ කෙලෙසින්ද?

## 15. ද්විතීය නීති සංග්‍රහය 6:20-25
- තමන් දෙවියන්වහන්සේට කීකරුවිය යුත්තේ කුමක් නිසාදැයි දරුවෙකු ඔබෙන් ඇසුව හොත් ඔබ දෙන පිළිතුර කුමක්ද?
- ඔබේ සභාව දෙවියන්වහන්සේ පිළිබඳව දරුවන්ට කෙතරම් හොඳින් උගන්වන්නේද?

## 16. ද්විතීය නීති සංග්‍රහය 7:1-11

- 6 පදය බලන්න. ඔබ සිටින ස්ථානයේ සිටින නොඇදහිලිවතුන්ට වඩා ඔබේ ජීවිතය කෙතරම් වෙනස්වන්නේද? ඔබ ශුද්ධ බවත් දෙවියන්-වහන්සේට අයත් බවත් අනෙක් මිනිසුන්ට දැකගත හැකිද?
- 8 පදය බලන්න. දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමකරන බව මතකතබාගැනීමෙන් වෙනසක් සිදුවන්නේද?

## 17. ද්විතීය නීති සංග්‍රහය 8:1-20

- ඔබගේ ජීවිතයේ අසීරු කාලයන් තුළින් කුමන පාඩම් ඔබ උගත්තේද?
- 17-18 පද බලන්න. පොහොසතකු වීමෙන් ඔබ සිටින ස්ථානයේ කුමන අනතුරු තිබේද?

## 18. ද්විතීය නීති සංග්‍රහය 9:4-24

- ඔබ අනෙක් මිනිසුන්ට වඩා හොඳ අයෙකැයි ඔබ කවදා හෝ සිතුවේද? දෙවියන්වහන්සේ ඔබට ආශීර්වාද කළේ මේ නිසා යැයි ඔබ සිතන්නේද (4-6 දක්වා පද)?
- 12 පදය බලන්න. ඔබ දෙවියන්වහන්සේ වෙතින් ඉක්මනින් ඉවත්වූ අවස්ථා ඔබට මතකද?

## 19. ද්විතීය නීති සංග්‍රහය 9:25-29

- නරක දේ කරන හා ඇදහිල්ල අතහැර දමා ඇති සහාවේ සිටින අය උදෙසා ඔබ යාච්ඤා කරන්නේ කෙසේද?
- නොඇදහිලිවතුන් විසින් ඔබ ජීවත්වන ආකාරය දැක දෙවියන්වහන්සේ වෙත එනු පිණිස නිවැරදි දේ කරන්නට ඔබේ සහාව උදෙසා ඔබ කෙසේ යාච්ඤා කරන්නේද?

## 20. ද්විතීය නීති සංග්‍රහය 10:12-22

- 16 පදය බලන්න. මෙය සිදුවන්නේ කෙසේද? ඔබ හදවතින් චර්මඡේදනය වී සිටින්නේද?
- 21-22 පද බලන්න. ඔබේ ප්‍රශංසාව දෙවියන්-වහන්සේද? ඔබ දිනපතා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්නේ කෙසේද?

## 21. ද්විතීය නීති සංග්‍රහය 12:1-7

- 5 පදය බලන්න. දෙවියන්වහන්සේට ඔබ කරන නමස්කාරයේ කේන්ද්‍රය වන්නේ කුමක්ද (යොහන් 2:21 බලන්න)?
- 7 පදය බලන්න. දෙවියන්වහන්සේට ඔබ කරන නමස්කාරය ප්‍රීතිමත් එකක්ද? එය ප්‍රීතිමත් එකක් වන්නේ කවර ආකාරවලින්ද?

## 22. ද්විතීය නීති සංග්‍රහය 13:1-11

- ඔබ සිටින ස්ථානයේ බොරු ප්‍රොපේතවරුන් සිටින්නේද? ඔවුන් පිළිබඳව ඔබේ සෙනඟට ඔබ අනතුරු අඟවන්නේ කෙසේද?
- 1-4 දක්වා පද බලන්න. ඔබ සිටින ස්ථානයේ මිනිසුන් අනාවැකි පලකරන්නන් හෝ හාස්කම් කරන්නන් අනුව යන්නේද?

## 23. ද්විතීය නීති සංග්‍රහය 14:1-21

- මිථ්‍යාදෘෂ්ටික ආහාරවේල්වලට සහභාගි වන ලෙස ඔබ සිටින ස්ථානයේ අයට ආරාධනා ලැබෙන්නේද? ඔවුන් කළ යුතු දේ ගැන ඔබ අනුශාසනා කරන්නේ කෙසේද?
- නොඇදහිලිවතුන් කරන දේ ඔබ සිටින ස්ථානයේ කිතුනුවන් කරන්නේ කුමන ආකාර වලින්ද?

## 24. ද්විතීය නීති සංග්‍රහය 14:22-29

- කිතුනු සේවය හා ධර්මදූත කටයුතු සඳහා දිය යුත්තේ කුමක්දැයි ඔබ තීරණය කරන්නේ කෙසේද?
- ඔබගේ දීම ඔබට දෙවියන්වහන්සේ විශ්වාස කිරීම උගන්වන්නේ කෙසේද (23 පදය)?

## 25. ද්විතීය නීති සංග්‍රහය 15:1-18

- මුදල් ණයට දීම මගින් දුප්පත් කිතුනුවන්ට උපකාරීවීමේ ක්‍රමය ඔබේ සහාවේ තිබේද?
- දුප්පත් කිතුනුවන්ට උපකාර කිරීම සඳහා තමන් සතු දේ ඔබේ සහාව බෙදා ගන්නේ කෙසේද?

## 26. ද්විතීය නීති සංග්‍රහය 16:1-17

- නත්තල් හා පාස්කුව වැනි වැදගත් කිතුනු උත්සව ඔබ සමරන්නේ කෙසේද?
- දෙවියන්වහන්සේ කළේ කුමක්දැයි මතක තබාගැනීමට ඇදහිලිවන්තයන්ට උපකාරී වන ආකාර වලින් ඔබ ඒවා සමරන්නේද?
- දෙවියන්වහන්සේ කළ දේ ගැන ප්‍රීතියෙන් නිතර සමරන්නේද?

## 27. ද්විතීය නීති සංග්‍රහය 17:14-20

- අශ්වයන්, භාර්යාවන් හා වස්තුව සඳහා රජවරුන්ට දුන් අනතුරු ඇඟවීම් ගැන සිතන්න. මුදල්, ලිංගික ක්‍රියාවන් හා බලය යනු සුලබ පරීක්ෂාවන්ය. මේ පරීක්ෂාවලට ඔබ එරෙහි වන්නේ කෙසේද?
- මෙම පරීක්ෂාවන් නායකයෙකු හට ඉතාම නරක ඒවා වන්නේද?

## 28. ද්විතීය නීති සංග්‍රහය 18:9-19

- 9-11 දක්වා පද බලන්න. ඔබ සිටින ස්ථානයේ කෙබඳු ආකාරයේ කට්ටඩියන්, පේන කියන්නන් වැනි අය සිටින්නේද?
- ඔබ සිටින ස්ථානයේ ඇදහිලිවතුන්ට ඔවුන් අනතුරුදායක වන්නේ කෙසේද?
- 15 පදය බලන්න. මෝසෙස් වැනිවූ ප්‍රොපේතවරයා යේසුස්වහන්සේය. ඔබ යේසුස්වහන්සේට ඇහුම්කන් දෙන්නේ කෙසේද?

## 29. ද්විතීය නීති සංග්‍රහය 22:1-12

- 1-4 දක්වා පද බලන්න. එකිනෙකා සතු සම්පත් වඩා හොඳින් රැකබලා දීම ඇදහිලිවතුන්ට කළ හැක්කේ කෙසේද?
- 8 පදය බලන්න. මිනිසුන්ට ඔබේ නිවස හා වතුපිටි ආරක්ෂා සහිත ස්ථාන බවට පත්කර ගැනීම සඳහා අදහස් සාකච්ඡා කරන්න.

## 30. ද්විතීය නීති සංග්‍රහය 22:13-30

- සෙනඟ ලිංගික පාපයන්ට නිතරම වැටෙන්නේ ඇයි?
- විවාහයේ විශ්වාසවන්තව සිටින්නට සභාව කිතුනුවන්ට උපකාර කර ශක්තිමත් කළහැක්කේ කෙසේද?

## 31. ද්විතීය නීති සංග්‍රහය 26:1-11

- ස්වාමීන්වහන්සේ ඔබ සඳහා කර ඇත්තේ මොන-වාද? ඔබේ ජීවිතයට අදාළව වාක්‍ය 5-10 ලියන්න.
- දෙවියන්වහන්සේ ඔබට දී ඇති යහපත් දේ මොනවාද? එපීස 1:3-14 ද කියවන්න.

## 32. ද්විතීය නීති සංග්‍රහය 27:1-13

- පැරණි ගිවිසුම් ව්‍යවස්ථාව යේසුස්වහන්සේ සම්පූර්ණ කළේ කෙසේද?
- ඔබ පැරණි ගිවිසුම් ව්‍යවස්ථාව කියවන විට එය ඔබට ඔබගේ පාපයන් හා අසාර්ථකවීම් පෙන්වා දෙන්නේද?
- ගලාති 3:10-14 කියවන්න. පාපයෙන් සමාව ලැබීම ගැන හා ව්‍යවස්ථාවෙන් නිදහස්වීම ගැන ඔබට නිතරම ප්‍රීතියක් තිබේද? දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

## 33. ද්විතීය නීති සංග්‍රහය 28:1-14

- 10 පදය බලන්න. පැරණි ඉශ්‍රායෙල් දෙවියන්-වහන්සේට කීකරු වී ආශීර්වාද ලැබීම ගැන අනෙක් ජාතීන් හා සෙනඟ කුමක් සිතිය යුතුද?
- දෙවියන්වහන්සේ ඔබට දී ඇති ආශීර්වාද මොනවාද?
- එපීස 1:3-14 කියවන්න. ඔබේ සභාව තුළින් නොඇදහිලිවන්තයන් දෙවියන්වහන්සේ වෙත එන්නේද?

## 34. ද්විතීය නීති සංග්‍රහය 28:15-68

- දෙවියන්වහන්සේ කෙනෙකුට ශාප කරන්නේ කුමන හේතුවක් නිසාද?
- අප උදෙසා ශාපය විදීම සඳහා යේසුස්වහන්සේ කළේ කුමක්ද?

## 35. ද්විතීය නීති සංග්‍රහය 30:1-10

- 6 පදය බලන්න. දෙවියන්වහන්සේ ඔබේ හදවත වෙනස් කර තිබේද? ඔබ ඒ බව දන්නේ කෙසේද?
- 1-3 දක්වා පද බලන්න. ඔබ දෙවියන්වහන්සේ වෙත ආපසු හැරී ඇවිත්ද? ඔබ කළ යුත්තේ කුමක්ද?

## 36. ද්විතීය නීති සංග්‍රහය 30:11-20

- 19 පදය බලන්න. ජීවිතය තෝරාගැනීම සඳහා ඉන් ලැබෙන තේරුම කුමක්ද?
- යේසුස්වහන්සේගේ වචන හා ජීවිතය යන තේමාව කෙතරම් වැදගත් වන්නේද?

## 37. ද්විතීය නීති සංග්‍රහය 31:1-13

- 7 පදය බලන්න. ඔබට ධෛර්ය හා විශ්වාසය ගෙන දෙන්නේ කුමක්ද?
- 13 පදය බලන්න. දෙවියන්වහන්සේගේ වචනය ඔබ සහ ඔබේ දරුවන් එක්ව කොපමණ වරක් සවන්දෙන්නේද?

## 38. ද්විතීය නීති සංග්‍රහය 32:1-18

- ඔබගේ ජීවිතය සඳහා 4 වන සත්‍ය වන්නේද?
- 18 පදය බලන්න. සෙනඟට ජීවිතය දෙන පර්වතය වූ දෙවියන්වහන්සේ සෙනඟ විසින් අතහැර/අමතක කර දමන්නේ ඇයි?

## 39. ද්විතීය නීති සංග්‍රහය 34:1-12

- 9 පදය බලන්න. දෙවියන්වහන්සේගේ සෙනඟගේ නායකයන්ට ප්‍රඥාව වැදගත් වන්නේ ඇයි?
- 10 පදය බලන්න. යේසුස්වහන්සේ මෝසෙස් වැනි ප්‍රොපේතවරයකු වූයේ කෙසේද?

# ද්විතීය නීති සංග්‍රහය ඉගැන්වීම

## ද්විතීය නීති සංග්‍රහය පොත සඳහා දේශනා සටහන්

*...ලොව වටා සිටින බයිබල් ගුරුවරුන් උදෙසා ලියා ඇත*

**යාච්ඤා කරන්න - සුදානම් වන්න - දේශනා කරන්න** පොත් පෙළ ලොව පුරා සිටින බයිබල් ගුරුවරුන්ට දෙවියන්වහන්සේගේ වචනය නිවැරදිවත් පැහැදිලිවත් පැහැදිලි කරදීම සඳහා මාර්ගෝපදේශයන් වන්නේය. "ලජ්ජාවට පත්වීමට අවශ්‍ය නැති සත්‍යයේ වචනය නිවැරදිව පැහැදිලි කර දෙන යහපත් සේවකයකු වන්න"යි 2 තිමෝති 2:15 පවසයි.

*ද්විතීය නීති සංග්‍රහය ඉගැන්වීම* මෙය කිරීම සඳහා ඔබට උපකාරී වේ. එය ඔබට

- වත්මන් කිතුනුවන්ට දෙවියන්වහන්සේ පරණ ගිවිසුම් ව්‍යවස්ථාවන් අදාළ වන්නේ කෙසේද යන්න **අවබෝධ කරගැනීමටත්**
- අප දෙවියන්වහන්සේට කීකරු වියයුත්තේ ඇයිදැයි **ඉගෙනීමටත්**
- දෙවියන්වහන්සේ විශ්වාසවන්තව සිටිමින් උන්වහන්සේට කීකරුවීමට සෙනඟට **උපකාර වීමටත්**
- ඔබේ සෙනඟට එක් එක් කොටස වැදගත් වන්නේ කෙසේදැයි **සිතීමටත්**
- ප්‍රධාන කාරණය පැහැදිලිව **ඉගැන්වීමටත්**

උපකාරී වේ.



අර්ථවිග්‍රහාත්මක දේශනා කිරීම්වල අවශ්‍යතාව බොහෝසේ කතාබහට ලක්වී ඇත. එහෙත් ආසියාවේ සැබෑ අර්ථවිග්‍රහාත්මක දේශනා පවත්වන්නේ ඉතාම ස්වල්ප දෙනෙකු පමණි. මෙම පොත් පෙළ බොහෝ දේශකයන්ගේ ජීවිතවල හා සේවයන් සඳහා නව ගැම්මක් ලබාගැනීමට උපකාරීවනු ඇත. අර්ථවිග්‍රහාත්මක දේශනා කිරීම් වර්තමාන සභාපාලකවරුන්ට ප්‍රායෝගික නොවන, කළ නොහැකි කාර්යයක් නොවන බව එය පෙන්වා දෙයි. ප්‍රායෝගික ආකාරයන්ගෙන් දේශනා කිරීම සඳහා බයිබල් ජේදයන් විවෘත කරදීමෙන් වචනයේ සේවකයන්ගේ අලුත් පරම්පරාවක් පෝෂණය කිරීමට මෙම පොත් පෙළ උපකාරී වේ.

*ආචාර්ය අජිත් ප්‍රනාන්දු, ඉගැන්වීම් අධ්‍යක්ෂක - යෞවන කිතුමග*



ලොව පුරා පවතින විශාලතම අවශ්‍යතාවන්ගෙන් එකක් වන්නේ බයිබල් ජේදය මත දැඩිව පදනම් වූ එහි බලය හා අදාළත්වය හෙළි කරන්නාවූ දේශනාවන්ය. යාච්ඤා කරන්න - සුදානම් වන්න - දේශනා කරන්න පොත් පෙළ සම්පත් අඩු බොහෝ සභාපාලකවරුන්ට සහ එහි ගිහි දේශකයන්ට මහත් උපකාරයක් වන්නේය.

*ජොනතන් ලැම්බ්, අධ්‍යක්ෂක, ලන්ග්හැම් දේශනා සේවය, ලන්ග්හැම් ජාත්‍යන්තර හවුල්කාරිත්වය*

රු. 200/-

ISBN 978-955-82389-0-5

Langham PARTNERSHIP

CTS Publishing
Colombo Theological Seminary
Resources to the Church for the Transformation of Nations